



ශ්‍රී ලංකා

# මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම

2017 - 2021

# මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2017 - 2021



*අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය*


පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ සංවර්ධනය හා යුක්තිය ළඟාකර ගැනීම සඳහා වූ කතිකාවත තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය හා අපරානුමත කර ඇති මානව හිමිකම් සම්මුතීන් මෙන්ම ස්වේච්ඡා ප්‍රතිඥාවන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇත.

ජාතික ප්‍රාදේශීය හා ප්‍රජා මට්ටමේ මානව අයිතිවාසිකම් ගැටළු නිරාකරණය කෙරෙහි රජය දක්වන කැපවීම ගෙන ඇති විවිධ වැඩපිළිවෙලවලින් පැහැදිලිවේ.

ව්‍යවස්ථානුකූල, ප්‍රතිපත්ති හා පරිපාලන ව්‍යුහයන් හරහා මානව හිමිකම් සුරැකීම හා ප්‍රවර්ධන ඉලක්ක අරමුණු කරගත් ක්‍රියාකාරකම්, ජාතික ක්‍රියාදාමයන් හා යාන්ත්‍රණ ශක්තිමත් කිරීම උදෙසා ගතහැකි පියවර 2017-2021 වර්ෂ සඳහා වූ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත්ය.

කැබිනට් මණ්ඩලය විසින් පත්කරනු ලැබූ අන්තර් අමාත්‍ය අනුකමිටුවක් විසින් මෙහෙයවන ලද ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී රජය, සිවිල් සංවිධාන, ජාතික මානව හිමිකම් කොමිසම, එක්සත් ජාතින්ගේ ආයතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා විද්වතුන්ගේ අදහස් උපදේශන ක්‍රියාවලියක් හරහා ලබාගන්නා ලදී.

ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සමාජයේ දුර්වලම කොටස්ද ඇතුළුව සියළු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවට හා ප්‍රවර්ධනයට රජය විසින් ගනු ලැබූ තවත් එක් සාධනීය පියවරක් බව මාගේ විශ්වාසයයි. මෙම සැලසුම සකස් කිරීමටත්, ඉදිරි පස් වසර තුළදී එය සාර්ථකව ක්‍රියාවට නැංවීමටත් සහය දැක්වූ හා දක්වන සියලු පාර්ශවයන්ට මාගේ ස්තූතිය පුදකර සිටිනවා.



*ගරු අග්‍රාමාත්‍යතුමාගේ පණිවිඩය*

සියලු ශ්‍රී ලාංකිකයන්ගේ මානව හිමිකම් සුරැකීම හා ප්‍රවර්ධනය සඳහා රජය දැඩි කැපවීමකින් කටුයතු කරයි. නිදහසෙන් පසුව පුළුල් පරාසයක අයිතිවාසිකම් හඳුනාගෙන රට ස්ථිර වශයෙන් ඉදිරියට ගොස් ඇත. එක් අතකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට මානව හිමිකම් ඇතුළත් කිරීම මගින් අයිතිවාසිකම් ව්‍යවස්ථානුගත කර ඇත. අනෙක් අතට ජාත්‍යන්තර සම්මුතීන් අපරානුමත කර දේශීය නීති පද්ධතියට එම සම්මුතීන්හි විධිවිධාන සංස්ථාගත කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කර ඒවා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමටද රජය කටයුතු කරයි. බලහත්කාරයෙන් අතුරුදහන්වීම්වලින් සියලු දෙනා ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මුතිය හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අපරානුමත කිරීම හරහා මෑතකදී ශ්‍රී ලංකාව විසින් මානව හිමිකම් සඳහා වූ සිය කැපවීම පුළුල් කළේය.

මානව හිමිකම් තවදුරටත් වර්ධනය කිරීමට රජය දක්වන කැපවීම පුළුල් කිරීම සඳහා, 2017-2021 වර්ෂ සඳහා වූ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට තීරණය කර ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ මැතිවරණ කොමිසම මෙන්ම සිවිල් සමාජ ක්‍රියාකරුවන් සහ මහජනතාව ඇතුළු ස්වාධීන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු පුළුල් පරාසයක පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර සකස් කරන ලද මෙම සැලැස්ම ඉදිරි පස් වසර තුළ මානව හිමිකම් පිළිබඳ ශ්‍රී ලංකාවේ දැක්ම පිළිබිඹු කරයි.

කැබිනට් මණ්ඩලය විසින් ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පත සමාලෝචනය කර ඇත. අනුමත සැලැස්ම තුළ ප්‍රමුඛ පෙළේ ක්ෂේත්‍ර අරමුණු කර ගනිමින් තේමාවන් දහයක් සඳහා යෝග්‍ය, ක්‍රියාකාරී සැලසුම් හා කරුණු අඩංගු වේ. මෙහි පූර්ණ සාර්ථකත්වය ළඟා කර ගැනීමට නම් අදාළ රාජ්‍ය ආයතන සහ රේඛීය අමාත්‍යාංශ විසින් නියමිත වේලාවට හා සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගතයුතු බවට මා විශ්වාස කරමි. එබැවින් මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා පූර්ණ සහයෝගය ලබාදෙන ලෙස මම සියලු පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටිමි. මානව අයිතිවාසිකම් සහතික කිරීම සහ ශ්‍රී ලංකාවේ සියලු ජනතාවගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා මෙවැනි සාමූහික ප්‍රයත්නයන් වැදගත් වනු ඇත.

# පටුන


| | | | |
|---|---|---|---|
| පරිච්ඡේද | 1 | සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් | 01 - 23 |
| | 2 | වද හිංසා වැළැක්වීම | 25 - 37 |
| | 3 | කාන්තා අයිතිවාසිකම් | 39 - 65 |
| | 4 | අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් සහ ආපසු පැමිණි සරණාගතයින්ගේ අයිතිවාසිකම් | 67 - 92 |
| | 5 | සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් | 93 - 110 |
| | 6 | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් | 111 - 156 |
| | 7 | ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් | 157 - 191 |
| | 8 | ළමා අයිතිවාසිකම් | 193 - 209 |
| | 9 | කම්කරු අයිතිවාසිකම් | 211 - 216 |
| | 10 | පාරිසරික අයිතිවාසිකම් | 217 - 243 |

# සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

# සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්

ශ්‍රී ලංකාවේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සඳහා ලබාදුන් නිසි හඳුනාගැනීම දශක කිහිපයක් පුරා විහිදුන ක්‍රියාවලියකි. 1947 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පසුකාලීනව 1972 ජනරජ ව්‍යවස්ථාව හරහා මෙම අයිතිවාසිකම් ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම සඳහා වන බැඳීම පිළිබිඹු කරන ලදී. එතැන් පටන් 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ඒ සඳහා නිසි රාමුවක් සකස් කළ අතර, ඉන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් අධිකරණය හරහා බලගැන්විය හැකි අතර, ස්වාධීනව වන්දි ලබාදීමේ යාන්ත්‍රණයක් සපයනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ වෙනත් කරුණු අතර සිතීමේ, හෘදසාක්ෂියේ සහ ආගමික නිදහස, වද හිංසාවලින් ආරක්ෂා කිරීමේ නිදහස, සමානාත්මතාව සහ වෙනස් ලෙස නොසැලකීම සඳහා අයිතිය, අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීමෙන්, රඳවාගැනීම හෝ දඬුවම් දීමෙන් නිදහස, කථාකිරීමේ, රැස්වීමේ, එකතුවීමේ සහ සමාගමයේ නිදහස අන්තර්ගතය. ජීවත්වීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි පැහැදිලිව සඳහන් නොවන අතර, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජීවත්විමේ අයිතිය පූර්ණ වශයෙන් වක්‍රාකාරව පිළිගෙන ඇත.

මේ අතර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාත්‍යන්තර බැඳීම්වලට යටත් වෙමින්, 1980 ජූනි 11 වෙනි දින සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) ශ්‍රී ලංකාව පිළිගන්නා ලදී. එමෙන්ම 1982 පෙබරවාරි 18 දින සියලුම ආකාරයේ ජාතිවාදී කොන්කිරීම් තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (CERD) සහ 1994 ජනවාරි 03 වෙනි දින වධ හිංසා සහ වෙනත් සැහැසි, අමානුෂික හෝ නොහොබිනා ආකාරයෙන් සැලකීම හෝ දඬුවම් කිරීමට විරුද්ධ සම්මුතියද (CAT) පිළිගන්නා ලදී. තවද, 2016 මැයි 25 වෙනි දින සියලුම පුද්ගලයින් බලහත්කාරයෙන් අතුරුදන් කරවීම් වලින් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මුතිය (CED) ද අනුමත කරන ලදී.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ව්‍යවස්ථාමය සහ ජාත්‍යන්තර බැඳීම් පිළිගැනීම හැරුණු විට, ශ්‍රී ලංකාව නිශ්චිත කේන්ද්‍රීය සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා නීති සම්පාදනය කර ඇත. 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පිළිබද පනත බලාත්මක අතර, ඉන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දැනට ප්‍රකාශිතව සහ ගම්‍යාර්ථව පිළි නොගත් ඉහත නම් සදහන් කළ පනතෙහි විශේෂ විධිවිධාන නීතිගත කෙරේ. එමෙන්ම ශ්‍රී ලංකාව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත මෑතක දී පනවනු ලැබූ අතර, ඉන් පුරවැසියන්ට තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අයිතිය සහතික කරන අතර, පුරවැසියන්ට තොරතුරු සඳහා ප්‍රවේශ විය හැකි ක්‍රියාවලියක් දක්වා ඇත. එමෙන්ම, අතුරුදන් වූ පුද්ගලයින් ලකුණු කළ හැකි සහ එම පවුල්වලට අතුරුදන් පුද්ගලයින් පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශ විය හැකි ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා, 2016 අංක 14 දරණ අතුරුදන් වූ පුද්ගලයින් පිළිබඳ කාර්යාල (කාර්යයන් ස්ථාපිත කිරීම, පරිපාලනය සහ මුදාහැරීම) පනත ද පනවන ලදී.

ශ්‍රී ලංකාවේ පුද්ගලයින්ට ඔවුන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන්, පිළියම් ලබාගත හැකි ස්ථාන ගණනාවක් ඇත. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට රජයේ, විධායක හෝ පරිපාලන ක්‍රියාකරුවන් විසින් සිදුකරන මූලික අයිතිවාසිකම් කඩ කිරීම් පිළිබඳ විමර්ශනය කිරීමට අධිකරණමය බලය පැවරී ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ මහාධිකරණයට සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පිළිබද පනත යටතේ වැරදි සම්බන්ධ නඩු විභාග කිරීමට අධිකරණමය බලය ඇත. මේ අතර, මානව හිමිකම් පිළිබඳ ආරක්ෂාව සහ ප්‍රවර්ධනය සඳහා ආයතනිකමය වැඩපිළිවෙල ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම විසින් පිහිටුවන ලද, 1996 අංක 21 දරණ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම් සභා පනත තුළින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. අත්තනෝමතිකව සිරභාරයට ගැනීම සහ රඳවාගැනීමෙන් නිදහස ඇතුළුව, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සනාථ කෙරෙන වැදගත් බලතල රාශියකින් මෙම කොමිසම බලගන්වා තිබේ. එමෙන්ම එයට මූලික අයිතිවාසිකම් කඩකිරීම සහ කඩකිරීම් සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීමට ද බලය හිමිය.

වර්තමාන ජාතික කාර්ය සැලැස්ම මගින් පවත්නා නීතිමය සහ ආයතනිකමය යාන්ත්‍රණ, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ජාත්‍යන්තර සම්මතයන් සහ යහපත් ක්‍රියාමාර්ග පිළිපදින ආකාරයෙන් ශක්තිමත් කිරීම අරමුණු කෙරේ.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. ජීවත්වීමේ අයිතිය ආරක්ෂා කිරීම. | 1.1. ජීවත්වීමේ අයිතිය ප්‍රකාශිතව පිළිගැනීම. | 1.1.1. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය තුළ දක්වෙන, ජීවත්වීමේ අයිතිය පිළිබඳ නිර්වචනය සහ විෂය පථය සමාලෝචනය කර සළකා බැලීම. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණ පිළිබඳව මෙහෙයුම් කමිටුව තුළින් පාර්ලිමේන්තුවට යොමු කිරීම) | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | මෙහෙයුම් කමිටුව විසින් යොදාගත් ජීවත්වීමේ අයිතිය පිළිබඳ නිසි සැකැස්ම. |
| | | 1.1.2. ජීවත්වීමේ අයිතිය ඇතුළත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සංශෝධනය කිරීම. (සැ.යු. මූලික අයිතිවාසිකම් පිළිබඳ පාර්ලිමේන්තු උප කමිටුව විසින් නිර්දේශ කළ පරිදි) | | | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ජීවත්වීමේ අයිතිය ඇතුළත් කිරීම. |
| | 1.2. ඝාතන සම්බන්ධයෙන් අතිරේක අපක්ෂපාතී අධිකරණමය විමර්ශන ක්‍රියාමාර්ග උසස් කිරීම. | 1.2.1. සමාලෝචනයක් සිදු කර, එකී සමාලෝචනයේ ප්‍රතිඵලය මත පදනම් ව, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 30 පරිච්ඡේදය සහ අධිකරණ තන්ත්‍ර පනත සංශෝධනය කිරීම තුළින් මහේස්ත්‍රාත්වරුන්ට :<br>1. රජයේ නිලධාරීන් ඇතුළුව, යම් පුද්ගලයෙකු විසින් සිදු කළේ යැයි චෝදනා ලැබ සිටින සෑම මරණයක්ම පිළිබඳවම විමර්ශනය කිරීම.<br>2. අවශ්‍ය අපරාධ සහ අධිකරණ වෛද්‍ය විමර්ශන සිදු කිරීමට උපදෙස් ලබාදීම සහ නියාමනය.<br>3. මරණයට හේතුව (තීන්දුව තුළින්) විද්‍යාමාන වුවද, මරණය පිළිබඳ විමර්ශන අඛණ්ඩව සිදුකිරීම.) | අධිකරණ අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා නීති කොමිසම<br>පාර්ලිමේන්තුවේ අදාළ ආංශික පාලන කමිටුව<br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | අපරාධ නඩු විධි විධාන සංග්‍රහය පිළිබඳ (සංශෝධිත) කෙටුම්පත සකස් කර, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br>පාර්ලිමේන්තුව විසින් අපරාධ නඩු විධි විධාන සංග්‍රහය (සංශෝධිත) පනත බලාත්මක කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.3 බලහත්කාරයෙන් අතුරුදන් කරවීම සාපරාධී වරදක් ලෙස ප්‍රකාශයට පත් කිරීම. | 1.3.1. සියලුම පුද්ගලයින් බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මුතියේ විධි විධාන ඇතුළත් කිරීමට නීති පද්ධතිය බලගැන්වීම සහ බලහත්කාරයෙන් අතුරුදන් කිරීම සාපරාධී වරදක් ලෙස ප්‍රකාශයට පත් කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව | කෙටි කාලීන | සියලුම පුද්ගලයින් බලහත්කාරයෙන් අතුරුදන් කිරවීම්වලින් ආරක්ෂාකිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br>සියලුම පුද්ගලයින් බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් ආරක්ෂාකිරීම සඳහා ජාත්‍යන්තර සම්මුතිය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම. |
| | 1.4. 2016 අංක 14 දරණ අතුරුදන්වූවන් පිළිබඳ කාර්යල පනත ක්‍රියාත්මක කිරීම. | 1.4.1. පනතේ 1 (2) වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කළ ආඥාවකින් අතුරුදන්වූවන්ගේ කාර්යලය පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම. | විෂය පවරන ලද අදාළ රේඛීය අමාත්‍යාංශය | කෙටි කාලීන | අතුරුදන්වූවන්ගේ කාර්යාලයේ විෂය නියමිත රේඛීය අමාත්‍යාංශයකට පැවරීම.<br>පනතේ 1 (2) වගන්තිය අනුව අතුරුදන්වූවන්ගේ කාර්යාලය පිළිබඳ පනතේ සියලුම කොටස් ගැසට් කිරීම. |
| | | 1.4.2. විපතට පත්වූවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ පූර්ණ සහභාගිත්වය තහවුරු කරමින් පනත ක්‍රියාත්මක කිරීම. | | මධ්‍ය කාලීන | ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ධනාත්මක ඇගයීම (ස්වාධීන ඇගයීමක් මත පදනම්ව). |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 2. සියලුම පුද්ගලයින්ගේ නිදහස සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම (අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් සහ රඳවාගැනීමෙන් නිදහස ඇතුළුව) | 2.1. ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සමඟ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීතිවල ගැලපීම සහතික කිරීම. | 2.1.1. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන්ට අනුකූලව, ත්‍රස්තවාදය වැළැක්වීමේ නව නීතියකින් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනත ප්‍රතිස්ථාපනය කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ජාතික ආරක්ෂාව පිළිබඳ අංශික පාලන කමිටුව | කෙටි කාලීන | පවත්නා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුගත වන වෙනත් නීතියක් පැනවීම. |
| | 2.2. අත් අඩංගුවට ගනු ලබන අවස්ථාවේදී සියලුම පුද්ගලයින්ට නීතිඥ සහාය වෙත ප්‍රවේශවිය හැකිවීම සහතික කිරීම. | 2.2.1. පොලිස්පතිවරයා විසින් 2012 දී නිකුත් කළ නීති යටතේ, සියලුම පුද්ගලයින්ට නීතිඥයෙකු වෙත ප්‍රවේශ විමේ අයිතිය ලබාදීම සඳහා අපරාධ නඩු විධි විධාන සංග්‍රහය සමාලෝචනය කර, ඒ මත පදනම්ව සංශෝධනය කිරීම.<br><br>සැකකරුවෙකුට නීතිඥයෙකු වෙත ප්‍රවේශය ලබාදෙන විට, සාක්ෂ්‍යවත් සම්මත පිළිබඳව අපරාධ නඩු විධි විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා  කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br><br>අපරාධ නඩු විධි විධාන සංග්‍රහ (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 2.3. රඳවා ගැනීම පිළිබඳ ස්වාධීන ප්‍රමාද දෝෂයන් හඳුනාගැනීම. | 2.3.1. පහත කරුණු සම්බන්ධව පවත්නා පරිපාලන ක්‍රියාපටිපාටි සමාලෝචනය කර ඒ මත පදනම් ව සංශෝධන සිදු කිරීම.<br>1. රඳවාගැනීමේ ස්ථාන නිරීක්ෂණය සඳහා මහෙස්ත්‍රාත්වරු සහ නීතිය ක්‍රියාත්මක කරන අනෙකුත් ආයතන බලගැන්වීම.<br>2. සියලුම සිරභාරයට ගැනීම් (PTA යටතේ සිරභාරයට ගැනීම්වලට අමතරව) ඇතුළත් කිරීම සහ ප්‍රදේශයේ රජයේ නීතිඥවරයාට සිරගතකිරීම් වාර්තා කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සහ පනතේ 28 (1) වගන්තිය යටතේ කොමිසමට අධිකාරි බලය පැවරීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පාර්ලිමේන්තුව විසින් අපරාධ නඩු විධි විධාන සංග්‍රහය (සංශෝධිත) පනත පැනවීම.<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව විසින් පැනවීම. |
| | | 2.3.2. සිරභාරයේ සිටින සියලුම පුද්ගලයින් පිළිබඳ සවිස්තරාත්මක දත්ත ගබඩාවක් සකස් කර, විධිමත් පදනමක් මත රඳවා ගැනීමේ නිල ස්ථාන ප්‍රකාශයට පත්කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | දත්ත ගබඩාව සකස් කර පවත්වාගෙන යාම. |
| | | 2.3.3. සිරභාරයේ සිටින පුද්ගලයින් පිළිබඳ දත්ත පදනමක් පවත්වා ගැනීමට විධිමත් පරිදි සම්පත් ලබාදෙන ස්වාධීන ආයතනයක් (උදා : ශ්‍රී ලංකා මානව හිමිකම් කවුන්සිලය) සහතික කිරීම. | මුදල් අමාත්‍යාංශය/ කැබිනට් මණ්ඩලය | | අයවැය යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම්. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 2.3.4. පුද්ගලයින් රදවා තබා ගැනීමට බලය හිමි ආයතන, විමර්ශන සිදු කිරීමට සහ සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට බලය හිමි ආයතනවලින් වෙනස් වන බව පැහැදිලිව දැනගැනීම සඳහා නීති සමාලෝචනයේ සහ පැනවීමේ අවශ්‍යතාව සලකා බැලීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුවේ අදාළ ආංශික පාලන කමිටුව | මධ්‍ය කාලීන | සමාලෝචනය සම්පූර්ණ කිරීම. |
| | | 2.3.5. ඉහත සඳහන් නීති කෙටුම්පත සකස් කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා නීති කොමිසම | දිගු කාලීන | අපරාධ නඩු විධි විධාන සංග්‍රහය (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම.<br>අපරාධ නඩු විධි විධාන සංග්‍රහ (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කිරීම. |
| | 2.4. රිමාන්ඩ් භාරයේ ඇතුළුව සිරගතව සිටින පුද්ගලයින්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම. | 2.4.1. නඩු විභාගයට පෙර රැඳිවියන් වශයෙන් සිටින අය (සැකකරුවන් සහ චූදිතයින් ඇතුළුව) සහ වරදකරුවන් වූ පුද්ගලයින් වෙන වෙනම රදවා ගන්නා බව සහතික කිරීමට බන්ධනාගාර රෙගුලාසි සංශෝධනය කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව | මධ්‍ය කාලීන | බන්ධනාගාර රෙගුලාසි සංශෝධනය කිරීම. |
| | | 2.4.2. සෑම සිරකරුවෙකුටම යුක්තිය සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීමට, සෑම සිරකරුවෙකු සම්බන්ධයෙන් දත්ත පවත්වාගෙන යාම, එම තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම ඇතුළුව බන්ධනාගාර අතර ජාලගත විද්‍යුත් දත්ත පදනමක් ස්ථාපිත කිරීම. | | මධ්‍ය කාලීන | දත්ත පදනමක් ස්ථාපිත කොට නඩත්තු කරගෙන යාම සහ කමිටුවක් පත්කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 2.4.3. රජයේ නිල ප්‍රතිපත්තියේ කොටසක් ලෙස සිරකරුවන්ට සැලකිය යුතු ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු එක්සත් ජාතීන්ගේ අවම නීති ඇතුළත් කිරීමේ ශාක්‍යතාව අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සහ කාන්තා සිරකරුවන්ට සැලකිය යුතු ආකාරය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ නීති රීති සහ බැංකොක් නීති රීති ලෙස හඳුන්වන අත්අඩංගුවට ගැනීමකින් තොරව වරදකරුවන් වූ කාන්තාවන් සම්බන්ධයෙන් ගත හැකි පියවර, සිරකරුවන්ට සැලකිය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැදගත්කම හා ශාක්‍යතාව අධ්‍යයනය කිරීමට කමිටුවක් පත්කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව | දිගු කාලීන | කමිටුවේ නිර්දේශ නීතිය හා සාමය පිළිබද අමාත්‍යාංශය වෙත දැනුම් දීම. |
| | 2.5. බන්ධනාගරවල අතිවාසය අවම කිරීමට කටයුතු කිරීම. | 2.5.1. විකල්ප දඬුවම් සහ ප්‍රජා මූලිකව වරද නිවැරදි කිරීමේ නීතියක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකරණය සහ නීතිඥවරුවරු සංවේදී කරවීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | දිගු කාලීන | සංවේදී කරවන වැඩසටහන් |
| | 2.6. ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූලව සාක්ෂිකරුවන් සහ වින්දිතයන්ගේ ආරක්ෂාව සහතික කිරීම. | 2.6.1. පහත කරුණු සහතික කිරීම සඳහා 2015 අංක 4 දරණ අපරාධයන්ට ලක්වූවන් සහ සාක්ෂිකරුවන්ට සහායවීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සමාලෝචනය හා සංශෝධනය කිරීම :<br><br>සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහන් සඳහා වග කියන ආයතන, විධිමත්ව නීති බලගැන්වීමේ ආයතනවලින් වෙන් කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තුව | කෙටි කාලීන | අපරාධයට ලක්වූවන්, සාක්ෂිකරුවන්ට සහායවීම සහ ආරක්ෂා කිරීමේ (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම හා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br><br>අපරාධයට ලක්වූවන්, සාක්ෂිකරුවන්ට සහායවීම සහ ආරක්ෂා කිරීමේ (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 2.7. මිනිස් ජාවාරම් සිදුවීම අවම කිරීම. | 2.7.1. මිනිස් ජාවාරම්වලට ගොදුරුවූවන්ට ඒ පිළිබඳ දැනුම් දිය හැකි යාන්ත්‍රණ සඳහා ප්‍රවේශය ඇති බවට සහතිකවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | ජාවාරම්වලට ගොදුරුවූවන්ට ඒ පිළිබඳ දැනුම් දිය හැකි යාන්ත්‍රණය වෙත ප්‍රවේශය වැඩි කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් මත පදනම්ව ධනාත්මක ඇගයීමක් සිදු කිරීම. |
| | | 2.7.2. මිනිස් ජාවාරම් මැඩලීමට ගන්නා ක්‍රියාමාර්ගවල බලපෑම ලේඛනගත කිරීමට සහ විධිමත්ව ඇගයීමට ක්‍රමයක් හඳුන්වාදීම. | | මධ්‍ය කාලීන | ලේඛන ගත කිරීම සහ ඇගයීම් ක්‍රමයක් ස්ථාපිත කර පවත්වාගෙන යාම. |
| | | 2.7.3. පුනරුත්ථාපනය ඇතුළුව විපතට පත්වූවන් සහ සාක්ෂිකරුවන් සඳහා රාජ්‍ය සහාය සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග සැපයීම. | | කෙටි කාලීන | විපතට පත්වූවන් ආරක්ෂා කිරීමට සහ පුනරුත්ථාපනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් මත පදනම් වූ ධනාත්මක ඇගයීම. |
| 3. පුද්ගල නිදහස සඳහා අයිතිය පිළිගැනීම | 3.1. පුද්ගල නිදහස සඳහා අයිතිය පිළිබඳ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීම සහතික කිරීම. | 3.1.1. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ අරමුණින්, පුද්ගල නිදහස පිළිබඳ නිර්වචනය සහ විෂය පථය සමාලෝචනය කිරීම හා සලකා බැලීම. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙහෙයුම් කමිටුව තුළින් පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම) | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට පුද්ගල නිදහස ඇතුළත් කිරීම. |
| | | 3.1.2. ඉහත සමාලෝචනය අනුව, මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි පුද්ගල නිදහස ඇතුළත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම (සැ.යු. මූලික අයිතිවාසිකම් පිළිබඳ පාර්ලිමේන්තු උප කමිටුව විසින් නිර්දේශ කරන ලදී.) | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 4. තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුළුව කථාකිරීමේ සහ ප්‍රකාශන නිදහස ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම. | 4.1. ද්වේශ සහගත කථාවලට අදාළ නීතිය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම. | 4.1.1 ද්වේශ සහගත කථා තහනම් කිරිමට අදාළව 2007 අංක 56 දරණ සිවිල් සහ දේශපාලන අයිතීන් සම්බන්ධ ජාත්‍යන්තර සම්මුති පනතේ විධිවිධාන පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවත්වීම. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | මහ ජනයා වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්. |
| | | 4.1.2. ද්විතීයික පාසල් මට්ටමින් ද්වේශ සහගත කතා පිළිකුල් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ජාතික සංහිඳියාව, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | | ද්විතීයික පාසල් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| | 4.2. තොරතුරු දැනගැනීමේ අයිතිය සක්‍රීය කිරීම සහ සම්පූර්ණ කිරීම. | 4.2.1. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ආවරණය වන සියලුම රජයේ ආයතනවලට, තොරතුරු නිලධාරීන් පුහුණු කර පත්කිරීම. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | සියලුම රජයේ ආයතනවල තොරතුරු නිලධාරීන් සඳහා පත්වීම් සහ පුහුණුව ලබාදීම. |
| | | 4.2.2. සියලුම පාර්ශ්වකරුවන්ගේ උපදේශකත්වයෙන්, පනත විසින් අපේක්ෂා කරන ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම. | | කෙටි කාලීන | පාර්ශ්වකරුවන්ගෙන් උපදේශනය ලබා ගැනීම.<br>ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.<br>දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| | | 4.2.3. තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන සම්බන්ධයෙන් දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | රජයේ ආයතනවල බලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් (තොරතුරු නිලධාරීන් සඳහා ඉහත සඳහන් සම්මත පුහුණුවට අමතරව) |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.2.4. තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ රජයේ බලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සමාලෝචනය පැවැත්වීම.<br><br>කමිටුවේ නිර්දේශ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයට දැනුම්දීම. |
| | | 4.2.5. තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සිදුකිරීම, සමාලෝචනයේ අනාවරණයන් ප්‍රකාශයට පත්කිරීම සහ ඉන් මතු කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම. | | දිගු කාලීන | නිර්දේශ ක්‍රියාත්මක කිරීම. |
| | 4.3. ප්‍රජාතන්ත්‍රවාදී විනිවිදභාවය ඉහළ නැංවීම. | 4.3.1. ජනාධිපතිවරණ, මහ මැතිවරණ, පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ පනත්, වත්කම් හා වගකීම් ප්‍රකාශ කිරීමේ නීතියට අදාළ වන පරිදි සංශෝධන සහිතව, නාම යෝජනා ඉදිරිපත් කිරීමේ පූර්ව කොන්දේසියක් ලෙස ද නියමිත් කාලපරිච්ඡේදය අවසානයේ නැවත ඡන්දයක් පැවැත්වෙන අවසථාවක දී නැවත වත්කම් හා වගකීම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට නියම කිරීමට හැකි වන පරිදි සමාලෝචනය කර සංශෝධනය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තුව<br><br>මැතිවරණ කොමිසම | මධ්‍ය කාලීන | නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br><br>පාර්ලිමේන්තුව විසින් නීති සම්පාදනය කිරීම. |
| | | 4.3.2. වාර්ෂික වත්කම් ප්‍රකාශ ලබා ගැනීම වෙනුවෙන් රෙගුලාසි සංශෝධනය කර, වත්කම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම, අපරාධ සම්බාධ පැනවිය හැකි වරදක් ලෙස පිළිගැනීම. | | | රෙගුලාසි සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br><br>මැතිවරණ කොමිසම විසින් රෙගුලාසි නිකුත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 5. සිතීමේ, හෘදසාක්ෂියේ සහ කැමති ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස යන මේ සියල්ල ආරක්ෂා කරමින් ප්‍රවර්ධනය කිරීම. | 5.1. ආගමික නිදහසට ඇති නීති විරෝධී බාධා ඉවත් කිරීම | 5.1.1. යමෙකුගේ ආගම හෝ ආගමික විශ්වාසය ප්‍රකට කිරීමේ නිදහසට අදාළව පරිපාලන චක්‍රලේඛ සමාලෝචනය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>බුද්ධ ශාසන අමාත්‍යාංශය | කෙටි කාලීන | සමාලෝචනය අවසන් කිරීම. |
| | | 5.1.2. ඉහත සමාලෝචනය මත පදනම් ව රාජ්‍ය අනුමැතියකින් තොරව නිකුත් කළ සියලුම චක්‍රලේඛ ඉවත් කරගැනීම. | ජාතික සංහිඳියාව, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි කාලීන | රාජ්‍ය අනුමැතියකින් තොරව නිකුත් කළ සියලුම චක්‍රලේඛ ඉවත් කරගැනීම. |
| | | 5.1.3. පූජා භූමිවලට ප්‍රහාර එල්ලවීම වැළැක්වීමට සක්‍රීය ක්‍රියාමාර්ග ගැනීම : | අධිකරණ අමාත්‍යාංශය<br>නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | |
| | | 1. ආගමික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී, චෝදනා ඉදිරිපත් කිරීමේදී සහ වරදකරුවන්ට දඬුවම් පැමිණවීමේදී 2007 අංක 56 දරණ සිවිල් සහ දේශපාලන අයිතීන් සම්බන්ධ ජාත්‍යන්තර සම්මුති පනත ඇතුළුව සුදුසු නීති යටතේ කටයුතු කිරීම. | නීතිපති දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | පූජාභූමිවලට පහරදීම පිළිබඳ ස්වාධීනව නිශ්චය කළ සංඛ්‍යා ලේඛන අනුව එවැනි පහරදීම් අවම කිරීම. |
| | | 2. පූජ්‍ය පක්ෂයේ සාමාජිකයින් හෝ වෙනත් ආගමික නායකයින් සැකකරුවන් ලෙස නම් කර ඇති නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ අධිකරණ නිලධාරීන්ට අතිරේක පුහුණුවක් ලබාදීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ආගමික ප්‍රචණ්ඩත්වය (වාර්තා වූ පහරදීම්වල ප්‍රතිශතයක් ලෙස) පිළිබඳ නඩු විභාග කිරීම සහ අවශ්‍ය පරිදි එහි අපරාධකරුවන් පිළිබඳ තීන්දු කිරීම වැඩි කිරීම.<br>පුහුණුව ලබාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 3. ආගමික කණ්ඩායම්වලට පහරදීම වැළැක්වීමට ප්‍රදේශයේ පොලිසිය අසමත් වූ අවස්ථාවන්හිදී, ජාතික පොලිස් කොමිසම මගින් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>ජාතික පොලිස් කොමිසම | මධ්‍ය කාලීන | විනය ක්‍රියාමාර්ග ගැනීම වැඩිකිරීම. (පොලිසිය විසින් ක්‍රියාමාර්ගයක් නොගත් පැමිණිලි ප්‍රතිශතයක් ලෙස) |
| | | 4. ප්‍රදේශයක සිදුවිය හැකි ආගමික නොසන්සුන්තා පිළිබඳ පූර්ව අනතුරු අගවන, එය පැතිරීම වළක්වනු ලබන අන්තර් විශ්වාසී කණ්ඩායම්වල උපදේශකත්වයෙන්, ප්‍රජා මට්ටමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | දිගු කාලීන | පූර්ව අනතුරු අගවන පද්ධතියක් ස්ථාපිත කිරීම. |
| 6. සමානාත්මතාව (හරයාත්මක, සමානාත්මතාව ඇතුළුව) සහ වෙනස් ලෙස නොසැලකීම තහවුරු කිරීම. | 6.1. ජීවිතයේ සෑම අවස්ථාවකදීම වෙනස් ලෙස නොසලකනු ලැබීම සහ අසාධාරණ කොන්කිරීම්වලින් ආරක්ෂාවීමේ අයිතිය සහතික කිරීම. | 6.1.1. ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය, ජනවර්ගය, ආගම, කුලය, උපන් ස්ථානය, ලිංග භේද අනන්‍යතාව, ආබාධිත බව ඇතුලුව තහනමට ලක්වීමේ පදනම මත, වෙනස් ලෙස නොසැලකීම සඳහා අයිතිය පිළිබඳ නිර්වචනය සමාලෝචනය කර එහි විෂය පථය යළි සලකා බැලීම. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙහෙයුම් කමිටුව මගින් පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම) | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | වෙනස් ලෙස නොසැලකීමේ අයිතිය පිළිබඳ සුදුසු වැඩ පිළිවෙලක් කමිටුව විසින් උපයෝගී කරගැනීම. |
| | | 6.1.2. ඉහත සමාලෝචනය මත පදනම් ව ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, ජනවර්ගය, ආගම, කුලය, උපන් ස්ථානය, ලිංග භේද අනන්‍යතාව, ආබාධිත බව හෝ වෙනත් තත්ත්වයක් ඇතුළුව තහනමට ලක්වීමේ පදනම මත, වෙනස් ලෙස නොසලකනු ලැබීමේ අයිතිය සහතික කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. | ව්‍යවස්ථාදායක සභාව | මධ්‍ය කාලීන | ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට වෙනස් ලෙස නොසැලකීමේ අයිතිය ඇතුළත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
| --- | --- | --- | --- | --- | --- |
| | | 6.1.3. පුද්ගලික අංශයේ සේවා ස්ථාන ඇතුළුව සියලුම සේවා ස්ථානයන්හී ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, ජනවර්ගය, ආගම, කුලය, උපන් ස්ථානය, ලිංග භේද අනන්‍යතාව හෝ ආබාධිතතාව ඇතුළුව තහනමට ලක්වන පදනම මත වෙනස් ලෙස නොසැලකීම සඳහා අයිතිය සහතික කිරීමට නීති පැනවීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>කම්කරු අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තුව | | නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br><br>පාර්ලිමේන්තුව විසින් නීති බලාත්මක කිරිම. |
| | | 6.1.4. පහත කරුණු පිළිබඳව විසිරී ඇති සංඛ්‍යාන එක්රැස් කිරීම, වාර්තා කිරීම සහ ලබාදීම සඳහා මධ්‍යම නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම :<br><br>1. ජන විකාස සංයෝගය සහ සමාජ-ආර්ථික තත්ත්වය අධ්‍යාපනය, සේවා නියුක්තිය, ජනවාර්ගික හා ජන - ආගමික සුළුතරයන්ගේ ජන ජීවිතය හා දේශපාලන ජීවිතය, කාන්තාවන් සහ ආබාධිත පුද්ගලයින් තුළ නියෝජනය වන ආකාරයෙන් අයිතිවාසිකම් සමානව භුක්තිවිඳීම පිළිබඳව මනා තක්සේරුවක් සිදු කිරීමට ප්‍රත්‍යක්ෂමූලික පදනමක් සැපයීම.<br><br>2. විපතට පත්වූවන්ගේ වයස, ලිංග භේදය සහ ජන මූලය අනුව විසිරී පවතින පැමිණිලිවල ස්වභාවය සහ පැමිණිලි සංඛ්‍යාව | අධිකරණ අමාත්‍යාංශය<br><br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය (එනම් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)<br><br>ජාතික සංහිඳියාව, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි කාලීන | මධ්‍යගත අධීක්ෂණ යාන්ත්‍රණයක් සැකසීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 6.1.5. අදාළ ප්‍රජාව සමඟ උපදේශකත්වයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වගන්තිය සමාලෝචනය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 16 වගන්තිය සමාලෝචනය කිරීම. |
| | | 6.1.6. වෙනස්ව නොසලකා ඉඩම් වෙන් කරන බවට සහතික කිරීමට නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ සුදුසු නීති ප්‍රතිසංස්කරණ තුළින් හවුල් අයිතිය පිළිබඳ සංකල්පය හඳුන්වාදීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| | | 6.1.7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වැරදි සංශෝධනය කර, ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන්ට අනුකූල බව සහතික කර, අවශ්‍ය අවස්ථාවලදී නීති ගෙන ඒම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අවශ්‍ය අවස්ථා සඳහා නීති පැනවීම. |
| | | 6.1.8. ගෘහස්ථ සේවකයින් සඳහා යෝග්‍ය රැකියා පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ C189 අපරානුමත කිරීම. | කම්කරු සහ වෘත්තීය සබඳතා අමාත්‍යාංශය | දිගු කාලීන | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ C189 අපරානුමත කිරීම. |
| | 6.2. දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සමානාත්මතාව වැඩි කිරීම. | 6.2.1. පළාත් පාලන, පළාත් සභා සහ ජාතික මැතිවරණයන් හීදී, කාන්තා අපේක්ෂකයින්ට අවම නාමයෝජනා සංඛ්‍යාවක් වෙන්කිරීම වැනි තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග තුළින් දේශපාලන සහ ජන ජීවිතයේ කාන්තා සහභාගිත්වය වැඩි කිරීම. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම | මධ්‍ය කාලීන | කාන්තා අපේක්ෂකයින්ගේ නාම යෝජනා ප්‍රතිශතය වැඩිකිරීම.<br><br>පළාත් පාලන ආයතන, පළාත් සභා සහ පාර්ලිමේන්තු නියෝජනයේ කාන්තා ප්‍රතිශතය වැඩිකිරීම. |
| | | 6.2.2. දේශපාලන පක්ෂවල ක්‍රියාකාරී කමිටු සහ තනතුරු දරන්නන් ලෙස කාන්තාවන් සඳහා අවම ආසන සංඛ්‍යාවක් වෙන් කිරීමේදී දිරි දීමනා ලබා ගත හැකිදැයි විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම. උදා : අවම සම්මත පිළිගන්නා දේශපාලන පක්ෂවල කටයුතු සඳහා වැඩි දිරි දීමනා ලබාදීමේ වැඩපිළිවෙලක් ඇතුළත් කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම | මධ්‍ය කාලීන | කමිටුවක් පත්කිරීම.<br><br>කමිටුවේ නිර්දේශ අධිකරණ අමාත්‍යාංශය සහ මැතිවරණ කොමිසමට දනුම්දීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 7. මානව හිමිකම් ප්‍රමුඛ කිරීම. | 7.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයට සහ නීති සකස් කිරීමේ ක්‍රියාවලයේ විනිවිදභාවයට අනුකූල වීම සහතික කිරීම. | 7.1.1. අදාළ නීතිවල පශ්චාත් බලාත්මක කිරීමේ සමාලෝචනයක් සිදු කිරීම. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙහෙයුම් කමිටුව මගින් පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම) | ව්‍යවස්ථාදායක සභාව<br><br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>ජාතික සංහිඳියාව, සංවාද සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පශ්චාත් බලාත්මක කිරීමේ සමාලෝචනයක් ඇතුළත් කිරීම. |
| | | 7.1.2. රජයේ ආයතන වෙත සිවිල් සමාජයේ, අවදානම් කණ්ඩායම් සහ අදාළ පාර්ශ්වකරුවන් සමඟ උපදේශනයෙන් ජාතික නීති හා ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහා අවශ්‍ය වන සම්මත ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.<br><br>උදා - පහත දැ ඇතුළුව, නීති සකස් කිරීමේ ක්‍රියාවලියේ ඉහළ ජනතා සහභාගිත්වය සහතික කිරීමට, පවත්නා ආංශික පාලන කමිටු උපයෝගී කරගැනීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම :<br><br>1. කෙටුම්පත් පිළිබඳ ජනතාවගෙන් ලිඛිත නිරීක්ෂණ සහ නිර්දේශ ලබාගැනීම.<br><br>2. ජනතාවගෙන් ලද නිරීක්ෂණ සහ නිර්දේශ මත පදනම් ව, කෙටුම්පත පිළිබඳ මහජන විමසීමක් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | සම්මත ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 7.2. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ දැනුවත්භාවය වැඩිකිරීම. | 7.2.1. සෑම වසරකම පළමු කාර්තුව පිළිබඳ සමාලෝචනයක් සිදුකර ඒ මත පදනම්ව වාර්ෂික වාර්තාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කළ හැකි වන පරිදි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් සභා පනත සංශෝධනය කිරීම හා ඒ තුළින් පහත සඳහන් දෑ ලේඛනගත කිරීම :<br>1. පසුගිය වසරක කාලය තුළ ශ්‍රී ලංකාවේ මානව හිමිකම්වල තත්ත්වය,<br>2. එහි රාජකාරි ඉටු කිරීමේදී ගනු ලැබූ ක්‍රියාමාර්ග,<br>3. පර්යේෂණ මගින් කළ සොයාගැනීම්. | අධිකරණ අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | මධ්‍ය කාලීන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව මගින් බලාත්මක කිරීම. |
| | 7.3. මානව හිමිකම් පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් පිළිබඳ වගකීම් දරන්නන් සහ අයිතිවාසිකම් දරන්නන් අතර දැනුවත්භාවය වැඩි කිරීම. | 7.3.1. ද්විතීයික පාසල් සිසුන් ඇතුළුව රජයේ නිලධාරීන්ට හා පොදු ජනතාවට පිරිනමන සියලුම මානව හිමිකම් පුහුණු පාඨමාලාවන්හි විෂය නිර්දේශ සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම.<br>(උදා : මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය විසින් මීට පෙර සකස් කළ පුහුණු අත්පොත) | අධිකරණ අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විෂයමාලාව සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම. |
| | | 7.3.2. ද්විතීයික මට්ටමේ පාසල්වල මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| | | 7.3.3. මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 7.3.4. පහත ආයතන සඳහා මානව හිමිකම් පුහුණු වැඩසටහන් පැවැත්වීම :<br>1. ශ්‍රී ලංකා පොලිසිය<br>2. ශ්‍රී ලංකා යුධ හමුදාව<br>3. ශ්‍රී ලංකා නාවික හමුදාව<br>4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>5. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>6. සිවිල් ආරක්ෂක බලකාය<br>7. බන්ධනාගාර දෙපාර්තමේන්තුව<br>8. දිස්ත්‍රික් මට්ටමේ නිළධාරීන්ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය අංශයේ සේවකයින්<br>9. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු<br>10. පළාත් සභා මන්ත්‍රීවරු<br>11. පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිළධාරීන්<br>12. පළාත් පාලන නිලධාරීන් | අධිකරණ අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | දිගු කාලීන | පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| | 7.4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ සොයාගැනීම් බලාත්මක කිරීම් වැඩි කිරීම. | 7.4.1. සමාලෝචනයක් සිදු කර ඒ මත පදනම්ව, මානව හිමිකම් කඩකිරීම සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයින්ට එරෙහිව නඩු කටයුතු සලකා බැලීමේ සහ ඇතුළත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ විමර්ශන සටහන් සලකා බැලීමට නීතිපතිවරයා සවිබලගැන්වීම සඳහා අපරාධ නඩු විධි විධාන සංග්‍රහය සංශෝධනය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | අපරාධ නඩු විධි විධාන සංග්‍රහ (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br>අපරාධ නඩු විධි විධාන සංග්‍රහ (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව විසින් පැනවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 7.4.2. වලංගු හේතුවක් නොමැතිව කොමිසමේ නිර්දේශයක් ක්‍රියාත්මක නොකරන අවස්ථාවක, විපතට පත් වූ පාර්ශ්වය වෙනුවෙන් පළාත් මහාධිකරණ තුළ චෝදනා ගොනු කිරීමේ හැකියාව සලකා බැලීමේ අරමුණින් නීතිපතිවරයා වෙත යොමු කිරීමට කොමිසම බලගැන්වීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම් පනත සංශෝධනය කිරීම. | | දිගු කාලීන | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත් කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා (සංශෝධිත) පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කිරීම. |
| | | 7.4.3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ නිර්දේශ මත පදනම්ව උසස්වීම් ලබාදීම සැලකිල්ලට ගැනීම සහතික කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිසම සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අතර නිරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | දිගු කාලීන | නිරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| 08. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කර ප්‍රවර්ධනය කරන ආයතන ශක්තිමත් කිරීම. | 8.1. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම. | 8.1.1. අධිකරණයට සහ ස්වාධීන ආයතනවලට විනිවිදභාවයෙන් යුතුව සහ අපක්ෂපාතීව පත්කිරීම් සිදුකිරීම සහතික කිරීමට නීතිමය සහ වෙනත් ක්‍රියාමාර්ග ගැනීම. | අධිකරණ අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br>පාර්ලිමේන්තුව විසින් නීතිය බලාත්මක කිරීම. |
| | | 8.1.2. නුසුදුසු බලපෑම්, පෙළඹවීම්, පීඩන, තර්ජන හෝ මැදිහත්වීම්වලින් අධිකරණය ආරක්ෂා කිරීම සහතික කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. | | දිගු කාලීන | කමිටුව පත්කිරීම.<br>කමිටුවේ නිර්දේශ අධිකරණ අමාත්‍යාංශය සහ අධිකරණ සේවා කොමිසම වෙත දනුම් දීම.<br>(කමිටුවේ සොයාගැනීම් මත පදනම්ව) නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 8.1.3. උසාවිය අවමානයට පත්වීම සම්බන්ධයෙන් පවත්නා නීති සංශෝධනය කිරීම සහ ජාත්‍යන්තර සම්මත සහ යහපත් ව්‍යවහාරයන්ට අනුකූලව උසාවිය අවමානයට පත්වීමෙන් ආරක්ෂා කිරීමට සුදුසු නීති පැනවීම. | අධිකරණ අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව | කෙටි කාලීන | (කමිටුවේ සොයාගැනීම් මත පදනම්ව) නීති කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කිරීම. |
| | 8.2. රජයේ නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි සහ කාර්යයන් කරගෙන යාමේදී ඵලදායිත්වය වැඩි කිරීම. | 8.2.1. කාන්තාවන්, ළමුන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට එරෙහිව සියලුම වර්ගයේ ප්‍රචණ්ඩත්වයන්ට කාර්යක්ෂමව, සුදුසු පරිදි සහ සංවේදීව ප්‍රතිචාර දක්වන බව සහතික කිරීම පිණිස විශේෂයෙන් විනිසුරුවන්, නඩු මෙහෙයවන්නන් සහ ආරක්ෂක හමුදා ඇතුළු රජයේ නිලධාරීන් සඳහා පුහුණුව ලබාදීම. | අධිකරණ අමාත්‍යාංශය<br>විනිසුරුවන් පුහුණු කිරීමේ ආයතනය | මධ්‍ය කාලීන | පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| 9. මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගිතාව වැඩි කිරීම. | 9.1. ස්වාධීන සන්නිවේදනයන් ලබාගැනීම හා පිළිගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතන හඳුනාගැනීම. | 9.1.1. විකල්ප පෙරාතු ලේඛන යටතේ සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ මධ්‍යස්ථානය විසින් සකස් කළ අදහස් සම්බන්ධ තත්ත්වය සමාලෝචනය කිරීම සහ, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාවලීන් සකස් කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතන සමග ස්වාධීන සන්නිවේදන ක්‍රියාවලි සහ සහයෝගීව කටයුතු කිරීම නැවත ආරම්භ කර පවත්වාගෙන යාම.<br>ගිවිසුම් ආයතනවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාවලි සකස් කිරීම. |
| | 9.2. එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතන සමග සම්බන්ධතා ශක්තිමත් කිරීම. | 9.2.1. එක්සත් ජාතීන්ගේ ගිවිසුම් ආයතන සමග සහභාගිත්වය සම්බන්ධීකරණය කිරීම සඳහා, ස්ථිර මානව හිමිකම් ගිවිසුම් ආයතන වාර්තාකරන කමිටුවක් ස්ථාපිත කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ස්ථිර කමිටුවක් පත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 10. භාෂා අයිතින් ආරක්ෂා කිරීම සහ රාජ්‍ය භාෂා ඵලදායීව ක්‍රියාත්මක කිරීම. | 10.1. භාෂා අයිතින් ආරක්ෂා කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම. | 10.1.1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් ආරක්ෂක හමුදා, පොලිසිය සහ රාජ්‍ය අංශය තුළ ත්‍රෛයි භාෂා භාවිතය තවදුරටත් ධෛර්යමත් කිරීම. | ජාතික සංවාද පිළිබඳ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ධනාත්මක ඇගයීම (ස්වාධීන ඇගයීම මත පදනම්ව)<br><br>නාම පුවරු භාෂා ත්‍රිත්වයෙන්ම නිර්මාණය කිරීම<br><br>රජය භාවිත කරන ආකෘති පත්‍ර භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කිරීම.<br><br>කැමති භාෂාවක් පදනම් කරගෙන ප්‍රතිචාර දැක්වීම. |
| | | 10.1.2. සියලුම අභ්‍යන්තර, බාහිර, ජංගම සහ නිශ්චල නාම පුවරු භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත බව සහතික කිරීම. | | | |
| | | 10.1.3. සියලුම රජයේ ආයතනවල මහජනතාව විසින් භාවිත කරන ආකෘති පත් භාෂා ත්‍රිත්වයෙන්ම සැකසී ඇති බව තහවුරු කිරීම.<br><br>i. සේවා ලබාගැනීම වෙනුවෙන් සියලුම පුරවැසියන්ගේ ඉල්ලීම්, වාචික හෝ ලිඛිත ප්‍රතිචාර වශයෙන් ඔවුන් අභිමත රාජ්‍ය භාෂාවකින් හෝ සන්ධාන භාෂාවකින් ලබාගත හැකිවීම තහවුරු කිරීම.<br><br>ii. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නිලධාරීන්ට ආයතනික සහාය යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 11. ඡන්දය දීමේ අයිතිය සහ සමාන ඡන්දබල අයිතිය ආරක්ෂා කරමින් උසස් කිරීම. | 11.1. ඡන්දය දීමේ අයිතිය ආරක්ෂා කර උසස් කිරීම. | 11.1.1. ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම්ලත් ආබාධිත ඡන්දදායකයින්ට ඡන්ද මධ්‍යස්ථාන වෙත ප්‍රවේශවීමේ හැකියාව වැඩි කිරීම, සහතික වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. | සමාජ සවිබලගැන්වීමේ හා සුභ සාධන අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම | මධ්‍ය කාලීන | ක්‍රියාමාර්ග උපයෝගී කරගැනීම. |
| | | 11.1.2. මැතිවරණය පැවැත්වෙන දිනයේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ඡන්දදායකයින්ට, නිවාඩු ලබාදීම විධිමත් කරන නීති හඳුන්වාදීම. (සේවය කරන ස්ථානය සහ නියමිත ඡන්ද මධ්‍යස්ථානයට ඇති දුර වැනි සාධක පිළිබඳ සැලකිලිමත් වෙමින්) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br><br>කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම<br><br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br><br>පාර්ලිමේන්තුව විසින් නීතිය බලාත්මක කිරීම. |
| | | 11.1.3. මැතිවරණ දිනයේදී අත්‍යවශ්‍ය රාජකාරිවල යෙදී සිටින පුද්ගලයින්ට, තැපැල් ඡන්දය භාවිත කිරීමට හෝ ඔවුන්ට නියමිත් ඡන්ද මධ්‍යස්ථානයෙන් බැහැරව පහසුවෙන් ප්‍රවේශවිය හැකි ඡන්ද මධ්‍යස්ථානයක දී ඡන්දය පාවිච්චි කිරීම සඳහා අවස්ථාව ලබාදීමට නීතිමය සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම<br><br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br><br>පාර්ලිමේන්තුව විසින් නීති පැනවීම. |
| | 11.2. සමාන ඡන්දබලය වැඩි කිරීම. | 11.2.1. වයස අවුරුදු 17 ට වැඩි සියලුම පුරවැසියන් ඇතුළත් කළ විවෘත අතිරේක රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට හැකිවන නීති පැනවීම. මැතිවරණ රෙජිස්ටරයේ වාර්ෂික සංශෝධනය කිරීම ආරම්භ කරන දිනයට වයස අවුරුදු 18 සම්පූර්ණ නොකළ, නමුත් ඡන්ද දැන්වීම නිකුත් කරන දිනයට ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරාලන පුද්ගලයින්ට ඡන්ද අයිතිය ලබාදීමේ අරමුණෙන් මෙම අතිරේක රෙජිස්ටරය හඳුන්වාදීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම<br><br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | නීති කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කිරීම.<br><br>පාර්ලිමේන්තුව විසින් නීතිය පැනවීම. |

# වධ හිංසා වැළැක්වීම

## වද හිංසා වැළැක්වීම

වද හිංසා සහ සෑම ආකාරයකම කුරිරු, අමානුෂික සහ ආත්ම ගරුත්වයට හානි වන අයුරින් සැලකීම හෝ දඬුවම් කිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ බැඳීම 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි පරිච්ඡේදයේ ව්‍යවස්ථානුකූලව දක්වා ඇත. විශේෂයෙන් 11 වැනි පරිච්ඡේදය මගින් වද හිංසා හෝ කුරිරු, අමානුෂික සහ ආත්ම ගරුත්වයට හානි වන අයුරින් සැලකීම සපුරා තහනම් වේ. එමෙන්ම, වද හිංසාවෙන් නිදහස්වීම අහිමි කළ නොහැකි මෙන්ම සීමා රහිත වන අතර, අවහිරකිරීම් වලට යටත් නොවේ. යම් පුද්ගලයෙකුගේ වද හිංසාවෙන් නිදහස්වීමේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය වන්නේ නම්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඊට පිළියම් ලබා ගත හැකිය.

වද හිංසා සහ සෑම ආකාරයකම කුරිරු, අමානුෂික සහ ආත්ම ගරුත්වයට හානි වන අයුරින් සැලකීම හෝ දඬුවම් කිරීමට එරෙහි සම්මුතිය ශ්‍රී ලංකාව විසින් 1994 ජනවාරි 03 දින පිළිගනු ලැබීය. එමෙන්ම සම්මුතියේ විධි විධාන සහ ඒ යටතේ පවතින බැඳීම් ශ්‍රී ලංකාවේ ජාතික නීතියට ඇතුළත් කරන බව සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකාව 1994 අංක 22 දරණ වද හිංසා සහ සියලුම ආකාරයේ කුරිරු, අමානුෂික සහ ආත්ම ගරුත්වයට හානි වන අයුරින් සැලකීම හෝ දඬුවම් කිරීමට එරෙහි සම්මුතිය පිළිබඳ පනත සහ 2005 අංක 23 දරණ ශාරීරික දණ්ඩනය (අවලංගු කිරීම) පිළිබඳ පනත් පනවන ලදී. ඒ සමගම, සම්මුතිය සමග අනුකූලතාව සහතික කිරීමට සහ වද හිංසාව වැළැක්වීමට, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධි විධාන සංග්‍රහය වරින් වර සංශෝධනය කර ඇත. 2016 ජූනි මස, ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනත යටතේ අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් හමුදාවන්ට සහ පොලීසියට නව උපදෙස් නිකුත් කරන ලදී. විශේෂයෙන් මෙම උපදෙස්වලින් වද හිංසාව තහනම් කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන්, 2016 මැයි මස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම විසින් මෙයට පෙර නිකුත් කළ උපදෙස් කිහිපයක්ද බලාත්මක කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රජය කිසිඳු ලෙසකින් එකඟ නොවීමේ නොගැනීමේ ප්‍රතිපත්තියක් පවත්වා ගනී.

වද හිංසාව පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය එසේ වුවද, එය තහනම් කිරීම හා බලගැන්වීම සම්බන්ධ අභියෝග තවදුරටත් පවතී. මෙම සන්දර්භය තුළ, රජයේ ආයතන, සිවිල් සමාජය සහ පොදු ජනතාවගේ උපදේශන අනුව මෙම සැලැස්මට වද හිංසාව පිළිබඳ වෙනම ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ඇතුළත් කිරීමට තීරණය කරන ලදී. එම නිසා, මෙම සැලැස්මෙහි කාර්ය ලක්ෂණ මගින් වද හිංසාව වැළැක්වීම, පරීක්ෂා කිරීම සහ තුරන් කිරීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව ජාත්‍යන්තරව සහ ජාතික මට්ටමින් ශ්‍රී ලංකාවේ කැපවීම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම පිණිස සැලසුම් කරන ලදී.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. සිදුවීම් අනාවරණය කරගැනීම සහ ක්‍රමික දුර්වලතා සාකච්ඡාවට බඳුන් කිරීම. | 1.1. බිය මත පදනම්ව රාජ්‍ය නිලධාරියෙකුට එරෙහිව පැමිණිල්ලක් ගොනු කිරීමට ඉදිරිපත් නොවීම, සාකච්ඡාවට බඳුන් කිරීම. | 1.1.1. වද හිංසාවට අදාළ පැමිණිලි පිළිගැනීම සහ විමර්ශනය කිරීමේ වගකීමට බැඳී සිටින පොලිස් නිලධාරීන්ගෙන් සමන්විත ස්වාධීන ඒකකයක් ශක්තිමත් කිරීමට සුදුසු නීති කෙටුම්පත් කිරීම සහ ප්‍රසිද්ධ කිරීම. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය (පෙරමුණ ගැනීම)<br>පොලිස් දෙපාර්තමේන්තුව<br>ජාතික පොලිස් කොමිසම (NPA) | මධ්‍ය කාලීන | වද හිංසාව ඇතුළුව පොලිසියට එරෙහිව පැමිණිලි භාරගැනීම, විමර්ශනය, සහ ඒ පිළිබඳ විභාග කිරීම ආරම්භ කිරීමට සුදුසු බලතල සහිත ස්වාධීන ඒකකයක් ස්ථාපිත කිරීම. |
| | | 1.1.2. වද හිංසාවට අදාළ නඩු විභාගය ආරම්භ කර පවත්වා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට ඒකකය බලගැන්වීම. | නීතිපති දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | |
| | | 1.1.3. වද හිංසාව පිළිබඳ පැමිණිලි වාර්තා කිරීම, විමර්ශනය සහ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජාතික පොලිස් කොමිසම තුළ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම. | | කෙටි කාලීන | වද හිංසාව පිළිබඳ පැමිණිලි වාර්තා කිරීම, විමර්ශනය සහ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට ජාතික පොලිස් කොමිසම තුළ විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීම. (ඉහත සඳහන් කළ ස්වාධීන ඒකකය කාර්යයන් ආරම්භ කරන තුරු) |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.2. ඵලදායීව නඩු විනිශ්චය සහතික කිරීම සඳහා පැමිණිලි ලේඛනගත කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම. | 1.2.1. අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මනෝ වෛද්‍යවරුන් සහ නීතිඥවරුන්ට වද හිංසා පිළිබඳ සාක්ෂි සහ විපතට පත්වූවන්ගේ ජීවන තත්ත්වයට වද හිංසාවෙන් සිදුවූ සම්පූර්ණ බලපෑම ලේඛනගත කිරීමට විශේෂ පුහුණුවක් ලබාදීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය (පෙරමුණ ගනිමින් අධිකරණ වෛද්‍ය නිලධාරීන් මනෝ වෛද්‍යවරුන් සහ අදාළ නිලධාරීන්) | කෙටි කාලීන | විශේෂ පුහුණුවක් ලබාදීම. |
| | | 1.2.2. සැලකිය යුතු පාර්ශ්වයන්ගේ අභිමතාර්ථයන් තුලනය කරන තීන්දුවකට එළඹීමට හැකි වන පිණිස ඉස්තාන්බුල් මූල ලේඛයේ ප්‍රමිති අනුගමනය කිරීම. | ශ්‍රී ලංකා නීතිඥ සංගමය සමඟ අධිකරණ අමාත්‍යාංශය (නීතිඥවරු සම්බන්ධයෙන්) | කෙටි කාලීන | |
| | | 1.2.3. වද හිංසාවෙන් සෞඛ්‍යයට සහ මානසික වශයෙන් ඇතිවන බලපෑම, ඒ හා සම්බන්ධ ජාත්‍යන්තර බැඳීම්, නීති විද්‍යාවට අනුව නඩු විනිශ්චය කිරීම සහ කිසිඳු ලෙසකින් වද හිංසාවට එකඟ නොවීම (Zero-tolerance) පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම උදෙසා, සෑම ශ්‍රේණියකම අධිකරණ නිලධාරීන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම. | අධිකරණ අමාත්‍යාංශය<br>අධිකරණ සේවා කොමිසම<br>අගවිනිසුරු | මධ්‍ය කාලීන | සෑම ශ්‍රේණියකම අධිකරණ නිලධාරීන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම. |
| | | 1.2.4. විනිසුරුවන්ගේ පුහුණුවේ කොටසක් ලෙස වද හිංසාව වැළැක්වීම සහ විනිශ්චය කිරීම පිළිබඳ මොඩියුලයක් හඳුන්වාදීම. | විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය (පෙරමුණ ගැනීම) | මධ්‍ය කාලීන | මොඩියුල හඳුන්වාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.3. වද හිංසා සිදුවීම් අනාවරණය කර ගැනීමේ හා ඊට අදාළ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීම සඳහා, පොලීසිය හා අදාළ රාජ්‍ය ආයතන සිදුකරන අත් අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් නිවැරදිව සිදුකරන බවට මහේස්ත්‍රාත්වරුන් නිසි ලෙස අධීක්ෂණය කරන බවට සහතික වීම. | 1.3.1. පත්වීම් ලබාදීමට පෙර සියලුම මහෙස්ත්‍රාත්වරුන්ට අධිකරණ වෛද්‍ය පුහුණුව ලබාදීම. | විනිසුරුවන් පුහුණු කිරීමේ ආයතනය | කෙටි කාලීන | පුහුණුව ලබාදීම. |
| | | 1.3.2. අත්අඩංගුවට ගැනීමෙන් පසු සහ උසාවියට ඉදිරිපත් කිරීමට පෙර, සැකකරු වද හිංසාවට ලක්වී ඇති බව පරීක්ෂා කිරීමට සහ සෝදිසි කිරීමට මහේස්ත්‍රාත්වරුන්ට නියම කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>අධිකරණ සේවා කොමිසම | කෙටි කාලීන | මහේස්ත්‍රාත්වරුන්ට උපදෙස් ලබාදීම. |
| | | 1.3.3. නිසි ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලියක් සකස් කළ පසු, වද හිංසා පිළිබඳ පැමිණිලි වාර්තා කර ඒවා පොලිස් මූලස්ථානය වෙත හෝ එහි ස්වාධීන ඒකකයට භාරදීමට කටයුතු කරන ලෙස අධිකරණ ලේඛකාධිකාරීවරයාට නියම කරන්නැයි මහේස්ත්‍රාත්වරුන්ට උපදෙස් ලබාදීම. | අධිකරණ අමාත්‍යංශය<br>අධිකරණ සේවා කොමිසම | කෙටි කාලීන | |
| | | 1.3.4. ක්‍රමානුකූලව රිමාන්ඩ් බන්ධනාගාර නියාමනය කිරීමට මහේස්ත්‍රාත්වරුන්ට උපදෙස් ලබාදීම. | අධිකරණ අමාත්‍යාංශය<br>අධිකරණ සේවා කොමිසම<br>විනිසුරුවන් පුහුණු කිරීමේ ආයතනය | මධ්‍ය කාලීන | මහේස්ත්‍රාත්වරුන්ට උපදෙස් ලබාදීම. |
| | | 1.3.5. මහේස්ත්‍රාත් පුහුණුවට හා විෂයමාලාවට ඉහත වගකීම් හඳුන්වාදීම. | | | විෂයමාලාව යාවත්කාලීන කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.4. විපතට පත්වූවන්ට ඔහුගේ / ඇයගේ කැමැත්ත අනුව වෛද්‍ය නිලධාරියෙකුගෙන් වෛද්‍ය සහාය ලබාගැනීමේ අයිතිය සහතික කිරීම. | 1.4.1. විපතට පත්වූවන්ට මානසිකව බලපෑමක් සිදුවී ඇත්නම්, ඒ පිළිබඳ අනාවරණය වන හෝ ඒ පිළිබඳව තක්සේරුවක් සිදු කළ හැකි බවට සහතික වන පරිදි අධිකරණ වෛද්‍ය වාර්තා (MLR) සහ අධිකරණ වෛද්‍ය තක්සේරුවේ පවත්නා ආකෘති සංශෝධනය (MLA) කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය (පෙරමුණ ගැනීම) | කෙටි කාලීන | අධිකරණ වෛද්‍ය වාර්තා සහ අධිකරණ වෛද්‍ය තක්සේරුවේ ආකෘති සංශෝධනය කිරීම. |
| | | 1.4.2. වද හිංසාව පිළිබඳ ලේඛනගත භෞතික සාක්ෂිවල ඵලදායිතාවය වැඩි කිරීම පිණිස, අධිකරණ වෛද්‍ය නිලධාරීන් වැඩි පිරිසක් බඳවා ගැනීම, පුහුණු කිරීම හා ප්‍රමාණවත් පහසුකම් ලබාදීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | බඳවා ගැනීම සහ පුහුණුව සම්පූර්ණ කිරීම. |
| | | 1.4.3. උපදෙස් (චක්‍රලේඛ) නිකුත් කිරීම :<br>(අ) විපතට පත්වූවෙකු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් සිදුකරන ඉල්ලීමක් මත අදාළ අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් ඔහුගේ / ඇයගේ වෛද්‍ය වාර්තාවේ පිටපතක් ලබාගැනීමේ අයිතිය.<br>(ආ) හැකි අවස්ථාවන් හිදී ඔහු/ඇය කැමැති වෛද්‍ය නිලධාරියෙකුගෙන් පරීක්ෂා කරවා ගැනීමට අයිතිය. (කාන්තා වෛද්‍ය නිලධාරිනියකගෙන්, හෝ විපතට පත්වූවෙකු විරුද්ධතාව ප්‍රකාශ නොකළ වෛද්‍ය නිලධාරියෙකුගෙන් යනාදී වශයෙන්) | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | සුදුසු උපදෙස් නිකුත් කිරීම. |
| | | 1.4.4. වද හිංසාවක් පිළිබඳ පැමිණිල්ලක් වාර්තා කරන සියලුම අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් ඉහත ඒකකය සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත එම පැමිණිල්ලේ පිටපතක් ඉදිරිපත් කළ යුතු බවට උපදෙස් ලබාදීම. | | කෙටි කාලීන | සුදුසු උපදෙස් නිකුත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.5. වද හිංසාව පිළිබඳ චෝදනා, සැකකරුවන්ගේ අයිතිවාසිකම්, පොලීසියේ රාජකාරිය සහ වද හිංසා කිසිඳු අයුරකින් ඉවසා නොසිටීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පුළුල්ව ප්‍රචාරය කිරීම. | 1.5.1. වද හිංසා සිද්ධි සම්බන්ධයෙන් ලබාගත හැකි පිළියම් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම (HRCSL) | මධ්‍ය කාලීන | දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>පහත දැක්වෙන කරුණු සඳහා මහජනයාගේ දැනුවත්භාවය වැඩි කිරීමට යොදාගත් ක්‍රම :<br>■ පැමිණිලි යාන්ත්‍රය.<br>■ වද හිංසා කිසිඳු අයුරකින් ඉවසා නොසිටීම තහවුරු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිය කෙරෙහි පොලීසිය කෙතරම් කැපවී සිටී ද<br>■ සැකකරුවන්ගේ අයිතිවාසිකම්<br>■ සැකකරුවන් කෙරෙහි පොලිස් නිලධාරීන් සතු යුතුකම් |
| | 1.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 පරිච්ඡේදයේ පැමිණිලි සම්බන්ධ කාලසීමා ප්‍රතිශෝධනය කිරීම. | 1.6.1. මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත හැකි කාල සීමාව මාස හයක් දක්වා දීර්ඝ කිරීම සහතික කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමාලෝචනය කර සංශෝධනය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව | කෙටි කාලීන | සමාලෝචනය අවසන් කිරීම. |
| | | 1.6.2. එම සමාලෝචනයට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම. | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ව්‍යස්ථානුකුල කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br>ව්‍යස්ථානුකුල කෙටුම්පත පැනවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 2. විමර්ශනය | 2.1. නඩු පැවරිය හැකි වැරදි පිළිබඳ මූලික ක්‍රියාමාර්ගයන්ට අනුකූල වීම. | 2.1.1. අත්අඩංගුවට ගැනීම, රඳවාගැනීම, සැකකරුවන්ට සැලකීම, සටහන් වාර්තා කිරීම, පොලිස් ස්ථාන පරීක්ෂා කිරීම සහ යුතුකම් පැහැර හැරීම / අසමත්වීම අඩුපාඩු සඳහා සුදුසු දඬුවම් ලබාදීම ඇතුළුව ක්‍රියා පටිපාටි සහතික කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාශයට පත් කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාශයට පත් කිරීම. |
| | | 2.1.2. එම පොලිස් දෙපාර්තමේන්තු නියෝග, නීතිවලට ඇතුළත් කිරීම. | | කෙටි කාලීන | දෙපාර්තමේන්තු නියෝග නීතිවලට ඇතුළත් කිරීම. |
| | 2.2. වද හිංසාව පිළිබඳ පැමිණිලි ඵලදායීව විමර්ශනය කිරීම. | 2.2.1. සියලුම පැමිණිලි සඳහා මූලික ක්‍රියාවලි දෙකක් ඇති බවට සහතික කිරීම :<br>* පැමිණිල්ලෙන් පැහැදිලි වන වැරදි විමර්ශනය කිරීම සහ සාපරාධි නීතිය යටතේ ඒ සම්බන්ධයෙන් වැදගත් ක්‍රියාමාර්ග ගැනීම.<br>* විනයානුකූල ක්‍රියාමාර්ග. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය (පෙරමුණ ගනිමින්)<br>අධිකරණ අමාත්‍යාංශය<br>පොලිස්පතිවරයා | මධ්‍ය කාලීන | අදාළ ක්‍රියාවලිය තුළ රෙගුලාසි නිකුත් කිරීම. |
| 3. පිළියම් ලබා ගැනීම සඳහා විපතට පත්වූවන්ට සහාය ලබාදීම. | 3.1. නීති සහාය ලබාදීම. | 3.1.1. විපතට පත්වූවන්ට නීති සහාය ලබා ගැනීමේ හැකියාව සැලසීම. | අධිකරණ අමාත්‍යාංශය (පෙරමුණ ගනිමින්) | මධ්‍ය කාලීන | නීති සහාය ලබා ගැනීමේ හැකියාව |
| | | 3.1.2. රජයේ නිලධාරීන්ට එරෙහිව වධහිංසා සම්බන්ධ පැමිණිලි ගොනු කරන පුද්ගලයින්ට නීති ආධාර කොමිසමේ සහාය හිමිවන බවට සහතික වීම. | | කෙටි කාලීන | නීති ආධාර කොමිසම හරහා නීති සහාය ලබාදීම. |
| | 3.2. විපතට පත්වූවන්ට මනෝ-සමාජයීය සහ වෛද්‍ය සහාය ලබාදීම. | 3.2.1. පැමිණිල්ලක් ලද විගස වද හිංසාවට ලක්වූවන් පිළිබඳ තක්සේරුවක් සිදුවන බවට හා මනෝ වෛද්‍ය ප්‍රතිකාර සැලසෙන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | යාන්ත්‍රණය ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 4. වැළැක්වීමේ ක්‍රියාමාර්ග | 4.1. වධ හිංසාව කිසිඳු අයුරකින් ඉවසා නොසිටීමේ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම. | 4.1.1. වධ හිංසාව කිසිඳු අයුරකින් ඉවසා නොසිටීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට සහ ප්‍රචාරණය කිරීමටත්, ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහාත් යාන්ත්‍රණ පිහිටුවිය යුතු ආයතන ‍:<br>■ නීතිපති දෙපාර්තමේන්තුව<br>■ ශ්‍රී ලංකා පොලීසිය<br>■ ජාතික පොලිස් කොමිසම<br>■ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය<br>■ සෞඛ්‍ය අමාත්‍යාංශය<br>■ අධිකරණ අමාත්‍යාංශය (අධිකරණ වගකීම් සම්බන්ධයෙන්) | අධිකරණ අමාත්‍යාංශය (ප්‍රධාන) | කෙටි කාලීන | ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීම. |
| | 4.2. අත් අඩංගුවට ගන්නා අවස්ථාවේදී පවතින හිමිකම් පිළිබඳ සැකකරුවන් දැනුවත් කිරීම. | 4.2.1. සෑම සැකකරුවෙකුම අත් අඩංගුවට ගැනීමේදී ඔහුගේ / ඇයගේ අයිතීන් සම්බන්ධයෙන් පොලිසිය විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසියෙන් සිදුකරන ප්‍රකාශයක පිටපතක් සපයන බවට සහතික වීම. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | පොලිස් ආඥා පනත යටතේ නියමයන් නිකුත් කිරීම. |
| | | 4.2.2. අත් අඩංගුවට ගනු ලබන අවස්ථාවේදී, ළඟම ඥාතියෙකුට අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කුවිතාන්සියක් නිකුත් කිරීමේ ක්‍රියාවලියට ආකෘතියක් සකස් කර, එය තරයේ පිළිපැදීම. | | | පොලිස් ආඥා පනත යටතේ නියමයන් නිකුත් කිරීම.<br>සමාලෝචනය අවසන් කිරීම.<br>CCPA සංශෝධිත කෙටුම්පත සකස් කිරීම සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම. |
| | | 4.2.3. වධ හිංසාවක් පිළිබඳව ලැබුණු පැමිණිල්ලක, විමර්ශන ක්‍රියාවලිය තුළ ගනු ලැබූ පියවර සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු ලබාදීම. | | | පොලිස් ආඥා පනත යටතේ නියමයන් නිකුත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 4.3. වද හිංසාව සම්බන්ධ කුමන හෝ ක්‍රියාවක් අධීක්ෂණය කිරීමට පොලිස් සිරකුටි සහ බැරැක්ක නියාමනය කිරීම. | 4.3.1. නීතිය බලගැන්වීමේ ක්‍රියාවලියේ කාර්යයක්ෂම බව සහතික කිරීම සඳහා CCTV කැමරා සවි කිරීමට නිශ්චිත කාල සීමාවක් ලබාදීම. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | කාල සීමාවක් ලබාදීම. |
| | 4.4. වැළැක්වීමේ ඍජු ක්‍රියාමාර්ග යොදා ගැනීම. | 4.4.1. සියලුම පොලිස් සහ බන්ධනාගාර නිලධාරීන්ට සාපරාධී ක්‍රියා සටහන් කිරීම, ප්‍රශ්න කිරීම සහ විමර්ශනය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දීම, එම නිලධාරීන් වද හිංසා පැමිණවීමේ ක්‍රමයට යොමු නොවන පරිදි වඩාත් දියුණු ශිල්පීය ක්‍රම හඳුන්වාදීම. | අධිකරණ අමාත්‍යාංශය<br>නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | දිගු කාලීන | පුහුණුව අවසන් කිරීම. |
| | | 4.4.2. සැකකරුවන්ට සැළකීමේ ක්‍රියාවලියේදී චර්යා ආබාධ බලපෑමක් ඇති නොකරන බවට සහතික කිරීම සඳහාත්, ඉහළ බලධාරීන්ගේ නියෝග මත වද හිංසා පැමිණවීමෙන් වෛද්‍ය විද්‍යාත්මකව ඇතිවන බලපෑම සාකච්ඡාවට බඳුන් කිරීම සඳහාත්, පොලිස් නිලධාරීන්ට මනෝ වෛද්‍ය සහාය ලබාදීම. | | මධ්‍ය කාලීන | මනෝ වෛද්‍ය සහාය ලබාදීම. |
| | 4.5. පොලිස් බලකායේ ගුණාත්මකභාවය වැඩි කිරීම. | 4.5.1. පොලීසියේ වෘත්තීයමභාවය සහ මහජන කටයුතු සමඟ සම්බන්ධවීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබාදීම. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>ජාතික පොලිස් කොමිසම | දිගු කාලීන | මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 4.6. පවිටු ක්‍රියාවන්ට දඬුවම් නොදී සිටීම අවසන් කිරීම හා එසේ විය හැකි අවකාශ අධෛර්යමත් කිරීම. | 4.6.1 වද හිංසා ක්‍රියා සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ පොලිස් නිලධාරීන්ට එරෙහිව දැඩි විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම. (එනම් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති නිලධාරියෙකුට එරෙහිව කඩිනම් විමර්ශන පැවැත්වීමට කටයුතු කරන බව සහතික කිරීම) | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>ජාතික පොලිස් කොමිසම | මධ්‍ය කාලීන | සුදුසු විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම. |
| | | 4.6.2 අභ්‍යන්තර විනයානුකූල ක්‍රියාමාර්ග විධිමත්ව සහ කඩිනමින් අනුගමනය කරන බවට සහතික කිරීම. | | | |
| | 4.7. නීතිය බල ගන්වන සහ ආරක්ෂක නිලධාරීන් වද හිංසා පැමිණවීමේ ක්‍රියාවන් අනුගමනය අධෛර්යමත් කිරීම. | 4.7.1 ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු ආංශික පාලන කමිටුව විසින් දැනට සළකා බලන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ වද හිංසාව දිරිමත් කරන විධි විධාන ඇතුළත් නොවන බවට සහතික කිරීම. | ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු ආංශික පාලන කමිටුව | කෙටි කාලීන | සුදුසු විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම. |
| 5. කාර්ය සැලැස්ම නියාමනය සහ සමාලෝචනය කිරීම. | 5.1. මානව හිමිකම් පිළිබඳ ජාතික කාර්ය සැලසුමේ, වද හිංසා සම්බන්ධ කාර්ය ලක්ෂණ ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීමට යාන්ත්‍රණයක් පිහිටුවීම. | 5.1.1. මානව හිමිකම් පිළිබඳ ජාතික කාර්ය සැලසුමේ, වද හිංසා සම්බන්ධ කාර්ය ලක්ෂණ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා පරිපූර්ණ අන්තර් - අමාත්‍ය යාන්ත්‍රණයක් ගොඩනැගීම. | අධිකරණ අමාත්‍යාංශය<br>නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සමන්විත අන්තර් - අමාත්‍ය කමිටුවක් | කෙටි කාලීන | යාන්ත්‍රණය ගොඩනැගීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 5.2. ප්‍රධාන ආයතන අතර නියාමනය, සමාලෝචනය සහ ඒවා අතර සම්බන්ධීකරණය. | 5.2.1. වද හිංසා පැමිණිලි සම්බන්ධයෙන් ජාතික මට්ටමේ දත්ත ගබඩාවක් පවත්වා ගැනීම. | නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය (පෙරමුණ ගනිමින්) | කෙටි කාලීන | පිළියම් ලබා ගත හැකි ක්‍රියාවලිය ඒකාබද්ධ කරමින් ඒ සඳහා ප්‍රවේශය පහසු කිරීම. |
| | | 5.2.2. වින්දිතයන් සහ ඔවුන්ගේ නියෝජිතයින්ට ප්‍රතිලාභ අත්වන පිළියම් ක්‍රියාවලියක් ඒකාබද්ධ කරමින්, ඒ සඳහා ප්‍රවේශය පහසු කිරීම. | අධිකරණ අමාත්‍යාංශය, නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සමන්විත අන්තර් අමාත්‍ය කමිටුව | මධ්‍ය කාලීන | |
| | | 5.2.3. පැමිණිලි පිළිබඳ දත්ත සමාලෝචනය, පැමිණිලිවලට ප්‍රතිචාර දැක්වීමට ක්‍රියාමාර්ග ගැනීම සහ විෂමතා ඇත්නම් ඒවා ආමන්ත්‍රණය කිරීමට සැලසුම් සමාලෝචනය කිරීම. | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම<br>ජාතික පොලිස් කොමිසම<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | පැමිණිලි පිළිබඳ දත්ත සමාලෝචනය. |
| | | 5.2.4. ව්‍යුහගත, විධිමත් සම්බන්ධීකරණයක් සහ තොරතුරු හුවමාරුවක් සහතික කිරීම. | නීතිපති දෙපාර්තමේන්තුව<br>නීති හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ව්‍යුහගත සම්බන්ධීකරණය සඳහා ක්‍රමයක් ස්ථාපිත කිරීම. |

# කාන්තා අයිතිවාසිකම්

## කාන්තා අයිතිවාසිකම්

රජය විසින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇති අතර, කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්ව සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) ඇතුළු ජාත්‍යන්තර සම්මුතීන් හා ප්‍රකාශනයන් සඳහා පාර්ශ්වකරුවෙකු ලෙස කටයුතු කරයි. ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී නීති පැනවීම, ප්‍රතිපත්ති සකස් කිරීම සහ කාර්යය සැලසුම් සංවර්ධනය කිරීම තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අත්කර ගැනීම සඳහා මේ වන විට රජය කටයුතු කරමින් සිටියි. විශේෂයෙන්ම සෞඛ්‍යය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් ඔස්සේ කාන්තා සවිබලගැන්වීම හා සම්බන්ධ බොහෝ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ශ්‍රී ලංකාව ප්‍රගතිය අත්කර ගෙන ඇත. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයෙහි සහ ගිවිසුම් ප්‍රකාර පොරොන්දු ඉටුකිරීම තුළ මෙන්ම, 2015 දී එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක තුළින් සම්මත කරගත් ස්ත්‍රී පුරුෂ දර්ශක අත්පත් කරගැනීම හරහාද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳව අවධානය යොමුව තිබේ.

මෙම ජාතික කාර්යය සැලැස්ම තුළින් විශේෂයෙන් ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු සමානාත්මතාවයක් අත්පත් කරගත යුතු බවට අවධාරණය කර සිටියි. ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය නාගරික සහ ග්‍රාමීය ක්ෂේත්‍ර දෙකෙහිම පිරිමින්ට වඩා අවම තත්ත්වයක පවතී. ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවුවද, විශේෂයෙන්ම නුපුහුණු අංශයේ ශ්‍රම දායකත්වය ඇතළුව සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් ගැටළු පවතී. යුද්ධයෙන් පීඩාවට පත්වූ කාන්තාවන්ගේ ආර්ථික, ආරක්ෂාව සහ යටිතල පහසුකම් පිළිබඳ අවශ්‍යතාව සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමුවීම අවශ්‍යය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1325 යෝජනාවෙන් විස්තර කෙරෙන පරිදි අධිකරණ පද්ධතියේ සිදුකරන වෙනස්කම් සඳහා ස්ත්‍රී පුරුෂභාවය ඇතුළත් කිරීම අත්‍යවශ්‍යය. පළාත් පාලන ආයතන තුළ කාන්තාවන් සඳහා සියයට 25% ක නියෝජනයක් වෙන් කර තිබුණද, පාර්ලිමේන්තු සහ පළාත් සභාවන්හී කාන්තා නියෝජනය වැඩි කිරීම සඳහා ඒ වෙනුවෙන් තවදුරටත් හඩ නැගීම අත්‍යවශ්‍යය.

නිවෙස්වල, සේවා ස්ථාන සහ ප්‍රජාව තුළ ස්ත්‍රීපුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සඳහා මහජනයා සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්හි සංවේදීතාව ඇතිකරවීමට ක්‍රියාකිරීම වැදගත්වේ. එබැවින් කාර්ය සැලැස්ම තුළින් ස්ත්‍රීපුරුෂ සමානතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා රජයේ බැඳීම වැඩි කර ඇති අතර, සැලැස්මේ පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීමට ඵලදායි ක්‍රියාත්මක කිරීමක් සහ නියාමන පද්ධතියක් අවශ්‍ය කෙරේ. වෙනස්ව සැලකීමට මුල්වන ආකල්ප සහ සමාජයේ සෑම මට්ටමකම සිටින කාන්තාවන්ගේ කාර්යභාර්යයන් හි ඒකාකාරී ස්වරූපය පිටුදැකීම සඳහා සහයෝගයෙන් ක්‍රියාත්මක කළ යුතු වැඩපිළිවෙලක අවශ්‍යතාව මතුව පවතී. එබැවින් සක්‍රීය යාන්ත්‍රණයක් හරහාද, ප්‍රමාණවත් සම්පත් දායකත්වයක් තුළින් මෙන්ම ක්‍රමවත් නිරීක්ෂණ පද්ධතියක් ඔස්සේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හදුනාගැනීම, වෙනස්ව සලකනු ලැබීම පිටුදැකීම, සමාන අයිතීන් තහවුරු කරමින් කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි රජයේ කැපවීම යනාදී මේ සියල්ල ජාතික කාර්යය සැලැස්ම මගින් උත්කර්ෂයට නැංවේ.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. කාන්තා අයිතීන් සහතික කිරීම. | 1.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ කාන්තා අයිතීන් ශක්තිමත් කිරීම. | 1.1.1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතීන් පිළිබඳ පරිච්ඡේදයට කාන්තා අයිතීන් පිළිබඳ කොටසක් එක් කිරීම. | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ විධි විධාන ඇතුළත් කිරීම. |
| | 1.2. ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය ආයතනික යාන්ත්‍රණ. | 1.2.1. ව්‍යවස්ථාමය විධි විධාන යටතේ ස්වාධීන කොමිසමක් ලෙස කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසමක් ස්ථාපනය කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | කාන්තාවන් පිළිබඳ කොමිසම ස්ථාපනය කිරීම. |
| | 1.3. අධීක්ෂණ හා ප්‍රතිපත්ති සැළසුම් කිරීමේ කාර්ය සඳහා ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් වෙන්ව දත්ත එක් රැස් කිරීම. | 1.3.1. ස්ත්‍රීපුරුෂ වශයෙන් වෙන් වෙන්ව දත්ත එක් රැස් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය<br>ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් වෙන්ව දත්ත සංචිත පවත්වාගෙන යාම. |
| 2. ගර්භණී සහ කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ මට්ටම වර්ධනය කිරීම. | 2.1. ගර්භණී සහ කිරිදෙන මව්වරුන්ගේ පෝෂණ මට්ටම වර්ධනීය තත්ත්වයකට ගෙන ඒම. | 2.1.1. ගර්භණී සහ කිරිදෙන මව්වරුන්ගේ පෝෂණය හා සම්බන්ධ වැඩසටහන් ශක්තිමත් කොට කාලයට යෝග්‍ය ලෙස සකස් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සභා | දීර්ඝ කාලීන | ගර්භණී සහ කිරිදෙන මව්වරුන් අතර අවදානම් සහිත ගබ්සාවීම් අවම කරගැනීම සහ උපත් පාලන ක්‍රම සඳහා යොමුවීමේ වර්ධනයක් අත්පත් කරගැනීම. |
| 3. අනවශ්‍ය ගැබ් ගැනීම් අවම කිරීමට හැකි වන පරිදි උපත්පාලන ක්‍රම භාවිතය පිළිබඳ දැනුවත්භාවයේ වර්ධනයක් ඇති කිරීම. | 3.1. අවදානම් සහිත ගබ්සා පිළිබඳව දැනුවත් කිරීම. | 3.1.1. ඒ සඳහා සුදුසු ගුරු පුහුණු හා නව පාඨමාලා පැවැත්වීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සභා | දීර්ඝ කාලීන | අවදානම් සහිත ගබ්සා අවම කිරීම හා උපත්පාලන භාවිතයේ වර්ධනයක් ඇති කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 4. STD/HIV/AIDS ආසාදිත පුද්ගලයින් හට සේවාවන්ට ප්‍රවේශ වීමේ අවස්ථාව සැලසීම. | 4.1. ගුණාත්මක සෞඛ්‍යය සේවා සඳහා ප්‍රවේශවීමට පහසුකම් සැලසීම. | 4.1.1. STD/HIV/AIDS ආසාදිත පුද්ගලයන් සඳහා සේවාවන් ලබාගත හැකිවීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | STD/HIV/AIDS ආසාදිත පුද්ගලයින් සඳහා සේවාවන් සැපයීම. |
| 5. ව්‍යාභිචාරය, ස්ත්‍රීදූෂණය සහ ප්‍රධාන වශයෙන්ම උපතින්ම පවතින විකෘතිතා මත වෛද්‍යානු-කූලව ගබ්සා කිරීම සාපරාධි වරදක් ලෙස නොසැලකීම. | 5.1. ව්‍යාභිචාරය, ස්ත්‍රීදූෂණය සහ ප්‍රධාන වශයෙන්ම උපතින්ම පවතින විකෘතිතා මත වෛද්‍යානුකූලව ගබ්සා කිරීම සාපරාධි වරදක් ලෙස නොසැලකීම. | 5.1.1. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයට අදාළ සංශෝධන ගෙන ඒම. | අධිකරණ අමාත්‍යාංශය<br>සෞඛ්‍යය අමාත්‍යාංශය<br>කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම<br>මානව හිමිකම් කොමිසම | මධ්‍ය කාලීන | දණ්ඩ නීති සංග්‍රහ පනත (සංශෝධිත) සැකසීම. |
| | | 5.1.2. ප්‍රතිපත්ති සම්පාදකයන්ද ඇතුළුව විවිධ පාර්ශ්වකරුවන් සමග ජාලගත වෙමින් ඉහත සඳහන් වෙනස්කම්වලට සහාය වීම. | | | ප්‍රතිපත්ති සම්පාදකයන් සමග පැවති සාකච්ඡා |
| | | 5.1.3. කැබිනට් අනුමැතිය ලබාගනිමින් පනත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. | | | පනත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 6. රැකියාවන්ට ප්‍රවේශ වීම ඇතුළුව කාන්තාවන්ගේ ආර්ථික හිමිකම් සහ නිදහස ප්‍රවර්ධනය කිරීම. | 6.1. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ රැකියාවන් හි කාන්තා සහභාගිත්වය වැඩි කිරීම. | 6.1.1. විධිමත් සහ සාම්ප්‍රදායික නොවන අංශවල ඉහළ නිපුණතා සහිත රැකියා වෙනුවෙන් කාන්තාවන් පුහුණු කිරීමේ කර්තව්‍යය සඳහා ආයෝජනය කිරීම : උදා. තොරතුරු තාක්ෂණ අංශය. | වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍යකාලීන - සහ දීර්ඝ කාලීන | සාම්ප්‍රදායික නොවන අංශයන් හි අවම වශයෙන් කාන්තාවන් සියයට 40% ක පිරිසක් පුහුණු කිරීම. |
| | | 6.1.2. ස්ත්‍රී පුරුෂභාවය සම්බන්ධව පවතින සමාජ බැමි බිඳලා කාන්තාවන්ද පුහුණු පන්ති සඳහා යොමුවන අයුරින් වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා අවස්ථා උදාකර දීම. | | | වෘත්තීය පුහුණු වැඩසටහන් සංවිධාන කිරීම. |
| | | 6.1.3. කාන්තාවන් වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනයට සහභාගි කරගැනීම දිරිගැන්වීම සඳහා ශිෂ්‍යයන්, දෙමාපියන් හා ගුරුවරුන් අතර දැනුවත්බව ඇති කිරීම. | | | වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය තුළ සමාන සහභාගීත්වය. |
| | 6.2. රාජ්‍ය හා පුද්ගලික අංශයේ රැකියා සඳහා කාන්තා සහභාගීත්වයට පවතින බාධාවන් පිළිබඳව අවධානය යොමු කිරීම. | 6.2.1. පුද්ගලික අංශයේ කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා උපාධිධාරී කාන්තාවන් බඳවාගැනීම සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් සඳහා කාන්තාවන් වැඩි සංඛ්‍යාවක් තෝරා ගැනීම. | ආයෝජන මණ්ඩලය<br>බැංකු සහ<br>පුද්ගලික අංශය | දීර්ඝ කාලීන | කාන්තා සේවා නියුක්තියේ ප්‍රතිශතය ඉහළ නැංවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.3. සේවා නියුක්තියේ විධිමත් අංශය තුළ ස්ත්‍රී පුරුෂ පරතරය අවසන් කිරීම. | 6.3.1. රැකියාවේ නිරත කාන්තාවන්ගේ කුඩා දරුවන් රැකබලා ගැනීම සඳහා විධිමත් අධීක්ෂණයකින් යුත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සඳහා දිරි දීමනා වෙන් කිරීම. | කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>පළාත් සභා<br>පුද්ගලික අංශය | දීර්ඝ කාලීන | ප්‍රමාණවත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාවක් ස්ථාපනය කිරීම. |
| | | 6.3.2. රැකියාවේ නිරත කාන්තාවන් සඳහා ආරක්ෂිත සහ විධිමත් සේවයක් සැලසීම සහතික කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවය වෙනුවෙන් ආයෝජනය කිරීම. | ප්‍රවාහන අමාත්‍යාංශය<br>මගී ප්‍රවාහන අධිකාරිය | මධ්‍ය කාලීන | නිසි ප්‍රවාහන පහසුකම් සැපයීම. |
| | | 6.3.3. අර්ධ කාලීන සහ ආයතනයෙන් පරිබාහිරව යනාදී වශයෙන් විධිමත් අංශ සඳහා නම්‍යශීලීව සේවය සැලසීමට හැකි වන වැඩ පරිසරයක් සඳහා උනන්දු කරවීම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය<br>ලංකා වාණිජ මණ්ඩලය | මධ්‍ය කාලීන | නම්‍යශීලිව සේවය සැලසිය හැකි වැඩපිළිවෙළක් හඳුන්වා දීම. |
| | | 6.3.4. දරුවන් රැකබලාගැනීම හා පවුලේ වගකීම් සම්බන්ධයෙන් පිරිමින්ගේ කාර්ය භාරය සහ වගකීම් ප්‍රවර්ධනය උදෙසා හඩ නැගීම. | කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | නිවසේ කටයුතු සඳහා පිරිමින්ගේ සහභාගීත්වය වැඩි කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 7. වැටුපක් නොලබන රැකබලාගැනීම් හා ගෘහස්ත කාර්යයන් හඳුනාගැනීම හා ඒවාට වටිනාකමක් ලබාදීම. | 7.1. ශ්‍රම බලකා සංගණන තුළදී, වැටුපක් නොලබන රැකබලා ගැනීම් හා ගෘහස්ථ කාර්යයන්හි වටිනාකම් ගණන් බැලීම සහ එම වටිනාකම් දළ දේශීය නිෂ්පාදනයට ඇතුළත් කර ගැනීම. | 7.1.1. ගෘහ සේවය හා වැටුපක් රහිතව සැලසෙන රැකබලාගැනීම හා සම්බන්ධ පවතින වත්මන් ප්‍රතිපත්තිය හා නීති රාමුව විමර්ශනය කර, රටේ ආර්ථිකයට කාන්තාවගේ පුළුල් දායකත්වය නිසි පරිදි හඳුනාගැනීම. | කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | වැටුප් රහිතව රැකබලාගැනීම සැලසීම හා ගෘහ සේවය හඳුනාගැනීම. |
| | | 7.1.2. ගෘහ සේවය පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති අංක 189 විමර්ශනය කර අපරානුමත කිරීම සලකා බලමින්, එය අනුකූලනය සලකා බැලීම. | කම්කරු අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ජාත්‍යන්තර කම්කරු සංවිධානය | මධ්‍ය කාලීන | ඒකීකරණය සලකා බැලීම සඳහා විමර්ශනයක් සිදු කිරීම. |
| | | 7.1.3. ගෘහ සේවයේ නියැලෙන, කොන්ත්‍රාත් හෝ කෘෂිකාර්මික අංශයේ උප කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන, නිශ්චිත කාලසීමාවක් තුළ පමණක් රැකියාවේ යෙදෙන සහ තාවකාලික රැකියාවල නියැලෙන කාන්තාවන්ගේ ආර්ථික අයිතීන් ආරක්ෂා කෙරෙන නීති ක්‍රියාත්මක කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>ජාත්‍යන්තර කම්කරු සංවිධානය | මධ්‍ය කාලීන | අවිධිමත් අංශයේ සේවයේ නියුතු කාන්තාවන්ගේ ආර්ථික අයිතීන් සුරක්ෂිත කිරීම. |
| | | 7.1.4. ගෘහ සේවයේ රැකියාවන්හි නියැලෙන්නන් සේවයේ අනුයුක්ත කිරීම හා සම්බන්ධ සම්මතයන්, පත්කිරීම්, ගෙවීම් හා ආරක්ෂා කිරීමට අදාළව කම්කරු අමාත්‍යාංශය සමග රෙගුලාසි සකස් කිරීම වෙනුවෙන් සාකච්ඡා කිරීම. | කම්කරු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ගෘහ සේවිකාවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් සුදුසු යාන්ත්‍රණයන් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 8. භූමිය ද ඇතුළුව ආර්ථික සම්පත් කෙරෙහි හිමිකාරිත්වය ප්‍රකාශ කිරීම, පාලනය කිරීම සඳහා සමාන අයිතිය හා ප්‍රවේශය ලබාදීම. | 8.1. ඉඩම් හිමිකාරිත්වය, සහ පාලනයට කාන්තාවන් හට සමාන අයිතිය හා ප්‍රවේශය සුරක්ෂිත කිරීම. | 8.1.1. ඉඩම් සංවර්ධන ආඥා පනතේ සහ ඉඩම් අන්සතු කිරීමට අදාළ පුද්ගලික නීතිවල ඇති අසාධාරණ විධිවිධාන සංශෝධනය කිරීම. | ඉඩම් අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | අදාළ නීති සංශෝධනය කිරීම |
| | | 8.1.2. ආර්ථික සම්පත් වෙනුවෙන් සමාන අයිතිවාසිකම් ලබාදීම සඳහා ප්‍රතිසංස්කරණ පවරා ගැනීම. | | මධ්‍ය කාලීන | ආර්ථික සම්පත් වෙනුවෙන් සමාන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ප්‍රතිසංස්කරණ සකස් කිරීම. |
| 9. ගොවි කාන්තාවන්ගේ සමාජ-ආර්ථික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. | 9.1. ගොවි සංවිධානවල කාන්තා සහභාගිත්වය වැඩි කිරීම හා ඒවායේ කාන්තා භූමිකාව ශක්තිමත් කිරීම. | 9.1.1. ගොවි සමාජයන් හි ගෙවිලියන්ගේ අවම දායකත්වය සියයට 30% ක් වන සේ සුරක්ෂිත කිරීම. | කෘෂිකර්ම අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ගොවි සංවිධානවල කාන්තා සහභාගීත්වය වැඩි කිරීම. |
| | | 9.1.2. ගොවි සංවිධානවල සාමාජිකයන් සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ නිලධාරීන් සඳහා ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ සංවේදී වෙමින් කාන්තා නායකත්වයේ සහ ආර්ථික අයිතිවාසිකම්හි වැදගත්කම යටතේ විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | කෘෂිකර්ම අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | කාන්තාවගේ නායකත්වය හා ආර්ථික අයිතීන් පිළිගැනීම. |
| | | 9.1.3. ගෙවිලියන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම. | සමාජ සේවා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සමාජ ආරක්ෂණ යෝජනා හඳුන්වා දීම. |
| | | 9.1.4. ගෙවිලියන් සඳහා තාක්ෂණික අංශයේ මෙන්ම, නිපුණතා පුහුණුව සහ අධ්‍යයන චාරිකා සඳහා ප්‍රවේශවීමේ අවස්ථා සුරක්ෂිත කිරීම. | කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>පළාත් සභා | මධ්‍ය කාලීන | සෑම අංශයකම පුහුණුව සඳහා ගෙවිලියන් ඇතුළත් කර ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 10. සංක්‍රමණික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | 10.1. කාන්තා සංක්‍රණික සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කෙරෙන පියවර ගැනීම හා සුරාකෑම් වැළැක්වීම. | 10.1.1. එකඟ වූ නියමයන් හා කොන්දේසි (රැකියා කොන්දේසි, වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ) මත පදනම්ව සේවා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධ පසුවිපරම් යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය | කෙටි කාලීන | සේවා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.<br>පසු විපරම් යාන්ත්‍රණ සංවර්ධනය කිරීම. |
| | | 10.1.2. සේවා ගිවිසුම්හි කොන්දේසි කඩකිරීම සම්බන්ධයෙන්, සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් ලැබෙන පැමිණිලිවලට සක්‍රීයව ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ යාවත්කාලීන කිරීම සහ එවැන්නක් සම්බන්ධයෙන් කාන්තා ශ්‍රමිකයන් තුළ දැනුවත් භාවයක් ඇති කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>විදේශ සේවා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | පැමිණිලි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| | | 10.1.3. සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයන්ගේ ස්වාමිපුරුෂයන් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි පවුලේ සාමාජිකයින් හට ආරක්ෂාව සලසමින් සිය ජීවන තත්ත්වයන් උසස් කරගැනීම සඳහා ඉවහල් වන වැඩසටහන් හඳුන්වාදෙමින් ක්‍රියාත්මක කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>විදේශ සේවා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | පවුල් ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 11. බහුආංශික මැදිහත්වීම් තුළින් කාන්තාවන් හා ගැහැණු දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවම කිරීම. | 11.1. නීති ප්‍රතිසංස්කරණ | 11.1.1. පසුගිය වර්ෂ පහක කාලය තුළ අවසන් කළ සියලුම නීති ප්‍රතිසංස්කරණ වාර්තා පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම වාර්තාවන්හි නිර්දේශ පිළිබඳ ලැයිස්තුවක් සකස් කිරීම. | කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>රාජ්‍ය නොවන සංවිධාන | කෙටි කාලීන | සමීක්ෂණය සිදු කිරීම හා නිර්දේශයන් පිළිබද ලැයිස්තුවක් සකස් කිරීම. |
| | | 11.1.2. නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි කාන්තා සහභාගිත්වය සහතික කිරීම. | කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි කාන්තා සහභාගීත්වය. |
| | | 11.1.3. සයිබර් අපරාධ සහ විශේෂිත කාණ්ඩයන්ට අයත් ලිංගික හිරිහැර සම්බන්ධ කරුණු අන්තර්ගත කිරීම සඳහා ලිංගික හිරිහැර පිළිබඳ ඡේද අංක 345 තවදුරටත් විකාශනය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | 365 A ඡේදය තවදුරටත් විකාශනය කිරීම. |
| | | 11.1.4. ස්වකීය කැමැත්ත (වර්තමානයේ අවුරුදු 16) ලෙස පිළිගැනෙන වයසට අවම වයසක, බාල වයස්කාර ලිංගික සම්බන්ධතා කිසිදු ලෙසකින් අනුමත නොකිරීම තහවුරු කිරීමට, නීතියට අනුව ස්ත්‍රී දූෂණය සම්බන්ධ ඡේද අංක 363 පැහැදිලි අර්ථකතනයක් සිදු කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | කිසිදු ලෙසකින් අනුමත නොකිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. |
| | | 11.1.5. සැමියා හා බිරිඳ නීතියෙන් වෙන්ව සිටිය ද, කිසිදු විරුද්ධත්වයකින් තොරව වෛවාහික ස්ත්‍රී දූෂණය අපරාධයක් ලෙස සැලකීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | වෛවාහක ස්ත්‍රී දූෂණය සම්බන්ධ නීතිය බලාත්මක කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 11.1.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීති සංග්‍රහයේ 11 වෙනි වගන්තිය හා සමගාමීව, රාජ්‍ය නොවන මට්ටමේ ක්‍රියාකාරීන් ඇතුළත් කිරීමට සහ ලිංගික හිංසනය වධහිංසාවේ එක් පැතිකඩක් ලෙස හඳුනාගැනීම සඳහා වධහිංසා පනතේ වධහිංසාව යන්නෙහි අර්ථකථනය පුළුල් කිරීම. එසේ නැතහොත් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රාජ්‍ය, රාජ්‍ය නොවන මට්මේ ක්‍රියාකාරීන් සහ ලිංගික හිංසනයන්ද ආවරණය වන පරිදි වධහිංසාව සම්බන්ධ වෙනම අපරාධයක් ලෙස බලාත්මක කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අර්ථ නිරූපණය පුළුල් කිරීම. |
| | | 11.1.7. ස්වාධීන වශයෙන් තහවුරු කිරීම ද ඇතුළුව, කාන්තාවන් ලබාදෙන සාක්ෂිවල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ප්‍රවිචාරක විධි විධාන ඉවත් කිරීම සඳහා සාක්ෂි ලබාදීමේ ආඥා පනත ප්‍රතිසංස්කරණය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | සාක්ෂි ලබාදීමේ ආඥා පනත ප්‍රතිසංස්කරණය කිරීම. |
| | | 11.1.8. වෘත්තීය සංගම් සහ සේවායෝජකයින්ගේ සංගම්වල උපදෙස් ලබා ගනිමින් ලිංගික හිංසන සහ අතවර සම්බන්ධයෙන් කාන්තාවන්ට ප්‍රතිචාර දැක්විය හැකි සේ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සේවායෝජකයන් අනිවාර්යයෙන්ම හඳුන්වාදිය යුතු මාර්ගෝපදේශ සහ පත් කළ යුතු කමිටු පිළිබඳ නිසි ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය<br>ලංකා වාණිජ මණ්ඩලය<br>වෘත්තීය සමිති | කෙටි කාලීන | ලිංගික හිංසනවලට ප්‍රතිචාර දැක්වීමට කමිටු ස්ථාපිත කිරීම. |
| | | 11.1.9. සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඇති බාධා ඉවත් කිරීම සහ සාක්ෂි මත ප්‍රතිචාර දැක්වීමට හැකි පරිදි ගෘහස්ථ හිංසනය පිළිබඳ පනතට සංශෝධන ගෙන ඒම. | අධිකරණ අමාත්‍යාංශය<br>කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව | කෙටි කාලීන | ගෘහස්ථ හිංසනය පිළිබඳ පනත සංශෝධනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 12. කාන්තාවන්ට වෙනස්ව සැලකනු ලබන ඒකාකාරී ක්‍රම පිටුදැකීම. (Gender stereotyping) | 12.1. ස්ත්‍රී පුරුෂභාවයේ ඒකාකාරී ක්‍රම පිටුදැකීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීම. | 12.1.1. ස්ත්‍රී පුරුෂභාවයේ ඒකාකාරී ක්‍රම පිටුදැකීම සඳහා මහජනතාව, සෑම අධ්‍යාපන මට්ටමක්ම නියෝජනය කරන ශිෂ්‍යයන්, ජනමාධ්‍ය, ආගමික සහ ප්‍රජා නායකයින් යනාදී පාර්ශ්වයන්ගේ දැනුවත්භාවය වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | පොදුවේ ස්ත්‍රී පුරුෂභාවයේ ඒකාකාරී ක්‍රම අවම කිරීම. |
| | | 12.1.2. ස්ත්‍රී පුරුෂභාවයේ ඒකාකාරී ක්‍රමවල සෘණාත්මක බලපෑම පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම පිණිස, කලා ක්ෂේත්‍ර යොදා ගැනීම. | ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳව සංවේදීබව ඇති කිරීම. |
| 13. වින්දිතයන්ගේ අයිතීන් ආරක්ෂා කෙරෙන, අපරාධකරුවන් තම වරදට වගකියන ස්ත්‍රී පුරුෂභාවයට සංවේදී යුක්ති ක්‍රියාදාමයක්. | 13.1 නීතිය ප්‍රබලව බලාත්මක කිරීම. | 13.1.1. ජාතික පොලිස් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස, පොලිස්, ළමා හා කාන්තා කාර්යාංශ ප්‍රමාණාත්මකව වැඩි කිරීම, ඒවායේ ගාම්භීරත්වය ඉහළ නැංවීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | පොලිස් ස්ථානවල කාන්තා හා ළමා අංශ සංඛ්‍යාව වැඩි කිරීම. |
| | | 13.1.2. පැමිණිලිකරුවන්ගේ පෞද්ගලිකත්වය හා ආරක්ෂාව සැලසීම සඳහා යටිතල පහසුකම් සුරක්ෂිත කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | යටිතල පහසුකම් සංවර්ධනය.<br>නිරීක්ෂණ යාන්ත්‍රණය නිර්මාණය කිරීම. |
| | | 13.1.3. ලබාදෙන සේවාව පිළිබඳව නිසි තක්සේරුවක් සඳහා භාවිත කිරීම පිණිස ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ සිදුවීම් වාර්තා කිරීමට හා නිරීක්ෂණය කිරීම වෙනුවෙන් යාන්ත්‍රණයක් සකස් කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 13.1.4. අධිකරණ හා රජයේ නිලධාරීන්ට අතිරේක වශයෙන් අධ්‍යාපන හා දැනුවත්බව සම්බන්ධ පුහුණුවක් ලබාදීම. (උදා. නීතිය බලාත්මක කරන නිලධාරීන්, සෞඛ්‍ය සේවා සපයන්නන්, සමාජ සේවකයන්, ප්‍රජා නායකයන් හා සාමාන්‍ය ජනතාව) | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව<br>අධිකරණ සේවා කොමිසම<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අධිකරණ හා මහජන නිලධාරීන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම. |
| | | 13.1.5. පොලිස් කාන්තා හා ළමා කාර්යාංශයේ මෙන්ම සෑම පොලිස් ස්ථානයකම සිංහල සහ දෙමළ යන භාෂා ද්විත්වයෙන්ම කතා කළ හැකි නිලධාරිනියන් අනුයුක්ත කර ඇති බව සහතික කිරීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | භාෂා හැකියාව වර්ධනය කිරීම. |
| | 13.2. ක්‍රියාකාරීව චෝදනා ඉදිරිපත් කිරීම. | 13.2.1. ලිංගික හිංසනය සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් පිහිටුවීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>නීතිපති දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | විශේෂ ඒකකයක් පිහිටුවීම. |
| | | 13.2.2. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇතුළුව, බරපතල අපරාධ සම්බන්ධයෙන් අත්හිටවූ දඬුවම් තහනම් කිරීමට නීති සම්පාදනය කිරීම සහ අපරාධ යුක්ති ක්‍රියාවලියේ පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා, බරපතල අපරාධ සම්බන්ධයෙන් අවම දඬුවම් පිළිබඳ සංකල්පය හඳුන්වාදීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව<br>අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | නීති සම්පාදන හඳුන්වා දීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 13.3. ඵලදායී අධිකරණ හා ක්වාසි අධිකරණ ප්‍රතිචාර. | 13.3.1. විනිසුරුවරුන්ගේ පුහුණු වැඩසටහන් සඳහා කාන්තාවන් සහ ගැහැණු ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ද සාකච්ඡාවට ලක් කෙරෙන පුළුල් විෂයමාලාවක් හඳුන්වාදීම. | අධිකරණ සේවා කොමිසම | කෙටි කාලීන | ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ විෂය මාලාවක් හඳුන්වාදීම. |
| | | 13.3.2. කාසි විනිශ්වයකරුවන් පත්කිරීමට පෙර ඔවුන්ගේ පුහුණුවේ කොටසක් ලෙස කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ විෂයමාලාවක් සකස් කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විෂයමාලාව සකස් කිරීම. |
| | | 13.3.3. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, ඒ හා බැඳුණු පවුල් සම්බන්ධතා සමඟ ගනුදෙනු කිරීම පිළිබදව, අර්ධ විනිසුරුවන් සඳහා පැහැදිලි මාර්ගෝපදේශ සකස් කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | මාර්ගෝපදේශ සකස් කිරීම. |
| | 13.4. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම. | 13.4.1. වින්දිතයන් හට ආරක්ෂාව සැලසෙන නිසි යාන්ත්‍රණයක් මෙන්ම එය ක්‍රියාත්මකවීම පිළිබඳ පැහැදිලි අර්ථකථනයක් ලබා දීම සඳහා වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත සමාලෝචනය හා සංශෝධනය. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ නීතිය යළි සැකසීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 13.5. යුක්ති ක්‍රියාදාමයේ වෙනස්වීම. | 13.5.1. අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටියදී පිරිමින් සහ කාන්තාවන් ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වධහිංසාවන්ට ලක් කළ අපරාධකරුවන්ට එරෙහිව විශ්වසනීය අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකිරීමට පියවර ගැනීම. | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | පරීක්ෂණයක් සිදුකිරීම සඳහා පවතින ක්‍රම. |
| | | 13.5.2. විශේෂයෙන් ගැටුම් සමයේ පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව විසින් සිදුකළ බව කියන ප්‍රචණ්ඩ ක්‍රියා චෝදනා සම්බන්ධයෙන් පියවර ගැනීම. | ආරක්ෂක අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | චෝදනාවන් සාකච්ඡාවට බඳුන් කිරීම. |
| | | 13.5.3. නිසි රෙගුලාසි සහ සංශෝධන සිදුකරමින්, 2006 අංක 4 දරන ජිනීවා සම්මුතිය ක්‍රියාත්මක කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | ජිනීවා සම්මුතිය ක්‍රියාත්මක කිරීම. |
| | 13.6. ප්‍රචණ්ඩත්වයට බඳුන් වූ වින්දිතයන්ට සහාය වීම. | 13.6.1. ප්‍රචණ්ඩත්වයෙන් විපතට පත්වූවන් සඳහා රාජ්‍ය අනුග්‍රහය යටතේ වාසස්ථාන පිහිටුවීම සහ, ඒවා ඇතුළු පවතින වාසස්ථාන නඩත්තු කරමින් ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>රාජ්‍ය නොවන සංවිධාන | කෙටි කාලීන | ප්‍රමාණවත් වාසස්ථාන සංඛ්‍යාවක් ස්ථාපනය කිරීම. |
| | | 13.6.2. අපරාධකරුවන් ඇතුළුව, ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත්වූවන්ට මනෝ-සමාජයීය සහාය ලබාදීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | මනෝ සමාජයීය සහාය ලබාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 14. කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාකච්ඡාවට බඳුන් කිරීමේදී ආංශික මැදිහත්වීම. | 14.1. වෙනත් අංශවල ඵලදායී ප්‍රතිචාර. | 14.1.1. ලිංගික අපරාධ පිළිබඳ විමර්ශනය සහ පැමිණිලි මෙහෙයවන, විපතට පත්වූවන් ආරක්ෂා කරන විවිධ ආයතන අතර සම්බන්ධීකරණය සහතික කිරීමට මාර්ගෝපදේශ සකස් කිරීම සහ එක් එක් නියෝජිතායතනයේ වගකීම් පැහැදිලි කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | මාර්ගෝපදේශ සකස් කිරීම. |
| | | 14.1.2. අත්අඩංගුවේ පසුවන, බන්ධනාගාරගතව සිටින අපරාධකරුවන් සඳහා, අධිකරණ ක්‍රියාවලිය හරහා අනිවාර්ය මානසික පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | මනෝ සමාජයීය පුනරුත්තාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| | | 14.1.3. ලිංගික අපරාධ සම්බන්ධයෙන් වරදකරුවන් කරනු ලැබූවන් පිළිබඳ ලේඛනයක් සකස් කර, අඛණ්ඩ නියාමනය මගින් එවැනි අපචාර නැවත සිදුවීම වැළැක්වීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>අධිකරණ සේවා කොමිසම | මධ්‍ය කාලීන | ලේඛනයක් සකස් කර අධීක්ෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 14.2. වගවීම. | 14.2.1. කාන්තා සහ ළමුන් සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට, ගිවිසුම්ගත ආයතන විසින් අවසන් කළ නිරීක්ෂණ පිළිබඳ වාර්තා කිරීම සඳහා විශේෂිත අංශයක් ස්ථාපිත කිරීම, එම වාර්තාවල අවසන් නිරීක්ෂණ සියලු රාජ්‍ය නියෝජිතායතන හා සම්බන්ධ කර, ඒවා අදාළ අමාත්‍යාංශ වෙත යවන බවට සහතික වෙමින්, පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී ඒවා අනිවාර්යයෙන් සැලකිල්ලට ගැනීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | විශේෂ අංශය ස්ථාපනය කිරීම. |
| | 14.3. ලේඛනගත කිරීම. | 14.3.1. අදාළ සියලුම රජයේ ආයතන හරහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ දත්ත එකතු කිරීම සඳහා ක්‍රමයක් නිර්මාණය කිරීම සහ එම ක්‍රමය නඩත්තුකරගෙන යාම සඳහා එක් ආයතනයක් වෙත වගකීම පැවරීම. | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | ක්‍රමවේදයක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 15. නිවසේ කාන්තා ගෘහමූලිකයා (FHH) පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම. | 15.1. නිවසේ කාන්තා ගෘහමූලිකයන්ගේ මූලික අවශ්‍යතා ඉටුකිරීම සඳහා ඒකරාශී වූ සහ සාකල්‍ය ආකාරයකින් රාජ්‍ය මට්ටමේ ප්‍රතිචාරයේ වර්ධනයක් අත්කර ගැනීම සහ ක්‍රියාත්මකවීම. | 15.1.1. නිවසේ කාන්තා ගෘහමූලිකයා (FHH) කවුද යනුවෙන් නිල අර්ථකතනයක් ලබාගැනීමට නිවසේ කාන්තා ගෘහමූලිකයා පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ විවිධ කාණ්ඩ සම්බන්ධයෙන් සියලුම රජයේ ආයතනවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම. | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | මාර්ගෝපදේශ නිකුත් කිරීම. |
| | | 15.1.2. නිවසේ කාන්තා ගෘහමූලිකයා පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ විවිධ කාණ්ඩ පිළිබඳ දත්ත සංචිතයක් පවත්වා ගෙනයාම සහ විධිමත් පරිදි යාවත්කාලීන කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | දීර්ඝ කාලීන | දත්ත සංචිතයක් නිර්මාණය කිරීම හා නිවසේ කාන්තා ගෘහමූලිකයා පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ විවිධ කාණ්ඩ සිතියම්ගත කිරීම සම්පූර්ණ කිරීම. |
| | | 15.1.3. පවුලේ සාමාජිකයින්ගේ සහ කාන්තා ගෘහ මූලිකයන්ගේ අවශ්‍යතා මත පදනම්ව, කාන්තා ගෘහ මූලිකයන් වෙත සමාජ ආරක්ෂක ප්‍රතිලාභ සැලසීම. | සමාජ සවි බලගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | මූල්‍ය හා වෙනත් ආකාරයේ සහාය සඳහා නිර්ණායක සකස් කිරීම. |
| | | 15.1.4. ආබාධිත කාන්තා ගෘහ මූලිකයෙකු සිටින පවුල් වෙත හා ආබාධිත සාමාජිකයන් සිටින කාන්තා ගෘහ මූලික පවුල් වෙත (FHH) ඉලක්කගත මූල්‍ය සහ වෙනත් ආකාරයේ සහාය ලබාදීම. | සමාජ සවිබලගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | මූල්‍ය හා වෙනත් ආකාරයේ සහාය සඳහා කාල රේඛාවක් හා සැලසුමක් සකස් කිරීම. |
| | | 15.1.5. වයස අවුරුදු 70 ට වැඩි සහ තරුණ පරිණත මට්ටම නොඉක්මවූ වැඩිහිටි කාන්තා ගෘහ මූලික පවුල්වල අවශ්‍යතා මත, ජීවනෝපාය අවස්ථාවන් ඇතුළුව මූල්‍ය සහ වෙනත් ආකාරයේ සහාය ලබාදීම. | සමාජ සවි බලගැන්වීමමේ හා සුබසාධන අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | සහාය ලබාදීමට අදාළ නියෝග |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 16. කාන්තා ගෘහමූලිකයන් ඇතුළුව, යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් අතර දිළිදුකම අවම කිරීම සඳහා ජීවනෝපාය හා වෙනත් ආදායම් ඉපැයීමේ මාර්ග සැකසීම. | 16.1. යුධයෙන් පීඩාවට පත් වූ කාන්තාවන්ගේ, කාන්තා ගෘහ මූලිකයන් සහ ඔවුන්ගේ පවුල්වල දරිද්‍රතා මායිම අවම කිරීම. | 16.1.1. ජීවනෝපාය මාර්ගයක් සහ සුරක්ෂිත ආදායම් මාර්ගයක් සහතික කිරීම සඳහා කාන්තා ගෘහ මූලිකයන්ට ආර්ථිකමය වාසි සැලසෙන අවස්ථාවන් උදා කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>සමාජ බලගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | කාන්තා ගෘහ මූලිකයන් වෙත ලබාදුන් ආර්ථිකමය වාසි සහිත අවස්ථා. |
| | | 16.1.2. යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් සහ කාන්තා ගෘහ මූලිකයන් අතර දරිද්‍රතාව සහ ණයගැතිභාවය සාකච්ඡාවට බඳුන් කිරීම සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම. | සමාජ බලගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම ස්ථාපනය. |
| | | 16.1.3. සම අයිතිය තබාගනිමින් රජය වෙනුවෙන් වෙන් කළ ඉඩම් කාන්තා ගෘහ මූලිකයන් සඳහා ලබාදීම. | ඉඩම් අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සම හිමිකම් යටතේ ලබාදුන් ඔප්පු වෙන් කිරීම. |
| | | 16.1.4. කාන්තා ගෘහ මූලිකයන් ඇතුළුව, යුද්ධයෙන් පීඩාවට පත්වූ කාන්තාවන්ගේ රැකබලාගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම. (උදා - දරුවන් රැකබලා ගැනීම, වැඩිහිටියන්ට උපකාර කිරීම, මානසික සහ සමාජයීය සහාය.) | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>සමාජ සවි බලගැන්වීමේ හා සුබසාධන අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | සත්කාර කටයුතු සඳහා සහාය ලබාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 17. අතුරුදන්වූවන්, නැතිවූ අය පිළිබඳ රාජ්‍ය වගවීම් ක්‍රියාවලිය, තහවුරු කිරීම සඳහා කාන්තා ගෘහමූලිකයන් ඇතුළු පවුලේ සාමාජිකයන්ට ඒ වෙනුවෙන් විසඳුම් හා සහන ලබාදීම. | 17.1. කාන්තා ගෘහමූලික පවුලක සාමාජිකයෙකු නැතිවී හෝ අතුරුදන් වී ඇති අවස්ථාවක ඔවුනට ඒ පිළිබඳ සත්‍ය දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම. | 17.1.1. කාන්තා ගෘහ මූලිකයින්ට ඉඩම් සඳහා අයිතිය සහ එයට හිමිකම, ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම සහ දේපල හුවමාරු කිරීම වැනි සේවා සහ සම්පත් සඳහා ප්‍රවේශය ඇතුළුව, නැති වූ හෝ අතුරුදන් වූ පුද්ගලයින්ගේ පවුල්වලට සහායවීම සඳහා නුදුටු සහතික ඇතුළුව සුදුසු නීති සහ ප්‍රතිපත්ති හඳුන්වාදීම. | අධිකරණ අමාත්‍යාංශය<br>සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය<br>ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය | මධ්‍ය කාලීන | නොපැමිණීමේ සහතික නිකුත් කිරීම සඳහා විධි විධාන. |
| | | 17.1.2. කාන්තා ගෘහ මූලිකයන් සිටින නිවෙස්වල නැති වූ හෝ, අතුරුදන් වූ පවුලේ සාමාජිකයින් පිළිබඳ දැනට පවතින තොරතුරු ක්‍රමවත්ව, අතුරුදන් වූ පුද්ගලයින් පිළිබඳව සොයා බලන කාර්යාලය (OMP) හරහා රජය විසින් ලබාදිය යුතුය. | අතුරුදන් වූවන් පිළිබඳව සොයා බලන කාර්යාලය<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි කාලීන | නැති වූ හා අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු සැපයීම. |
| | | 17.1.3. ගැටුම්වලින් පීඩාවට පත්වූ කාන්තාවන්, ඉන් ජීවිත අහිමි වූ හෝ අතුරුදන්වූවන්ගේ, ක්‍රියාන්විතයේදී නැති වූ අයගේ පවුල්වල සාමාජිකයින් සහ කාන්තා ගෘහ මූලිකයින් වෙත මනෝ - සමාජයීය සේවා සහ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයේ සිදුවන වෙනස්වීම් සඳහා ප්‍රවේශයන් සකසා දිය යුතුය. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | මනෝ සමාජයීය සේවා සැලසීම. |
| | | 17.1.4. අතුරුදන්වූවන්ගේ පවුල් සඳහා හිමි වන්දි පිළිබඳ තොරතුරු කාන්තා ගෘහ මූලිකයන්ට ඔවුන්ට හුරු භාෂාවෙන් ලබාදීම. | ආරක්ෂක අමාත්‍යාංශය<br>ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | තොරතුරු ලබාදීම / වන්දි ලබාදුන් අවස්ථා සංඛ්‍යාව. |
| | | 17.1.5. අතුරුදන්වූවන්ගේ පවුල් වෙත නීති ආධාර සේවා ලබාදීම. | නීති ආධාර කොමිෂන් සභාව | මධ්‍ය කාලීන | නීති ආධාර ලබාදුන් අවස්ථා ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 18. කාන්තා ගෘහ මූලිකයන් ඇතුළුව යුද්ධයෙන් පීඩාවට පත්වූ කාන්තාවන්, ලිංගික සූරාකෑම්වලින් හා ඊට සම්බන්ධ ප්‍රචණ්ඩත්-වයෙන් බේරා ගැනීම සඳහා ආයතනික මට්ටමෙන් ක්‍රියාත්මක යාන්ත්‍රණයක් සහ පුද්ගල කණ්ඩායම් ශක්තිමත් කිරීම. | 18.1. CEDAW ප්‍රතිඥා අනුව යමින් යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් ප්‍රචණ්ඩත්වයෙන් සහ ලිංගික සූරාකෑම වැළැක්වීම. | 18.1.1. පුහුණුව ලත්, ආචාරධර්ම හා බැඳුණු කාන්තා පොලිස් නිලධාරිනියන්, අධිකරණ වෛද්‍ය නිලධාරීන්, මහෙස්ත්‍රාත්වරුන් සහ උපදේශකයින් ලිංගික ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ ක්‍රියාවලියේ නීති බලගැන්වීමට ඉඩ යොදාගැනීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන |
| | | 18.1.2. කාන්තා ගෘහ මූලික පවුල් වෙත ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය සිදුකළ ආරක්ෂක නිරීක්ෂණ චාරිකාවලදී කාන්තා නිලධාරිනියකගේ පැමිණීම තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | මාර්ගෝපදේශ සංවර්ධනය |
| 19. කාන්තා ගෘහමූලිකයින් ඇතුළුව යුද්ධයෙන් පීඩාවට පත්වූ කාන්තාවන් සංක්‍රාන්තික යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ සිදුවන වෙනස්කම්වලට සහභාගි කරවීම. | 19.1. ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී වෙනස්කම් සහිත සංක්‍රාන්තික යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මකය. | 19.1.1. නීතියේ යථාර්ථයට ඇති පිළිගැනීම ඇතුළුව, ඔවුන් විසින් මුහුණදුන් විශේෂිත මානව හිමිකම් කඩකිරීම් සාකච්ඡාවට බඳුන් කෙරෙන, විශේෂිත සහ ඉලක්කගත වෙනස්කම් සහිත සංක්‍රාන්තික යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමේදී කාන්තා ගෘහ මූලිකයන් සමඟ උපදේශන පැවැත්විය යුතුය. | සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය | මධ්‍ය කාලීන | පැවැත්වූ උපදේශන ගණන<br>මනෝ සමාජයීය සහාය හා උපදේශනය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 20. යුද්ධයේ දී මියගිය හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට රජයෙන් ලබාදෙන සේවා. | 20.1. යුද්ධයේදී මිය ගිය හමුදා නිලධාරීන්ගේ වැන්දඹුවන්ට, යුද්ධයේ දී අතුරුදන් වූ ආරක්ෂක නිලධාරීන්ගේ වැන්දඹුවන්ට සහ පවුල්වලට සහන සඳහා දැනට පවතින යාන්ත්‍රණ ශක්තිමත් කර තිබෙනවා සේම ඒවාට ප්‍රවේශවීමේ අයිතිය ද තහවුරු කර ඇත. | 20.1.1. හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක සේවාවන්හි නිරතව සිටියදී මියගිය නිලධාරීන්ගේ වැන්දඹුවන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා වන රෙගුලාසි, ඔවුන්ගේ ලිංගික, ප්‍රජනන අයිතීන් ඇතුළුව රහස්‍යභාවය, ගෞරවය රැකෙන බව සහතික වන පරිදි ප්‍රතිශෝධනය විය යුතුය. | සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>රණවිරු සේවා අධිකාරිය | කෙටි කාලීන | රෙගුලාසි ප්‍රතිශෝධනය. |
| | | 20.1.2. යුද්ධයේදී මිය ගිය හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට, ආබාධිත රණවිරුවන්ගේ බිරින්දෑවරුන්ට පුහුණුව ලත් නිලධාරීන් හරහා මනෝ - සමාජයීය සහ උපදේශන සේවා ලබාදීම සිදු කිරීම. | රණවිරු සේවා අධිකාරිය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | මනෝ - සමාජයීය සහාය සහ උපදේශන සේවා ලබාදුන් අවස්ථා ගණන. |
| 21. හිටපු කාන්තා සෙබළියන් නැවත සමාජගත කිරීම. | 21.1 හිටපු කාන්තා සෙබළියන් සමාජය විසින් පිළිගැනීම. | 21.1.1. අවශ්‍යතාව මත පදනම් ව මානසික, සමාජීය සහාය සහ උපදේශන ලබාදීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>රණවිරු සේවා අධිකාරිය | කෙටි කාලීන | හිටපු කාන්තා සෙබළියන් වෙත ලබාදුන් උපදේශන සේවා. |
| | | 21.1.2. ජීවනෝපාය මාර්ග, නිවාස සහ වාසස්ථාන අවශ්‍යතා සඳහා අඩු පොළී ණය පහසුකම් ලබාදීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය | මධ්‍ය කාලීන | ණය ලබාදුන් වාර ගණන |
| | | 21.1.3. අගතියට පත් නොවී, කොන් කිරීමකින් තොරව, නැවත සමාජගත කිරීම සඳහා කාන්තා හැකියාවන් සඳහා ලිංග භේදය හා සංවේදී සමාජගත කිරීමේ යාන්ත්‍රණයක් සුරක්ෂිත කරමින් එහි සහාය හිමිකර දීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය | මධ්‍ය කාලීන | නැවත සමාජගත කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 22. නැවත පැමිණීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්, නැවත පදිංචි කිරීම, නැවත සමාජගත කිරීම හා ප්‍රතිසංස්ථාපනය ඔස්සේ අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ ගැටලුවට උපදේශන ක්‍රියාවලිය හරහා යෝග්‍ය ප්‍රතිපත්ති සම්පාදනය. | 22.1. නැවත පැමිණීම, නැවත පදිංචිකිරීම, සමාජගත කිරීම සහ ප්‍රතිසංස්ථාපනය යන කරුණු සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී ජාතික ප්‍රතිපත්ති. | 22.1.1. නැවත පැමිණීම, නැවත පදිංචි කිරීම සහ අභ්‍යන්තරව අවතැන්වූවන් යළි සමාජගත කිරීම විධිමත්ව සිදු කළ යුතු, ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී පරිපූර්ණ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කළ යුතුය. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. |
| | | 22.1.2. අභ්‍යන්තරව අවතැන්වූ කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ඔවුන් නැවත පදිංචි කිරීම සහතික කරන බව තහවුරු කරන පරිපූර්ණ කාර්යය සැලැස්මක් සකස් කළ යුතුය. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී ක්‍රියාවලියක් සකස් කිරීම. |
| | | 22.1.3. ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ දෘෂ්ටිකෝණයකින් පශ්චාත් යුද ප්‍රතිසංස්කරණ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා කාන්තාව සහභාගී වන අවස්ථා ගණන. |
| | | 22.1.4. ගැටුම්වලින් පීඩාවට පත්වූ කාන්තාවන් පශ්චාත් යුධ ගැටුම් සංවර්ධන ක්‍රියාවලියෙහි, පුනුරුත්තාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා දායක කරගත යුතුය. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා කාන්තාව සහභාගී වන අවස්ථා ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 23. අධ්‍යාපනයේ සියලු මට්ටම් සඳහා ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී ප්‍රතිපත්ති හඳුන්වාදීම. | 23.1. විධිමත් අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂභාවයේ කාර්යභාරය ඒකාකාරීවීම අවම කිරීම. | 23.1.1. පෙළ පොත්, විෂය මාලා සහ වෙනත් ලේඛනවල ස්ත්‍රී පුරුෂභාවී කාර්යන්ගේ ඒකාකාරීත්වය සම්බන්ධයෙන් අධ්‍යනයක් ඇතුළත් කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටි කාලීන | අධ්‍යනයක් ඇතුළත් කිරීම |
| | | 23.1.2. පෙළ පොත්, විෂය මාලා හා වෙනත් අධ්‍යන ලේඛනවලින් හා ක්‍රියාකාරකම්වලින් ස්ත්‍රී පුරුෂභාවී කාර්යයන් සම්බන්ධ ඒකාකාර ආකෘතීන් ඉවත් කිරීම හා විධිමත් පාසල් විෂයමාලාවන්ට, ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට ස්ත්‍රී පුරුෂභාවී කාර්යයන් ඒකාකාර කිරීම් වළකාලන කාර්යයන් ඇතුළත් කිරීමට පියවර ගැනීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය | මධ්‍ය කාලීන | පෙළපොත්, විෂයමාලා හා අනෙකුත් ලේඛනවල ප්‍රධාන ධාරාවේ ස්ත්‍රී පුරුෂභාවයේ තුලනයක් සිදු කිරීම. |
| 24. තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමානව ප්‍රවේශවීමේ අවස්ථා සහතික කිරීම. | 24.1. වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපනයේ ගැහැණු ළමුන්ගේ සහභාගිත්වය වැඩි කිරීම. | 24.1.1. විශේෂයෙන් වර්ධන ක්ෂේත්‍රය ඇතුළුව රැකියා වෙළඳපොලේ ඉල්ලුමක් පවතින පාඨමාලා සඳහා ගැහැණු ළමුන්ගේ සමාන සහභාගිත්වය. | කර්මාන්ත අමාත්‍යාංශය<br>ආයෝජන මණ්ඩලය<br>පුද්ගලික අංශය | දීර්ඝ කාලීන | රැකියා වෙළඳපොලේ ඉල්ලුමක් පවතින පාඨමාලා සඳහා ගැහැණු ළමුන්ගේ සහභාගිත්වය සියයට 40%කින් වැඩි කිරීම. |
| | | 24.1.2. පුහුණු සහ සුදුසුකම්ලත් කාන්තාවන් හට ශ්‍රම වෙළෙඳපොළට සමාන ප්‍රවේශයක් ලැබීම ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ නියෝජිතයෙකු සහභාගි කරවීම. | කර්මාන්ත අමාත්‍යාංශය<br>ආයෝජන මණ්ඩලය<br>පුද්ගලික අංශ | මධ්‍ය කාලීන | සහභාගිත්වය සියයට 40%කින් වැඩි කිරීම. |
| | 24.2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වෙත ප්‍රවේශය වැඩි කිරීම. | 24.2.1. පරිගණක සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළ පුහුණුවක් සහ අධ්‍යාපනයක් ලැබීමට ගැහැණු ළමුන් ධෛර්යමත් කිරීම. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ගැහැණු ළමුන්ගේ සහභාගිත්වය සියයට 50%කින් වැඩි කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 25. ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් සඳහා ප්‍රවේශය සහතික කිරීම. | 25.1. සිසුන් අතර ජීවන කුසලතා සහ නිපුණතා ශක්තිමත් කිරීම. | 25.1.1. සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපන යේ කොටසක් ලෙස ලිංගිකත්වය සහ ප්‍රජනන සෞඛ්‍යය ඉගැන්වීම සඳහා අන්තර්ක්‍රියාකාරී මොඩියුල සකස් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටි කාලීන | මොඩියුල සකස් කිරීම. |
| | | 25.1.2. ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ ළමුන් හා දෙමව්පියන් අතර දැනුවත්භාවයක් ඇති කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | මධ්‍ය කාලීන | ළමුන්, දෙමව්පියන් අතර දැනුවත්භාවය ඇති කිරීම. |
| 26. දේශපාලන ව්‍යුහය තුළ මෙන්ම තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී කාන්තා සහභාගිත්වය වැඩි කිරීම. | 26.1. පාර්ලිමේන්තුවේ සහ පළාත් සභාවල අවම වශයෙන් 1/3 ක කාන්තා නියෝජනයක් සහතික කිරීම. | 26.1.1. පාර්ලිමේන්තුවේ සහ පළාත් සභාවන්හි කෝටා ක්‍රමයක් සඳහා විධිවිධාන සැකසීම සඳහා දේශපාලන පක්ෂ සමඟ නිරන්තරයෙන් කටයුතු කරමින් ඔවුන් වෙත පීඩනයක් එල්ල කිරීම. | ලිංගභේදය සඳහා වූ පාර්ලිමේන්තු කමිටු<br>ජාතික කාන්තා කමිටුව<br>මැතිවරණ කොමිසම<br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුවේ කාන්තා දේශපාලන බල මණ්ඩල | කෙටි කාලීන | කෝටා ක්‍රමය සඳහා අවශ්‍ය නීති සංශෝධනය සිදු කිරීම. |
| | | 26.1.2. දේශපාලනයට පිවිසීමට අපේක්ෂා කරන කාන්තාවන්ගේ නිපුණතා වැඩි කිරීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම. | ජාතික කාන්තා කමිටුව<br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>රාජ්‍ය නොවන සංවිධාන | මධ්‍ය කාලීන | දේශපාලනයට පිවිසීමට අපේක්ෂා කරන කාන්තාවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම. |
| | | 26.1.3. පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වෙත කාන්තාවන්ට පිවිසීම සඳහා, නාමයෝජනා සහ පත්වීම් සම්බන්ධ මාර්ගෝපදේශ සකස් කිරීම ප්‍රවර්ධනය කිරීම. | ජාතික කාන්තා කමිටුව<br>මැතිවරණ කොමිසම | කෙටි කාලීන | මාර්ගෝපදේශ සකස් කිරීම හා ඒවා දේශපාලන පක්ෂ විසින් පිළිගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 26.2. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ඉහල මට්ටමේ තීරණ ගැනීමේ කාර්යය සඳහා කාන්තාවන් පත්කිරීමට සමාන අවස්ථා සහතික කිරීම. | 26.2.1. කුසලතාව මත පත්කිරීම සහ උසස්වීම් සිදුකෙරෙන ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය<br><br>පුද්ගලික අංශය | කෙටි කාලීන | ප්‍රතිපත්තිය සැකසීම හා ක්‍රියාත්මක කිරීම. |
| | 26.3. අවම වශයෙන් කාන්තාවන්ගෙන් 1/3 ක් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට පත්කිරීමට අදාළ විධි විධාන ක්‍රියාත්මක කිරීම. | 26.3.1. සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාන්තා නියෝජනය සඳහා අවම වශයෙන් 1/3 ක් වෙන්කිරීමට ප්‍රතිපත්තියක් හඳුන්වාදීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>මුදල් අමාත්‍යාංශය<br><br>ආයෝජන මණ්ඩලය<br><br>පුද්ගලික අංශය | මධ්‍ය කාලීන | මාර්ගෝපදේශ සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම. |

# අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් සහ ආපසු පැමිණි සරණාගතයින්ගේ අයිතිවාසිකම්

## අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් සහ ආපසු පැමිණි සරණාගතයින්ගේ අයිතිවාසිකම්

යුධ ගැටුම්, ස්වාභාවික විපත්, සංවර්ධනය සහ අදාළ කරුණු හේතු කොටගෙන ශ්‍රී ලංකාව අභ්‍යන්තර අවතැන්වීම සම්බන්ධ ගැටළුවලට විවිධ අවස්ථාවන්හිදී මුහුණ පා ඇත. යුද්ධය අවසාන වීමේ සිට, යුද්ධයෙන් පීඩාවට පත් අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ගේ අවශ්‍යතා සාකච්ඡාවට බඳුන් කිරීමට සහ එම සංඛ්‍යාව අවම කිරීමට වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත. විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල තම නිවාසවලට ආපසු යාමට නොහැකි අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් දස දහස් ගණනක් සිටියි. තමන්ගේ මුල් ගම් බිම් ප්‍රදේශ වෙත නැවත පැමිණීමේ අපේක්ෂාවෙන්, විශාල සරණාගතයන් සංඛ්‍යාවක් ඉන්දියාවේ සිටින අතර ඔවුන් තම මවුබිම වෙත පැමිණීමට අපේක්ෂා කරයි.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම පිණිස, ශ්‍රී ලංකා රජය විසින් විශේෂ පියවර ගෙන තිබෙන අතර, යුද්ධයෙන් පීඩාවට පත්වූවන් අභ්‍යන්තරව අවතැන්වීම සම්බන්ධයෙන් කල්පවත්නා විසඳුමකට අදාළ පරිපූර්ණ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, රජය විසින් උතුරු හා නැගෙනහිර අත් කරගෙන සිටි ඉඩම් ඒවායේ මුල් හිමිකරුවන්ට ලබාදීම, ආධාර, ජීවනෝපාය සහ නිවාස ලබාදීම, ඉඩම් හිමිකම් සහ ඉඩම්වල බිම්බෝම්බ ඉවත්කිරීමට ක්‍රියාමාර්ග ගැනීම මීට ඇතුළත් වේ. ඊට අමතරව, තවදුරටත් ඉඩම් මුදාහැරීමට බැඳී සිටින අතර වන්දි ලබාදීම වෙනුවෙන් කාර්යාලයක්ද ස්ථාපිත කර ඇත.

අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව අවම කිරීම තුළ යම් ප්‍රගතියක් අත්කර ගෙන තිබුණද, තවමත් බොහෝ අභියෝග පවතී. ඒවාට අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් සහ සරණාගතයින්ගේ සංඛ්‍යාව වැඩිවීම, නිල වශයෙන් නැවත පදිංචි කළ ප්‍රජාව සඳහා කල්පවත්නා විසඳුම් ලබාදීම, ඉඩම්වල පදිංචිය සහ ඉඩම් ආරාවුල් වැඩිවීම, නීති සහ ප්‍රතිපත්ති රාමු ප්‍රතිශෝධනය, සමාන සහයෝගය ලබාදීම සහ ඉන්දියාවේ සිට පැමිණි සරණාගතයින් ඇතුළුව විශේෂ අවධානමට ලක්විය හැකි පුද්ගලයින් සාකච්ඡාවට බඳුන් කිරීම ඇතුළත් වේ.

මෙයට අමතරව, ස්වාභාවික විපත් සහ සංවර්ධන කාර්යයන් තුළින් සිදුවන අවතැන්වීමේ ගැටළු විසඳීම සඳහා පරිපූර්ණ ප්‍රතිපත්තිමය සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වී ඇත.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන සරණාගතයින් ද ඇතුළුව, අවතැන්වීමේ ගැටළුව විසඳීම සඳහා ප්‍රතිපත්ති හා නීති රාමුවක් සකස් කිරීම. | 1.1. අභ්‍යන්තර අවතැන්වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්මවලින් උපුටා ගනු ලැබූ පවතින රාමුව සමාලෝචනය කිරීමෙන් පසු, ආපදාවන් හෝ සංවර්ධන ක්‍රියාවලිය හේතු කොට ගෙන අවතැන් වූ පුද්ගලයින් සඳහා පරිපූර්ණ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම. | 1.1.1. ගැටළුවට මුහුණ පා සිටින හෝ එවැනි අවදානමක් පවතින කණ්ඩායම් සමඟ පුළුල් උපදේශන. | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය,<br>ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ සහයෝගීත්වයෙන් අනෙකුත් අමාත්‍යාංශ, පළාත් සභා සහ අනෙකුත් අදාළ ආයතන | කෙටි කාලීන | උපදේශන පැවැත්වීම. |
| | | 1.1.2. පවත්නා වැඩපිළිවෙල සමාලෝචනය. | | | නීති රාමුව සමාලෝචනය අවසන් කිරීම. |
| | | 1.1.3. ප්‍රතිපත්තිය සකස් කිරීම. | අමාත්‍ය මණ්ඩලය | කෙටි කාලීන | ප්‍රතිපත්තිය ප්‍රසිද්ධ කිරීම. |
| | 1.2. ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින ක්‍රියාපටිපාටි සමාලෝචනයෙන් පසු ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම. | 1.2.1. දැනට පවතින වැඩපිළිවෙල සමාලෝචනය. | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය<br>ආපදා කළමණාකරණ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව අනෙකුත් අමාත්‍යාංශ සහ පළාත් සභා | කෙටි කාලීන | ක්‍රියාපටිපාටි සමාලෝචනය. |
| | | 1.2.2. අලූත් ක්‍රියා පටිපාටි පිළියෙල කිරීම. | | කෙටි කාලීන | ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.3. අවතැන්වීම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සහ ස්වේච්ඡාවෙන් තොර නැවත පදිංචි කිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සක්‍රීය කිරීම සඳහා නීති සංශෝධනය කිරීම. | 1.3.1. නීති සමාලෝචනය කිරීම. | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව අනෙකුත් අමාත්‍යාංශ (ආරක්ෂක අමාත්‍යාංශය සහ පළාත් සභා) | මධ්‍ය කාලීන | සමාලෝචිත නීති. |
| | | 1.3.2. නීති සංශෝධනය කිරීම. | | | සංශෝධිත නීති. |
| 2. අභ්‍යන්තරව අවතැන්වූවන් හා නැවත පැමිණෙන්-නන් අතර ඔවුන්ට බලපාන ප්‍රතිපත්තිය (යුද ගැටුම් හේතුවෙන් අවතැන්වූ සහ අනාගත ප්‍රතිපත්ති වෙනුවෙන් කල්පවත්නා විසඳුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියද ඇතුළුව) පිළිබඳ දැනුවත් කිරීම. | 2.1. අභ්‍යන්තර අවතැන්වූවන් හා නැවත පැමිණෙන්නන්ට බලපාන ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම. | 2.1.1. සියලුම පාර්ශ්වකරුවන් වෙත ජාතික ප්‍රතිපත්තිය බෙදා හැරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | තොරතුරු ප්‍රචාරණය සම්බන්ධයෙන් විස්තර ලියා පදිංචි කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 3. ප්‍රතිපත්ති ව්‍යාපෘති සම්බන්ධීක-රණය ක්‍රමවත්ව සිදුවීම පිළිබඳ සහතික වීම. | 3.1. ප්‍රතිපත්ති සමග ව්‍යාපෘති සම්බන්ධීකරණය ක්‍රමවත්ව සිදුවීම පිළිබඳව සහතික වීම. | 3.1.1. සම්බන්ධීකරණ නියෝජිතයා ලෙස නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය සහභාගි කරගනිමින් අන්තර් - අමාත්‍ය කමිටුවක් ස්ථාපනය කිරීම. | අමාත්‍ය මණ්ඩලය<br><br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබද අමාත්‍යාංශය | කෙටි කාලීන | අන්තර් අමාත්‍ය කමිටුවක් ස්ථාපිත කිරීම.<br><br>අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ ගැටළු පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පිළිබදව ක්‍රමවත් නිරන්තර යාවත්කාලීනයක් පවත්වාගෙන යාම. |
| 4. යුක්තිය සඳහා ප්‍රවේශය | 4.1. අවතැන්වූවන් සඳහා නීතිමය ලියකියවිලි ලබාගැනීමේ හැකියාව සහතික කිරීම. | 4.1.1. තව දුරටත් අභ්‍යන්තරව අවතැන්වූවන් නොවන, නමුත් ජාතික ප්‍රතිපත්තිය අනුව කල් පවත්නා විසඳුම් සොයාගත නොහැකි පුද්ගලයන් ඇතුළුව අභ්‍යන්තර අවතැන්වූවන් සහ නැවත පැමිණෙන්නන් ලියා පදිංචි කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබද අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෙටි කාලීන | මනාව යාවත්කාලීන වූ ලියාපදිංචියක් සිදු කිරීම. |
| | | 4.1.2. අභ්‍යන්තරව අවතැන්වූවන් සංඛ්‍යාව සහ ඔවුන්ට අවශ්‍ය ලියකියවිලි නිශ්චිතවම දැනගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබද අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෙටි කාලීන | සමීක්ෂණය සිදු කිරීම. |
| | | 4.1.3. ජංගම සේවා මගින් උප්පැන්න, මරණ, විවාහ සහතික අතුරුදහන් වීමේ සහතික, ජාතික හැඳුනුම්පත, පුරවැසිභාවයට අදාළ ලිපි ලේඛන, පාසල් වලට ඇතුල්වීමේ දී අවශ්‍ය පදිංචිය සනාථ කිරීමේ ලියවිලි, විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අයතීන් සඳහා අදාළ ලියකිවිලි, මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ අනෙකුත් ලියකියවිලි නිකුත් කිරීම. ඊට අමතරව එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන සහ අමාත්‍යාංශය<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | කෙටි කාලීන | ජංගම ඒකකවල විස්තර.<br><br>නිකුත් කරන ලද ලියකියවිලි වර්ගය සහ ගණන පිළිබඳ තොරතුරු |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.1.4. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>අදාළ ලියවිලි බෙදාහැරීම. |
| | | 4.1.5. ඉඩම් අවසර පත්‍ර / ප්‍රදානයන්ට අදාළ ලියකියවිලි අවශ්‍යතාව මත නිකුත් කළ හැකි පරිදි ජංගම ඒකක ක්‍රියාත්මක කළ හැකි අධීක්ෂණ ආයතනයක් ස්ථාපිත කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ඉඩම් අමාත්‍යාංශය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෙටි කාලීන | අධීක්ෂණ ආයතනයක් ස්ථාපිත කිරීම.<br>හසුරුවන ලද සිද්ධි ගණන<br>බෙදා හරින ලද තොරතුරු පැකේජ |
| | 4.2. නිසි වපසරියක් සකස් කිරීම හෝ ක්‍රියාත්මක කළ හැකි ආයතන ස්ථාපිත කිරීම. | 4.2.1. ආයතන ක්‍රියාත්මක කිරීමේ කාර්යයේදී මතුවන යටිතල පහසුකම්, පුහුණුව, නව්‍යකරණය ඇතුළු වපසරියේ හා සම්පත්වල පරතරය හඳුනාගනිමින් ඒවා සාකච්ඡාවට ලක් කිරීම. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය. | කෙටි කාලීන | (අ) සමීක්ෂණය<br>(ආ) පරතර හඳුනාගැනීම<br>(ඇ) ගනු ලැබූ පියවර |
| | 4.3. යුක්තිය සහ නීතිමය සේවාවන් වෙත ප්‍රවේශය සැලසීම. | 4.3.1. මාසික නීති කඳවුරු සහ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ විධි විධානයන්ට අනුව, අවතැන් වූ පුද්ගලයන් සඳහා නොමිලේ නීතිමය ආධාර ලබාගැනීමට හැකි වන පරිදි පවතින නීති ආධාර යාන්ත්‍රණයේ විකාශනයක් සිදු කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>නීති ආධාර කොමිසම | කෙටි කාලීන | නීති ආධාර යාන්ත්‍රණය විකාශනය කිරීම. |
| | | 4.3.2. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියෙන් පසු, අභ්‍යන්තරව අවතැන්වූවන් හට නීති ආධාර ප්‍රවේශය සහතික වීම. | | කෙටි කාලීන | නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියෙන් පසු සන්නිවේදන යාන්ත්‍රණය ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.3.3. ප්‍රතිලාභ සඳහා බලපැවැත්වෙන සියලුම නිර්ණායක කිසිදු ආකාරයක වෙනස්කොට සැලකීමකින් තොරව, විනිවිදභාවයෙන් යුත්, සමානාත්මතාව මත පදනම් වූ විශේෂයෙන්ම ගැටලුවට මුහුණපෑමේ අවදානමක් සහිත කණ්ඩායම් හා කාණ්ඩ ආවරණය වන පරිදි සකස් විය යුතුය. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | නිර්ණායක ප්‍රකාශයට පත් කළයුතු අතර ලබාදුන් ප්‍රතිලාභ පිළිබද වාර්තා විනිවිදබවින් සමන්විත යුතුය. |
| | | 4.3.4. අතුරුදන් වූ පවුලේ සාමාජිකයින් සෙවීමට සහයෝගය - අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය | අධිකරණ අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබද අමාත්‍යාංශය.<br>අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය | කෙටි කාලීන | අභ්‍යන්තරව අවතැන්වූවන්ට අතුරුදන් වූවන් පිළිබද කාර්යාලයට පිවිසීමේ විධි විධාන සැකසීම. |
| | | 4.3.5. වෛද්‍ය ප්‍රතිකාර සහ මනෝ උපදේශන සිට ඔවුන් වෙනුවෙන් නීතිමය කාරණාවලදී පෙනී සිටීම, වෘත්තිය පුහුණු සේවා සැපයීම දක්වා සත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ, ළමා සහ වැඩිහිටි කාණ්ඩ වෙනුවෙන් සහායක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම. | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>පළාත් මට්ටමේ ළමා ආරක්ෂක සහ පරිවාස අධිකාරිය | කෙටි කාලීන | මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.<br>ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| | | 4.3.6. කඩිනමින් වන්දි සඳහා හිමිකම් විභාග කොට තීරණය කිරීම සඳහා විශේෂ අධිකරණ පිහිටුවීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විශේෂ අධිකරණ පිහිටුවීම. හිමිකම් බැහැර කළ අවස්ථා නිරීක්ෂණය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.3.7. පොලීසිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන අභ්‍යන්තර අවතැන්වූවන්ගේ භාෂාවන් ගැන ප්‍රවීණතාවයක් ඇති නිලධාරින්ගෙන් සමන්විත බව තහවුරු කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | භාෂාවේ ප්‍රවීනත්වය දක්වන අයට පත්වීම් ලබාදීම. |
| | | 4.3.8. දිස්ත්‍රික් මට්ටමින් දුක් ගැනවිලි මණ්ඩලයක් පිහිටුවීම | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | දුක්ගැනවිලි මණ්ඩලය ස්ථාපිත කිරීම. |
| | | 4.3.9. දුක් ගැනවිලි කමිටුවේ තීරණවලට එරෙහිව අභියාචනා කඩිනමින් ඉහළ අධිකරණයක විභාග කිරීමට ප්‍රවේශය සැලසීම සඳහා අභියාචන ආයතනයක් ස්ථාපිත කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සුදුසු නීති හඳුන්වා දීම. |
| | | 4.3.10. සෑම ක්‍රියාකාරකමක් සඳහාම නියෝග කර ඇති පරිදි නීතිය සමාලෝචනය කිරීම හා අවශ්‍ය තැනදී යොදාගැනීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.<br><br>ඉඩම් අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සමාලෝචනය සම්පූර්ණ කිරීම.<br><br>අවශ්‍ය නම් නීති සංශෝධනය. |
| 5. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම සහ ආරක්ෂා කිරීම. | 5.1. කැමැත්තෙන් හැරුණවිට, මුල් පදිංචි ස්ථානවලට ආපසු පැමිණීමෙන් තොරව ලියාපදිංචිය හා ඵලදායි සහභාගිත්වයක් සඳහා පහසුකම් සැලසීම. | 5.1.1. ලියාපදිංචිය සහ ඵලදායී සහභාගිත්වය ඇතිකිරීමට, නීති සංශෝධනය කිරීම සඳහා පවත්නා නීතිය සමාලෝචනය කිරීම. | මැතිවරණ කොමිසම<br><br>අමාත්‍ය මණ්ඩලය<br><br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | නීති සමාලෝචනය.<br><br>නීති සංශෝධනය. |
| | | 5.1.2. දැනුවත්භාවය ඇති කිරීම. | මැතිවරණ කොමිසම<br><br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය. | මධ්‍ය කාලීන | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| | | 5.1.3. සංශෝධිත නීති ක්‍රියාත්මක කිරීම | මැතිවරණ කොමිසම | මධ්‍ය කාලීන | ඡන්දය ප්‍රකාශ කිරීමට පහසුකම් ඇතිකිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 6. අවතැන් ජනතාවට ස්ථිර විසඳුමක් ලැබී ඇති බව තහවුරු කිරීම. | 6.1. අවතැන් ජනතාවට ස්ථිර විසඳුමක් ලැබී ඇති බව තහවුරු කිරීම. | 6.1.1. මූලික සමීක්ෂණයක් සිදු කිරීම. | මැතිවරණ කොමිසම<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | සමීක්ෂණ සම්පූර්ණ කිරීම.<br>අභ්‍යන්තරව අවතැන්වූවන් ලියාපදිංචියෙන් ඉවත් කිරීම. |
| | | 6.1.2. පරිපූර්ණ සමීක්ෂණයක් සිදු කිරීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | |
| 7. ඉඩම් නැවත ලබාදීමේ දී ඒවා ප්‍රවේශ විය හැකි / පදිංචි විය හැකි / භාවිත කළ / පාවිච්චි කළ හැකි තත්ත්වයේ පැවතීම. | 7.1. නැවත පැමිණීම් සුරක්ෂිත කිරීම සඳහා ඉඩම් බිම්බෝම්බවලින් තොර බවට සහතික වීම. | 7.1.1. මූලික අධ්‍යයනයෙන් පසුව බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු වේගවත් කිරීම. | මැතිවරණ කොමිසම<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ආරක්ෂක අමාත්‍යාංශය<br>ජාතික බිම්බෝම්බ ඉවත් කිරීමේ මධ්‍යස්ථානය | මධ්‍ය කාලීන | ප්‍රතිශතයක් ලෙස බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල වැඩිවීම. |
| | | 7.1.2. බිම්බෝම්බ සහිත ප්‍රදේශවල වෙසෙන සියලුම දෙනා සඳහා, එහි අනතුරුදායක බව සහ ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි දියුණු කිරීම. | | කෙටි කාලීන | ප්‍රතිශතයක් ලෙස බෝම්බවලට ඉලක්කවූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව.<br>වැඩසටහන් සංඛ්‍යාව. |
| | | 7.1.3. බෝම්බ ඉවත් කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | | කෙටි කාලීන | අධීක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මකය. |
| | 7.2. නැවත පදිංචි කිරීම සඳහා අපේක්ෂිත ඉඩම්වල විශාල ලෙස ගස් වැවී තිබීම, හමුදාව විසින් භාවිත නොකළ ඉදිකිරීම්, සුන්බුන් ආදියෙන් තොර බව සහතික කිරීම. | 7.2.1. ඉඩම් ශුද්ධ කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම. | ආරක්ෂක අමාත්‍යාංශය [හමුදාව විසින් ඉඩම් නිදහස් කරන ප්‍රදේශවල]<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය. | මධ්‍ය කාලීන | වැඩසටහන් ස්ථාපිත කිරීම |
| | | 7.2.2. යාන්ත්‍රික උපකරණ ලබාදීම සහ නැවත පැමිණෙන්නන්ට ඉඩම් ශුද්ධ කිරීමට අවසර ලැබෙන යාන්ත්‍රණයක් සඳහා විධි විධාන සකස් කිරීම. | | කෙටි කාලීන | යාන්ත්‍රණ ස්ථාපිත කිරීම<br>ඉඩම් ශුද්ධ කිරීමට සූදානම් කර තිබෙන උපකරණ කට්ටල ගණන |
| | | 7.2.3. මුල් ගම් බිම් ප්‍රදේශවල (පාරවල්, පාසැල්, ළිං යනාදිය) මූලික යටිතල පහසුකම් පෙර තත්ත්වයට පත් කිරීම. | අදාළ රේඛීය අමාත්‍යාංශ<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | කෙටි කාලීන | පෙර තත්වයට ගෙන ඒම ආරම්භ කර, අවසන් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 8. අන්තර් සහ වෙනස්වන පියවර සඳහා විධි විධාන | 8.1. අතුරු කාලීන නිවාස ලබාදීම | 8.1.1. ඉඩම් සංගණනයක් පැවැත්වීම | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.<br><br>ඉඩම් අමාත්‍යාංශය<br><br>නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | කෙටි කාලීන | අතුරු නිවාස සපයාදීම.<br><br>පරිපූර්ණ නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. |
| 9. අල්ලාගෙන ඇති ඉඩම් නිදහස් කිරීම. | 9.1. අභ්‍යන්තරව අවතැන්වූවන්ට ඉඩම් ප්‍රවේශය සහ හිමි දේ සඳහා ප්‍රවේශයට පහසුකම් සැලසීම. | 9.1.1. මිනින්දෝරු ජනරාල් දෙපාර්තුමේන්තුවේ සේවක සංඛ්‍යාව වැඩි කිරීම සහ පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශයේ මිනින්දෝරුවන් වෙත කොන්ත්‍රාත් ලබාදීම. | ඉඩම් අමාත්‍යාංශය | කෙටි කාලීන | සේවකයින් පුහුණු කිරීමේ අවස්ථා වැඩිකිරීම.<br><br>කොන්ත්‍රාත් පදනම මත මිනින්දෝරුවන් සපයාගැනීම. |
| | | 9.1.2. ඉඩම් සංගණනයක් පවත්වා, අවශ්‍ය පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමෙන් ඉඩම් ලියාපදිංචි කිරීම් යාවත්කාලීන කිරීම. | | | ඉඩම් සංගණනය. |
| | 9.2. හමුදාව සහ පොලිසිය විසින් පරිහරණය කරන ඉඩම් පිළිබඳව සමාලෝචනයක් සිදු කර නැවත ලබාදීම. | 9.2.1. හමුදා පරිහරණය යටතේ පවතින සියලුම ඉඩම් පිළිබඳ පරිපූර්ණ සිතියම්ගත කිරීමක් සිදු කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය<br><br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>ඉඩම් අමාත්‍යාංශය<br><br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්තාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.<br><br>දිස්ත්‍රික් මට්ටමීමේ ක්‍රියාකාරීන්<br><br>අදාළ අනෙකුත් ක්‍රියාකාරීන් | කෙටි කාලීන | සිතියම්ගත කිරීම සම්පූර්ණ කිරීම. |
| | | 9.2.2. ජාතික ආරක්ෂාව හා සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය වන ඉඩම් හඳුනාගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම. | | කෙටි කාලීන | ඉඩම් හඳුනාගැනීම සහ කලින් කලට විමර්ශනය කළ හැකි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| | | 9.2.3. හමුදාව සහ අනෙකුත් අය විසින් ඉඩම් නිදහස් කළ යුතු කාල සීමාවක් සකස් කිරීම. | | කෙටි කාලීන | කාල රාමුවක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 9.3. මුල් ඉඩමට නැවත යාමේ නොහැකියාව. | 9.3.1. මුල් ඉඩම නැවත ලබා දීමට නොහැකි අවස්ථාවක දී, ඒ වෙනුවට ඊට සමාන වටිනාකමකින් යුත් ඉඩමක් හෝ වන්දි මුදලක් ලබාදීමට ප්‍රතිපාදන සකස් කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෙටි කාලීන | වන්දි මුදල් ලබාදීමේ නිර්ණායක භාවිතය සහ ප්‍රසිද්ධ කිරීම.<br>විකල්ප ඉඩම් හෝ වන්දි මුදල් ලබා දීම. |
| | | 9.3.2. සමාජ - ආර්ථික තත්ත්වයන්, ජීවන තත්ත්වයන් සහ ජීවත්වීම, වගා කටයුතු සිදු කිරීම සඳහා විසඳුම් නිර්දේශ කිරීම සඳහා නැවත පදිංචිය සමාලෝචනය කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය. | මධ්‍ය කාලීන | නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා සිද්ධීන් සමාලෝචනය. |
| | | 9.3.3. අභ්‍යන්තරව අවතැන්වූවන්ගේ ඉඩම් කිසියම් නීතිමය කරුණු මත වෙන් කිරීම, රක්ෂිත ලෙස පවත්වාගෙන යාම ලෙස ගැසට් කර තිබේ නම් ඒ පිළිබඳ තීරණ හා නීති සමාලෝචනයකට ලක් කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>සුදුසු බලධාරීන් (උදා - මහවැලි අධිකාරිය, වන සංරක්ෂක දෙපාර්තමේන්තුව) | කෙටි කාලීන | අදාළ ඉඩම් ගැසට් කිරීමට හේතු සෙවීම.<br>ගැසට් කරන ලද සියලුම ඉඩම් විමර්ශනය කිරීම.<br>ගැසට් කිරීමට ප්‍රමාණවත් හේතු නොමැති විට, එම තීරණ ප්‍රතිශෝධනය කිරීම හෝ අවලංගු කිරීම.<br>අවශ්‍ය නම් නීති, විමර්ශනය කිරීම. |
| | 9.4. බලහත්කාරයෙන් අත්පත් කරගැනීම් හේතුවෙන් පැන නඟින ගැටලු නිරාකරණය කිරීම. | 9.4.1. නීතිමය අයිතිය තහවුරු කරන, ආරවුල් නිරාකරණය සඳහා ඉවහල් වන යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම. | අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | ආරවුල් නිරාකරණය කිරීම සහ නීතිමය අයිතිවාසිකම් තහවුරු කිරීම. |
| | | 9.4.2. ඉඩම් පවරාදීමේ වැඩසටහනක් සකස් කිරීම සහ එම ඉඩම් පවරාදීමේ පදනම අධීක්ෂණය කිරීම. | ඉඩම් අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | වැඩසටහන සකස් කිරීම.<br>අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |
| | | 9.4.3. බලහත්කාරයෙන් ඉඩම අත්පත් කරගත් පුද්ගලයා යම් අවස්ථාවක දී ඉවත් කිරීමට සිදුවුවහොත් එම තැනැත්තාට තාවකාලික නිවාසක් හෝ ඉඩමක් ලබාදීම. | ඉඩම් අමාත්‍යාංශය | කෙටි කාලීන | ඉඩම නීත්‍යානුකූල හිමිකරුට භාරදීම. |

| පරමාර්ථය | | අරමුණ | | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|---|---|
| 10. | දේශපාලනමය වශයෙන් සංවේදී අන්තර් - ප්‍රජා ගැටලු නිරාකරණය කිරීම. | 10.1. | ගැටලුව අධ්‍යයනය හා නිරාකරණය. | 10.1.1. අන්තර් - ප්‍රජා ගැටළු හෝ ආරවුල් පවතින ඉඩම් සිතියම් ගත කිරීම සහ පාදක හේතු ලේඛනගත කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br><br>අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාල<br><br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | කෙටි කාලීන | ප්‍රදේශ සිතියම් ගත කිරීම.<br><br>වාර්තා පිළියෙල කිරීම. |
| | | | | 10.1.2. නැවත පදිංචි කරවූ අභ්‍යන්තරව අවතැන්වූවන් හා සත්කාර ප්‍රජාව අතර පවත්නා ගැටලු සම්බන්ධව කල් පවත්නා විසඳුමක් ඇති කිරීමට යාන්ත්‍රණයක් සැකසීම. | | කෙටි කාලීන | යාන්ත්‍රණ සකස් කිරීම. |
| 11. | වෙනස් ලෙස නොසලකා ඉඩම් ලබාදීම. | 11.1. | වෙනස් ලෙස නොසලකා ඉඩම් පැවරීම සහතික කිරීමට අවශ්‍ය නීති සහ පිළිවෙත් සමාලෝචනය කිරීම. | 11.1.1. අදාළ පනත් සම්පූර්ණයෙන් සමාලෝචනය කිරීම. (ඉඩම් සංවර්ධන ආඥා පනත සහ රාජ්‍ය ඉඩම් ආඥා පනත) | අධිකරණ අමාත්‍යාංශය<br><br>ඉඩම් අමාත්‍යාංශය | කෙටි කාලීන | නීති විමර්ශනයෙන් අනතුරුව සංශෝධනය කිරීම. |
| | | | | 11.1.2 මුලික වශයෙන් තනි අයිතිය තහවුරු කරගත් අවස්ථාවක දී හැර, හවුල් අයිතිය යටතේ ඉඩම් වෙන් කිරීම. | ඉඩම් අමාත්‍යාංශය | | හවුල් අයිතිය ස්ථාපිත කිරීම. |
| | | | | 11.1.3. වෙනස් ලෙස නොසලකා ඉඩම් වෙන්කිරීම සහතික කිරීමට සහ, ගෘහ මුලික සංකල්පය ක්‍රියාත්මක කිරීමට නියාමන යාන්ත්‍රණයක් පිහිටුවීම. | ඉඩම් අමාත්‍යංශය සහ අදාළ රේඛිය අමාත්‍යාංශ<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | අධීක්ෂණ යාන්ත්‍රණක් ස්ථාපිත කිරීම.<br><br>දැනුවත් කිරීමේ වැඩසටහන්. |
| | | | | 11.1.4. පවත්නා පරිපාලනමය බාධක විමර්ශනය. | ඉඩම් අමාත්‍යංශය, සහ අදාළ රේඛිය අමාත්‍යාංශ<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෙටි කාලීන | විමර්ශනය අවසන් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 12. දෙවන හා තෙවන පරම්පරාවේ අභ්‍යන්තරව අවතැන් වූවන්ට සහ නැවත පැමිණෙන්නන්හට ස්ථිර විසඳුම් ලබාදීමේ ප්‍රතිපාදන | 12.1. දෙවන හා තුන්වන පරම්පරාවේ අභ්‍යන්තරව අවතැන්වූවන් සම්බන්ධයෙන් අදාළ ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම. | 12.1.1. ප්‍රතිපත්තිය සකස් කිරීම. | අමාත්‍ය මණ්ඩලය | කෙටි කාලීන | ප්‍රතිපත්තියක් සකස් කිරීම. |
| | 12.2. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | 12.2.1. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ඉඩම් අමාත්‍යාංශය | දිගු කාලීන | දෙවන හා තෙවන පරම්පරාවේ අභ්‍යන්තරව අවතැන් වූවන්ට ඉඩම් වෙන්කිරීම. |
| 13. ප්‍රමාණවත් පානීය ජලය ලබාදීම. | 13.1. සියලු ගෘහස්ථ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය තිරසර පානීය ජල සැපයුමක් සහතික කිරීම. | 13.1.1. අවම ප්‍රමිතින්ට අනුව පානීය ජලය සැපයීම. | ජල සම්පාදන හා ජලාප්‍රවාහන අමාත්‍යාංශය | කෙටි කාලීන | පානීය ජල සැපයුම් ස්ථාපිත කිරීම.<br>ගෘහස්ථ ජල පිළියම් ඒකක ලබාදීම. |
| | | 13.1.2. ගෘහස්ථ පරිහරණයට හා බීමට සුදුසු බව තහවුරු කර ගැනීමට ජලයේ ගුණාත්මක තත්ත්වය නිතිපතා පරීක්ෂා කිරීම. | වාරි මාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය | | ජල සම්පත් සංඛ්‍යාව පරීක්ෂා කිරීම. |
| | | 13.1.3. කාන්තාවන්ගේ සම සහභාගිත්වය සහතික වන පරිදි දේශිය ජල කළමනාකරණ කමිටු පිහිටුවීම. | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | ජල කළමනාකරණ කමිටු පිහිටුවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 14. සනීපාරක්ෂාව සඳහා වූ අයිතිය සහතික කිරීම. | 14.1. දුර්වල පුද්ගල කණ්ඩායම් පිළිබඳව නිසි සලකා බැලීමක් සිදු කරමින්, ස්ත්‍රී පුරුෂභාවය හා සංවේදී වන අයුරින් සනීපාරක්ෂක අයිතිය තහවුරු කිරීම. | 14.1.1. සංස්කෘතියේ ස්වභාවයන් සහ පිළිවෙත් සැලකිල්ලට ගනිමින්, ජාත්‍යන්තර සම්මතයන් හා සමගාමීව, සනීපාරක්ෂක ප්‍රමිතීන් පිළිබඳ ජාතික මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අදාළ රේඛීය අමාත්‍යාංශ<br>පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කෙටි කාලීන | මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම.<br>සැලැස්ම සකස් කිරීම.<br>ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස අවශ්‍ය පහසුකම් ප්‍රමාණය<br>සියලුම පාර්ශ්වකරුවන් විසින් මාර්ගෝපදේශන පිළිපැදීම. |
| 15. වන්දි සඳහා ප්‍රතිපත්තියක් හඳුන්වා දීම. | 15.1. වන්දි සඳහා පරිපූර්ණ රාමුවක් සකස් කිරීම. | 15.1.1. වන්දි ලබාදීමේ විවිධ පැතිකඩ අවධානයට යොමු වන පර්පූර්ණ වන්දි ප්‍රතිපත්තියක් ඇති කිරීම සහ එහි ක්‍රියාකාරකම්වලට බලපෑම් කළ හැකි සහ දැනුම්දිය හැකි වැඩසටහනක් සැපයීම. | වන්දි ලබාදීම පිළිබඳ කාර්යාලය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | කෙටි කාලීන | වන්දි ප්‍රතිපත්තිය හා වැඩසටහන් රාමුව සකස් කිරීම. |
| | | 15.1.2. වන්දි ලබාදීම සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම. | | කෙටි කාලීන | වන්දිවලට අයත්වන්නේ කුමක්ද, එය ප්‍රජාවට ඉවහල් වන්නේ කෙසේද යන්න පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීම. |
| 16. වන්දි සඳහා කාර්යාලයක් පිහිටුවීම. | 16.1. වන්දි සඳහා විධි විධාන සැලැස්වීම සඳහා විශේෂඥයින්ගේ දැනුම හා සම්පත් සහිත ආයතනයක් පිහිටුවීම. | 16.1.1. ක්ෂේත්‍ර නියෝජනයක් සහිත කාර්යාලය ස්ථාපිත කිරීම. | වන්දි සඳහා කාර්යාලය<br>විදේශ කටයුතු අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>අදාළ රේඛීය අමාත්‍යාංශ | මධ්‍ය කාලීන | පරීක්ෂා හා වන්දි සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ස්ථිර ආයතනයක් නිර්මාණය කිරීම. |
| | | 16.1.2. එම කාර්යාලයේ බලපත්‍රය පිළිබඳ දැනුවත් කිරීම සහ ජනතාවගෙන් අදහස් / යෝජනා ලබා ගැනීම. | | මධ්‍ය කාලීන | දැනුවත් කිරීමේ වැඩසටහන්. |
| | | 16.1.3. වන්දි ගෙවීම සඳහා කාර්යාලය තුළ පීඩාවට පත්වුවන්ගේ අරමුදලක් පිහිටුවීම. | | මධ්‍ය කාලීන | අරමුදලක් පිහිටුවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 17. අභ්‍යන්තරව අවතැන්වූවන් සහ නැවත පැමිණෙ-න්නන් සඳහා වන්දි ලබාදෙන ක්‍රම. | 17.1. සාධාරණ අයුරින් වන්දි ලබාදීම. | 17.1.1. අභ්‍යන්තර අවතැන් වූවන් / නැවත පැමිණෙන්නන්ගේ වත්මන් අවශ්‍යතා සාකච්ඡාවට ලක් කෙරෙන සාධාරණ වන්දි ක්‍රමයක් හඳුනා ගැනීමත්, වන්දි ලබාදීම විශ්වසනීය, විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියක් හරහා සිදු කිරීම. | වන්දි සඳහා කාර්යාලය සහ අදාළ රේඛිය අමාත්‍යාංශ | කෙටි කාලීන | වන්දි ලබාදෙන යෝජනා ක්‍රමය ස්ථාපනය කිරීම. |
| | | 17.1.2. වන්දි ක්‍රමය පිළිබඳ අභ්‍යන්තරව අවතැන්වූවන් සහ නැවත පැමිණෙන්නන් දැනුවත් කිරීමට සත්කාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ අයදුම්පත් කැඳවීම. | | කෙටි කාලීන | පවත්වන ලද සත්කාරක වැඩසටහන් ප්‍රමාණය සහ අයදුම්පත් ප්‍රමාණය |
| 18. වන්දි ගෙවීමේ ක්‍රමවේද හඳුන්වා දීම. | 18.1. සාධාරණ ලෙස අභ්‍යන්තරව අවතැන් වූවන්හට, නැවත පැමිණෙන්නන්ට වන්දි ගෙවීම තහවුරු කිරීම. | 18.1.1. වන්දි ගෙවීමේ ක්‍රමයට ඇතුළත් කළ යුතු ප්‍රදේශ හඳුනා ගැනීම. | වන්දි සඳහා කාර්යාලය<br><br>විදේශ කටයුතු අමාත්‍යාංශය, සහ අදාළ රේඛිය අමාත්‍යාංශ | කෙටි කාලීන | විශ්වසනීයත්වයෙන් යුත් සම වන්දි ගෙවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. |
| | | 18.1.2. සාධාරණ ලෙස වන්දි ගෙවීම. | | | |
| 19. අවතැන් වීම් නැවත ඇති නොවීමට වගබලා ගැනීම. | 19.1. අවතැන්වීම් සම්බන්ධ අනාගත රටාව වැළැක්වීම සහ කල්පවත්නා විසඳුමකට තර්ජනයක් විය හැකි සාධක සාකච්ඡාවට ලක් කිරීම. | 19.1.1. අවතැන්වීමට බලපාන හේතුවල මූලාරම්භය හඳුනාගැනීම සහ අනාගත අවතැන්වීම් සඳහා මුල්විය හැකි හේතු සෙවීම සහ කල්පවත්නා විසඳුම් වලට තර්ජනයන් විය හැකි කරුණු සාකච්ඡාවට ලක් කළ හැකි සේ අවශ්‍ය පියවර ගැනීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br><br>අදාළ රේඛිය අමාත්‍යාංශ, සහ පළාත් සභා | කෙටි කාලීන | අභ්‍යන්තරව අවතැන් වූවන් සහ නැවත පැමිණෙන්නන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමට, කල්පවත්නා විසඳුම් සහ ක්‍රමවේදයක් අවබෝධ කර ගැනීම. |
| | | 19.1.2. අවස්ථාවන් නියාමනය කිරීම සඳහා ප්‍රජා කණ්ඩායම් උසස් කිරීම සහ අනාගතයේ අවතැන්වීම් සිදු නොවීම සඳහා රජයේ නිලධාරීන් සමඟ එක්ව කටයුතු කර එය සාකච්ඡාවට ලක් කිරීමට සැලැස්වීම. | | කෙටි කාලීන | සන්නිවේදන උපාය මාර්ග සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 20. අභ්‍යන්තරව අවතැන්වූවන්ට සහ නැවත පැමිණෙන්නන්ට මානසික සෞඛ්‍ය, වෛද්‍ය සහ සමාජ - ආර්ථික පුනරුත්ථාපන වැඩසටහන් හඳුන්වාදීම. | 20.1. අභ්‍යන්තරව අවතැන්වූවන් සහ නැවත පැමිණෙන්නන්ගේ පුනරුත්ථාපන අවශ්‍යතා සාකච්ඡාවට ලක් කිරීම. | 20.1.1. විනිවිදභාවයෙන් යුත්, සාධාරණව අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රම හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | පුනරුත්ථාපන ක්‍රම ස්ථාපනය කිරීම. |
| 21. මනෝ - සමාජයීය සහාය ලබාදීම. | 21.1. නැවත පදිංචිකිරීම්වලින් පසු සහාය ඇතුලුව, අභ්‍යන්තරව අවතැන් වූවන් සහ නැවත පැමිණෙන්නන්ට මනෝ - සමාජයීය ආරක්ෂාව ලබාදීම. | 21.1.1. මනෝ - සමාජයීය උපදේශන සේවා පැවැත්වීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීමේ සහ සුභසාධන අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | ඉලක්කගත පුද්ගලයන් සංඛ්‍යාව.<br>ඉලක්කගත ජනතාවගේ ජන විකාශනය.<br>ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ප්‍රමාණය. |
| | | 21.1.2. අන්‍යෝන්‍ය සහාය ලබාදීම පිණිස දේශිය වශයෙන් පුහුණුව ලත් කණ්ඩායම් නිර්මාණයට කටයුතු කිරීම. | | කෙටි කාලීන | කණ්ඩායම් නිර්මාණය කර පුහුණු කිරීම. |
| | | 21.1.3. කාන්තා සෞඛ්‍ය සේවා සපයන්නන් සහ සේවාවන් වෙත ප්‍රවේශය සැලසීම. | | කෙටි කාලීන | ලබාදුන් ප්‍රවේශ |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 22. අභ්‍යන්තරව අවතැන්වුවන් අතර සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම. | 22.1. වසංගත සහ බෝවන රෝග වැළැක්වීම. | 22.1.1. දරුවන් සඳහා (අවශ්‍යතාව මත වැඩිහිටියන්) එන්නත් ලබාදීම සහතික කිරීම සහ, පසුවිපරම සඳහා සුදුසු වෛද්‍ය වාර්තා පවත්වාගෙන යාම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | එන්නත් ලබාදුන් පුද්ගලයන් සංඛ්‍යාව.<br>එන්නත් කිරීම් සඳහා දරන්නට වූ පරිශ්‍රමයන්. |
| | | 22.1.2. රෝග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමුකර, රෝග නිවාරණ වැඩසටහන් සකස් කිරීම. | | කෙටි කාලීන | රෝග නිවාරණ වැඩසටහන් ස්ථාපිත කිරීම. |
| | | 22.1.3. නිරෝධායන පහසුකම් තහවුරු කිරීම. | | කෙටි කාලීන | පහසුකම් සැලසීම. |
| | 22.2. සෞඛ්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම. | 22.2.1. තොරතුරු ලබාදීම හා මූලික සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධ මාර්ගෝපදේශන. | සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | තොරතුරු ලබා දී ඇති ප්‍රජාවේ ප්‍රතිශතයක් ලෙස වර්ධනය. |
| | | 22.2.2. දේශීය වශයෙන් පිළිගත් වෘත්තිකයින් හරහා සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම. | සමාජ සවිබලගැන්වීමේ සහ සුභසාධන අමාත්‍යාංශය | කෙටි කාලීන | මෙහෙයවන ලද වැඩසටහන් සංඛ්‍යාව. |
| | 22.3. සෞඛ්‍ය සේවා නිලධාරීන් පුහුණු කිරීම. | 22.3.1. දරුවන්, ලිංගික අපචාර හා වෙනත් ආකාරයේ හිංසනයන්ට ගොදුරු වූවන්, මානසික සහාය අවශ්‍ය පුද්ගලයන් සමග වැඩ කටයුතු කිරීමේදී විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බව හඳුනාගනිමින්, සෞඛ්‍ය සේවා නිලධාරීන් හට පුහුණු අවස්ථා ලබාදීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | පුහුණුව ලබාදුන් සෞඛ්‍ය සේවා නිලධාරීන් සංඛ්‍යාව. |
| | | 22.3.2. ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ළමා අපචාර හඳුනාගත හැකි ක්‍රම පිළිබඳව අවධානය යොමු කර පුහුණුව ලබාදීම. | | | පුහුණුව ලබාදුන් සෞඛ්‍ය සේවා නිලධාරීන් සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 22.4. සෞඛ්‍ය සේවාවන් වෙත ප්‍රවේශය ලබාදීම. | 22.4.1. සායනයන් ස්ථාපනය කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සායන සංඛ්‍යාව. |
| | | 22.4.2. ස්ථානීය වෛද්‍ය සේවා ලබාදිය නොහැකි අවස්ථාවලදී ප්‍රවාහන ප්‍රතිපාදන සහ ගිලන් රථ සේවා සැපයීම. | | | ලබාදුන් සේවා සංඛ්‍යාව. |
| 23. අධ්‍යාපනය සඳහා ප්‍රවේශය. | 23.1. අභ්‍යන්තරව අවතැන්වූවන්ට සහ නැවත පැමිණෙන්නන් හට බාධාවකින් තොරව, අධ්‍යාපනය ලැබීමේ අවස්ථා සහතික කිරීම. | 23.1.1. ළඟම පාසල වෙත යාමට හැකි වන පරිදි තාවකාලික හැඳුනුම්පතක් ලබාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීමමේ සහ සුභසාධන අමාත්‍යාංශය<br>පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටි කාලීන | ලබාදුන් හඳුනාගැනීමේ ලියවිලි. |
| | | 23.1.2. පාසල් යාම සඳහා අභ්‍යන්තරව අවතැන්වූවන් සහ නැවත පැමිණි අයගේ දරුවන් හට, ප්‍රවාහන පහසුකම් සහ ආරක්ෂාව සහතික කිරීම. | | | ලබාදුන් ප්‍රවාහන පහසුකම් හා ආරක්ෂාව. |
| | | 23.1.3. දරුවන් සඳහා අතිරේක අධ්‍යයන කට්ටල ලබාදීම. | | | ලබාදුන් අතිරේක අධ්‍යයන කට්ටල ගණන. |
| | | 23.1.4. පාසල් නිල ඇඳුම් සහ මූලික ලිපිද්‍රව්‍ය සැපයීම. | | | ලබාදුන් නිල ඇඳුම් / ලිපිද්‍රව්‍ය ප්‍රමාණය. |
| | | 23.1.5. ආර්ථිකමය සහ නිවසේ තත්ත්වයන් මත පාසල් යා නොහැකි අභ්‍යන්තරව අවතැන්වූ නව යොවුන් වියේ අය සඳහා විකල්ප පාසල් හෝ නිපුණතා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | | පවත්වන ලද වැඩසටහන් ගණන. |
| | | 23.1.6. ප්‍රධාන විභාග සඳහා විශේෂ විභාග ශාලා සූදානම් කිරීම. | | | සූදානම් කළ විශේෂ විභාග. |
| | | 23.1.7. ළමුන් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා පුස්තකාල (ජංගම) සඳහා ප්‍රවේශවීමේ අවස්ථාව හිමිකර දීම. | | | ලබාදුන් ප්‍රවේශයන්. |
| | | 23.1.8. ගැටුම් සහ ආපදා නිසා පීඩාවට පත් ප්‍රදේශවල පාසල් ප්‍රතිසංස්කරණය කර පිළිසකර කිරීම තහවුරු කිරීම. | | | පාසල් යළි සකස් කිරීම සහ අළුත්වැඩියා කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 24. සංක්‍රාන්ති අවස්ථාවේදී මූලික අවශ්‍යතා සපුරා ඇති බවට සහතික කිරීම. | 24.1. නැවත පදිංචිවීම ආරම්භයේදී ආර්ථික සහාය ලබාදීම. | 24.1.1. අභ්‍යන්තරව අවතැන්වූවන් සහ නැවත පැමිණෙන්නන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වනතුරු සහයෝගය ලබාදීමට කටයුතු කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සහයෝගය අවශ්‍ය ප්‍රමාණයේ අඩුවීම. |
| 25. ණය පහසුකම් ලබාගැනීමේ හැකියාව සහතික කිරීම. | 25.1. ණය ලබා ගැනීමේ ප්‍රවේශය වැඩිකිරීම. | 25.1.1. ස්වයං රැකියා සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හිමියන් සඳහා ණය පහසුකම් සැලසීම. | මුදල් අමාත්‍යාංශය<br>පළාත් සභා | කෙටි කාලීන | ලබාදුන් ණය. |
| | | 25.1.2. ණය ආපසු ගෙවීමේ ක්‍රම ගැන දැනුවත් කිරීමේ සහාය සේවා නිර්මාණය කිරීම. | | | ක්ෂුද්‍ර ණය ක්‍රම (උදා. සණස) |
| 26. ප්‍රමාණවත් ජීවනෝපාය මාර්ග සහතික කිරීම. | 26.1. ජීවනෝපාය මාර්ගවලට වඩා හොඳ ප්‍රවේශයක් ලබාදීම. | 26.1.1. ජීවනෝපාය මාර්ග පිළිබඳ ඉලක්කගත පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් හඳුන්වාදීම. | වෙළෙඳ අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීමේ සහ සුභසාධන අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යාංශය<br>කුඩා කර්මාන්ත අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| | | 26.1.2. වෙළෙඳපල සහ මිලදී ගැනීම් අතර සම්බන්ධතා දියුණු කිරීම. | | | සම්බන්ධතා වර්ධනය කිරීම. |
| 27. යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය. | 27.1. ආර්ථික කටයුතු සඳහා සහන මිලට යටිතල පහසුකම් ලබාදීම. | 27.1.1. නැවත පදිංචි කිරීම් සිදු කිරීමට ඉලක්ක කෙරෙන පෙදෙස්වල යටිතල පහසුකම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | විදුලි හා බලශක්ති අමාත්‍යාංශය<br>මාර්ග සංවර්ධන අධිකාරිය | දිගු කාලීන | යටිතල පහසුකම්වලට ප්‍රවේශය ඇති නිවාස ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 28. ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම. | 28.1. අභ්‍යන්තරව අවතැන්වූවන් / නැවත පැමිණෙන්නන් අතර ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීම. | 28.1.1. ක්ෂේත්‍ර නිලධාරීන් හරහා මාර්ගෝපදේශන සහාය ලබාදීම. | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය | මධ්‍ය කාලීන | රජයේ උපදේශන සේවා මගින් සහය දෙනු ලැබූ පුද්ගලයින් ගණන. |
| | 28.2. අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධවීමේ අවස්ථාව ලබාදීම. | 28.2.1. එක වහලයක් යට සේවාවන් රැසක් සැලසීම. | පළාත් පාලන ආයතන<br>ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය | කෙටි කාලීන | සහාය ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව. |
| | | 28.2.2. උපදේශන සේවා සඳහා මධ්‍යම සම්පත් ලබාදීම. | පළාත් පාලන ආයතන<br>ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය | | උපදේශන සේවා ලබාදීම. |
| 29. අභ්‍යන්තරව අවතැන්වූවන් / නැවත පැමිණෙන්-නන් අතර අවදානම් සහිත පුද්ගලයින් සුරැකීම. | 29.1 වයස්ගත අයගේ ජීවන තත්ත්වයන් උසස් කිරීම. | 29.1.1. වැඩිහිටියන් සඳහා ප්‍රමාණවත් වැඩිහිටි නිවාස සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම සහ දැනට පවත්නා නිවාස අලුත්වැඩියා කිරීම. | සමාජ සවිබලගැන්වීමේ සහ සුභසාධන අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>පළාත් සභා | මධ්‍ය කාලීන | වැඩිහිටි නිවාසවල සිටින පුද්ගලයන් සංඛ්‍යාව. |
| | | 29.1.2. ගම් මට්ටමින් වැඩිහිටි කමිටු ස්ථාපිත කිරීම. | | කෙටි කාලීන | ස්ථාපිත කර ඇති කමිටු සංඛ්‍යාව. |
| | 29.2. ආබාධිත අයගේ අවශ්‍යතා සපුරාලීම. | 29.2.1. සියලුම පොදු ගොඩනැගිලි තුළට ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශය ලබාදීම. | සමාජ සවිබලගැන්වීමේ සහ සුබසාධන අමාත්‍යාංශය<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | දිගු කාලීන | ප්‍රවේශ විය හැකි පොදු ගොඩනැගිලි ගණන. |
| | | 29.2.2. ආබාධිත පුද්ගලයින් සඳහා නිවාස වැඩිදියුණු කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම. | | කෙටි කාලීන | සහාය ලබාදුන් පුද්ගලයින් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 29.3. ආබාධිත පුද්ගලයන් පුනරුත්ථාපනය සහ සමාජගත කිරීම. | 29.3.1. ආබාධිත පුද්ගලයන් සඳහා ආධාරක උපකරණ සැපයීම. | සමාජ සවිබලගැන්වීමේ සහ සුබසාධන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ආධාරක උපකරණ හිමි වූ පුද්ගලයින් සංඛ්‍යාව. |
| | | 29.3.2. ආබාධිත පුද්ගලයින් සඳහා ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | කෙටි කාලීන | පුනරුත්ථාපනය කරන ලද ආබාධිත පුද්ගලයින් ගණන. |
| | 29.4. කාන්තා ගෘහමූලික පුද්ගලයින් එක් අයෙකු හෝ කිහිපදෙනෙකු, අතුරුදන් වූ ඇතුළුව, තනි ගෘහ මූලික කුටුම්භවල ආරක්ෂාව සහතික කිරීම. | 29.4.1. තනි ගෘහ මූලික කුටුම්බ ආරක්ෂාවේදී පවත්නා පරතරයේ විශ්ලේෂණයක් සිදු කිරීම. | | මධ්‍ය කාලීන | නිර්දේශ සමාලෝචනය කිරීම. |
| | | 29.4.2. විශ්ලේෂණයන් මත පදනම්ව තනි ගෘහ මූලික කුටුම්බ සඳහා සහාය වැඩි කිරීම. | | කෙටි කාලීන | සහාය ලබාදුන් පවුල් ගණන. |
| 30. නැවත පැමිණෙන්-නන්ට සාර්ථක ලෙස නැවත ජීවිතය ආරම්භ කිරීමට අයිතීන් හා හිමිකම් සඳහා ඇති ප්‍රවේශය. | 30.1. යළි පැමිණි අය පුරවැසියන් ලෙස පිළිගැනීම තහවුරු කිරීම. | 30.1.1. ආපසු පැමිණ ඇති පිටරට වාසය කරන සරණාගතයින් සහ නැවත පැමිණි නමුත් ශ්‍රී ලංකාව තුළ සමාජගත කර නොමැති හෝ පුරවැසියන් ලෙස හඳුනා නොගත් සරණාගතයින් සඳහා තාවකාලිකව පැමිණි බවට වූ සරණාගත හැඳුනුම්පත (TRRIC) නිකුත් කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාල | කෙටි කාලීන | ආපසු පැමිනෙන්නන්ට නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 30.2. නැවත පැමිණෙන්නන් හට සියලුම සේවා සහ අයිතිවාසිකම් සඳහා ප්‍රවේශය සහතික කිරීම. | 30.2.1. ප්‍රතිපත්ති, රෙගුලාසි සහ පරිපාලන මාර්ගෝපදේශය නිර්මාණය කිරීම හෝ සංශෝධනය කිරීම. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br><br>විදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | ප්‍රතිපත්ති, රජයේ චක්‍රලේඛ සහ ඉන්දියාවේ හෝ වෙනත් රටවල උපන් සරණාගතයින් සඳහා පුරවැසිභාවයේ පමාව ඉවත් කිරීම පිළිබඳව රජයේ චක්‍රලේඛය කොන්සියුලර් සේවාව වෙත නිකුත් කිරීම.<br><br>ඉන්දියාවේ හෝ වෙනත් රටවල සරණාගත කඳවුරුවල උපත ලැබූ සරණාගතයින්ට බලපවත්වනා දඩ ඉවත් කිරීම සඳහා නව රෙගුලාසි නිකුත් කිරීම.<br><br>ඉන්දියාවේ සහ වෙනත් රටවල සරණාගතයින් ලෙස ජීවත් වන ශ්‍රී ලාංකික මව්පියන්ට දාව උපන් දරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ ගැටළුව අවසන් කිරීම.<br><br>නැවත පැමිණෙන්නන්ට, රටට පැමිණෙන අවස්ථාවේදී වෛද්‍ය පරීක්ෂණයක් කර ගැනීමට කාලෝචිත ප්‍රවේශයක් සහතික කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 30.3. සරණාගතයින් ලෙස නැවත පැමිණෙන්නන් හට මූලික අවශ්‍යතා සැපයීම. | 30.3.1. ඉඩම් ගැටළු විසඳීම සහ ඉඩම් නොමැති නැවත පැමිණෙන්නන් හට ඉඩම් වෙන්කරලීම සඳහා ප්‍රතිපත්තියක් හෝ පරිපාලන මාර්ගෝපදේශනයක් හෝ නියෝගයක් සකස් කිරීම. | ඉඩම් අමාත්‍යාංශය<br>මහවැලි සංවර්ධන අධිකාරිය හා පරිසර අමාත්‍යාංශය<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනුරුත්ථාපන, නැවත පදිංචි කරවීමේ සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය<br>පළාත් සභා | කෙටි කාලීන | ඉඩම් ගැටළු නිරාකරණයට ප්‍රතිපත්තියක් හඳුන්වාදීම. |
| | | 30.3.2. රජයේ නිවාස යෝජනා ක්‍රමය තුළට යළි පැමිණි අය ඇතුළත් කර ගැනීම. | | කෙටි කාලීන | ආපසු පැමිණෙන්නන් ඇතුළත් කර ගැනීම. |
| | | 30.3.3. නැවත පැමිණෙන්නන් හට පුහුණුව සහ රැකියා අවස්ථා සැපයීම. | | කෙටි කාලීන | වෘත්තීය කුසලතා ප්‍රගුණ කළ තරුණ තරුණියන් සංඛ්‍යාව. |
| | | 30.3.4. ව්‍යවසායකත්ව කටයුතු සඳහා ජීවන ආධාර ලබාදීම. | | කෙටි කාලීන | ව්‍යවසායකත්ව වැඩසටහන්වල නියැලෙන නැවත පැමිණෙන්නන්ගේ සංඛ්‍යාව. |
| | 30.4. නැවත පැමිණි සරණාගතයින් සතු වෘත්තිය හා ඩිප්ලෝමා සහතිකවලට පිළිගැනීමක් ලබාදීම. | 30.4.1. කාර්මික සහ වෘත්තීය සාමාර්ථයන් හඳුනාගැනීමට ප්‍රතිපත්ති සකස් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>විභාග දෙපාර්තමේන්තුව<br>ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | කෙටි කාලීන | සරණාගතයින්ගේ අධ්‍යාපන තත්ත්වයන් හා වෘත්තිය සුදුසුකම්වලට වැඩි පිළිගැනීමක් ලබාදීම.<br>ඩිප්ලෝමා හා වෘත්තිය සුදුසුකම්වලට පිළිගැනීමක් ලබාදීම සඳහා ඒවා ගාස්තුවලින් නිදහස් කර අයඳුම්පත් භාරගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 31. ස්වභාවික විපත් නිසා සිදුවන අවතැන්වීම් වැළැක්වීම. | 31.1. නියඟය, වෙරළ ඛාදනය, නායයෑම් ඇතුළු ස්වභාවික විපත් හරහා සිදුවිය හැකි අවතැන් වීම වැළැක්වීම. | 31.1.1. සියලූ පාරිසරික ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. | පළාත් සභා | මධ්‍ය කාලීන | යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. |
| | | 31.1.2. අවතැන්වීම් සඳහා බලපාන විවිධ ස්වභාවික විපත් පිළිබඳ අධ්‍යයනයක් සිදුකර, එය පිටුදැකීමට හා සිදුවිය හැකි හානිය අවම කිරීම සඳහා නිර්දේශ සකස් කිරීම. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>පරිසර අමාත්‍යාංශය<br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | සිදුකළ අධ්‍යනය සහ ලබාදුන් නිර්දේශ. |
| | | 31.1.3. අවතැන්වීම් සඳහා බලපාන විවිධ ස්වභාවික විපත් පිළිබඳ අධ්‍යයනයක් සිදුකර එය පිටුදැකීමට හා සිදුවිය හැකි හානිය අවම කිරීම සහ පෙර සූදානම් වීම සම්බන්ධ නිර්දේශ සකස් කිරීම. | | මධ්‍ය කාලීන | සිදුකළ අධ්‍යයන සහ බෙදා හරින ලද නිර්දේශ. |
| | | 31.1.4. පරිසරයට සිදුවන හානි නිසා අවතැන් වීම් වැළැක්වීමට පාරිසරික විගණන පැවැත්වීම. | | මධ්‍ය කාලීන | සිදු කළ විගණන. |
| | | 31.1.5. පරිසර හිතකාමී භාවිතයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 32. ස්වභාවික විපත් සඳහා පෙර සූදානම | 32.1. ස්වභාවික විපත් සිදුවන අවස්ථාවන්හිදී සේවයේ යෙදවීමට අවශ්‍ය ප්‍රතිපත්තිය පිළියෙල කිරීම. | 32.1.1. ප්‍රදේශීය මට්ටමෙන් සේවයේ යෙදවීමේ ප්‍රතිපත්තිය පිහිටුවීම. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය<br>පළාත් සභා<br>අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රතිපත්තිය සකස් කිරීම. |
| | | 32.1.2. පාසල් විෂය නිර්දේශයට ආපදා සඳහා පෙර සූදානම ඇතුළත් කිරීම. | | මධ්‍ය කාලීන | විෂය නිර්දේශය යාවත්කාලීන කිරීම. |
| | | 32.1.3. ස්වභාවික විපත් අවස්ථාවන් හීදී ප්‍රජාව විසින් අනිවාර්යයෙන් අනුගමනය කළ යුතු යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | | මධ්‍ය කාලීන | යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. |

# සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම්

# සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම්

විදේශ රැකියා නියුක්තිය ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගලා එන වැදගත් සහ ස්ථාවර මූලාශ්‍රයකි. මෑතකාලීන වසරවලදී, ශ්‍රී ලංකාවේ සේවකයින් පිටරටවලට යොමුවීමේ වැඩි ප්‍රවණතාවක් පෙන්නුම් කොට ඇති අතර, සංක්‍රමණික සේවකයින්ගේ ප්‍රේෂණවල සමස්ත ගලා ඒම 2015 වසර තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 6,980ක් විය.

සංක්‍රමණය පාලනය සහ විධිමත් කිරීම පිළිගනු ලබන, සංක්‍රමණික සේවකයින් ආරක්ෂා කරමින් සවි බලගන්වන, සහ සංක්‍රමණය සහ සංවර්ධනය සම්බන්ධ කරන ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය පාලනය කෙරේ. වෙනම අමාත්‍යංශයක් පිහිටුවීම තුළින් සංක්‍රමණික සේවකයින්ගේ සුබ සාධනය ආරක්ෂා කිරීම සඳහා රජය විසින් ලබා දී තිබෙන ඉහළ ප්‍රමුඛතාව පිළිබිඹු කෙරේ. 1985 දී පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියුක්ති කාර්යාංශය (ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය), රටේ ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය පරිපාලනය සඳහා වග කියනු ලබන රජයේ ප්‍රධාන ආයතනයයි. එමෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල හරහා, සංක්‍රමණික සේවකයින්ගේ සේවා කොන්දේසි නියාමනය කිරීම සඳහා ස්ථාපිත යාන්ත්‍රණයක් ද පවතී.

සංක්‍රමණික සේවකයින් ඇතුළුව සියලුම පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල්, ජාතිය, පෙළපත, නෛතික හෝ වෙනත් බේදයකින් තොරව, මූලික අයිතිවාසිකම් සහ මූලික ශ්‍රම ආරක්ෂණ වෙනුවෙන් හිමිකම් කියනු ලබයි. විශේෂයෙන් සංක්‍රමණිකයින් ඔවුන් අනතුරට ලක්විය හැකි තත්ත්වයන් හා සම්බන්ධ යම් මානව හිමිකම් සහ ආරක්ෂණයන්ට ද හිමිකම කියයි. මානව අයිතිවාසිකම් පිළිබඳ ලෝක සම්මේලනය සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරන මෙන් සියලුම රාජ්‍යයන්ගෙන් ඉල්ලා සිටී.

සියලුම සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආරක්ෂා කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ශ්‍රී ලංකාව අනුමත කර ඇත. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි වී, පිටත්ව යන ශ්‍රී ලංකාවේ සෑම සේවකයෙකු වෙතම නොමිලේ රක්ෂණ ආවරණය, සංක්‍රමණික සේවකයින්ගේ ළමුන් සඳහා ශිෂ්‍යත්ව, අනාගත කාන්තා ගෘහ සේවිකාවන් සහ ගෘහස්ථ නොවන සේවිකාවන් සඳහා පිටත්වීමට පෙර පුහුණු වැඩසටහන්, පිළිසරණක් නොමැති සේවකයින් සඳහා පිටත්වීමේ වියදම්, පිළිසරණක් නැති සේවකයින් සඳහා පිටත්ව යන රටේ දී ආරක්ෂිත නිවාස සහ ප්‍රධාන වශයෙන් ශ්‍රමය ලබාගන්නා රටවල රාජ්‍යතාන්ත්‍රික මෙහෙවර සඳහා සුභ සාධන නිලධාරීන් පත් කිරීම වැනි වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. විදේශ රැකියා සහ සුබ සාධන අමාත්‍යංශය සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ශ්‍රී ලංකාවේ පුහුණු සේවකයින් සඳහා නව රැකියා අවස්ථාවන් සොයා බැලීම සඳහා මැද පෙරදිග රටවලට අමතරව, ආසියානු සහ යුරෝපීය රටවල් ගණනාවක් සමග අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබේ.

එමෙන්ම ජාතික සංක්‍රමණික සෞඛ්‍ය ප්‍රතිපත්තිය (2013), උප ප්‍රතිපත්තිය සහ සංක්‍රමණික සේවකයින් ආපසු පැමිණීම සහ ප්‍රත්‍යනුකලනය පිළිබඳ ජාතික කාර්ය සැලැස්ම ද (2015), සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා හඳුන්වා දෙන ලදී. ඊට අමතරව, සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ප්‍රාදේශීය උපදේශන කියාවලි (RCP) සහ කොළඹ ක්‍රියාවලිය, අබුඩාබි සාකච්ඡාව, සංක්‍රමණය සහ සංවර්ධනය පිළිබඳ ගෝලීය සංසදය, වැනි ගෝලීය සංසදයන් තුළ සහභාගිවෙමින්, සක්‍රීය කාර්යභාරයක් ඉටු කරමින් සුහද සම්බන්ධතාවයක් පවත්වා ගනී. මානව හිමිකම් සමඟ ක්‍රියාකාරී සම්බන්ධතා මෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීමටත්, සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව කටයුතු කරන විශේෂ රපෝර්තුකරුවා සමඟ සමීප සම්බන්ධතාවක් ඇතුළුව අනෙකුත් අධීක්ෂණ හා නියාමන යාන්ත්‍රණ සමග වැඩකිරීමේ සම්බන්ධතා ඇති කර ගැනීමටද උත්සාහ ගනියි. සංක්‍රමණික සහ මානව අයිතිවාසිකම්වලට අදාළ ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී එකමුතුව සහ වටහා ගැනීම සහතික කිරීමට අදාළ සියලුම පාර්ශ්වකරුවන් එකට එකතු කරනු ඇත.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 01. ශ්‍රී ලංකාවේ සියලුම සංක්‍රමණික සේවකයින් ආරක්ෂා කර සවි බලගන්වන ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තියක් (NLMP). | 1.1. 2008 ජාතික ශ්‍රම සංක්‍රමණික ප්‍රතිපත්තියේ විෂය පථය පුළුල් කිරීම සහ යාවත්කාලීන කිරීම. | 1.1.1. පවත්නා ජාතික ශ්‍රම සංක්‍රමණික ප්‍රතිපත්තිය සමාලෝචනය කර, වර්තමාන සන්දර්භානුගත වෙනස්වීම් පිළිබිඹු වන අයුරින් එය විකාශය කිරීම සහ කාලීන සමාලෝචන සහ යාවත්කාලීන කිරීම් සහතික කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | 2008 ජාතික ශ්‍රම සංක්‍රමණික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය වාර්තා කිරීම.<br>ජාතික ශ්‍රම සංක්‍රමණික ප්‍රතිපත්තිය පිළිබඳ කැබිනට් පත්‍රිකාව යාවත්කාලීන කිරීම. |
| | 1.2. ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණ නීති විෂය පථය පුළුල් කිරීම. | 1.2.1. ශ්‍රම සංක්‍රමණයට අදාළව යාවත්කාලීන කළ ප්‍රතිපත්ති හා අනුමත කළ සම්මුතිවලට ගැලපෙන පරිදි, 1985 ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම. | | මධ්‍ය කාලීන | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ නව පනත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීම. |
| 02. බඳවා ගැනීමේ අවස්ථාවේදී සංක්‍රමණික සේවකයින් සූරාකෑමට ලක්වීම අවම කිරීම. | 2.1. බඳවා ගැනීමේ ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කර, විධිමත් කොට, නියාමනය කිරීම. | 2.1.1. ශ්‍රී ලංකාව තුළ බඳවා ගැනීමේ අතරමැදියන් පිළිබඳ මූලික සමීක්ෂණයක් සිදුකිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>සංක්‍රමණය සඳහා ජාත්‍යන්තර සංවිධානයේ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ලියාපදිංචිය සඳහා යාන්ත්‍රණයක් / මාර්ගෝපදේශයක් ප්‍රකාශ කිරීම.<br>මහජනතාවට අන්තර්ජාලය හරහා තොරතුරු ලබාගැනීමට හැකිවන සේ දත්ත ගබඩාවක් සැකසීම. |
| | | 2.1.2. ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී විදේශ රැකියා ආයතන සඳහා ආචාර ධර්ම සංග්‍රහය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ආචාර ධර්ම සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ නියාමන යාන්ත්‍රණයක අවශ්‍යතාව. |
| | | 2.1.3. බලපත්‍රලාභී විදේශ රැකියා ආයතනවල කටයුතු පිළිබඳ කලින් කලට නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියුක්ති කාර්යාංශය ශක්තිමත් කිරීම. | | | පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව බඳවා ගැනීමේ ආයතනවලට එරෙහි ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කාර්යාංශය වෙත පැමිණිලි අඩුවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 2.2. සියලුම අනාගත, නැවත පැමිණෙන සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙත ආරක්ෂිත සංක්‍රමණික තොරතුරු හුවමාරු කර ගැනීමට දේශිය මට්ටමින් විධිමත්ව නිලධාරීන් පුහුණුකිරීම, දැනුවත් කිරීම සහ යාවත්කාලීන කිරීම. | 2.2.1. ආරක්ෂිත ශ්‍රම සංක්‍රමණික තොරතුරු පිළිබඳ අත්පොත වැඩි දියුණු කිරීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ යෙදවුම් සමඟ විදේශ රැකියා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ආරක්ෂිත ශ්‍රම සංක්‍රමණික අත්පොත වැඩි දියුණු කිරීම සහ මාර්ගෝපදේශ ලෙස දේශීය මට්ටමේ නිලධාරීන්ට එය ලබා ගැනීමට සැලැස්වීම. |
| | | 2.2.2. සම්මත සහ මනාව වැඩි දියුණු කළ විෂයමාලා මත පදනම්ව, විදේශ රැකියා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් කලින් කලට දැනුවත් කිරීම් සිදු කිරීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ යෙදවුම් සමඟ විදේශ රැකියා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අදාළ දිස්ත්‍රික්කයන්හි පුහුණුකළ නිලධාරීන් ගණන (ස්ත්‍රීපුරුෂ වශයෙන් වෙන් කරනු ලදුව)<br>පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන. |
| | 2.3. සංක්‍රමණික සේවකයින්ට ආරක්ෂිත සංක්‍රමණ පිළිබඳ තොරතුරු හුවමාරුව සඳහා දේශිය පාර්ශ්වකරුවන් (රජය හා පුද්ගලික) සමඟ සහයෝගිතාව ඉහළ නැංවීම. | 2.3.1. ඔවුන්ගේ සේවා සහ සම්බන්ධතා හඳුනාගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් සේවා සපයන්නන් පිළිබඳ සිතියමක් සකස් කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය | කෙටි කාලීන | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ඉහළ සංක්‍රමණික අගයක් පවතින දිස්ත්‍රික්කවල, සහාය සේවා සපයන්නන් පිළිබඳ ලැයිස්තුවක් ලබාගැනීමට පහසුකම් සැපයීම. |
| | 2.4. විදේශ රැකියා අමාත්‍යාංශය / ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් නිකුත් කරන රෙගුලාසි / චක්‍රලේඛ පැහැදිලිබව සහ වැරදි අර්ථකථනයන්ට ඉඩ නොලැබෙන බවට සහතික කිරීම. | 2.4.1. චක්‍රලේඛ හා රෙගුලාසි සකස් කිරීම අවසන් කිරීමට පෙර, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ සංවර්ධන නිලධාරීන්ගේ කුඩා කණ්ඩායම් සමඟ උපදේශනය. | විදේශ රැකියා අමාත්‍යාංශය | කෙටි කාලීන | ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ සංවර්ධන නිලධාරීන් විසින් ලබාදුන් ප්‍රතිචාර සුදුසු පරිදි අන්තර්ගතයට ඇතුළත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 03. පිටත්වීමට පෙර අදියරේදී සංක්‍රමණික සේවකයන් සූරාකෑමට ලක්වීම අවම කිරීම. | 3.1. පිටත්ව යන රටේ වර්තමාන තත්ත්වය සහ මෑතකාලීන කම්කරු නීති විශේෂයෙන් ගමනාන්ත රටවල පූර්ව පිටත්වීම් විෂයමාලා සමාලෝචන පිළිබඳව සොයා බැලීම. | 3.1.1. සියලුම සේවකයින් සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රමිතිගත පූර්ව පිටත්වීම් විෂයමාලාව අවශ්‍ය පරිදි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | යාවත්කාලීන කළ විෂයමාලාව සියලුම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පුහුණු මධ්‍යස්ථානවල භාවිත කිරීම. |
| | 3.2. කාන්තා ගෘහ සේවිකාවන් සඳහා පිටත්ව යන රට මත පදනම්ව පූර්ව පිටත්වීම් පුහුණුවේ තත්ත්වය හා ප්‍රමිතිය උසස් කිරීම. | 3.2.1. 2012 දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සංවර්ධනය කළ පූර්ව පිටත්වීම් පුහුණු මත පදනම්ව ඒවා සංවිධාන කිරීම. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථාන පිළිබඳ තක්සේරු වාර්තා. |
| | 3.3. අඩු පුහුණු හා අර්ධ පුහුණු සංක්‍රමණික සේවකයින්ගේ අනෙකුත් සියලුම කාණ්ඩ සඳහා, පූර්ව පිටත්වීම් පුහුණුව පිළිබඳ තත්ත්වය හා ප්‍රමිතිය උසස් කිරීම හා වර්ධනය කිරීම. | 3.3.1. සියලුම අනාගත ගෘහස්ථ අංශයේ සහ අඩු සහ අර්ධ පුහුණු සේවකයින් (කාන්තා ගෘහ සේවිකා නොවන කාන්තාවන් හා පිරිමි) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රමිතිගත විෂයමාලාව තුළින් දින 5 ක පූර්ව පිටත්වීම් පුහුණුවකට යොමු කිරීම. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ජාතික තත්ව සහතික 3 වන ශ්‍රේණියේ සහතික හිමි, විශේෂිත වර්ගයේ ගෘහස්ථ නොවන අංශයේ කාන්තාවන් සහ ගෘහස්ථ අංශයේ පිරිමින් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වැඩිවීම. |
| | 3.4. සියලුම සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සංක්‍රමණික සේවකයින් (නුපුහුණු සහ ගෘහ සේවකයින්, කාන්තා සහ පිරිමි) විසින් හොඳින් අවබෝධ කරගෙන පිළිගෙන ඇති බව සහතික කිරීම. | 3.4.1. සුදුසු දේශීය භාෂාවකින් ශ්‍රම රැකියා ගිවිසුම් ලබාදීම සහ සංක්‍රමණික ශ්‍රමිකයන් විසින් ගිවිසුම අත්සන් කිරීමට පෙර පැහැදිලි කිරීම් සිදුකිරීම. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | දිස්ත්‍රික්කය එවැනි ගිවිසුම් සම්බන්ධයෙන් නිකුත් කළ වාර්තා ගණන |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 3.5. බාහිර සංක්‍රමණිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය සහතික කිරීම. | 3.5.1. පූර්ව පිටත්වීම් පිළිබඳ සෞඛ්‍ය තක්සේරු ප්‍රමිතිකරණය | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පසුගිය වසර දෙක තුළ පූර්ව පිටත්වීමේ සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානවල පුහුණු ලබාගෙන ඇති ප්‍රතිශතයේ වැඩිවීම.<br><br>පූර්ව පිටත්වීමේ සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානවල තාක්ෂණ මාර්ගෝපදේශ පිළිපැදීම ප්‍රතිශතයක් ලෙස වැඩිවීම. |
| | | 3.5.2. බිම් මට්ටමේ පුහුණුවක් මගින් සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශ්වකරුවන්ට සංක්‍රමණයට අදාළ තොරතුරු කරා පිවිසීමට ඇති අවස්ථා වර්ධනය කිරීම. | | මධ්‍ය කාලීන | අනාගත සංක්‍රණිමකයින්ගේ සෞඛ්‍ය ප්‍රවේශය ඉහළ නැංවීමට සන්නිවේදනය පිළිබඳ පුහුණු වූ ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයේ වැඩිවීම ප්‍රතිශතයක් ලෙස වැඩිවීම.<br><br>අනාගත සංක්‍රමණිකයින්ගේ සෞඛ්‍ය ප්‍රවේශය ඉහළ නැංවීමට සන්නිවේදනය පිළිබඳ පුහුණු වූ ප්‍රාථමික සෞඛ්‍ය නොවන පාර්ශ්වකරුවන්ගේ වැඩිවීම ප්‍රතිශතයක් ලෙස.<br><br>පූර්ව පිටත්වීම් සෞඛ්‍ය තක්සේරු අවස්ථාවේදී පුද්ගලික සෞඛ්‍ය වාර්තාවක් සහිත සංක්‍රමණිකයින්ගේ වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 3.6. සංක්‍රමණ ක්‍රියාවලිය තුළ සෞඛ්‍ය තත්ත්වය මැනවින් පවත්වා ගැනීමට බාහිර සංක්‍රමණිකයන්ගේ සෞඛ්‍ය ආශ්‍රිත දක්ෂතා වර්ධනය කිරීම. | 3.6.1. පූර්ව පිටත්වීම් සෞඛ්‍ය තක්සේරුවලින් සෞඛ්‍යය සම්පන්න බව හඳුනාගත් අය වැඩිදුර හසුරුවාගැනීම සඳහා නිරීක්ෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සෞඛ්‍ය නිපුණතා සහිත නව විෂයමාලා යොදා ගෙන ඇති පුහුණු මධ්‍යස්ථානවල වැඩිවීම ප්‍රතිශතයක් ලෙස. |
| | | 3.6.2. සෞඛ්‍යයට අදාළ නිපුණතා සංවර්ධනය ඇතුළත් කිරීමට පූර්ව පිටත්වීම් නිපුණතා වැඩසටහන් ශක්තිමත් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සෞඛ්‍ය ගැටළු පිළිබඳ පුහුණු වූ පූර්ව පිටත්වීම් නිපුණතා වැඩසටහන්හි පුහුණුකරුවන් වැඩිවීමේ ප්‍රතිශතය. |
| | 3.7. සියලුම පිටත්වීම් තොටුපළහිදී සංක්‍රමණික සේවකයින්ට උසස් සේවාවක් සහතික කිරීම සහ ආගන්තුක රට තුළ සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පහසුකම් සැලසීම. | 3.7.1. කටුනායක සහ මත්තල ගුවන්තොටුපලේ ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ ඒකකය විසින් ලබාදෙන සේවාවන් වැඩි කිරීමට ජාතික පහසුකම් සමඟ සම්බන්ධවීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සහ මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තුළ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම. |
| | | 3.7.2. ඉහළ පාරිභෝගික සේවාවක් ලබාදීම සහතික කිරීම සඳහා ගුවන්තොටුපළ ඒකකයේ විදේශ රැකියා නියුක්ති කාර්යාංශ ඒකක කාර්යමණ්ඩලයේ හැකියා ධාරිතාව වැඩි කිරීම. | විදේශ රැකියා නියුක්ති කාර්යාංශ සහ අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන්, ගුවන් තොටුපළ සහ ශ්‍රී ලංකා ගුවන් සේවය, ආගමන විගමන දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | පුහුණු කළ නිලධාරීන් ගණන |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 04. සේවා අදියරේදී සංක්‍රමණික සේවකයින් සූරාකෑමට ලක්වීම වැළැක්වීම. | 4.1. විදේශයන්හි සේවය සඳහා හැකියාව සහිත කාර්ය මණ්ඩල බඳවා ගන්නා බවට සහතික වීම. (විකල්පයක් ලෙස තෝරාගත් කාර්ය මණ්ඩයේ හැකියාව සහ ධාරිතාව වර්ධනය සහතික කිරීම) | 4.1.1. බඳවාගැනීමේ නිර්ණායක වැඩි දියුණු කිරීම සහ සම්මත කෙටිකාලීන පුහුණු පාඨමාලා වැඩි දියුණු කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | දීර්ඝ කාලීන | ප්‍රකාශයට පත්කළ බඳවාගැනීමේ නිර්ණායක ලබාගත හැකිවීම.<br>තානාපති සේවයේ නිලධාරීන් සඳහා කලින් කලට සිදුවන පුහුණු කිරීම් පිළිබඳ වාර්තා. |
| | | 4.1.2. විදේශීය දූත මෙහෙවර තුළ තෝරාගත්/හඳුනාගත් කාර්ය මණ්ඩලයෙන් කලින් කලට සමාලෝචන ලබාගැනීම. | | මධ්‍ය කාලීන | කලින් කළට සිදුවන සමාලෝචන පිළිබඳ වාර්තා. |
| | 4.2. විදේශ රැකියා අමාත්‍යාංශය විසින් මාර්ගෝපදේශ සහ අත්පොත උපයෝගී කරගැනීම සැලකිල්ලට ගැනීම සහ කලින් කලට සමාලෝචන සිදු කිරීම. | 4.2.1. සංක්‍රණික සේවකයින්ට සේවය ලබාදීමේදී ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල තුළ අනුරූපතාව සහතික කිරීමට රාජතාන්ත්‍රික මෙහෙවර සඳහා මෙහෙයුම් අත්පොත මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කරන බව සහතික කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | දූත මණ්ඩල ප්‍රධානියා විසින් මෙහෙයුම් අත්පොත භාවිතා කිරීමින් විශේෂ කාර්යාල ක්‍රියාපටිපාටි නිකුත් කිරීම. |
| | 4.3. නීති සහාය ලබාගැනීම සඳහා ගමනාන්ත රටේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීම. | 4.3.1. නීති සහාය ලබාගැනීම සඳහා ගිවිසුම් වලට ඇතුළත් වීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ශ්‍රී ලංකාවේ සංක්‍රණික සේවකයින් සඳහා අඛණ්ඩව නීති සහාය ලබා ගැනීමට නීතිඥ මණ්ඩලයක් පිහිටුවීම. |
| | 4.4. නුපුහුණු කාණ්ඩය අවධානමට පත්වීම අවම කරගැනීම සඳහා ඉහළ නිපුණතා සහිත රැකියා අවස්ථා ලබාගැනීම සඳහා ගමනාන්ත රටේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීම | 4.4.1. ඉහළ නිපුණතා සහිත රැකියාවන්හි නව අවස්ථා ලබාගැනීම සඳහා ගිවිසුම්වලට එළඹීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | ලබාගත් උසස් නිපුණතා රැකියා ඇණවුම් ගණන.<br>සොයාගත් නව ගමනාන්ත ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 4.5. ගමනාන්ත රට තුළ ශ්‍රී ලාංකීය සේවකයින් සමග අදාළ (නීති හා රෙගුලාසි) යාවත්කාලීන කිරීම් හුවමාරු කර ගැනීමේ යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම. | 4.5.1. අදාළ විදේශීය දූත මණ්ඩලය මගින් ගමනාන්ත රටතුළ ශ්‍රී ලාංකීය සේවකයින් සමග අඛණ්ඩ සම්බන්ධතාව වැඩි කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ජාත්‍යන්තර සංක්‍රමණික දිනය, නිදහස් දිනය, ආගමික නිවාඩු දින වැනි ශ්‍රී ලංකාවේ ඇති විශේෂ දිනයන් හා සමගාමීව සංවිධාන කළ විශේෂ සිදුවීම් / කාර්යයන්. |
| | 4.6. විදේශීය බඳවා ගැනීමේ ආයතන සහ ඒවා විසින් ලබා දෙන සේවා නිවැරදිව සිදු වන බව සහතික කිරීම | 4.6.1. විදේශීය බඳවාගැනීමේ ආයතනවල පහසුකම් සහ හැකියාවන් අඛණ්ඩව පරීක්ෂා කිරීම සඳහා යාන්ත්‍රයක් ස්ථාපිත කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | මධ්‍ය කාලීන | ශ්‍රම සහායකයින්ට උපයෝගී කර ගත හැකි පරිද්දෙන් විදේශ නියෝජිතයන් නිරීක්ෂණයට ලක් කළ හැකි මාර්ගෝපදේශ සකස් කිරීම. |
| 05. ජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම. | 5.1. සංක්‍රමණික ශ්‍රමිකයන් සූරාකෑමට ලක් විය හැකි අවදානම් තත්වය සහ මිනිස් ජාවාරම ඇතුළු සංක්‍රමණ ක්‍රියාවලියේ සෑම අදියරයකදීම ආරක්ෂාකාරීව සංක්‍රමණය වීම පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම. | 5.1.1. ජනමාධ්‍ය අතර බෙදාහැරීම සඳහා විශේෂිත අධ්‍යාපනික සහ සන්නිවේදන තොරතුරු වැඩි දියුණු කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය<br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>රාජ්‍ය මාධ්‍ය | මධ්‍ය කාලීන | විශේෂ තොරතුරු බෙදා හැරීම සඳහා විධිමත් ගුවන් කාලයක් ලබාදීම පිළිබඳ මාධ්‍ය ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇති කරගැනීම. |
| | | 5.1.2. රජයේ සහ රාජ්‍ය නොවන සියලුම පාර්ශ්වකරුවන් සඳහා ඉලක්කගත ජාතික සහ පළාත් මට්ටමේ වැඩසටහන් පැවැත්වීම. | | | සූරාකෑම සහ ජාවාරම් ක්‍රම මත පදනම්වූ පැමිණිලි සංඛ්‍යාව අඩුවීම.<br>මිනිස් ජාවාරම් මත ඒ සම්බන්ධයෙන් වාර්ෂිකව ඉදිරිපත් වූ චෝදනා ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 5.2. සංක්‍රමණික ශ්‍රමිකයන් පිළිබඳ ජනතා ආකල්ප සහ දෘෂ්ටිකෝණ වෙනස් කිරීම සහ ඔවුන් පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩ නැගීම. | 5.2.1. සංක්‍රමණික සේවකයින්ගෙන් හිමිවන ධනාත්මක දායකත්වය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය<br><br>විදේශ රැකියා අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | පූර්ව පිටත්වීම් පුහුණුවේදී සහ ජාතික අවස්ථාවලදී තම ධනාත්මක අත්දැකීම් හුවමාරු කරමින් කථිකයින් හෝ සම්පත් දායකයින් ලෙස කටයුතු කළ සංක්‍රමණිකයින්ගේ සංඛ්‍යාව.<br><br>ජනතාව දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍ය විසින් ක්‍රියාත්මක කරන ලද ධනාත්මක වැඩසටහන් ගණන.<br><br>රටේ ආර්ථිකයට සංක්‍රමණික සේවකයින්ගේ ධනාත්මක දායකත්වය පිළිබඳ දැනුවත් කිරීමට සංවිධානය කළ විශේෂිත වැඩසටහන්.<br><br>තමන් සම්බන්ධ ලිපි හා වාර්තාවන් හි ධනාත්මක ප්‍රතිරූපය ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන සමඟ සිදුකළ වැඩසටහන් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 06. ගමනාන්ත රටවල සංක්‍රමණික සේවකයන්ගේ ආරක්ෂාව වැඩි කිරීම. | 6.1. විදේශීයන් හි ශ්‍රී ලාංකීය සංක්‍රමණික සේවකයින් ආරක්ෂා කෙරෙන යාන්ත්‍රණ බල ගැන්වීම. | 6.1.1. ප්‍රධාන ගමනාන්ත රටවල් සමඟ නව ද්වී පාර්ශ්වික ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සහ සමාලෝචනය කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | එක් එක් රට සමඟ පවත්වන ලද ඒකාබද්ධ තාක්ෂණ කමිටු රැස්වීම් ගණන.<br><br>උසස් නිපුණතා මට්ටම් ප්‍රවර්ධනය කිරීමට අලුත් ගමනාන්ත රටවල් සමඟ එළැඹි ද්විපාර්ශ්වික ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් ගණන. |
| | | 6.1.2. විදේශ දූත මෙහෙවරයන්හි කම්කරු අංශවලට පිළිගත් සුදුසුකම් සහිත නිලධාරීන් පත් කිරීම සහ පත්වීම් ලද රටේ කම්කරු නීතිය සහ අදාළ භාෂා නිපුණතා ඇතුළුව රටේ අභ්‍යන්තර නීතිය පිළිබඳ ඔවුන්ගේ පුහුණුව වැඩි කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>විදේශ රැකියා අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන.<br><br>සංවිධාන කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. |
| | | 6.1.3. නීතිඥ මණ්ඩලයක් පත් කිරීමට ශ්‍රමය ලබන රටේ රාජතාන්ත්‍රික මෙහෙවර සැපයීම සහ ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ මූල්‍යමය සහාය තුළින් නීතිමය සහාය තහවුරු කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | විපතට පත්වූවන්ට නීතිමය පහසුකම් ලබාදෙන එක් එක් රටවල ප්‍රජා සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 07. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවූ සංක්‍රමණික සේවකයන්ට සේවාවන් ලබාදීම. | 7.1. මරණයක් හෝ අවදානම් අවස්ථාවක ඵලදායීව ප්‍රතිචාර දැක්වීම. | 7.1.1. මෙතෙක් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවූ සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන ගැටළු ආමන්ත්‍රණය කිරීමට ප්‍රමාණවත් සම්පත් සහිතව විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් සම්බන්ධතා අංශයේ සේවා වැඩි කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවූ සංක්‍රමණික සේවකයින්ගෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් සම්බන්ධතා අංශයට වාර්තා වූ සිද්ධි ගණන.<br>ප්‍රතිලාභින් ගණන. |
| 08. සංක්‍රමණික සේවකයන් නැවත පැමිණීම සහ සමාජගත කිරීම. | 8.1. සමාජ, ආර්ථික, භෞතික හා මානසික යහපැවැත්ම සහතික කිරීම සහ සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සේවයේ නියුක්ත කරවීම හා සවි බල ගැන්වීම. | 8.1.1. සංක්‍රමණික සේවකයින් නැවත පැමිණීම සහ සමාජගත කිරීම පිළිබඳ උප ප්‍රතිපත්ති සහ ජාතික කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | ප්‍රතිලාභින් ගණන. |
| | | 8.1.2. ආබාධිත තත්ත්වයට පත් සංක්‍රමණික සේවකයින්ද ඇතුළුව නැවත පැමිණි සංක්‍රමණිකයින් ඵලදායීව සමාජගත කිරීම සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම් වෙත ප්‍රවේශවීමට සහාය ලබාදීම සහ අවශ්‍ය අයට නැවත පැමිණීම සඳහා දිගුකාලීන ආරක්ෂාව සහ සේවය ලබාදීම. | | | ප්‍රතිලාභින් ගණන. |
| | | 8.1.3. ආරක්ෂිත සහ ගෞරවනීය නැවත පැමිණීමක් සහ සමාජගත කිරීමකට සහායවීම පිණිස ප්‍රමාණවත් නිලධාරීන්, කලාපීය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් සමග අනෙකුත් ආයතන හා සම්බන්ධ විය හැකි පරිදි, විදේශ රැකියා නියුක්ති කාර්යාංශයෙහි විශේෂ ඒකකයක් පිහිටුවීම. | | | ඒකක පිහිටුවීම.<br>ප්‍රතිලාභින් ගණන. |
| | | 8.1.4. මූලික සෞඛ්‍යාරක්ෂක ආයතන තුළ තොරතුරු කළමනාකරණ ක්‍රමයක් ඇති කිරීම. | | | තොරතුරු කළමනාකරණ ක්‍රමය තුළ ලියාපදිංචි නැවත පැමිණි සංක්‍රමණිකයින් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 8.2. සාර්ථකව නැවත පැමිණි සංක්‍රමණිකයන් ප්‍රාථමික සෞඛ්‍යය සේවා පද්ධතියට ඇතුළත් කරගැනීම සහතික කිරීම. | 8.2.1. සෞඛ්‍ය ගැටළු නිවාරණය සහ කළමනාකරණය සඳහා යොමු කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | දීර්ඝ කාලීන | HIV, මැලේරියා, ක්ෂය රෝගය, බෝ නොවන රෝග සඳහා ස්වේච්ඡාවෙන් පරීක්ෂාවන්ට ඉදිරිපත් වූ නැවත පැමිණි සංක්‍රමණිකයින් ගණන.<br><br>පරීක්ෂාකළ මැලේරියා, HIV, ක්ෂය රෝග, බෝ නොවන රෝග යනාදී රෝග වැළඳී ඇති බවට තහවුරු වූ සංක්‍රමණිකයන්ගේ ප්‍රතිශතය. |
| 09. සෑම පියවරකදීම සංක්‍රමණික සේවකයින්ගේ දුක් ගැනිවිලි ඵලදායී ආකාරයෙන් නිරාකරණය කිරීම. | 9.1. මිනිස් ජාවාරමට හසුවූවන් සඳහා වන්දි හිමිවන ක්‍රියාමාර්ග සහතික කිරීම. | 9.1.1. කාන්තා සංක්‍රමණික සේවකයින්ගේ විශේෂිත පැමිණිලි සඳහා විශේෂ බේරුම් මණ්ඩලයක් ස්ථාපිත කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br><br>විදේශ රැකියා අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | බේරුම් මණ්ඩලය ස්ථාපිත කිරීම.<br><br>බේරුම් මණ්ඩලය විසින් විසඳන ලද ගැටළු සංඛ්‍යාව. |
| | 9.2. ජාතික පාර්ශවකරුවන්, නියෝජිතායතන සහ සිවිල් සමාජ ආයතන සමඟ එක්ව, සංක්‍රමණික සේවකයින්ගේ දුක් ගැනිවිලි සඳහා වන්දි ලබාදීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සහ කේන්ද්‍රගත කිරීම. | 9.2.1. විපතට පත් වූ අයට අවශ්‍ය, වෛද්‍ය, මානසික, නීතිමය සහ වෙනත් සහායන් ලැබෙන බව සහතික කිරීමට විශේෂඥයින් සඳහා යොමු කිරීමට යාන්ත්‍රණයක් ඇතුළුව, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයෙහි විශේෂ ඒකකයක් පිහිටුවීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | ඒකක පිහිටුවීම.<br><br>ඒකකය වෙත පැමිණි සේවකයින් ගණන.<br><br>ප්‍රතිලාභීන් සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 9.3. සංක්‍රමණික සේවකයන් වෙනුවෙන් බේරුම් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ මෙම සේවය සඳහා පුළුල් ප්‍රචාරයක් තිබෙන බවට සහතික වීම. | 9.3.1. බේරුම් කිරීම සහ ආරාවුල් විසඳීමේ යාන්ත්‍රණය සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | විසඳන ලද පැමිණිලි ගණන. |
| | 9.4. සේවයේ නියුතු සංක්‍රමණික සේවකයින් සඳහා උපදෙස් සහ අවවාද ලබාදීමට හැකි වන පරිදි ඔවුන්ගේ ගැටළු, හිමිකම්, අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ විදේශ දූත මණ්ඩල නිලධාරීන් මනාව දැනුවත් බව සහතික කිරීම. | 9.4.1. මානසික උපදේශනය ඇතුළුව සුබ සාධන සේවා සහ කොන්සියුලර් සහාය වැඩි කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | ලබාදුන් සහාය. |
| | | 9.4.2. දුක් ගැනවිලි නිරාකරණය සඳහා විදේශීය දූත මණ්ඩලයේ නිලධාරීන්ගේ හැකියාව වැඩි දියුණු කිරීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම. | | | |
| 10. ඡන්දය දීමේ අයිතිය | 10.1. සංක්‍රමණික සේවකයින්ගේ ඡන්ද අයිතිය සහතික කිරීම. | 10.1.1. විදේශයන්හි ජීවත්වන ශ්‍රී ලාංකීය සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිසමට යෝජනා ලබාදීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | ඡන්දය දීමේ අයිතියෙහි වැඩිවීම. |
| 11. සංක්‍රමණික සේවකයන්ගේ නිපුණතා ඉහළ නැංවීම | 11.1. විදේශ ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා පුහුණු සහ වෘත්තීය ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම. | 11.1.1. ජාත්‍යන්තරව පිළිගත් නිපුණතා සපුරාලීමට පුහුණු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව හා මෘදු කුසලතා වර්ධනය කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය (NAITA) | මධ්‍ය කාලීන | පුහුණු සහ පාඨමාලා විෂයකරුණු.<br>පුහුණු කළ පුද්ගලයින් සංඛ්‍යාව.<br>වැඩි දියුණු කළ පුහුණු ඒකක ගණන. |
| | | 11.1.2. අදාළ අමාත්‍යාංශයන්හි සහාය ලබාගනිමින් පුහුණු ඒකකවල තත්ත්වය වර්ධනය කිරීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 12. සංක්‍රමණික සේවකයන්ගේ පවුල්වල සෞඛ්‍ය සහතික කිරීම. | 12.1. හදිසි සෞඛ්‍යය තත්ත්වයක් හෝ සංක්‍රමණික සේවකයෙකුගේ මරණයක් වැනි විශේෂ අවස්ථාවන්ට මුහුණ පෑමේදී ඔවුන්ගේ පවුල්වලට සහාය වන තොරතුරු උත්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ ක්‍රියාවලියක් සකස් කිරීම. | 12.1.1. හදිසි සෞඛ්‍යය තත්ත්වයක් හෝ සංක්‍රමණික ශ්‍රමිකයෙකුගේ මරණයක් වැනි විශේෂ අවස්ථා සම්බන්ධයෙන් දැනුවත්භාවයක් ඇති කිරීමට තොරතුරු උත්පාදනය හා බෙදාහැරීමේ ක්‍රියාවලියක්. | සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | සංක්‍රමණිකයින් සහ පවුල් අතර සන්නිවේදනය අඩාලවීම පිළිබඳ ලැබුණු පැමිණිලි ගණන.<br><br>සෞඛ්‍ය තත්ත්වයන් ආශ්‍රිත සන්නිවේදන කටයුතු මෙහෙයවීම සඳහා සෑම මට්ටමකම / අදාළ පාර්ශ්වකාර සංවිධානවල පුහුණු නිලධාරීන් ගණන. |
| 13. අවදානම් සහගත තත්ත්වයන්ට පත්විය හැකි අවස්ථාවන්හි ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණික-යින්ගේ ළමුන් ආරක්ෂා කිරීම. | 13.1. අවදානම් තත්ත්වයේ පසුවන සංක්‍රමණික සේවකයින්ගේ ළමුන් හඳුනාගැනීම සහ සහයවීම සඳහා අවධානය යොමුකළ ඉලක්කගත වැඩසටහන් වැඩි දියුණු කිරීම. | 13.1.1. අවදානම් සහගත තත්ත්වයේ පසුවන සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සමාජීය හා පවුල් පිළිබඳ සටහන් සකස් කර, ඔවුන්ගේ දරුවන් සඳහා විශේෂ සුබ සාධන සහ ආරක්ෂණ අවශ්‍යතා ඇතුළත් දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම. | | කෙටි කාලීන | සකස් කළ පවුල් සටහන් ගණන.<br><br>දත්ත ගබඩාවක් නිර්මාණය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 14. තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළට සංක්‍රමණික සේවකයින් සහ පවුලේ සාමාජිකයි-න්ගේ අදහස් ඇතුළත් කිරීම. | 14.1. සංක්‍රමණික සේවකයින් සහ පවුලේ සාමාජිකයින් සම්බන්ධ කරගත හැකි, ඔවුන්ගෙන් නිරන්තරයෙන් ප්‍රතිචාර ලබා ගත හැකි යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | 14.1.1. අවදානම් සහගත පවුල්වල අවශ්‍යතා පරිදි පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම / ළමා ආරක්ෂණ සැලසුම් සම්බන්ධීකරණය කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | සකස් කළ සැලසුම් ගණන.<br>සහාය ලබා දුන් ළමුන් ගණන. |
| | | 14.1.2. එම පවුල් පිළිබඳ කලින් කල සොයා බැලීම සහ නියාමනය. | | | පසු විපරම් සංචාර ගණන. |
| | | 14.1.3. සංක්‍රමණික සේවක සංවිධාන ජාතික උපදේශන කමිටුවේ ස්ථිර සාමාජිකයින් බවටද, රෙගුලාසි සහ ප්‍රතිපත්ති අවසන් කිරීමට පෙර ඔවුන්ගෙන් උපදෙස් ලබා ගන්නා බවටද සහතික කිරීම. | | | ජාතික උපදේශන කමිටුවේ සිටින සංක්‍රමණික සේවක සංවිධාන ගණන.<br>ජාතික වැඩමුළු සඳහා සහභාගී වන සංක්‍රමණික සේවක සංවිධාන ගණන. |
| 15. පර්යේෂණ හා සංවර්ධනය තුළින් සජීවී සංක්‍රමණ (LM) ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. | 15.1. ශ්‍රම සංක්‍රමණය සම්බන්ධයෙන් ශක්තිමත් පර්යේෂණ වැඩපිළිවෙලක් වැඩි දියුණු කිරීම. | 15.1.1. ශ්‍රම සංක්‍රමණයට අදාළ වන ප්‍රධාන ක්ෂේත්‍ර / ගැටළු පිළිබඳ කලින් කළට සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | දීර්ඝ කාලීන | සිදුකරන ලද පර්යේෂණ ගණන. |
| | | 15.1.2. ලබා ගත හැකි සමීක්ෂණ හා පර්යේෂණවල සොයාගැනීම් සහ වාර්තා රැස් කිරීම. | | | ලබාගත හැකි වාර්තා ගණන. |
| | | 15.1.3. පර්යේෂණවල සොයාගැනීම් අදාළ පාර්ශ්වකරුවන් / ප්‍රතිපත්ති සම්පාදකයින් සමග බෙදා ගැනීම. | | | පර්යේෂණවල සොයාගැනීම් සැබෑ ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලියට පිටිවහලක් වූ අවස්ථා ගණන. |
| | | 15.1.4. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයෙහි පර්යේෂණ ධාරිතාව වැඩි කිරීම සඳහා පර්යේෂණ ආයතන සමඟ සහයෝගී පර්යෙෂණ ප්‍රවර්ධනය කිරීම | | | කාර්ය සැලැස්මක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 16. සියලුම සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම. | 16.1. සම්මුතිය මත පදනම්ව ශ්‍රී ලංකාවට පනවන ලද බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා පරිපූර්ණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 16.1.1. ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සැලැස්මක් වැඩි දියුණු කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සකස් කළ හා ක්‍රියාත්මක කළ කාර්ය සැලැස්ම. |
| | | 16.1.2. සියලුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවන්ට පරිවර්තනය කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර පුළුල්ව බෙදා හැරීම. | | | රාජ්‍ය භාෂාවෙන් එක්සත් ජාතීන්ගේ සම්මුතිය ලබාගත හැකිවීම. |
| | | 16.1.3. මධ්‍යම / දිස්ත්‍රික් / ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ සියලුම පුහුණු හා ධාරිතාව ඉහළ නැංවීම්වලදී එක්සත් ජාතීන්ගේ සම්මුතිය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට ඒකක ඇතුළත් කිරීම. | | | පුහුණු වැඩසටහන් ගණන. |
| 17. ගෝලීය සහ කලාපීය ප්‍රතිපත්ති සංවාද තුළින් ශ්‍රම සංක්‍රමණය ශක්තිමත් කිරීම. | 17.1. ශ්‍රමය ලබාදෙන සහ ලබාගන්නා රටවල් සමඟ සම්බන්ධතා ශක්තිමත් කිරීම. | 17.1.1. ගෝලීය සහ කලාපීය ප්‍රතිපත්ති සංවාද තුළින් මව් රටවල් අතර සහයෝගය, සාධාරණ බඳවාගැනීමේ සම්මත ප්‍රවර්ධනය කිරීම සහ ජාත්‍යන්තර මානව හිමිකම් සහ ශ්‍රම සම්මත මත පදනම් ව ඒකීය සේවා ගිවිසුම් වැඩි කිරීම තවදුරටත් සිදු කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය | කෙටි කාලීන | සකස් කළ හා ක්‍රියාත්මක කළ කාර්ය සැලැස්ම. |
| | | 17.1.2. සියලුම සංක්‍රමණික සේවකයින් සඳහා ශිෂ්ට රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට සංක්‍රමණය පිළිබඳ කලාපීය උපදේශක ක්‍රියාවලියේ සාමාජික රටවල් සහ ගමනාන්ත රටවල් සමඟ සහයෝගීත්වයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | විදේශ රැකියා අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>විදේශ රැකියා නියුක්ති කාර්යාංශය | කෙටි කාලීන | අදාළ සංවාද පිළිබඳ උපායමාර්ගික දැක්ම යටතේ සිදු කළ කාර්යයන් ගණන. |

# විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම්

# විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම්

ශ්‍රී ලංකා රජය විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අදාළව විශාල ප්‍රගතියක් ලබාගෙන ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය මගින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්හට ආබාධය මත පදනම්ව වෙනස් ලෙස නොසැලකීම තහවුරු කෙරෙන අතර ඔවුන්ගේ ගෞරවය, අභිමානය හා ස්වාධීනත්වය තහවුරු කිරීම සිදු කරනු ලබයි. තවද 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මගින් "විශේෂ අවශ්‍යතා සහිත කිසිඳු තැනැත්තෙකු යම් සේවා නියුක්තියක හෝ කාර්යාලයක හෝ සේවයට බඳවා ගැනීමේදී හෝ යම් අධ්‍යාපනික ආයතනයකට ඇතුළු කර ගැනීමේදී ඒ ආබාධය හේතුකොට ගෙන ඔහු යම් වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොකළ යුතු බව සහතික කෙරේ".

ආබාධිතභාවයට අදාළව ප්‍රතිපත්ති, මාර්ගෝපදේශයන්, නීති හා වැඩසටහන් සකස් කිරීමේ ප්‍රධාන රාජ්‍ය ආයතනය සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයයි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සේවා හා සංවර්ධන කටයුතු අමාත්‍යාංශය මගින් අධීක්ෂණය කරමින් සහාය ලබා දෙනු ලැබේ. අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකාව සඳහා ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන ලද අතර 2003 අගෝස්තු මාසයේදී ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා වන ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය මගින් වළක්වා ගත හැකි රෝග අඩු කර ගැනීම, ආබාධිතභාවයට පත්වීම වළක්වා ගැනීම සඳහා ආබාධිතභාවය පිළිබඳ සෞඛ්‍ය වැඩසටහන් පැවැත්වීම හා සෞඛ්‍යාරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම ඉලක්ක කෙරේ. තවද එම ප්‍රතිපත්තිය මගින් පුනරුත්ථාපනය කෙරෙන විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ මුල් ළමාවිය සංවර්ධනය කෙරෙහිද අවධානය යොමු කෙරේ. සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පුද්ගල සේවාවන්, නිවාස වෙත පැමිණීම, උපකාරක මෙවලම්, උග්‍ර හා නිදන්ගත මානසික රෝගවලින් පෙළෙන ළමුන්ගේ දෙමාපියන් සඳහා උපදේශනය සහ දැනුවත් කිරීමද මෙමගින් සිදු කෙරේ. එමෙන් ම මානසික සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ආබාධිත පුද්ගලයන්ගේ ගැටළු සඳහා පිළියම් සෙවීම සඳහා මගපෙන්වීම් සපයනු ලැබේ. 1997 පොදු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ටද සාමාන්‍ය පංති කාමර තුළ අධ්‍යාපනය ලැබීම සඳහා අවස්ථාව සැලසීම හඳුන්වා දෙනු ලැබීය. ආබාධ සහිත ළමුන්ගේ යහපත සඳහා ඉගැන්වීමේ වෙනස්කම්, විෂයමාලාව, උපදේශනය, රැකියා මාර්ගෝපදේශනය, පාසල් පාදක කළමනාකරණය හා ගුරු අධ්‍යාපනය සඳහා නව ක්‍රමෝපායන් ආදිය ප්‍රවර්ධනය කරන ලදී.

1996 දී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ජාතික සභාවක් පිහිටුවන ලදී. මෙම සභාවේ කාර්යභාරය වන්නේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කර්යාලය හරහා ශ්‍රී ලංකාවේ යිශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය, වර්ධනය හා ආරක්ෂා කිරීම සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට අදාළ ගැටළු පිළිබඳ රජයට උපදෙස් ලබා දීමයි. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික සභාව හා ජාතික ලේකම් කාර්යාලය යන ආයතන දෙකම සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට ශ්‍රී ලංකාව 2007 මාර්තු 30 දින අත්සන් තැබීමෙන් පසුව පවතින ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. නව නීතිය විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පනත ලෙස නම් කෙරෙනු ඇති අතර පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්වේ. 2016 දී ශ්‍රී ලංකා රජය විසින් ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අපරානුමත කරන ලදී.

කෙසේ වෙතත්, සිවිල්, දේශපාලන, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ක්ෂේත්‍රයන්ට අදාළව පූර්ණ සහභාගීත්වය හා ඇතුළත් වීම තහවුරු කිරීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට සේවාවන් සපයා ගැනීමේදී බොහෝ බාධකයන්, එනම් පාරිසරික බාධක, ප්‍රවාහන බාධක, සන්නිවේදන බාධක හා සංස්කෘතික බාධකයන්ට මුහුණ දීමට සිදු වන බව නිරීක්ෂණය කළ හැකිය. මෙරට සංඥා භාෂා පුහුණුව හා භාෂණ පරිවර්තන පහසුකම් ව්‍යාප්ත කිරීම ඉතා වැදගත් වේ. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ යහපැවැත්මට අදාළ ජාත්‍යන්තර සම්මුතීන්, ජාතික නීති හා රාජ්‍ය ප්‍රතිපත්ති / රෙගුලාසි සැලකිල්ලට ගනිමින් සහ අදාළ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, සිවිල් සමාජයේ නියෝජිතයන් සහ ශාස්ත්‍රඥයින්ගේ උපදෙස් මත ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය අනෙකුත් සියලු පාර්ශවකරුවන් සමග එක්ව මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ඇප කැප වී කටයුතු කරයි.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ | 1.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වූ විශේෂිත පනතකින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව අයිතිවාසිකම් පරිච්ඡේදය තුළින් පැහැදිලිව ඔවුන්ගේ අයිතීන් හඳුනාගැනීම.<br><br>මෙම අයිතීන්ට :<br><br>ආර්ථික, සමාජ, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් ;<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අධිකරණ සමාලෝචන පිළිබඳ ප්‍රධානත්වය ;<br><br>ස්ථාපිත ක්‍රියාත්මක කිරීම / නියාමනය සඳහා ස්වාධීන යාන්ත්‍රණය. | 1.1.1. මෙහෙයුම් කමිටු සාමාජිකයන් විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හා ඔවුන්ගේ නියෝජිත සංවිධාන වෙනුවෙන් පෙනී සිටින්නන් සඳහා උපදේශනය. | පාර්ලිමේන්තුව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙහෙයුම් කමිටුව මගින්) | කෙටි කාලීන | වි.අ.පු. නියෝජිතයින් සමඟ පවත්වන ලද උපදෙස් සාකච්ඡාවන් ගණන.<br><br>මෙහෙයුම් කමිටුව මගින් අදාළ කර ගන්නා ලද වි.අ.පු. අයිතිවාසිකම් යෝග්‍ය ලෙස සකස් කිරීම. |

*** වි.අ.පු. - විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්**

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 2. ස්වාධිපත්‍ය පිළිබඳ අයිතිවාසිකම. | 2.1. සෑම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයෙකුගේම පුද්ගල ස්වාධිපත්‍ය, පෞද්ගලිකත්වය සහ පුරවැසිභාවයට ගරු කිරීම, සහ සහභාගිත්වය, ස්වයං-නියෝජනය සහ තමා වෙනුවෙන් කථාකිරීම සඳහා පරිසරයක් සහතික කිරීම. | 2.1.1. මානසික හා කායික ආබාධ සහිත පුද්ගලයින් සඳහා නිර්මාණය කළ සහ /හෝ ඔවුන් විසින් භාවිතා කරන ප්‍රධාන සේවා සියල්ල හඳුනාගැනීම. | සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රධාන සේවා සහ වැඩසටහන්වල තත්ත්ව වාර්තා. |
| | | 2.1.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ නිදහස සම්බන්ධයෙන් සේවා සහ වැඩසටහන් ව්‍යූහ, ක්‍රියාවලි සහ පුද්ගලයන්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ කැමැත්ත මත තෝරාගැනීම් සිදු කිරීමට සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි (CRPD) බැඳීම් පිළිබිඹු වන අයුරින් තීරණ ගැනීමේදී ඔවුන්ගේ සහභාගිත්වය ශක්තිමත් කිරීම සඳහා සමාලෝචනය කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අවසන් කර ඇති හඳුනාගත් සේවා සහ වැඩසටහන් පිළිබඳ සමාලෝචන ප්‍රතිශතය. |
| | | 2.1.3. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් විමසීමෙන් පිළියම් විධි, හැකියා වර්ධන ක්‍රියාමාර්ග සහ භාවිතාවන්ගේ වෙනස්වීම් එම සේවා සහ වැඩසටහන් ශක්තිමත් කිරීමට සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ස්වාධිපත්‍ය, පුද්ගලභාවය සහ සම්පූර්ණ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමට නිර්දේශ කිරීම. | ක්‍රියාකාරකම් 15 හි සඳහන් ස්වාධීන අධීක්ෂණ පටිපාටිය | දිගුකාලීන | ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ හැකියා වර්ධනයට සහාය වන හඳුනාගත් සේවා සහ වැඩසටහන් ප්‍රතිශතය.<br><br>එම වැඩසටහන් තුළින් ඇති වූ වෙනස්කම්වල වර්ධනයන්හි ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 3. යෝග්‍ය රැකියා සඳහා අයිතිවාසිකම ආරක්ෂා කිරීම. | 3.1. සාධාරණව යොදාගැනීමේ විධිවිධාන තුළින් වෙනස් ලෙස නොසැලකීම සහතික කිරීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ග තුළින් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය වැඩි කිරීම. | 3.1.1. සුදුසුකම් ලත් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට අයදුම් කිරීම සඳහා සමාන අවස්ථාවන් සැලසෙන පරිදි ඇගයීම් කිරීම් සහ පරීක්ෂණ (මානසික සහ වෛද්‍ය යෝග්‍යතා පරීක්ෂණ ඇතුළුව) යොදා ගැනීම ;<br><br>විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සේවා ස්ථානයන්හි කටයුතු කිරීම පහසුවීමට ප්‍රමාණවත් පහසුකම් ලබාදීම, ඇතුළුව බඳවා ගැනීම් සහ සේවා ස්ථානයේ තත්ත්වයට අදාළව නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය;<br><br>පළාත් සභා | මධ්‍ය කාලීන | සංශෝධිත බඳවාගැනීමේ නිර්ණායක ;<br><br>අයදුම්කරන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br><br>ලබා දෙන පහසුකම් (ක්‍රියාත්මක කිරීම) |
| | | 3.1.2. රාජ්‍ය අංශයේ සියලුම රැකියාවන්ට අදාළව අනුමත පුරප්පාඩු අතරින් 3%ක් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා ව්‍යවස්ථානුකූලව වෙන් කිරීම. | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් රැකියාවලට බඳවා ගන්නා සියලුම රාජ්‍ය අංශයේ ආයතන. | දිගුකාලීන | රාජ්‍ය අංශයේ ආයතන තුළ වන විශේෂ අවශ්‍යතා සහිත සේවකයින්ගේ ප්‍රතිශතය. |
| | 3.2. පුද්ගලික අංශයේ සේවා නියුක්තිය වැඩි කිරීම. | 3.2.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ගෞරවයෙන් සලකනු ලබන බවටත්, ඔවුන් සේවා යෝජකයින්, සම සේවකයින් සහ පාරිභෝගිකයින්ගේ අවමන් කිරීම් හෝ අගතිගාමී හැසිරීම්වලින් ආරක්ෂා කරනු ලබන බව සහතික කිරීමට මානව සම්පත් ප්‍රතිපත්ති සහ සමාගම් ව්‍යවහාරයන්ට වෙනස්කම් සිදු කිරීම අවශ්‍ය වේ. | කම්කරු අමාත්‍යාංශය<br><br>කම්කරු විනිශ්චය සභාව<br><br>ලංකා සේවා යෝජකයින්ගේ සංගමය<br><br>වාණිජ මණ්ඩලය<br><br>වෘත්තීය සංගම් | මධ්‍ය කාලීන | සහතික කර සිටීමේ කාර්යයෙහි කොටසක් ලෙස පුද්ගලික අංශය විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් බඳවාගැනීම, ඔවුන්ගේ මානව සම්පත් ප්‍රතිපත්ති සහ ආදාළ භාවිතාවන් පිළිබඳ සමීක්ෂණය. |
| | | 3.2.2. රැකියා ස්ථානයේ සිටින විවිධ විශේෂ අවශ්‍යතා සහිත සේවකයන් සඳහා අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ඇතුළුව අසාධාරණ රැකියා භාවිතයන්ගෙන් ආබාධ සහිත පුද්ගලයින් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයේ ඵලදායීතාවය ඉහළ නැංවීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 3.2.3. විභවයන් සහිත විශේෂ අවශ්‍යතා සහිත සේවකයින් සඳහා රැකියා තනතුරු සහ වෘත්තීය මාර්ගෝපදේශ සකස් කිරීම. | | | |
| | | 3.2.4. විභවයන් සහිත සේවා යෝජකයින්ට තොරතුරු හා සම්බන්ධතා සහ විභවයන් සහිත සේවකයින්ට සියුම් කුසලතා පිළිබඳ පුහුණු ලබාදීම මගින් යථාර්ථවාදී කාර්ය වැඩසටහන්වලට සහයවීම. | | | වෘත්තීය මාර්ගෝපදේශ පහසුකම ස්ථාපිත කිරීම. |
| | | 3.2.5. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ඇතුළත් කිරීම සහ කාලීනව විශේෂ අවශ්‍යතා විගණනයන් සිදු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම ඇතුළුව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සේවයට බඳවා ගැනීම ධෛර්යමත් කිරීම සඳහා පුද්ගලික අංශයට බදු සහන සහ වෙනත් දිරිගැන්වීම් සකස් කිරීම. | | | බදු පාලන ක්‍රමයට ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම. |
| | | 3.2.6. රැකියාවට අදාළ අසාධාරණ භාවිතාවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ආරක්ෂා කිරීමට හැකි වන පරිදි පුද්ගලයන් පුහුණු කිරීම හා ප්‍රවේශ ගැලපීම් සහිතව පවතින පැමිණිලි යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම. | | | විශේෂ අවශ්‍යතා විගණනය සඳහා ස්වේච්ඡා ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ යොදා ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 3.3. පවත්නා රැකියා වෙළෙඳපොළ තුළ යෝග්‍ය රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම සඳහා ප්‍රධාන ධාරාවේ වෘත්තීය සහ වෘත්තීමය පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශය වැඩි කිරීම. | 3.3.1. පවත්නා රෙගුලාසිවලට අනුකූලව අවම ප්‍රමිතීන් අනුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇතුළු සියලු ම පුහුණු මධ්‍යස්ථාන වෙත පුද්ගලයන් හට ප්‍රවේශවීමේ හැකියාව ඇති කිරීම. | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල විධිමත් විගණන සිදු කිරීම.<br>සියලුම විෂයමාලා යොදාගැනීම.<br>දැනට සිටින සංඥා භාෂණ පරිවර්තකයන්ගේ ප්‍රතිශතය.<br>උපකාරක තාක්ෂණය ලබාගත හැකිබව.<br>වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා ඇතුළත් කර ගන්නා ලද විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br>පුහුණු වැඩසටහන්වල ඵලදායීතාව ඇගයීමේ වාර්තාව. |
| | | 3.3.2. අවශ්‍ය පරිදි සියලුම වෘත්තීය පුහුණු පාඨමාලා යොදා ගැනීම සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සාධාරණ ඉඩකඩ සැලසීම් (යොදා ගැනීම්) ලබාදීම. | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | | |
| | 3.4. ස්වයං - රැකියා සඳහා වැඩි කරන ලද සහාය | 3.4.1. කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ඔවුන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවා සඳහා වෙළෙඳ පොළ නිර්මාණය කිරීමට පුහුණු, වෙළෙඳපොළ සහ මූල්‍යනය සඳහා සම්බන්ධතා ඇති කිරීම. | ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය<br>නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>වෘත්තීය පුහුණු අධිකාරිය<br>වාණිජ මණ්ඩලය<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)<br>ජාතික අධ්‍යාපන ආයතනය | මධ්‍ය කාලීන | පුහුණු කරන ලද විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br>ස්වයං රැකියාවන්හි නියුක්ත විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ ප්‍රතිශතය.<br>රාජ්‍ය ණය සහ දීමනා වෙත ප්‍රවේශය ලබා ගත් පුද්ගලයින්ගේ ප්‍රතිශතය. |
| | | 3.4.2. රාජ්‍ය ග්‍රාමීය බැංකු තුළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 4. ප්‍රමාණවත් ජීවන මට්ටමක් හා සමාජ ආරක්ෂාව | 4.1 අන්‍යයන් සමඟ සමාන පදනමක් මත ප්‍රධාන ධාරාවේ සමාජ ආරක්ෂණ වැඩසටහන් තුළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් පූර්ණ වශයෙන් ඇතුළත් කිරීම. | 4.1.1. සුදුසුකම් ලත් සියලුම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සමාජ ආරක්ෂාව සහ දිළිඳුකම තුරන් කිරීමේ යෝජනා ක්‍රම මගින් සමානව ප්‍රතිලාභ ලබාදීමට ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ව්‍යූහ තුළ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය<br><br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>ජාතික ළමාරක්ෂක අධිකාරිය<br><br>රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br><br>රාජ්‍ය ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය | මධ්‍ය කාලීන | දිවිනැගුමෙහි ඇතුළත් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br><br>සමෘද්ධියෙහි ඇතුළත් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය. |
| | 4.2. දැනට පවත්නා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශේෂ වූ සමාජ ආරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම. | 4.2.1. යෝග්‍යතාව අනෙකුත් පොදු සමාජ ආරක්ෂණ වැඩසටහනවලින් (උදා : දරිද්‍රතා මට්ටම, ස්ත්‍රීපුරුෂභාවය, ආබාධිතභාවයේ තත්ත්වය, පවුල / ආරක්ෂාව ලබාදෙන්නාගේ සහාය) සීමා නොකරන බව සහතික කරමින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා යෝග්‍යතා නිර්ණායක සංවර්ධනය කිරීම සහ ප්‍රසිද්ධ කිරීම. | සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය | | චක්‍රලේඛ තුළින් ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් යෝග්‍යතා නිර්ණායක ප්‍රසිද්ධ කිරීම. |
| | | 4.2.2. සුදුසුකම් ලත් සියලුම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය ඇති බව සහතික කිරීම සඳහා ගනු ලැබූ නිශ්චිත ක්‍රියාපටිපාටිමය සහ අයවැය ක්‍රියාමාර්ග. | රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය | | විශේෂ දීමනා ලැබෙන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය. |
| | | 4.2.3. පුද්ගලයාගේ කැමැත්ත සහ මනාපයට ගරුකරමින්, වීදියේ හෝ ස්ථිර වාසස්ථානයක් නොමැතිව ජීවත්වන මානසික ආබාධ සහිත පුද්ගලයින් සඳහා සුදුසු සහාය සහ සේවා ලබාදීම. | සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය | | නේවාසික පහසුකම් සහිත මානසික - සමාජ ආබාධ සහිත පුද්ගලයින් |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 4.3. ආර්ථික සංවර්ධන සැලසුම් සහ උපායමාර්ග ඇතුළත් කිරීම. | 4.3.1. සංවර්ධන ප්‍රතිපත්ති පිළිබිඹු කරන ක්‍රමෝපායන් හා සැලසුම්වලට අදාළ ක්‍රියාවලීන්, ප්‍රතිඵල හා අයවැය මගින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් නිශ්චිතව හඳුනාගනු ලැබේ. | අග්‍රාමාත්‍ය කාර්යාලය<br><br>රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br><br>පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය<br><br>රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br><br>සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන / දිගුකාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළත් කරන ලද ජාතික, පළාත්, දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන සැලසුම්වල ප්‍රතිශතය.<br><br>විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළත් කරන ලද සංවර්ධනය සඳහා වන ජාතික, පළාත්, දිස්ත්‍රික් මට්ටමේ අයවැය වෙන්කිරීම්වල ප්‍රතිශතය. |
| | 4.4. නිවාස සඳහා වන හිමිකම. | 4.4.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සියලුම ප්‍රජා පාදක හවුල් නිවාස හෝ පහසුකම් සහ එවැනි උපකාර ඉල්ලා සිටින විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ප්‍රවේශය සලසා දීම සහ ඒවා ලබාගැනීමේ හැකියාව ඇති කිරීම. | නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය<br><br>නැවත පදිංචි කරවීමේ අමාත්‍යාංශය<br><br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br><br>නාගරික සංවර්ධන අධිකාරිය<br><br>ඉඩම් ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන අධිකාරිය | මධ්‍ය කාලීන සිට දිගුකාලීන දක්වා | නිවාස හිමිකම ඇති විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br><br>ප්‍රවේශ විය හැකි නිවාස යෝජනා ක්‍රම ප්‍රතිශතය.<br><br>ඉඩම් හිමි විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ පවුල්වල ප්‍රතිශතය.<br><br>යුද්ධයෙන් පීඩිත තමන්ගේ නිවාසවල ජීවත් වන / තමන්ගේ ඉඩමට ප්‍රවේශය ඇති විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සංඛ්‍යාව.<br><br>රජයේ නිවාස දීමනා සඳහා ප්‍රවේශය ඇති විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය. |
| | | 4.4.2. සියලුම සමාජ ආර්ථික මට්ටම්වලට ප්‍රවේශය සඳහා පවත්නා සහාධිපත්‍ය නිවාස විගණනය කිරීම. | | | |
| | | 4.4.3. රාජ්‍ය අංශයේ යෝජනා ක්‍රමවල නිවාස අතරින් කොටසක් (උදා : 3%) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට වෙන්කිරීම. | | | |
| | | 4.4.4. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ප්‍රමුඛතාවය ලබාදීම සඳහා යුද්ධයෙන් පීඩාවට පත් කලාපයන්හී නැවත පදිංචි කරලීමේ වැඩසටහන් සහ නිවාස යෝජනා ක්‍රම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.4.5. සියලුම ඉඩම් බෙදාදීමේ යෝජනා ක්‍රමයන්හිදී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට හා ඔවුන්ගේ පවුල්වලට ප්‍රමුඛතාව ලබාදීම. | | | |
| | | 4.4.6. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා විශේෂිත ඉඩම් බෙදාදීමේ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම. | | | |
| | | 4.4.7. ප්‍රවේශ තත්වය වැඩි දියුණු කිරීමේදී, පරතර හඳුනාගැනීම සඳහා සේවා ඉහළ නැංවීමට ණය සහ දීමනා වැඩි කිරීම. | | | |
| 5. අධ්‍යාපනය සඳහා වන අයිතිවාසිකම ලබා දීම. | 5.1. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්හට සමාන පදනමක් මත ප්‍රාථමික හා ද්විතීයික පාසල් තුළ ගුණාත්මක හා නිදහස් අධ්‍යාපනය ලබාදීම. | 5.1.1. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට නිර්මිත පරිසරය, සන්නිවේදනය සහ තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | දිගු කාලීන | ප්‍රවේශවීමේ හැකියා මට්ටම ඇගයීමට ප්‍රාථමික සහ ද්විතීක පාසල් විගණනය. |
| | | 5.1.2. සුළු සහ මන්ද ඥානාත්මක විශේෂ අවශ්‍යතා සහිත ළමුන් ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අධ්‍යාපනය ලබාදීම සඳහා පුද්ගලගත සහාය ක්‍රියාමාර්ග සකස් කරනු ලැබේ. | අග්‍රාමාත්‍ය කාර්යාලය | කෙටිකාලීන | ගුරු පුහුණුවල ගුණාත්මකභාවය සහ ඵලදායිතාවය. |
| | | 5.1.3. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම / නිපුණතා වර්ධනය ඇති කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය සහ උපකරණ එක් එක් අධ්‍යාපන කලාපය තුළ වන පාසල්වලින් 50% කට ලබා දීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍යකාලීන/ දිගුකාලීන | පුහුණු කරන ලද ගුරුවරුන් සංඛ්‍යාව.<br>විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට ඉගැන්වීම සඳහා පහසුකම් සහිත පාසල්වල ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 5.2. රාජ්‍ය අංශය තුළ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීම සඳහා සියලුම වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට අවස්ථා වැඩි කිරීම. | 5.2.1. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට නිර්මිත පරිසරය, සන්නිවේදනය සහ තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පිවිසීමේ මට්ටම අගයමින් සියලුම තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන පිළිබඳ විගණනය.<br>විවිධ වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සහ වර්ධනය සඳහා නිර්දේශවලට අදාළ ප්‍රතිශතය. |
| | | 5.2.2. ඉගෙනුම් සහ ඉගැන්වීම් ද්‍රව්‍ය ලබාගත හැකි ආකාරයෙන් පවත්වා ගැනීම. | | දිගුකාලීන | සපයාගත හැකි ද්‍රව්‍ය සහිත විශ්වවිද්‍යාලවල ප්‍රතිශතය. |
| | | 5.2.3. අධ්‍යාපනය තුළ සියලුම ධාරාවන්හි විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ප්‍රවේශවීම සඳහා කෝටා ක්‍රමයක් ඇති කිරීම. | | මධ්‍ය කාලීන | බඳවාගත් විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ ප්‍රතිශතය. |
| | | 5.2.4. අභ්‍යන්තර - ආබාධිත කොටස් කොන් කිරීම පිළිබඳ හඳුනා ගැනීම සහ විශේෂිත අවශ්‍යතා සහිත පුද්ගලයන් සමාන ප්‍රතිලාභ ලබන බව සහතික කිරීම. (උදා - සවන්දීමේදී දුර්වල සිසුන්) | | කෙටිකාලීන | සමාලෝචනය කිරීම. |
| | 5.3. විශේෂ පාසල් විධිමත් කර නියාමනය කිරීම. | 5.3.1. විශේෂ පාසල්වල ළමුන්ට සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයෙහි සම්මතයන් සහ ගුණාත්මකභාවයට සමාන අධ්‍යාපනයක් ලැබෙන බව සහතික කිරීමට සම්මතයන් සංවර්ධනය කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>පළාත් පාලන සහ පළාත් අධිකාරීන් | කෙටිකාලීන | පුහුණු කළ විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ ප්‍රතිශතය.<br>සම්මතයන් සංවර්ධනය සහ ප්‍රචලිත කිරීම. |
| | | 5.3.2. විධිමත් නියාමන ක්‍රම ක්‍රියාත්මක කිරීම. | ගුරු පුහුණු ආයතන / විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන | මධ්‍ය කාලීන | නියාමනය කරගෙන යාම සඳහා පුහුණු කළ කාර්ය මණ්ඩලය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 5.4. අපකීර්තිය, අපයෝජනය සහ වෙනත් ආකාරයේ කොන්කිරීම් තුරන් කිරීම සහ ආබාධිතබව නිසා ප්‍රධාන ධාරාවේ අධ්‍යාපන පද්ධතියෙන් විශේෂ අවශ්‍යතා සහිත ළමුන් ඉවත්කිරීමේ ප්‍රතිශතය අඩු කිරීම. | 5.4.1. සියලුම වර්ගයේ කොන් කිරීම් හඳුනාගෙන ඒවා තහනම් කරමින් සහ දුක්ගැනවිලි සහ පිළියම් සඳහා යාන්ත්‍රණ පිහිටුවමින් දෙමව්පියන්, ගුරුවරුන් සහ පාසල් ප්‍රජාවේ වෙනත් සාමාජිකයින්ගේ උපදෙස් ලබාගෙන රෙගුලාසි සකස් කිරීම. | පාසල් පාදක කළමනාකරණය<br>අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටිකාලීන | රෙගුලාසි වැඩිදියුණු කිරීම සහ ප්‍රචලිත කිරීම. |
| | | 5.4.2. සිසුන් සහ ගුරුවරුන් පිළිබඳ ආබාධිත සමානතා පුහුණුව. | පළාත් පාලන සහ පළාත් අධිකාරීන්<br>ගුරු පුහුණු ආයතන / විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | පුහුණුව ලබා දීම. |
| | | 5.4.3. ගුරු පුහුණු ආයතන, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල විෂයමාලාවන්ට ආබාධිතභාවයට අදාළ විෂය මාලාවන් ඇතුළත් කිරීම. | | දිගුකාලීන | ආබාධිතභාවයට අදාළ අධ්‍යයන පාඨමාලා පිරිනමන තෘතීයික ආයතනවල ප්‍රතිශතය. |
| | | 5.4.4. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ කොන් කිරීමේ ප්‍රමාණය සහ ආකාර ඇගයීම සඳහා ප්‍රාථමික සහ ද්විතීක අධ්‍යාපන ආයතනවල සිසුන් පිළිබඳ දත්ත රැස්කිරීමට ස්වාධීන සමීක්ෂණ පැවැත්වීම සහ ප්‍රධාන ධාරාවේ අධ්‍යාපන පද්ධතියට ඔවුන්ගේ බඳවාගැනීමේ අඩු අනුපාත සහ ඉන් ඉවත්වීමට හේතු හඳුනා ගැනීම. | | කෙටිකාලීන | විශේෂ අවශ්‍යතා සහිත ළමුන් අධ්‍යාපනය තුළ කොන් කිරීම සහ ඉන් ඉවත් කිරීම පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එය ප්‍රකාශයට පත්කිරීම. |
| | | 5.4.5. විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සෞඛ්‍ය හෝ සමාජ සේවා ලබා ගන්නා අවස්ථා පිළිබඳ ඇගයීම සඳහා නිරන්තර දත්ත රැස් කිරීමක් සිදු කිරීම. | | සිදු කෙරෙමින් පවතියි. | වාර්ෂික සංගණනයේ දී දත්ත ඇතුළත් කිරීම. |
| | | 5.4.6. වාර්ෂික පාසල් සංගණනයේදී විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පිළිබඳ දත්ත ඇතුළත් කිරීම. | | මධ්‍ය කාලීන | දත්ත රැස්කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 5.4.7. විවිධ වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත වි.අ. සහිත ළමුන් විසින් මුහුණපාන විශේෂිත ගැටළු හඳුනාගෙන ආමන්ත්‍රණය කිරීම සඳහා එම දත්ත රැස්කිරීම ආබාධිත වර්ගය අනුව එකතු නොකරන බව සහතික කිරීම. | | දිගුකාලීන | වාර්ෂික සංගණනයේදී දත්ත ඇතුළත් කිරීම. |
| | | 5.4.8. ගම්බද හා අර්ධ නාගරික ප්‍රදේශයන්හි වෙසෙන විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට පාසල් වෙත ප්‍රවේශ වීම සඳහා ප්‍රවාහන සහාය වැඩිදියුණු කිරීම. | | මධ්‍ය කාලීන | ප්‍රවාහන පහසුකම් ලබාදෙන පාසල්වල ප්‍රතිශතය |
| | 5.5. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම. | 5.5.1. ප්‍රධාන ධාරාවේ පාසල් තුළ විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ අධ්‍යාපනය සඳහා ගුරුවරු, විදුහල්පතිවරුන්, සහ උපදේශකවරුන්, වෙනත් සහය කාර්ය මණ්ඩලය ඇතුළු පිරිසෙහි අඛණ්ඩ පුහුණුව වැඩි දියුණු කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මධ්‍ය කාලීන / දිගුකාලීන | සංවර්ධනය කරන ලද පුහුණු වැඩසටහන් වර්ග සංඛ්‍යාව. |
| | | 5.5.2. අන්තර්ග්‍රහණීය අධ්‍යාපන ගුරු පුහුණුව සඳහා තවදුරටත් වැඩසටහන් සංවර්ධනය කිරීම, සම්පූර්ණ අධ්‍යාපනය සඳහා විශේෂඥ නිපුණතා සහිත ගුරුවරුන් බඳවාගෙන, පුහුණුකර, සියලු කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තු තුළ 1 AB පාසල්වලට අනුයුක්ත කෙරේ. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට වෙනස් ආකාරයෙන් සැලකීම පිළිබඳ වන පාසල් ප්‍රතිපත්ති සංවර්ධනය හා ප්‍රචලිත කිරීම.<br><br>බඳවා ගන්නා ලද ගුරුවරුන් සංඛ්‍යාව. |
| | | 5.5.3. අන්තර්ග්‍රහණීය පාසල්වල වි.අ. සහිත ළමුන්ට අඛණ්ඩව ඉගැන්වීම සඳහා විශේෂ අධ්‍යාපන ඒකකවල දැනට සිටින ස්වේච්ඡා ගුරුවරු ස්ථිර ගුරු සේවයට අනුයුක්ත කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කරන ලද ස්වේච්ඡා ගුරුවරුන් සංඛ්‍යාව. |
| | | 5.5.4. ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා ආබාධිතතා අන්තර්ග්‍රහණීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඇතුළත් කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | පවත්වන ලද පුහුණු වැඩසටහන් ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 5.5.5. සියලුම ගුරුවරුන් සඳහා අන්තර්ග්‍රහණීය අධ්‍යාපනය පිළිබඳ මොඩියුල ඇතුළත් කිරීම සඳහා දැනට පවත්නා ගුරු පුහුණු විෂයමාලා සංශෝධනය කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | විෂයමාලාව සංශෝධනය කිරීම. |
| | | 5.5.6. සිසු ගුරු අනුපාතය භාවිත වන හොඳම ආකෘතිවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා සියලුම පාසල්වල පන්ති කාමරයේ ප්‍රමාණය වෙනස් කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | වෙනස්කම් සිදු කරන ලද පාසල් ප්‍රතිශතය. |
| | | 5.5.7. ආබාධිත අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ පුහුණු ගුරුවරුන් විසින් යොදා ගනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ඉගෙනුම් ක්‍රම කලින් කලට සමාලෝචනය කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | කලින් කලට සමාලොචනය සිදු කිරීම. |
| | | 5.5.8. විශේෂ අවශ්‍යතා සහිත ළමුන් පන්ති කාමර තුළ කළමනාකරණය හා ධනාත්මක ක්‍රියාමාර්ග හරහා පන්ති කාමරය තුළ සිසුන් සමග එක්ව කටයුතු කිරීම, දිරිමත් කිරීම ඇතුළත් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම. | | කෙටිකාලීන | ගනු ලැබූ පියවර. |
| | | 5.5.9. ගුරු පුහුණු ආයතන, විශ්ව විද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනවල විෂය මාලාවන්ට ආබාධිතභාවයට අදාළ විෂයන් හඳුන්වා දීම. | | කෙටිකාලීන | ආබාධිතභාවයට අදාළ විෂයන් සහිත ආධ්‍යාපන ආයතනවල ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 6. ප්‍රවේශවිය හැකි සහ දැරිය හැකි මිලකට සෞඛ්‍ය සහ පුනරුත්ථාපනය. | 6.1. අන්‍යයන් හා සමාන පදනමක් මත ප්‍රධාන ධාරාවේ සෞඛ්‍යාරක්ෂණ ක්‍රමය සඳහා ප්‍රවේශය වැඩි කිරීම. | 6.1.1. විශේෂයෙන් මූලික ආරක්ෂණ මට්ටමේදී සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයේ සියලුම මට්ටම් සඳහා ආබාධිතභාවය කෙරෙහි සංවේදී සහ ආබාධිතතාව විශේෂිත සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ පුහුණුව සහ දැනුවත් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන/ දිගුකාලීන | ආබාධිතභාවය කෙරෙහි සංවේදී සෞඛ්‍යාරක්ෂණය භාවිතා කරන හා සපයන රාජ්‍ය අංශයේ වෘත්තිකයන්ගේ ප්‍රතිශතය. |
| | | 6.1.2. ප්‍රාදේශීය මට්ටමින් සමාජ සේවා අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය අතර සහයෝගීතාව විධිමත් කිරීම. | සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ ජාතික ආයතනය | | ගනු ලැබූ පියවර. |
| | | 6.1.3. ආබාධිතතා විශේෂිත සෞඛ්‍යාරක්ෂණ සේවා සහ විශේෂඥයින් සඳහා යොමු කිරීම (වැලැක්වීම, පූර්ව හඳුනාගැනීම, පුනරුත්ථාපනය සහ ඉදිරි කටයුතු) පිළිබඳ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා දේශීය භාෂාවන්ගෙන් මුද්‍රිත සම්පත් ලබාදීම. | පවුල් සෞඛ්‍යාරක්ෂක කාර්යාංශය | | ආබාධිත අන්තර්කරණ සෞඛ්‍ය සේවයේ තොරතුරු හා අධ්‍යාපනික ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීමේ සංඛ්‍යාව. |
| | | 6.1.4. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ළමුන් සඳහා ප්‍රමුඛ ප්‍රතිකාර සහ සේවා සහතික කිරීමට සෞඛාරක්ෂාව තුළ ප්‍රොටෝකෝල් හඳුන්වාදීම. | පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශ | | සෞඛ්‍ය ආරක්ෂණ සේවා සපයන ආයතන සංඛ්‍යාව.<br>පහසුවෙන් පිවිසිය හැකි සෞඛ්‍ය ආරක්ෂණ සේවා සපයන ආයතන සංඛ්‍යාව. |
| | | 6.1.5. 2006 ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳ රෙගුලාසිවලට අනුව සියලුම ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මූලික රෝහල් සහ 50% ක ග්‍රාමීය සෞඛ්‍ය සායනවලින් බාධක තොර කිරීම. | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු | | රෙගුලාසියට අනුකූලතාව දක්වන රෝහල් සංඛ්‍යාව. |
| | | 6.1.6. සෞඛ්‍යාරක්ෂක වෘත්තිකයින් සඳහා පිරිනමන සංඥා භාෂා පාඨමාලා පිරිනැමීම. (ප්‍රාථමික - තෘතීයික) | | | සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන් සැපයීමේ දී සංඥා භාෂාව තුළින් සන්නිවේදනය සිදු කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.2. ආබාධිතභාවය සහ අදාළ සෞඛ්‍යාරක්ෂණ මැදිහත්වීම් කලින් හඳුනා ගැනීම. | 6.2.1. පූර්ව උපත් සහ පසු උපත් සෞඛ්‍යාරක්ෂාව තුළ වන පරතර සහ අඩුපාඩු හඳුනා ගැනීම සඳහා දැනට පවත්නා මූලික සෞඛ්‍යාරක්ෂක සේවා ඇගයීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන / දිගුකාලීන | නිසි කලට රජයේ සෞඛ්‍යාරක්ෂාව ලැබෙන විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ ප්‍රතිශතය.<br>නිසි කලට රජයේ සෞඛ්‍යාරක්ෂාව ලැබෙන බිහිරි පුද්ගලයන්ගේ ප්‍රතිශතය. |
| | | 6.2.2. සියලුම නිවාරණ සහ ප්‍රතිකාරක සෞඛ්‍යාරක්ෂණ කාර්ය මණ්ඩලයට ළදරු උපත් ආශ්‍රිත දුර්වලතා මගහැරීම පිළිබඳ පුහුණු ලබාදීම. | පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශ<br>ප්‍රාදේශීසෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල<br>වි.අ.පු. පුද්ගලයින් සඳහා වන සංවිධාන | | පවත්වන ලද පුහුණු වැඩසටහන්වල ප්‍රතිශතය. |
| | | 6.2.3. හඳුනා ගැනීම සහ සියලුම අංශ සඳහා ප්‍රවේශය වැඩිකිරීමට භාවිතා කළ හැකි ආබාධිත තත්ත්වය මත පදනම් වූ ප්‍රමුඛතා කාඩ්පත් නිකුත් කිරීමට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ කැමැත්ත සහිතව වැඩසටහනක් සකස් කිරීම. | | | ප්‍රමුඛතා කාඩ්පත් නිකුත් කිරීම. |
| | 6.3. මනෝසමාජීය වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ ස්වාධිපත්‍යයට ගරුකරමින් ඔවුන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන සේවාවන් සඳහා ප්‍රවේශය ලබා දීම. | 6.3.1. සමාන සහාය, වෘත්තීමය සහාය සහ වෙනත් ආකාරයේ විධිමත් සහ නොවිධිමත් ආරක්ෂාව භාවිතයෙන් විශේෂයෙන් චිත්තවේගී සහ සමාජ අනතුරු සහ පීඩනය වැනි කාලසීමාවන් තුළ මනෝසමාජීය සහාය පිළිබඳ සුදුසු ආකාරයෙන් ආබාධිත පුද්ගලයින්ගේ විධිවිධාන සඳහා මාර්ගෝපදේශ සහ සේවා සංවර්ධනය කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ සිවිල් සමාජ සංවිධානවල උපදෙස් ලබා ගැනීමේ සාකච්ඡාවල ප්‍රතිශතය.<br>මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම හා ප්‍රචලිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 6.3.2. පහත සඳහන් දෑ සඳහා මනෝ සමාජීය ආබාධ සහිත පුද්ගලයින් සහ අදාළ සිවිල් සමාජ සංවිධාන සමග උපදේශකත්වයෙන් මාර්ගෝපදේශ සකස් කර ප්‍රකාශයට පත්කිරීම - :<br>- කලින් හඳුනාගැනීම / නරක අතට පත්වීම වැලැක්වීම.<br>- වර්ධිත සහභාගිත්වය සහ සහයෝගය.<br>- ආරක්ෂාව ලබාදෙන්නන් සහ සේවා සපයන්නන්ට පුහුණුව ලබා දීම.<br>- තමන්ට සහ අන්‍යයන්ට හානි සිදුවීමේ අවදානමෙන් ආරක්ෂාවීමට මේවා තුලනය කරමින් සිය කැමැත්තෙන් තොරව සිදු කරන ප්‍රතිකාර අඩු කිරීම ඇතුළුව ක්‍රියාපරිපාටි සහ අරක්ෂාව පාලනය. | අන්තර් - රාජ්‍ය සම්බන්ධීකරණ යාන්ත්‍රණ<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සුභසාධන හා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | | මාර්ගෝපදේශ ප්‍රකාශයට පත්කිරීම සහ ව්‍යාප්ත කිරීම.<br>විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට මනෝ සමාජීය සහාය ලබාදීමට සහ පහසුකම් සැපයීමට පුහුණු කළ පිරිස්.<br>විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ සිවිල් සමාජ සංවිධානවල උපදෙස් ලබා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.4. දිස්ත්‍රික් මට්ටමින් සාධාරණ මිලකට පිරිපූර්ණ පුනරුත්ථාපන සේවා ලබාදීම. | 6.4.1. ගුණාත්මක පුනරුත්ථාපන පහසුකම් ලබාදීමේදී භූගෝලීය විෂමතා අඩු කිරීමට සෑම දිස්ත්‍රික්කයකම අවම වශයෙන් එක් රෝහලක් වැඩි දියුණු කොට උත්ශ්‍රේණිගත කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ | මධ්‍ය කාලීන / දිගුකාලීන | රෝහල් 25 ක් උත්ශ්‍රේණිගත කිරීම සහ සාධාරණ සෞඛ්‍යාරක්ෂණයක් ලබාදීම. |
| | | 6.4.2. යුද්ධයෙන් පීඩිත දිස්ත්‍රික්කවල අඩු ආදායම් කාණ්ඩයේ වි.අ.පු. සහිත පුද්ගලයින් සඳහා උපකාරක මෙවලම් සහ ජංගම ආධාර උපකරණ ලබාදීම සඳහා කෘතිම අවයව බද්ධ කිරීම, අවයව චලන පහසුව ලබා දීමේ මෙවලම්, රෝද පුටු ආදී සේවා ස්ථාන ඇතුළුව පුනරුත්ථාපන සේවා ඇගයීම සහ ලබාදීම සඳහා බහු - විධ ශික්ෂණ සෞඛ්‍ය සේවා සායන ස්ථාපිත කිරීම. | | | නිසි කලට සෞඛ්‍යාරක්ෂණය ලැබෙන දරුණු ආබාධ සහිත ළමුන් සහ පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br>රෝහල් සහ සායන වෙත පැමිණීමට විශේෂ ප්‍රවාහනය භාවිතා කරන අඩු ආදායම්ලාභී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය. |
| | | 6.4.3. ප්‍රමාණවත්ව සහ විවිධ විෂය ක්ෂේත්‍රවලට අදාළ පුනරුත්ථාපන කාර්ය මණ්ඩලය පුහුණු කර බඳවා ගැනීම - උදා : කෘතිම අවයව, අවයව චලන පහසුව ලබා දීමේ මෙවලම් සහ රෝද පුටු කාර්මිකයින්. | | | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. |
| | | 6.4.4. සුදුසු උපකාරක මෙවලම් සහ ඊට අදාළව පසුව ආරක්ෂාව සපයන්නන් සමග පුනරුත්ථාපන වැඩසටහන් සම්බන්ධ කිරීම. | | | බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රතිශතය. |
| | | 6.4.5. දරුණු ආබාධ සහිත ළමුන් සහ පුද්ගලයින්ට සෞඛ්‍යාරක්ෂණය ලැබීම සහතික කිරීමට නිවාස වෙත පැමිණ සේවාවන් සැපයීම හඳුන්වාදීම. | | | නිවාස වෙත පැමිණ සැපයෙන සේවාවන් හඳුන්වාදීම සඳහා වන ක්‍රියාත්මක සැලැස්ම. |
| | | 6.4.6. අඩු ආදායම් සහිත වි.අ.පු. සඳහා පිවිසිය හැකි සහ සහනාධාර පදනම මත රෝහලට / සායනයට ගෙනයාමේ ප්‍රවාහන සේවා හඳුන්වාදීම. | | | ප්‍රවාහන පහසුකම් හඳුන්වාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.5. විශේෂ අවශ්‍යතා සහිත තරුණයින්ට ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය සහ සේවා ප්‍රවර්ධනය කිරීම. | 6.5.1. ජාතික මට්ටමේ ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය ආරක්ෂණ විධි නියෝගයන්ට සහ අයවැයට ආබාධිතභාවය ඇතුළත් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය පිළිබඳ පළාත් දෙපාර්තමේන්තු<br><br>පවුල් සෞඛ්‍යාරක්ෂණ කාර්යාංශය - අමාත්‍යාංශ සම්බන්ධීකරණ හා සේවා යාන්ත්‍රණය | කෙටි කාලීන | ජාතික මට්ටමේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යාරක්ෂණ වැඩසටහනට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ඇතුළත්වේ. |
| | | 6.5.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විවිධ මාධ්‍යයන්ගෙන් (බේල්, ශ්‍රව්‍ය, දෘශ්‍ය. සංඥා භාෂා යනාදිය) ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම. | | | ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යාරක්ෂණය පිළිබඳ තොරතුරු බේල් ක්‍රමයට / දෘශ්‍යමය / සංඥා භාෂාවෙන් ලබා ගැනීමේ හැකියාව පිළිබඳ ප්‍රචලිත කිරීම. |
| | | 6.5.3. විශේෂ අවශ්‍යතා සහිත තරුණයින් සහ පුද්ගලයින් සඳහා විශේෂ ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය වැඩසටහන් (අවශ්‍ය අවස්ථාවලදී) පැවත්වීම. | | | වි.අ.පු. සහිත පුද්ගලයින් සඳහා පවත්වන ලද විශේෂ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සැසියන්හි ප්‍රතිශතය. |
| 7. පවුල් ජීවිතය සහ ප්‍රජා ජීවිතය බුක්ති විඳීම. | 7.1. ප්‍රජාව තුළ ස්වාධීනව ජීවත් වීම. | 7.1.1. මානසික ආබාධ ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ප්‍රජා මට්ටමේ අපකීර්තිය සහ කොන් කිරීම අඩු කිරීම සඳහා ජනතාව, අධ්‍යාපනඥයින් සහ සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයින් ඉලක්ක කරමින් අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සහ පොදු ජනතාව සඳහා ඇති ප්‍රජා සේවා සහ පහසුකම් වි.අ.පු. ලබා ගැනීමේ හැකියාව සහතික කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අධ්‍යාපනික තොරතුරු.<br><br>සකස් කළ සෞඛ්‍යාරක්ෂණ හා අධ්‍යාපනික වෘත්තිකයින් මෙන්ම දෙමව්පියන් සහ රැක බලාගන්නන් අතර බෙදා හැරීම. |
| | | 7.1.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රජාවගෙන් හුදකලාවීම සහ වෙන්කිරීම වැළැක්වීමේ අරමුණින් විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට සහ අනෙකුත් පවුලේ සාමාජිකයින්ට පුද්ගල සහය සහ අනෙකුත් නිවස තුළ රැකවරණය සැපයීම සඳහා වි.අ.පු. අඩු ආදායම්ලාභි දෙමව්පියන්ට සහ රැකවරණය සපයන්නන්හට මූල්‍ය සහ තාක්ෂණික සහාය සඳහා වැඩසටහන් ස්ථාපිත කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | | වැඩසටහනක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 7.1.3. අනාථ නිවාස හෝ අධ්‍යාපනික අරමුණු සඳහා පිහිටුවා ඇති ආයතන ඇතුළුව සියලුම නේවාසික ආරක්ෂක මධ්‍යස්ථානවල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඔවුන්ගේ කැමැත්ත නොමැතිව පදිංචි නොකරනු ලබන බව සහතික කරන නියාමන වැඩපිළිවෙල. | අධ්‍යාපන අමාත්‍යාංශය | | නියාමන වැඩපිළිවෙල සකස් කිරීම. |
| | 7.2. පවුලට සහ පවුල් ජීවිතයට ගරු කිරීම. | 7.2.1. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ වගකීම නිසි අයුරින් ඉටු කිරීම සහ ඔවුන් අත්හැරීම සහ සැඟවීම වැළැක්වීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ දෙමව්පියන් මනාව සූදානම් කෙරෙන පරිදි ඔවුන්ට තොරතුරු සේවාවන් සහ සහාය ලබාදීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | අධ්‍යාපන සන්නිවේදන තොරතුරු සියලුම භාෂාවලින් සකස් කිරීම සහ ප්‍රසිද්ධ කිරීම. |
| | | 7.2.2. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ දෙමව්පියන් සඳහා තොරතුරු සහ අධ්‍යාපනික උපකරණ සංවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය, පුනරුත්ථාපනය සහ පූර්ව මැදිහත්වීම සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍ර තුළ ප්‍රවීණයින් පත්කොට ප්‍රාදේශීය මට්ටමින් ප්‍රසිද්ධ කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | උපකරණ (ද්‍රව්‍ය) සංවර්ධනය කිරීම.<br><br>තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම. |
| | | 7.2.3. විශේෂ අවශ්‍යතා සහිත තරුණයින් සහ ඔවුන්ගේ රැකවරණය සපයන්නන් ඉලක්ක කර ගත් අධ්‍යාපනික වැඩසටහන් හරහා සම්බන්ධතා, විවාහය සහ මාතෘත්වය / පීතෘත්වය ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ඉස්මතු කිරීමට හා ඔවුන්ගේ කැමැත්ත පරිදි කටයුතු කිරීමේ හැකියාව ලබා දීම. | සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යාංශය<br><br>මධ්‍යම රජයේ සහ පළාත් මට්ටමින් | කෙටි කාලීන | රූපවාහිනී සහ අනෙකුත් මාධ්‍යවලින් විකාශය කෙරුණු අධ්‍යාපනික වැඩසටහන්. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 8. ප්‍රවේශ වීමේ හැකියාව සහිත නිර්මිත පරිසරය, ප්‍රවාහනය, සන්නිවේදනය සහ උපකාරක තාක්ෂණය | 8.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට අන්‍යයන් හා සමාන පදනමක් මත ජීවිතයේ සියලුම අවස්ථාවන් සඳහා නිදහස්ව සහභාගිවීම සහ ඔවුන්ගේ ප්‍රජාව සමග ස්වාධීනව ජීවත්වීම සහතික කිරීම සඳහා පරිසරය ගොඩ නැගීම. | 8.1.1. 2016 ප්‍රවේශවීමේ රෙගුලාසිවල දක්වා ඇති සම්මතයන් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම, එවැනි රෙගුලාසි පිළි නොපදින රජයේ ගොඩනැගිලි හිමිකරුවන්ට එරෙහිව පැමිණිලි ලබාගැනීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට යාන්ත්‍රණ පිහිටුවීම. | නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය<br><br>සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යාංශය<br><br>නාගරික සංවර්ධන අධිකාරිය<br><br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | කෙටි කාලීන | ප්‍රවේශ වීමේ හැකියාව නොමැති ගොඩනැගිලි පිළිබඳ ලද පැමිණිලිවල ප්‍රතිශතය.<br><br>පවත්වන ලද විගණනවල ප්‍රතිශතය.<br><br>ප්‍රවේශ වීමේ හැකියාව නොමැති ගොඩනැගිලිවල පදිංචිකරුවන් වෙත යාන්ත්‍රණය මගින් සන්නිවේදනය සිදු කිරීමට අදාළ ප්‍රතිශතය.<br><br>පුහුණු පාඨමාලාවලට අදාළ විෂයමාලා සංශෝධනය කිරීම. |
| | | 8.1.2. නිර්මිත පරිසරය සහ ප්‍රවාහන පද්ධතියට අදාළ සියලුම රැකියාවන්හී අධ්‍යාපනික සහ පුහුණු පාඨමාලාවලට අදාළ විෂයමාලා තුළ ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳ මොඩියුල ඇතුළත් කිරීම (උදා : ගෘහ නිර්මාණ ශිල්පීන්, සිවිල් ඉංජිනේරුවන්, ඉදිකිරීම් සේවකයින්) | | | |
| | 8.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ජීවිතයේ සෑම අවස්ථාවකදී ම ගමන් කිරීමට සහ සහභාගිවීමට හැකියාව ඇති කරන දැරිය හැකි සහ ප්‍රවේශවිය හැකි පොදු ප්‍රවාහනය ලබාදීම. | 8.2.1. 2016 ප්‍රවේශවීමේ රෙගුලාසිවල දක්වා ඇති සම්මතයන් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම, එවැනි රෙගුලාසි පිළි නොපදින රජයේ ගොඩනැගිලි හිමිකරුවන්ට එරෙහිව පැමිණිලි ලබාගැනීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට යාන්ත්‍රණ පිහිටුවීම. | | දිගු කාලීන | යාන්ත්‍රණය ස්ථාපිත කිරීම. |
| | | 8.2.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා පිළිබඳ ප්‍රවාහනය සපයන්නන් දැනුවත් කිරීම (ප්‍රවාහන අංශයේ ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළුව). | | දිගුකාලීන | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 8.2.3. ප්‍රවාහන පද්ධතියට සම්බන්ධ සියලුම රැකියාවන්හී අධ්‍යාපනික සහ පුහුණු පාඨමාලාවලට අදාළ විෂයමාලා තුළ ප්‍රවේශ වීමේ හැකියාව පිළිබඳ මොඩියුල ඇතුළත් කිරීම. (උදා : ඉංජිනේරුවන්) | | දිගුකාලීන | මොඩියුල සකස් කිරීම. |
| | | 8.2.4. ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලය මගින් මෙහෙයවන බස්වලින් 1/3 ක් රෝද පුටු භාවිතා කරන්නන්ට ප්‍රවේශ වීමේ හැකියාව සහිත වීම හා සියලුම බස්රථ නැවතුම්පොලවල් සියලුම වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පහසුකම් සැලසෙන අයුරින් සකස් කිරීම. | | | අදාළ පහසුකම් සැපයීමට හැකි අයුරින් සකස් කරන ලද බස් රථ හා බස් නැවතුම්පළ ප්‍රතිශතය. |
| | | 8.2.5. සියලුම වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පහසුකම් ලබාදීමට දුම්රිය ස්ථානවලින් 1/3 ක් සකස් කිරීම සහ සියලුම දුම්රියවල අවම වශයෙන් එක් දුම්රිය මැදිරියක රෝද පුටු භාවිතා කරන්නන් සඳහා පහසුකම් සැපයීම. | | දිගුකාලීන | අදාළ පහසුකම් සැපයීමට හැකි අයුරින් සකස් කරන දුම්රිය ස්ථාන ප්‍රතිශතය. |
| | | 8.2.6. දැරිය හැකි මිලකට පිවිසිය හැකි ප්‍රවාහන සේවාවක් ලබාදීම සඳහා ටැක්සි ඇතුළුව පුද්ගලික ප්‍රවාහන මෙහෙයවන්නන්ට අදාළ බදු සහ වෙනත් සහන තුළින් දිරිදීමනා ලබාදීම. | | දිගුකාලීන | බදු සහන ලබා දීම.<br>පුද්ගලික ප්‍රවාහන සපයන්නන්ගේ සේවාව ලබා ගැනීමේ ප්‍රතිශතය. |
| | | 8.2.7. මාර්ගවල ස්ථාන හඳුනා ගැනීම සඳහා ප්‍රවාහන සේවා සපයන්නන් භාවිතා කරන ආබාධිතභාවයට අදාළ නොගැලපෙන පාඨයන් භාවිතාව ඉවත් කිරීමට චක්‍රලේඛ නිකුත් කිරීම. | | | නිකුත් කරන ලද චක්‍රලේඛ. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 8.3. තොරතුරු සහ සන්නිවේදනයට පිවිසීමේ හැකියාව | 8.3.1. ශ්‍රී ලාංකීය සංඥා භාෂාව විධිමත්ව පිළිගැනීම නීතිගත කිරීම සහ එය ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා රජය විසින් විශේෂිත ක්‍රියාමාර්ග ගැනීම. | සමාජ සේවා පිළිබඳ ජාතික පාසල<br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ<br>ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>සමාජ සිව්බල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය<br>සම්බන්ධීකරණ යාන්ත්‍රණය<br>මුදල් අමාත්‍යාංශය<br>විදුලි සංදේශ නියාමන කොමිසම | කෙටිකාලීන | පාර්ලිමේන්තුව විසින් කළ සංඥා භාෂා පනත නීතිගත කිරීම. |
| | | 8.3.2. සංඥා භාෂණ පරිවර්තනය සඳහා ජාතික සහතික පත් වැඩසටහනක් සකස් කිරීම. | | මධ්‍ය කාලීන | සහතිකපත් වැඩසටහනක් සකස් කිරීම. |
| | | 8.3.3. වෘත්තීමය සහතිකලත් සංඥා භාෂණ පරිවර්තකයින් 100 ක් ඩිප්ලෝමා මට්ටම තුළින් පුහුණු කිරීම. | | දිගුකාලීන | දැනට සිටින සහතික ලත් සංඥා භාෂණ පරිවර්තකයින් ප්‍රතිශතය. |
| | | 8.3.4. විශේෂ අවශ්‍යතාවයන් සහිත පුද්ගලයන්ට දැනුවත්භාවය ලබා ගැනීමට හැකි වන පරිදි සියලුම රාජ්‍ය මාධ්‍යවල ප්‍රවෘත්ති විකාශයන් අතරින් අවම වශයෙන් 50% ක් මුද්‍රණ හා දෘශ්‍ය මාධ්‍යයෙන්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට දැන ගැනීමේ හැකියාව ඇති ආකාරයෙන් විකාශය කිරීම.<br>(බ්‍රේල්, විශාල මුද්‍රණ, පහසු කියවීමේ ආදර්ශ, සංඥා භාෂණ පරිවර්තනය, සංඥා භාෂණ වීඩියෝ) | | මධ්‍ය කාලීන | පිවිසිය හැකි ප්‍රවෘත්ති විකාශයන් ප්‍රතිශතය.<br>පිටපත් කළ ඕඩියෝ සහ බේල් තොරතුරු ලබාගැනීමේ හැකියාව. |
| | | 8.3.5. රජය තුළ පිවිසිය හැකි තොරතුරු සඳහා සහ උපකාරී පදනමක් මත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට පිවිසිය හැකි තොරතුරු ලබාදීම සඳහා අවශ්‍ය සේවා සැලසීමට ඕඩියෝ සහ බේල් තොරතුරු සඳහා පිටපත් කිරීමක් සහ නිෂ්පාදන සේවාවක් සංවර්ධනය කිරීම. | | කෙටිකාලීන | සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.<br>ප්‍රවේශය සහිත තාක්ෂණ සහාය පිළිබඳ වන විදුලි සංදේශ නියාමන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම හා පැනවීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 8.4. උපකාරී සහ භාවිතා කළ හැකි තාක්ෂණයට පිවිසිය හැකිවීම. | 8.4.1. සවන්දීමේ සහ පෙනීමේ දුර්වලතා සහිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා භාවිතා කිරීමට නිර්මාණය කළ සන්නිවේදන උපාංග ලබාගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා අනුග්‍රහ සහ බදු රහිත යෝජනා ක්‍රම හඳුන්වාදීම. | මුදල් අමාත්‍යාංශය<br><br>සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය | කෙටිකාලීන | බදු රහිත අයිතම ගැසට් කිරීම.<br><br>ප්‍රසිද්ධ කළ සහ ප්‍රකාශයට පත්කළ මාර්ගෝපදේශ. |
| | | 8.4.2. සවන්දීමේ සහ පෙනීමේ දුර්වලතා සහිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ සේවය සඳහා ප්‍රවේශවීමට හැකියාව ඇති කරන තාක්ෂණික සහාය සියලුම පුද්ගලික සන්නිවේදන සේවා සපයන්නන් විසින් ලබාදීම. | | | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රමුඛතා කාඩ්පත් හිමිකරුවන් සඳහා වාරික පදනම් ගෙවීම්. |
| | | 8.4.3. සුදුසු පිරිවැය ඵලදායී උසස් තත්ත්වයේ උපකාරක උපාංග ලබාදීම, අවශ්‍යතා සමාලෝචනය කොට ඇගයීම සහ නිර්දේශිත කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම. | | | මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම හා ප්‍රචලිත කිරීම. |
| | | 8.4.4. ලැයිස්තුගත කරන ලද උපකාරක උපාංග නිෂ්පාදනය සහ ආනයනය සඳහා ස්ථාපිත බදු නිදහස් කිරීම් සහ සහන. | | | උපකාරක උපාංග සඳහා බදු නිදහස් කිරීම් සහ සහනදායී අනුපාත නිවේදනය කිරීම සහ ප්‍රසිද්ධ කිරීම. |
| | | 8.4.5. තාක්ෂණය සහ උපාංග ලබාගත හැකි සපයන්නන් පිළිබඳ සියලුම තොරතුරු ලබාදීම සඳහා නිෂ්පාදකයින් සහ බෙදාහරින්නන් පිළිබඳ නාම ලේඛනයක් සකස්කර, ප්‍රකාශයට පත් කර බෙදා හැරීම. | | | ප්‍රකාශයට පත් කළ ආවරණය කර උපාංග ලැයිස්තුව. |
| | | 8.4.6. ටෙන්ඩර් ක්‍රියාමාර්ගයන්හිදී ප්‍රමුඛතාව ලබා දීම තුළින් සුදුසු ගුණාත්මක උපකාරක උපාංගවල දේශීය නිෂ්පාදකයින් සඳහා දිරි දීමනා ලබාදීම. | | | දිරි දීමනා යෝජනාක්‍රම සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 9. දේශපාලන සහ මහජන සහභාගිත්වය. | 9.1. මැතිවරණ ක්‍රියාවලිය තුළ සහභාගිත්වය වැඩි කිරීම. | 9.1.1. නිර්මිත පරිසරය වැඩි දියුණු කිරීම ඇතුළුව සියලුම වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සියලුම ඡන්ද මධ්‍යස්ථානවලදී සාධාරණ පහසුකම් ලබාදීම. | මැතිවරණ කොමිසම<br>මැතිවරණ අධීක්ෂණ ආයතන<br>දේශපාලන පක්ෂ නායකයින්<br>පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් | | ප්‍රවේශවීමේ හැකියාව ස්ථාපිත කළ ඡන්ද මධ්‍යස්ථාන ප්‍රතිශතය. |
| | | 9.1.2. මැතිවරණ කොමිසම විසින් ආබාධිතභාවය පිළිබඳ වන ප්‍රතිපත්ති යොදා ගැනීම. | | | මැතිවරණ කොමිසම විසින් නිකුත් කළ ආබාධිතභාවයට අදාළ කරුණු ඇතුළත් කළ චක්‍රලේඛ. |
| | | 9.1.3. සියලුම වර්ගයේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළත් කර ඡන්ද ලියාපදිංචිය සකස් කිරීම. | | | මැතිවරණ කොමිසම විසින් ක්‍රියාත්මක කරන වි.අ.පු. ඇතුළත් වැඩසටහන්. |
| | | 9.1.4. පිවිසිය හැකි ආදර්ශ / උපකරණ පිළිබඳ ඡන්දදායකයන් සඳහා වන අධ්‍යාපනය හඳුන්වාදීම. | | | පුහුණුකළ මැතිවරණ නිලධාරීන් ප්‍රතිශතය.<br>ඡන්ද හිමිකම පිළිබඳ පුහුණු කළ ග්‍රාම නිලධාරීන්. |
| | | 9.1.5. පිවිසිය හැකි වැඩසටහන් තොරතුරු දේශපාලන පක්ෂ / අපේක්ෂකයින්ගෙන් ලබා ගැනීම. | | | ලබා ගතහැකි ආකාරයෙන් ඡන්දදායක අධ්‍යාපනික තොරතුරු පැවතීම. |
| | | 9.1.6. අන්තර්ග්‍රහණීය මැතිවරණ නියාමන භාවිතාවන්. | | | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ඇතුළත් ඡන්ද විගණනයෙහි ඡන්ද අධීක්ෂණ නියෝජිතයන් සිටීම. |
| | | 9.1.7. ඡන්දවලදී ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ මගින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් නියෝජනය කිරීම. | | | ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ හරහා ඡන්ද සඳහා තරග කරන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ප්‍රතිශතය. |
| | | 9.1.8. පාර්ලිමේන්තුවට ඇතුළු වීම සහ එහි රැස්වීම් කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා වි.අ.පු. හැකියාව ඇති කිරීමට පාර්ලිමේන්තුවේ ක්‍රියාපටිපාටි සහ යටිතල පහසුකම් සකස් කිරීම. | | | යටිතල පහසුකම් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 9.2. පොදු ජීවිතයේ කටයුතු සඳහා සහභාගිත්වය වැඩි කිරීම. | 9.2.1. ස්වයංපාලනය, සවිබලගැන්වීම සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් නියෝජනය සඳහා නිපුණතා, සම්පත් සහ දැනුම අත්කර ගැනීමට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගල සංවිධානවලට සහාය වීම. | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යටතේ ස්ථාපිත ස්වාධීන නියාමන යාන්ත්‍රණ<br><br>දිස්ත්‍රික් ලේකම්වරුන්<br><br>ප්‍රාදේශීය ලේකම්වරුන් | මධ්‍ය කාලීන | දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම්වලින් රජයේ සම්බන්ධීකරණය සහ සංවර්ධන කතිකාවන් සඳහා සහභාගිවන වි.අ.පු. සංවිධානවල නියෝජිතයන්. |
| | | 9.2.2. භාරකරුවන් වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ නියෝජිත සංවිධාන විසින් පත්කළ සිවිල් සමාජයේ සාමාජිකයින් විසින් පාලනය කෙරෙන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගල සංවිධාන ශක්තිමත් කිරීම සඳහා ස්වාධීන අරමුදලක් පිහිටුවීම. | | | ගැසට් කළ අරමුදල.<br><br>භාරකරුවන් පත් කිරීම.<br><br>ප්‍රදානය කරන ලද පළමු දීමනා භාණ්ඩය. |
| | | 9.2.3. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් දැනට පවත්නා සහ නව සම්බන්ධීකරණ සහ සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කිරීම. | | | ගන්නා ලද තීරණ ප්‍රතිශතය. |
| 10. ක්‍රීඩා, සංස්කෘතික සහ විනෝදාත්මක ක්‍රියා සඳහා සහභාගිත්වය. | 10.1. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්, තරුණයින්, සහ වැඩිහිටියන් (ගැහැණු ළමුන් සහ කාන්තාවන් ඇතුළුව) තරගකාරී සහ විනෝදාත්මක යන දෙඅංශයේ ක්‍රීඩාවලට ඔවුන්ගේ කැමැත්ත අනුව සහභාගි කරවීම සහ ක්‍රීඩා තෝරා ගැනීම සඳහා ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කිරීමට විකල්ප වැඩි දියුණු කිරීම. | 10.1.1. සියලුම ප්‍රාථමික සහ ද්විතීක පාසල් මගින් සාධාරණ පහසුකම් ලබාදීම හරහා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ප්‍රධාන ධාරාවේ ක්‍රීඩා කටයුතුවලට සහභාගි වීමට, නිරත වීමට සහ විනෝදවීමට අවස්ථාවන් ලබා දීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ක්‍රීඩා අමාත්‍යාංශය | කෙටිකාලීන | පිවිසිය හැකි සහ විගණනය කළ ස්ථානවල ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 10.1.2. සෑම පාසලකම ක්‍රීඩා අධ්‍යාපනික සහ පුහුණු විෂයමාලා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ක්‍රීඩා පිළිබඳ මොඩියුල ඇතුළත් වන පරිදි සකස් කෙරේ. | | මධ්‍ය කාලීන | ක්‍රීඩා විෂයමාලාව තුළ ආබාධිතභාවයට විශේෂිත වූ මොඩියුල සහිත පාසල් ප්‍රතිශතය. |
| | | 10.1.3. අන්තර් පාඨශාලාන්තර ක්‍රීඩා තරගවලට සහභාගි වන සියලුම පාඨශාලා මගින් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා වසරකට අවම වශයෙන් එක් ක්‍රීඩා තරගයක් සංවිධානය කිරීම. | | කෙටිකාලීන | සංවිධානය කරන ලද ක්‍රීඩා තරග ප්‍රතිශතය. |
| | | 10.1.4. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සහභාගිවන්නන් ලෙස සහ ප්‍රේක්ෂකයන් ලෙස ප්‍රතිලාභ ලැබිය හැකි වන පරිදි ප්‍රධාන ක්‍රීඩාවන් සෑම එකක් සඳහාම අවම වශයෙන් එක් දිස්ත්‍රික් මට්ටමේ පහසුකමක් බැගින් ඇතිකිරීම. | | දිගුකාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් විසින් භාවිතා කරන ප්‍රමාණය. |
| | | 10.1.5. වසරකට වි.අ.පු. විශේෂිත වූ දිස්ත්‍රික් මට්ටමේ අන්තර් පාඨශාලාන්තර ක්‍රීඩා තරග සංවිධානය, සංවර්ධනය සහ සහභාගිවීම සඳහා සියලුම ප්‍රාථමික සහ ද්විතීක පාසල් මගින් වි.අ. සහිත ළමුන්ට උපදෙස්, පුහුණුව සහ සම්පත් ලබාදීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | කෙටිකාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වන ක්‍රීඩා තරග සංවිධානය කිරීමේදී සහභාගිවන පාසල් ප්‍රතිශතය. |
| | | 10.1.6. ක්‍රීඩාවලදී වි.අ.පු. සමාන අවස්ථා ඇති කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩා පහසුකම් තුළ එක් උපදේශකයෙකු පුහුණු කිරීම. | | මධ්‍ය කාලීන | පුහුණු කරන ලද ක්‍රීඩා උපදේශකයන් සංඛ්‍යාව. |
| | | 10.1.7. පුද්ගලික අංශයේ අනුග්‍රාහකයින්ගේ අරමුදල්, පුහුණු, ප්‍රචාරණය සහ සම්බන්ධතා සහිතව වසරකදී ජාත්‍යන්තර තරග සඳහා අවම වශයෙන් එක් ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩිකාවක සහභාගිකරවීමට සම්පූර්ණ සහයෝගය ලබාදීම. | | මධ්‍ය කාලීන | අනුග්‍රහකත්වය ලැබෙන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය.<br><br>ජාත්‍යන්තර තරග සඳහා සුදුසුකම් ලබන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 10.2. විනෝදය, සංචාරය සහ සංස්කෘතික කටයුතු සඳහා ප්‍රවේශය. | 10.2.1. සියලුම ඓතිහාසික ස්මාරක පිහිටා ඇති ස්ථාන සහ ජාතික සංස්කෘතික වැදගත්කමක් සහිත ස්ථාන අතරින් 1/3 ක එම භූමියේ පුරාවිද්‍යා වටිනාකමට හානියක් නොවන පරිදි රෝද පුටු භාවිතා කරන්නන්ට පිවිසීමට හැකියාව ලබාදීම. | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය<br>ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>විශ්වවිද්‍යාල<br>උසස් අධ්‍යාපන ආයතන<br>සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය<br>ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br>හෝටල් කළමනාකරණ සමාගම්<br>නාගරික සංවර්ධන අධිකාරිය | මධ්‍ය කාලීන | විගණනය මත පදනම්ව ප්‍රවේශය ලබාදුන් ස්මාරක පිහිටි ස්ථාන ප්‍රමාණය. |
| | | 10.2.2. රංග ශාලා, කෞතුකාගාර, සිනමා ශාලා, පුස්තකාල සහ සංචාරක සේවා වැනි සංස්කෘතික අංගයන් සහ සේවා පිළිබඳ සියලුම ස්ථාන සඳහා පූර්ණ ප්‍රවේශය ලබාදීම. | | කෙටිකාලීන | විෂයමාලාවේ කොටසක් ලෙස 'සියලුදෙනාට සංචාරය' ඇතුළත් කරන ලද උසස් අධ්‍යාපන ආයතන ගණන.<br>පිවිසිය හැකි ආකෘතීන්හි ලබාගත හැකි තොරතුරුවල වර්ගය සහ ගුණාත්මකභාවය.<br>බදු සහන යෝජනා ක්‍රම සකස් කිරීම.<br>පවත්වන ලද පිවිසිය හැකි විගණන ගණන. |
| | | 10.2.3. රජය විසින් සපයන සියලුම සංස්කෘතික තොරතුරු, සංචාරක කර්මාන්තය සහ විනෝදාත්මක කටයුතු පිළිබඳ තොරතුරු පිවිසිය හැකි ආකාරයෙන් ලබාදීම. | | මධ්‍ය කාලීන | |
| | | 10.2.4. ප්‍රවේශවීමේ හැකියාව සහිත නිර්මිත පරිසරය ඇතුළු අන්තර්ග්‍රහණීය භාවිතාවන් ස්ථාපිත කරන හෝටල් සඳහා බදු සහන සහ වෙනත් දිරිදීමනා. | | කෙටිකාලීන | |
| | | 10.2.5. සංචාරක හෝටල් පිළිබඳ පිවිසුම් විගණන පැවැත්වීම සහ ඉන් සුදුසුකම් ලබන හෝටල් සඳහා සහතිකපත් නිකුත් කිරීම. | | මධ්‍ය කාලීන | |
| | | 10.2.6. ප්‍රවේශ වීමේ හැකියාව සහිත හෝටල් පිළිබඳ ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම. | | මධ්‍ය කාලීන | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 11. යුක්තියට ප්‍රවේශය. | 11.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට යුක්තිය සඳහා ප්‍රවේශ විය හැකිය. (උදා : පොලිසියට පැමිණිලි කිරීම, නීති කටයුතුවලට සහභාගිවීම, නීති බලගැන්වීම් ආයතන හා උසාවිවලට පිවිසීම, සාක්ෂිකරුවෙකු ලෙස කටයුතු කිරීම) | 11.1.1. විශේෂයෙන් අධිකරණ සහ පොලිස් සේවය ඇතුළු නීති බලගැන්වීමේ ආයතනවල කාර්ය මණ්ඩලය විශේෂයෙන් මානසික ආබාධ සහිත පුද්ගලයින් ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් හඳුනාගෙන ගනුදෙනුකිරීම සඳහා පුහුණු කෙරේ. | නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව<br>ජාතික පොලිස් කොමිසම<br>නීති ආධාර කොමිසම<br>සමථ මණ්ඩල<br>අධිකරණ සේවා කොමිසම<br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය | කෙටිකාලීන | පුහුණුකළ නීති බලගැන්වීමේ නිලධාරීන්ගේ ප්‍රතිශතය.<br>ආබාධිතභාවය පිළිබඳ කේන්ද්‍රීය කරුණු අවධානයට යොමු කරන ලද පොලිස් ස්ථාන ප්‍රතිශතය.<br>ප්‍රවේශ වීමේ හැකියාව සලසා දෙන ලද උසාවි සංකීර්ණ ප්‍රතිශතය.<br>ප්‍රවේශ වීමේ හැකියාව සලසා දෙන ලද පොලිස් ස්ථාන ප්‍රතිශතය.<br>ප්‍රවේශ වීමේ හැකියාව ඇති සහ ආබාධිතභාවය ආශ්‍රිත නීති ආධාර පිරිනැමිය හැකි නීති ආධාර මධ්‍යස්ථාන. |
| | | 11.1.2. පොලිස් ස්ථාන තුළ ආබාධිතභාවය පිළිබඳ අවධානයට ලක්වන කේන්ද්‍රීය කරුණු ඇතුළත් කිරීම. (මෙම අවධානය පිළිබඳ කේන්ද්‍රීය කරුණු සංඥා භාෂණ පරිවර්තකයින් සහ බේල් උපකරණ තුළින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සේවය ලබාදීම සඳහා සම්පත් සහ හැකියාවන්ගෙන් සමන්විත විය යුතුය) | | මධ්‍ය කාලීන | |
| | | 11.1.3. යුක්තිය සහ සාධාරණත්වය ලබාදීමේදී නිර්මිත පරිසරයට ප්‍රවේශවීම සහතික කිරීම සඳහා අවශ්‍ය ගැලපීම සිදු කිරීම. මෙවැනි කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දී ක්‍රියාත්මක කිරීම. | | මධ්‍ය කාලීන | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 11.1.4. නීති ප්‍රතිසංස්කරණ සහ පවත්නා නීති සාධාරණව අර්ථකථනය කිරීම තුළින් නීතිමය කටයුතුවලදී වි.අ.පු. වයස සහ පරිණත බවට ගැලපෙන සන්නිවේදන සහ ක්‍රියාපරිපාටිමය පහසුකම් සැලසීම.<br><br>1. ආබාධිතතාවේ ප්‍රතිඵලයක් ලෙස පීඩාවට ලක්විය හැකි පුද්ගලයෙකුට අවාසි වීමෙන් තොරව ආරක්ෂාව සහිතව, මානසික වි.අ.පු. සහිත පුද්ගලයන්හට 'භාරකරුවෙකු' හෝ 'නියෝජිතයෙකුගෙන්' සමග ප්‍රවේශය වීමේ හැකියාව ලබා දෙනු ලැබේ.<br><br>2. මනෝසමාජීය වි.අ.පු. සහිත පුද්ගලයින් නීතිය ඉදිරියේ දී සුදුසු මාර්ගෝපදේශවලට අනුකූලව සලකනු ලබන බවටත්, ප්‍රචණ්ඩත්වය, තැති ගැන්වීම් හෝ වෙනත් ආකාරයේ අයුතු භාවිතා කිරීමකට හෝ කොන් කිරීමකට හෝ වෙනත් ආකාරයක අපයෝජනයකට ලක් නොවන පරිදි පොලිස් දෙපාර්තමේන්තු නියෝග E7 සමාලෝචනය කොට ක්‍රියාත්මක කිරීම.<br><br>3. මානසික හෝ වෙනත් වි.අ.පු. හඳුනා ගැනීම හා සුදුසු සහාය හා රැකවරණය ලබා දීම සඳහා නීතිමය ගැටළුවලට මුහුණපා සිටින ළමුන් පිළිබඳ ළමා රෝග විශේෂඥයන් හා මානසික සෞඛ්‍ය පිළිබඳ වෘත්තිකයන් විසින් යෝග්‍ය ඇගයීමක් සිදු කරනු ලැබේ. | | දිගුකාලීන | මානසික ආබාධ සහිත පුද්ගලයන් සමග ගනුදෙනු කරන ක්‍රියාපටිපාටි ප්‍රතිසංස්කරණය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 11.2. යුද්ධයෙන් පීඩාවට පත් වූ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සංක්‍රාන්ති යුක්තිය සඳහා වන ඕනෑම යාන්ත්‍රණයකට ඇතුළත් කිරීම. | 11.2.1. යුධ හමුදාවන්හි සාමාජිකයින්, සිවිල් ආරක්ෂක සේවා නිලධාරීන්, කාන්තාවන්, ළමුන් සහ හිටපු සටන්කරුවන් ඇතුළුව යුද්ධයෙන් පීඩිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ගණනය කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වන යාන්ත්‍රණයන් සකස් කිරීම සඳහා යුද්ධයෙන් පීඩිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් අදහස් ලබා ගැනීම සඳහා යොදා ගැනීම. |
| | | 11.2.2. සංක්‍රාන්ති යුක්තිය සඳහා සියලුම උපදේශන ක්‍රියාවලින්හි යුද්ධයෙන් පීඩිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළත් කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වන යාන්ත්‍රණයන් තුළ සහභාගි වන පීඩිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්. |
| | | 11.2.3. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රහස්‍යභාවය සඳහා කැමැත්ත සහ මනාපය, අනෙකුත් අදාළ ක්‍රියාපටිපාටිමය සහ ස්වාධීන ඇපවීම්වලට ගරු කරමින්, ඔවුන් කැමති සන්නිවේදන මාධ්‍යවලට ප්‍රවේශය ඇතුළුව සංක්‍රාන්ති යුක්තියට අදාළ සියලුම ක්‍රියාවලීන්හී සමාන පදනමක් මත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ සහභාගිත්වය සහතික කිරීමට විධිවිධාන ඇතුළත් කිරීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | සංක්‍රාන්ති යුක්තිය සඳහා ස්ථාපිත කරන ලද යම් ක්‍රියාපටිපාටියක්, යාන්ත්‍රණයක් තුළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා විශේෂිත විධිවිධාන සැලසීම. |
| | | 11.2.4. කායික ආබාධ සහිත පුද්ගලයින්ට ද සංක්‍රාන්ති යුක්තිමය ක්‍රියාපටිපාටි සහ ආයතනවලට ප්‍රවේශ වීමට හැකිවීම. | | මධ්‍ය කාලීන / දිගුකාලීන | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 12. ප්‍රචණ්ඩත්වය සහ අපයෝජන-යන්ගෙන් නිදහස | 12.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් නිවස තුළ සහ පිටත මුහුණ දෙන සෑම ආකාරයකම සූරාකෑම, ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම. | 12.1.1. අපයෝජනයන් සිදු වන අවස්ථා මග හැරීම, හඳුනා ගැනීම සහ වාර්තා කරන ආකාරය පිළිබඳව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, ඔවුන්ගේ පවුල් සහ රැකබලාගන්නන් සහ නීති බලගැන්වීමේ පිරිස් ඉලක්ක කරමින් තොරතුරු ලබා දීම හා අධ්‍යාපනික වැඩසටහන් සකස් කිරීම. | අධිකරණ අමාත්‍යාංශය<br>නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික ළමාරක්ෂක අධිකාරිය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>පොලිස් දෙපාර්තමේන්තුව<br>ජාතික පොලිස් කොමිසම<br>නීති ආධාර කොමිසම<br>සමථ මණ්ඩලය<br>අධිකරණ සේවා කොමිසම | කෙටිකාලීන | පුහුණුව ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව.<br>පුහුණු කරන ලද ආයතන තුළ රැකවරණය සපයන්නන් සංඛ්‍යාව. |
| | | 12.1.2. එවැනි ආකාරයේ අපයෝජනයන් වැළැක්වීම සඳහා සියලුම ආයතනවල නියාමන රාමුවක් ස්ථාපිත කිරීම. | | | ස්ථාපිත නියාමන රාමු සහිත ආයතන සංඛ්‍යාව. |
| | | 12.1.3. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් විසින් භාවිතා කරන සහ / හෝ යොදා ගැනෙන සියලුම ආයතනික සැකසුම් විගණනය කිරීම. | | | ස්ථාපිත නියාමන රාමු සහිත ආයතන සංඛ්‍යාව. |
| | | 12.1.4. පහත දෑ සඳහා අධ්‍යයනයක් පැවැත්වීම :<br>- පවුල සහ ප්‍රජාව තුළ ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනයන් සඳහා අවදානම හඳුනාගෙන අඩුකිරීම;<br>- පුද්ගල සහ පුද්ගල ශරීරයට සම්බන්ධ අපයෝජනයන්ට අදාළව ප්‍රතිචාර දැක්විමට සහ වැළැක්වීමට ආරක්ෂිත සහ පිළියම් ලබා දීමේ ක්‍රියාමාර්ග නිර්දේශ ඉදිරිපත් කිරිම;<br>- වි.අ.පු. සහිත පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා අපයෝජනයන්ට අදාළව දඬුවම් නොලබා සිටීම අවම කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. | | | අධ්‍යයනයක් පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 12.1.5. මානසික සෞඛ්‍ය වාට්ටු සහ ආයතන ඇතුළුව සෞඛ්‍ය පහසුකම්වලදී ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමට සිදු වූ වි.අ.පු. පුද්ගලයින් පිළිබඳ වාර්තා කිරිමට සහ අධිකරණ වෛද්‍ය නිලධාරී පරීක්ෂණය සඳහා යාන්ත්‍රණ පිහිටුවීම. | | මධ්‍ය කාලීන | යාන්ත්‍රණ සකස් කිරීම. |
| | | 12.1.6. (විශේෂයෙන් නිදහස සීමාකර ඇති හෝ විශේෂ අවදානමකට ලක්විය හැකි පුද්ගලයින් සිටින නේවාසික පහසුකම්වල ආරක්ෂාව පිළිබඳ ස්වාධීන සහ නිතිපතා අධීක්ෂණය සඳහා මාර්ගෝපදේශ. | | කෙටි කාලීන | මාර්ගෝපදේශ සකස් කිරීම. |
| | | 12.1.7. අපයෝජනයට ලක් වූ පුද්ගලයන් ශාරීරික, ඥානාත්මක හා මානසික වශයෙන් සුව වීම හා ප්‍රත්‍යනුකලනය තහවුරු කිරීම සඳහා ඔවුන්ගේ කැමැත්තට ගරු කරමින් ආරක්ෂිත සේවා පිළිබඳ වැඩසටහනක් සංවර්ධනය කිරීම. | | | වැඩසටහන් සකස් කිරීම හා ප්‍රසිද්ධියට පත් කිරීම. |
| 13. දැනුවත්භාවය ඉහළ දැමීම | 13.1. රාජ්‍ය අංශය තුළ ආබාධිතභාවයට අදාළව සංවේදීකරණය සහ දැනුම වැඩි කිරීම. | 13.1.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ හිමිකම් නීති සහ ප්‍රතිපත්ති, ආබාධිත ශබ්දමාලාව, නොනැවතී පවත්නා අපකීර්තිය සහ කොන්කිරීම සහ සමාජ-සංස්කෘතික අගතීන්, ආබාධිත සමාජ චාරිත්‍ර විධි ආමන්ත්‍රණය කරමින් රාජ්‍ය අංශය සඳහා ආබාධිත අන්තර්ග්‍රහණීය පුහුණු වැඩසටහන් පැවැත්වීම. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br>පළාත් සභා<br>යෝජිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ හිමිකම් කොමිසම (ඉලක්ක අංක 15) | කෙටිකාලීන / දිගුකාලීන | රජයේ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිසාපති/ ප්‍රා.ලේ කාර්යාල සහ වෙනත් රජයේ ආයතන විසින් පවත්වන ලද ආබාධිතභාවයට අදාළ සංවේදීකරණ වැඩසටහන් සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 13.2. මාධ්‍ය තුළ සහ ඒ හරහා ආබාධිතභාවය පිළිබඳ දෘශ්‍යතාව වැඩි කිරීම. | 13.2.1. ආබාධිතභාවය සහ ආශ්‍රිත ගැටළු වාර්තාකරණයට මාධ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම. | රාජ්‍ය මාධ්‍ය සංස්ථා (මුද්‍රණ සහ විද්‍යුත්)<br>පුද්ගලික මාධ්‍ය ආයතන<br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය<br>ශ්‍රී ලංකා පුවත් පැමිණිලි කොමිසම<br>ශ්‍රී ලංකා ජනමාධ්‍ය පාසල<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | කෙටිකාලීන / දිගුකාලීන | මාධ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම. |
| | | 13.2.2. රාජ්‍ය සහ පුද්ගලික මාධ්‍ය ආයතන සඳහා ආබාධිතභාවයට අදාළ සංවේදීකරණ වැඩසටහන් පැවැත්වීම. | | | රාජ්‍ය මාධ්‍ය ආයතන හා පුද්ගලික මාධ්‍ය ආයතන සඳහා පවත්වන ලද ආබාධිතභාවයට අදාළ සංවේදීකරණ වැඩසටහන්. |
| | | 13.2.3. වි.අ.පු. පුද්ගලයින්ගේ ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ නිපුණතා සහ හැකියාවන් හඳුනා ගැනීම සඳහා මාධ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම. | | | ආබාධිතතා මොඩියුල ඇතුළත් කළ මාධ්‍ය අධ්‍යයන පාඨමාලා ප්‍රතිශතය. |
| | | 13.2.4. විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන / වෙනත් ආයතනවල මාධ්‍ය සහ ජනමාධ්‍යවේදී විෂයමාලාවන්ට ආබාධිතතා මොඩියුලයක් ඇතුළත් කිරීම. | | | ආබාධිතතාව මාධ්‍ය තුළ ධනාත්මකව නියෝජනය කළ අවස්ථා ප්‍රතිශතය. |
| | | 13.2.5. තම හිමිකම් සම්පූර්ණයෙන් භුක්ති විඳීමට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ සහභාගිත්වය සහ බලගැන්වීම සඳහා ආකල්ප සහ නිපුණතා වර්ධනය කරන මානසික සෞඛ්‍ය සාක්ෂරතා වැඩසටහන් ඇතුළුව නිපුණතා, කුසලතා සහ හැකියාවන් ඉස්මතු කිරීමට ගුවන්විදුලිය, රූපවාහිනිය සහ මුද්‍රිත මාධ්‍ය භාවිතා කරමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 14. කාන්තා සහ ළමා සුභසාධනය. | 14.1. විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ අයිතිවාසිකම් ඉහළ නැංවීම. | 14.1.1. පෙර පාසල්වල දී වි.අ. සහිත ළමුන් කලින් හඳුනා ගැනීම හා ඒ සම්බන්ධයෙන් මැදිහත් වීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>පළාත් සභා | මධ්‍යකාලීන | ආබාධිතභාවය පිළිබඳ උපදේශකවරුන් / සම්පත් දායකයින් බඳවා ගැනීම. |
| | | 14.1.2. සුදුසු මුල් ළමාවිය සංවර්ධන (ECCD) වැඩසටහන් ක්‍රියාත්මක වීම සහතික කිරීමට දිස්ත්‍රික් / ප්‍රාදේශීය මට්ටමින් ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම. | | | ස්ථාපිත කරන ලද මධ්‍යස්ථාන සංඛ්‍යාව.<br>මුල් ළමාවිය සංවර්ධන (ECCD) වැඩසටහන් යටතේ ලියාපදිංචි වන ලද ළමුන්. |
| | | 14.1.3. වි.අ. සහිත ළමුන්ගේ සුභසාධනය පිළිබඳ සංකල්පය ගුරු පුහුණු විෂයමාලාවට හඳුන්වාදීම සහ පන්තිකාමර භාවිතාවන්ට අදාළව මුඛ්‍යධාරාගත කිරීම. | | | විෂය මාලා සංශෝධනය කිරීම. |
| | | 14.1.4. විශේෂයෙන් සංවර්ධනාත්මක සහ මානසික වියවුල් / මානසික ආබාධ සඳහා පාසල් පදනම් සෞඛ්‍ය ඇගයීම් තුළ පූර්ව හඳුනාගැනීම සහ සුලමුල පරීක්ෂා කිරීමේ හැකියාව ඇතුළත් කිරීම. | | | සැලසුමක් සකස් කිරීම. |
| | | 14.1.5. සංවර්ධනාත්මක සහ මානසික ආබාධ සහ උපදේශන මූලධර්ම / ආචාරධර්ම (උදා - රහස්‍යභාවය) ඇතුළුව ආබාධිතතා ගැටළු පිළිබඳ පාසල් උපදේශකයින් සහ / හෝ ගුරුවරුන්ට සුදුසු පුහුණුව ලබාදීම. | | | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව. |
| | | 14.1.6. ගුරු පුහුණු විෂයමාලාවට ආබාධිතතාව ඇතුළත් බවට සහතික කිරීම. | | | විෂය මාලා සංශෝධනය කිරීම. |
| | | 14.1.7. මානසික ආබාධ සඳහා නිවාස සහ සිරගත නිවාස ලැබෙන සහ ඔවුන්ට සුදුසු ආරක්ෂාව සහ සහන ලබාදෙන සහතික ලත් පාසල්වල දැනට පදිංචිකරුවන්, හෝ ඒවාට බැඳීමට සිටින ළමුන් ඇගයීම. | | | ඇගයීම සිදු කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 14.2. විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ හඳුනාගත් / ප්‍රමුඛතාගත ගැටළු සඳහා විසඳුම් ලබාදීම | 14.2.1. විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සහ විසඳුම් ලබාදීම සඳහා අදාළ රජයේ ආයතනවල සහභාගිත්වයෙන් ආසන්න ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ කමිටුවක් පත් කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය<br>නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය | දැනට සිදු කෙරෙමින් පවතියි | කමිටුවක් පත් කිරීම. |
| | | 14.2.2. හඳුනාගත් ගැටළු සහ දැනටමත් අනුමත 2014 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ වෙනස් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | | | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. |
| | 14.3. තීරණ ගැනීමේදී කාන්තාවන් සක්‍රියව මැදිහත් කිරීම. | 14.3.1. පහත දෑ පිළිබඳ දැනුවත්භාවය තුළින් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ සංවිධාන ශක්තිමත් කිරීම.<br>කාන්තා අයිතිවාසිකම්, සෑම ආකාරයකම හිරිහැර සහ ප්‍රචණ්ඩත්වය සහ කොන් කිරීමට එරෙහිව වැඩකිරීම ජාලගත කිරීම, පවුල් උපදේශනය, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යාපනය ආදිය. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය<br>කුඩා කර්මාන්ත අමාත්‍යාංශය<br>මුදල් අමාත්‍යාංශය | කෙටිකාලීන | සැලැස්මක් සකස් කිරීම |
| | 14.4. සෑම මට්ටමකම දේශපාලනික වශයෙන් ශක්තිමත් වූ කාන්තාවන් සිටීම. | 14.4.1. ජාතික ලැයිස්තුව තුළින් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් පාර්ලිමේන්තුවට පත් කිරීම සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන තුළ සමාන පත්වීම් ලබාදීම. | මැතිවරණ කොමිසම<br>පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | කෙටිකාලීන / දිගුකාලීන | විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගෙන් සහිත ඉහළ මට්ටමේ රජයේ කමිටුව පත්කිරීම. (සියලුම කණ්ඩායම් නියෝජනය වන සේ) |
| | | 14.4.2. ඡන්ද අයිතිය සහ සියලුම මැතිවරණ ආයතන තුළ මැතිවරණ සඳහා පෙනී සිටීමේ අයිතිය සහතික කිරීම. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | | කෙටි සහ දිගුකාලීන ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම. |
| | | 14.4.3. විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් සඳහා යම් කාන්තා නියෝජනයක් වෙනුවෙන් හිමි කොටසින් ප්‍රතිශතයක් වෙන් කිරීම. | සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | | පාර්ලිමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් තෝරා ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 14.5. රජයේ සම්පත් ලබා දීම සහතික කිරීම. | 14.5.1. විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් සවිබලගැන්වීමට රජයේ වාර්ෂික අයවැයෙන් වෙනම අයවැයක් වෙන් කිරීම.<br><br>14.5.2. ජාතික ලැයිස්තුව තුළින් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් පාර්ලිමේන්තුවට පත් කිරීම සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතන තුළ සමාන පත්වීම් ලබාදීම.<br><br>14.5.3. ඡන්ද අයිතිය සහ පත්කෙරෙන ආයතනයන්ට අදාළ මැතිවරණ සඳහා පෙනී සිටීමේ අයිතිය සහතික කිරීම. | මුදල් අමාත්‍යාංශය<br><br>මැතිවරණ කොමිසම<br><br>පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | කෙටිකාලීන | ජාතික, පළාත් හා පලාත් පාලන අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම. |
| | 14.6. විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් ආර්ථික වශයෙන් බලගැන්වීම. | 14.6.1. පුහුණු, උපදේශනය සහ පසු විපරම් කටයුතු කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සහිතව විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ට ආදායම් ඉපයීමේ සහාය ලබාදීම සඳහා වෙනම රාජ්‍ය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම.<br><br>(උදා. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණුව ඇතුළත් ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කරන ලදී) | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය<br><br>කුඩා කර්මාන්ත අමාත්‍යාංශය<br><br>නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය<br><br>මුදල් අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විශේෂ අවශ්‍යතා සහිත කාන්තා ව්‍යවසායකයින් සඳහා බදු සහන ලබා දීමේ ප්‍රතිශතය.<br><br>මහ බැංකු වාර්තා ආදියෙන් පෙන්නුම් කරන ලද ආදායම් ඉපයීම සඳහා වන කාන්තා සහභාගීත්වය. |
| | 14.7. විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් පිළිබඳ පොදු ජනතාව අතර සංවේදීභාවය ඇති කිරීම. | 14.7.1. පොදු ජනතාව සංවේදීකරණය සඳහා විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත් තුළින් ජාතික මට්ටමේ දැනුවත්කිරීම. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | මුද්‍රිත, ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍යවල සේවයේ නියුතු වූවන් සඳහා වසරකට එක් පුහුණු වැඩසටහනක් පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 14.8. කාන්තා අයිතිවාසිකම් ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් නියාමනය කිරීම. | 14.8.1. කාන්තා ගැටළු විසඳන බව සහ හිමිකම් උල්ලංඝනය නොකරන බව සහතික කිරීම සඳහා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ දිස්ත්‍රික් මට්ටමේ නියාමන කමිටු පත් කිරීම. | අදාළ සියලුම පාර්ශ්වකරුවන්<br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | අධීක්ෂණ කමිටුව පත් කිරීම. |
| | | 14.8.2. කාන්තා ගැටළු විසඳන බව සහතික කිරීම සඳහා දිස්ත්‍රික් නියාමන කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ ජාතික මට්ටමේ නියාමන කමිටුවක් පත් කිරීම. | | | කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුවට ඇතුළත් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන් ඇතුළත් වේ. |
| | | 14.8.3. පොදු ජනතාව සංවේදීකරණය සඳහා විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත් තුළින් ජාතික මට්ටමේ දැනුවත්කිරීම් සිදු කිරීම. | | | |
| 15. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ හිමිකම් ආරක්ෂා කිරීමට, ගරු කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ව්‍යවස්ථාමය, ප්‍රතිපත්තිමය සහ ආයතනිකමය වශයෙන් කටයුතු කිරීම. | 15.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අනුව පවත්නා නීති සමාලෝචනය කිරීම. | 15.1.1. සමාලෝචනය කිරීම සඳහා මානව හිමිකම් නීතිය තුළ අධ්‍යාපනඥයින් සහ වෘත්තිකයින් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ හිමිකම්වලට අදාළ වෙනත් අංශයන්හී විශේෂඥයින් (උදා - අධ්‍යාපනය, මාධ්‍ය, මානසික සෞඛ්‍ය වෘත්තිකයින්) ඇතුළුව සිවිල් සමාජ ප්‍රවීනයින්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීම. | මානව හිමිකම් කොමිසම<br>ආබාධිතභාවයට අදාළ විධි නියෝග සහිත සියලුම අමාත්‍යාංශ<br>නීති කෙටුම්පත් කාර්යාලය<br>වාණිජ මණ්ඩලය | කෙටිකාලීන | කමිටුව පත් කිරීම. |
| | | 15.1.2. සමාලෝචනය මත පදනම්ව, පුද්ගලික අංශය තුළ පාර්ශ්වකරුවන්ගේ (උදා : ලංකා සේවා නියුක්තිකයින්ගේ සංගමය, වාණිජ මණ්ඩලය) උපදෙස් සහිතව පවත්නා නීති පද්ධතියට සංශෝධන යෝජනා කිරීම. | | | සංශෝධන පිළිබඳ අවසන් තීරණයක් ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 15.1.3. සියලුම භාෂාවන් සහ පිවිසිය හැකි ආකාරයෙන් සමාලෝචනය ප්‍රසිද්ධියට පත් කිරීම. | නීතිපති දෙපාර්තමේන්තුව<br>කැබිනට් මණ්ඩලය<br>පාර්ලිමේන්තුව | | සමාලෝචනයේ විචාර සහ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ උපදෙස් ලබාදුන් පාර්ශව හඳුනාගැනීම.<br>නව නීති පද්ධතිය පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ අපේක්ෂාව. |
| | | 15.1.4. නිර්දේශ කර ඇති පරිදි නීති සංශෝධනය. | | | සංශෝධිත නීති ගැසට් කිරීම. |
| | 15.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ අනෙකුත් ජාත්‍යන්තර රාමු සමඟ අනුරූපවන බව සහතික කිරීමට නීති සංශෝධනය සඳහා සකස් කෙරමින් පවතින ආබාධිතභාවය පිළිබඳ නීති සමාලෝචනය කර සංශෝධනය කිරීම. | 15.2.1. සමාලෝචනය සිදු කිරීම සඳහා මානව හිමිකම් නීතිය තුළ අධ්‍යාපනඥයින් සහ වෘත්තිකයින් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ හිමිකම්වලට අදාළ වෙනත් අංශයන්හි විශේෂඥයින් (උදා - අධ්‍යාපනය, ප්‍රවාහනය, නාගරික සංවර්ධනය, මාධ්‍ය, මානසික සෞඛ්‍ය) ඇතුළුව සිවිල් සමාජ ප්‍රවීණයින්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීම. | මානව හිමිකම් කොමිසම<br>සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය<br>ජාතික බුද්ධිමය දේපල දෙපාර්තමේන්තුව<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>නීති කෙටුම්පත් කාර්යාලය<br>නීතිපති දෙපාර්තමේන්තුව<br>කැබිනට් මණ්ඩලය<br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | විශේෂඥයින්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීම.<br>සිවිල් සමාජයේ අදහස් විමසුම් අවස්ථා ගණන. |
| | | 15.2.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, ඔවුන්ගේ නියෝජිත සංවිධාන, මානව හිමිකම් නීතිය තුළ අධ්‍යාපනඥයින් සහ වෘත්තිකයින් සහ විවිධ ජනවර්ගවලට අයත් වෙනත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ භූගෝලීය නියෝජනයන් සමඟ අදහස් ලබා ගැනීම සඳහා සාකච්ඡා කිරීම සහ ප්‍රතිචාර වාර්තා කිරීම. | | | සිවිල් සමාජ ප්‍රතිචාර සහ අදහස් සම්පාදනය කිරීම. |
| | | 15.2.3. පනත් භාෂා තුනෙන් කෙටුම්පත් කොට ප්‍රමාණවත් කාලසීමාවක් තුළ ලබාගතහැකි ආකෘතීන් මගින් සමාලෝචනය සහ මහජන අදහස් ලබා ගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කිරීම. | | | පනත් පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ඒවා ලබා ගතහැකි ආකෘතීන් මගින් අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 15.2.4. නීතිගත කළ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා නීති පද්ධතියට බලය ලබාදීම සඳහා ආබාධිත හිමිකම් පනත පැනවීම. | | | ගැසට්කළ පනත්. |
| | | 15.2.5. සංඥා භාෂා පනත පැනවීම. | | | |
| | | 15.2.6. බුද්ධිමය දේපල පනතට සිදු කරන ලද සංශෝධය - මරාකේෂ් ගිවිසුම පැනවීම. | | | |
| | | 15.2.7. සුදු සැරයටි පනත පැනවීම. | | | |
| | | 15.2.8. මානසික සෞඛ්‍ය පනත පැනවීම හා ප්‍රතිපත්තිය (ලෝක සෞඛ්‍ය සම්මේලනයේ (WHA) මානසික සෞඛ්‍ය ක්‍රියාකාරී සැලැස්ම 2013 - 2020 ට ගැලපෙන පරිදි මෙය සිදුකෙරේ). | | | |
| | 15.3. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුකූල වීම සඳහා සියලුම නව නීති කෙටුම්පත් ඇගයීමට ලක් කිරීම. | 15.3.1. නව නීති සමාලෝචනය සඳහා ආබාධිතතාව, මානව හිමිකම් නීතිය සහ ආබාධිත හිමිකම් පිළිබිඹු වන නීතිවලට අදාළ වෙනත් ක්ෂේත්‍රයන්හි විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුව. | නව නීති යෝජනා කරන අදාළ රේඛීය අමාත්‍යාංශ<br><br>මානව හිමිකම් කොමිසම | සිදු කෙරෙමින් පවතියි | කමිටුව පත් කිරීම සහ විධි නියෝග ප්‍රසිද්ධියට පත් කිරීම. |
| | | 15.3.2. සමාලෝචනයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලද අතර ඊට අදාළව ප්‍රතිචාර දැක්වීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සහ ඔවුන්ගේ සංවිධානවලට අවස්ථාව සහ ප්‍රවේශය ලබාදීම. | | | ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ සංවිධාන මගින් දක්වන ලද ප්‍රතිචාර සම්පාදනය කිරීම. |
| | | 15.3.3. සමාලෝචනයේ නිර්දේශවලට අනුකූලව නව නීති කෙටුම්පත් සංශෝධනය කිරීම. | | | නීතී සංශෝධනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 15.4. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 33 (1) වගන්තියට අනුකූලව ආබාධිත හිමිකම්වලට අදාළ බැඳීම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා වන ආයතනිකමය වැඩ පිළිවෙළ. | 15.4.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ජාතික සභාවේ සහ වි.අ.පු. අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට විශේෂයෙන් නියම කළ වෙනත් යාන්ත්‍රණවල ප්‍රමාණවත්භාවය හා කාර්යසාධනය ස්වාධීනව සමාලෝචනය කිරීම සඳහා ස්ථාපිත කමිටුව. | මානව හිමිකම් කොමිසම මගින් පත්කළ කමිටුව, හෝ අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ ස්ථාපිත කිසිඳු අමාත්‍යාංශයක බලපෑමෙන් තොර කාර්යය සාධන බලකාය. | කෙටිකාලීන | පත්කළ කමිටු සාමාජිකයින්, විධි නියෝග සහ හඳුනාගත් සාමාජිකයින්.<br><br>ප්‍රකාශිත ස්වාධීන සමාලෝචනය. |
| | | 15.4.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික සභාව සහ එවැනි වෙනත් ආයතනවල වර්තමාන සහ හිටපු සාමාජිකයින් මෙන්ම අමාත්‍යාංශවල වෙනත් නියෝජිතයින්, වි.අ. සහිත ජනතාව, වි.අ.පු. හා ඔවුන් සඳහා වන සංවිධාන සහ වෙනත් සිවිල් සමාජ පක්ෂපාතිත්වය දක්වන්නන්ගේ අදහස් ලබා ගැනීම. | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික සභාවෙහි දැනට නියෝජනය කරන හෝ පෙර නියෝජනය කළ සියලුම අමාත්‍යාංශ. | | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, ඔවුන් නියෝජනය කරන සංවිධාන සහ වෙනත් සිවිල් සමාජ ක්‍රියාකරුවන්ගේ අදහස් ලබා ගැනීම සහ ප්‍රතිචාර ප්‍රකාශයට පත් කිරීම. |
| | | 15.4.3. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික සභාවෙහි සහ වෙනත් ආයතනවල කාර්යයන් සහ තීරණ පිළිබඳ වාර්තා සමාලෝචනය. | ආබාධිභාවය කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා කැපවුණු අමාත්‍යාංශ (උදා - සමාජ සුභසාධන, අධ්‍යාපන, සෞඛ්‍ය) | | පත්කළ සාමාජිකයින් සහිත සථාපිත යාන්ත්‍රණ. |
| | | 15.4.4. වාර්තාව සියලුම භාෂාවන්ගෙන් ප්‍රකාශයට පත් කොට බෙදා හැරීම. | පාර්ලිමේන්තුව | | වාර්තාව පළකිරීම. |
| | | 15.4.5. පවත්නා යාන්ත්‍රණවල ප්‍රමාණාත්මකතාව පිළිබඳ ස්වාධීන සමාලෝචනයේ උගත් පාඩම් සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින් යෝජිත සම්බන්ධීකරණ යාන්ත්‍රණයේ ස්වභාවය සහ ව්‍යුහය පිළිබඳ නිර්දේශ නිර්ණය කිරීමට සහ ඉදිරිපත් කිරීමට රජයේ සහ සිවිල් සමාජයේ පාර්ශ්වකරුවන් සහ විශේෂයෙන් වි.අ.පු. සහ ඔවුන්ගේ නියෝජිත සංවිධානවල අදහස් ලබා ගැනීම සහ ඒවායේ ප්‍රතිචාර වාර්තා කොට ප්‍රසිද්ධ කිරීම. | | | සාමාජිකයන් පත් කිරීම හා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 15.4.6. රජය තුළ බහු - අමාත්‍යාංශමය, බහු - ආංශික සහ විවිධ මට්ටමේ ආබාධිත හිමිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ පරීක්ෂා කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | | | |
| | 15.5. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 33 (2) වගන්තියට අනුකූලව ආබාධිත හිමිකම් ක්‍රියාත්මක කිරීම නියාමනය සහ ඇගයීම සඳහා ආයතනිකමය වැඩ පිළිවෙල. | 15.5.1. පවත්නා යාන්ත්‍රණවල ප්‍රමාණාත්මකතාව පිළිබඳ ස්වාධීන සමාලෝචනයේ උගත් පාඩම් සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින් යෝජිත නියාමන යාන්ත්‍රණයේ ස්වභාවය සහ ව්‍යුහය පිළිබඳ නිර්දේශ නිර්ණය කිරීමට සහ සිදු කිරීමට රජයේ සහ සිවිල් සමාජයේ පාර්ශ්වකරුවන් සහ විශේෂයෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ නියෝජිත සංවිධාන සමග උපදේශනය සහ ඒවායේ ප්‍රතිචාර වාර්තා කොට ප්‍රසිද්ධ කිරීම.<br><br>අදහස් ලබා ගැනීම සහ සමාලෝචනය, පහත ආකාරයෙන් ස්ථාපිත කරන ලද ස්වාධීන යාන්ත්‍රණය :<br><br>1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත්කළ සාමාජිකයින් සහිත ආබාධිත හිමිකම් කොමිසමක්.<br><br>හෝ<br><br>2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළත් ප්‍රමාණවත් සම්පත් හා කාර්ය මණ්ඩලය සහිත මානව හිමිකම් කොමිසම තුළ වන විශේෂ ඒකකයක්. | මානව හිමිකම් කොමිසම<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව<br><br>ජනාධිපති කාර්යාලය<br><br>පාර්ලිමේන්තුව | මධ්‍ය කාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, ඔවුන් නියෝජනය කරන සංවිධාන සහ වෙනත් සිවිල් සමාජ ක්‍රියාකරුවන්ගේ අදහස් ලබා ගැනීම සහ ප්‍රතිචාර ප්‍රකාශයට පත් කිරීම.<br><br>පත්කළ සාමාජිකයින් සහිත යාන්ත්‍රණය ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 15.6. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් තහවුරු කෙරෙන වැඩසටහන් සහ සේවාවන් ලබාදීමේදී සාක්ෂි පදනම් වැඩි දියුණු කිරීම් සඳහා, ආබාධිතතාව විෂය කොටගත් දත්ත ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් රැස් කිරීම, වාර්තා කිරීම සහ භාවිතා කිරීම. | 15.6.1. සම්බන්ධිකරණ යාන්ත්‍රණයට සහයවන ලේකම් කාර්යාලයක් විසින් පවත්වාගෙන යන සහ පාලනය කෙරෙන තොරතුරු නිෂ්කාශනායතනයක් ලෙස කටයුතු කරන වි.අ.පු. පිවිසුම් වෙබ් අඩවියක් ස්ථාපිත කිරීම. | සම්බන්ධිකරණ යාන්ත්‍රණ<br>ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය<br>කම්කරු අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය<br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br>ජාතික ළමාරක්ෂක අධිකාරිය<br>මැතිවරණ කොමිසම<br>අග්‍රාමාත්‍ය කාර්යාලය | මධ්‍ය කාලීන | වෙබ් අඩවියක් නිර්මාණය කිරීම. |
| | | 15.6.2. ක්‍රියාකාරීත්වය පිළිබඳ ජාත්‍යන්තර වර්ගීකරණය (ICF) මත පදනම් වී එකතු නොකළ දත්ත පිළිබඳ වන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ කළමනාකරණ තොරතුරු පද්ධතියක් (DMIS) සකස් කිරීම. | | දිගුකාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (DMIS) සකස් කිරීම හා ප්‍රවේශය පිළිබඳ නීති ප්‍රසිද්ධියට පත් කිරීම. |
| | | 15.6.3. ප්‍රධාන සේවා ප්‍රවේශ ස්ථානවලින් (එනම් සෞඛ්‍ය අංශයේ සායන, ප්‍රාථමික පවුල් සෞඛ්‍ය සේවා ක්‍රමය) සහ ක්‍රමානුකූල සමීක්ෂණ තුළින් දත්ත සීමා සහිත වන මූලික අයිතිවාසිකම් පිළිබඳ (එනම් අධ්‍යාපනය තුළ ළමුන්) දත්ත නිතිපතා රැස් කිරීම. | | දැනට ක්‍රියාත්මක වේ. | සමීක්ෂණය අතරතුර හා එය නිම කිරීමෙන් පසු ඒ පිළිබඳ තොරතුරු සහ ප්‍රතිඵල ප්‍රසිද්ධියට පත් කිරීම. |
| | | 15.6.4. දැනට පවත්නා ජාතික ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා පර්යේෂණ කිරීම. | | මධ්‍ය කාලීන | යාවත්කාලීන කිරීම් සිදු කරමින් පවතියි. |
| | | 15.6.5. මානව හිමිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කිරීම සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සහ කාන්තාවන්ට අදාළ ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් ප්‍රගතිය සහ තත්ත්වය ඇගයීම. | | දැනට ක්‍රියාත්මක වේ. | කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 15.6.6. වි.අ.පු. රහස්‍යභාවය සහතික කිරීම සඳහා දත්ත ආරක්ෂාව සහ ප්‍රොටොකෝලයන්ට යටත්ව වෙනස් ලෙස නොසැලකීම තහවුරු කිරීම සඳහා දත්ත සහ සංඛ්‍යා ලේඛන, ලබා ගත හැකි ආකාරයෙන් සහ තාක්ෂණය සහිතව සකස් කිරීම. | | දැනට ක්‍රියාත්මක වේ | දත්ත ලබාගත හැකි බව. |
| | 15.7. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා සියලුම මධ්‍යම රජයේ සහ පළාත් අමාත්‍යාංශ තුළ ඔවුන් සඳහා සේවා සහ වැඩසටහන් ලබාදීම සඳහා අයවැය වෙන්කිරීම. | 15.7.1. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සේවා සහ වැඩසටහන් සඳහා අරමුදල් සපයන ලෙස වන ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශ මගින් මුදල් අමාත්‍යාංශය වෙත ලබාදීම. | සමාජ සවිබලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය<br>පළාත් මට්ටම ඇතුළුව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වන වැඩසටහන් සහ සේවා ක්‍රියාත්මක කරන වෙනත් අදාළ අමාත්‍යාංශ<br>මුදල් අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව<br>විගණකාධිපති<br>පාලන කමිටුව | මධ්‍ය කාලීන | යෝග්‍ය නීති සම්මත කිරීම. |
| | 15.8. ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කර සංශෝධනය කිරීම. | 15.8.1. රජය සහ සිවිල් සමාජයේ පාර්ශ්වකාර කණ්ඩායම්හි අදහස් ලබා ගැනීම.<br>15.8.2. සිදුකළ සමීක්ෂණ සහ අනෙකුත් පර්යේෂණ.<br>15.8.3. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට සහ අනෙකුත් අදාළ පවත්නා ප්‍රතිපත්ති, සැලසුම් සහ භාවිතාවන්ට අනුව සමාලෝචනය කොට සංශෝධනය කිරීම. | ආබාධිතභාවය පිළිබඳ කේන්ද්‍රස්ථාන සහිත සහ ආබාධිතභාවයට අදාළ විධි නියෝග සහිත සියලුම අමාත්‍යාංශ | මධ්‍ය කාලීන | යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්ති සංසරණය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 15.9. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 35 වගන්තිය යටතේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට වාර්තා කිරීම. | 15.9.1. රජය සහ සිවිල් සමාජයේ සහ විශේෂයෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ නියෝජිත සංවිධානවල පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම සහ ඔවුන්ගේ ප්‍රතිචාර ඇතුළත් කිරීම. | විදේශ කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන ලද වාර්තාව ප්‍රකාශයට පත් කිරීම. |
| | | 15.9.2. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුවට ඉදිරිපත් කිරීමට පෙර අදාළ වාර්තාව ප්‍රසිද්ධියට පත් කිරීම. | ආබාධිතභාවයට අදාළ සේවා සපයන සහ වැඩසටහන් ක්‍රියාත්මක කරන සියලුම රේඛීය අමාත්‍යාංශ | | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ පොදු නිරීක්ෂණ. |

# ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්

## ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්

ශ්‍රී ලංකාව ආර්ථික, සමාජ සහ සංස්කෘතික හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICESCR) 1980 දී අපරානුමත කළ අතර, එම නිසාම දේශීය නීති තුළින් සහ  පරිපාලන, විධායක හා අධිකරණ ක්‍රියාමාර්ග තුළින් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික හිමිකම් (ESCR)  ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී.

මානව හිමිකම්වල පරිපූර්ණත්වයට සහ අර්ථවත් බව සාක්ෂාත් කිරීමට, ශ්‍රී ලාංකිකයන්ට අනන්‍යවූ ගරුත්වය පිළිබඳ මූලිකව ම සළකමින් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කිරීම අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. ආර්ථික, සමාජ සහ සංස්කෘතික හිමිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ සුවිශේෂී අවශ්‍යතාව පිළිබඳව, රාජ්‍ය නියෝජන කාරක සභාවට දීර්ඝ වශයෙන් නිර්දේශ කිරීම් ඉදිරිපත් කර ඇත. මෙම ඇතුළත් කිරීම් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ පමණක්ම නොව, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම තුළද, රාජ්‍ය මුදල්, ඉඩම්, සංවර්ධනය පරිසරය, යුක්තිය සහ නීති ආධාර ලබා ගැනීමට ඇති අවකාශය, යන ක්ෂේත්‍ර තුළ ද සඳහන් විය යුතුය. ශ්‍රී ලංකාව සහාය පළ කර ඇති, තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතීන් සම්බන්ධයෙන් අසමතුලිතතාවන් මඟහරවා ගැනීමට රජය ධනාත්මක පියවර ගනු ලැබීම තවදුරටත් අවශ්‍යය. සිවිල් සහ දේශපාලන ක්ෂේත්‍ර හරහා පමණක් මෙම තත්වයන් විසඳා ගත නොහැකිය.

සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ සුභ සාධනය වැනි අංශයන් මුල් කර ගනිමින් මහජන ප්‍රතිපාදන ආශ්‍රිත සාධනීය පශ්චාත් - නිදහස් ඉතිහාසයකට ශ්‍රී ලංකාව හිමිකම් කියයි. කෙසේ වුවද මූලික අයිතිවාසිකම් හා හිමිකම් ලෙස ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතීන් හඳුනා ගැනීමට නම්, මෙම කරුණු අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීති සහ කාර්ය සැලසුම් අතරට ඒකාග්‍රකරණය වීම තීරණාත්මකව බලපායි. මෙම හිමිකම් නිදහස, ගෞරවය, යහපැවැත්ම සහ මානව ආරක්ෂාව සඳහා කේන්ද්‍රීය වැදගත්කමක් දරයි.

මානව අයිතිවාසිකම් සහතික කිරීම යනුවෙන් නීතිමය, ප්‍රතිපත්තිමය, හා එහි සුසංයෝගයෙන් ජාතික හා ස්වභාවික සම්පත් කලාපීය වශයෙන් හා මිනිස් ප්‍රජාව අතරත් සෙවරී පරිභෝජනය සිදුවිය යුතුය යන්නද අදහස් කෙරේ. එබැවින් සෙවරී පරිභෝජනය ප්‍රවර්ධනය කරන රාජ්‍ය මූල්‍ය විමධ්‍යගතකරණය, කලාපීය සම්පත් සඳහා කලාපීය වශයෙන් තීරණයන්ට එළැඹීම, කේන්ද්‍රීය පර්යන්ත සම්බන්ධතා යන කරුණු, අර්ථවත් ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා ඉවහල් වේ.

සහභාගිත්ව, තිරසර, සාධාරණ සහ සමබර කලාපීය වශයෙන් තුලනාත්මක සංවර්ධනය තුළින් යුක්ති සාධාරණත්වයක් රජය විසින් සහතික කළ යුතු බව සහ පුරවැසියන්ට ඔවුන්ගේ අයිතීන් බලාත්මක කිරීමට සහ ඉල්ලීමට සම්පත් ලබාදිය යුතු බව ජාතික මානව හිමිකම් කාර්ය සැලැස්ම මගින් (NHRAP) අවධාරණය කරයි. ශ්‍රී ලංකාව මෙම වගකීම් සපුරාලීමට ස්ථායි පියවර ගත යුතු අතර මෙම ප්‍රතිපත්තිය තුළ දැක්වෙන කාර්ය බද්ධ කරුණු එම වගකීම් ඉටු කිරීම සඳහා ඉක්මණින්ම ගත යුතු පියවර කිහිපයක් ලෙස දැක්විය හැකිය.

විශේෂයෙන්ම, අපේ ජනගහනයෙන් ප්‍රබලවම පීඩාවට පත්, සුළු ජන කොටස් අතර සුළු ජාතීන්ට, කාන්තාවන්, තරුණ ප්‍රජාව, දරුවන්, වතු ජනතාව, ආබාධිත පුද්ගලයන්, අතීතයේ දී ආයුධ අතට ගත් පුද්ගලයන් සහ තවත් බොහෝ පුද්ගලයන්ට මෙම අයිතීන් විශේෂයෙන් ලබාගත හැකි විය යුතුය. එබැවින් විශ්වීය වටිනාකමක් ඇති, නොබෙදිය හැකි සහ එකිනෙකට බද්ධ වූ මිනිස් අයිතිවාසිකම් ලෙස ආර්ථික, සමාජ සහ සංස්කෘතික හිමිකම් ආරක්ෂා කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, ශ්‍රී ලංකාවේ මහජනතාව හා විවිධ ප්‍රදේශ අතර අහිමි කිරීම්, වර්ගවාදී අසාධාරණකම්, අසමානතා, ජාතික මානව හිමිකම් කාර්ය සැලැස්ම මගින් ආමන්ත්‍රණය කරයි.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. සියල්ලන්ටම පූර්ණ සහ ඵලදායි රැකියා සහ වැදගත් වෘත්තීන්. | 1.1. වෘත්තියේ දී සමාන අවස්ථා ලබාදීම සහ සෘජු හා වක්‍ර අසාධාරණකම් වැළැක්වීම. | 1.1.1. ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව තක්සේරු කිරීමට මානව සම්පත් සංවර්ධන හා රැකියා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (NAHREP) සහ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය. | ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය / කම්කරු අමාත්‍යාංශය / කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | NHREP සමාලෝචනය.<br>ක්‍රියාකාරී සැලැස්ම නිර්මාණය කිරීම. |
| | | 1.1.2. ශ්‍රම බලකායට අයත් කාන්තාවන් වෙනස් කොට සැළකීමක් පෙන්නුම් කරන නීති සහ රෙගුලාසි ඉවත් කිරීම. | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | කෙටි / මධ්‍ය කාලීන | ශ්‍රම බලකායට අයත් කාන්තාවන් වෙනස් කොට සැළකීමක් පෙන්නුම් කරන නීති සහ රෙගුලාසි ගණනය කිරීම. |
| | | 1.1.3. ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යාමට සන්නද්ධ හමුදාවට සහ පොලිස් දෙපාර්තමේන්තුවට කාන්තා සේවක ප්‍රමාණයේ අවශ්‍යතාවට යටත්ව සන්නද්ධ හමුදාව සහ පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර සංශෝධනය කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය<br>නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය<br>ජාතික පොලිස් කොමිසම | කෙටි කාලීන | සමාලෝචනය අවසන් කිරීම.<br>සන්නද්ධ හමුදාව සහ පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම. |
| | | 1.1.4. කාන්තාවන් බඳවා ගැනීම් සහ උසස් කිරීම් කටයුතු වලදී සිදුවන සෘජු හා වක්‍ර අසාධාරණකම් භාවිතයෙන් තුරන් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා යෝජකයන් හට අදාළ සහ ප්‍රමාණවත් පුහුණුව ලබාදීම. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය /<br>ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය<br>ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය | මධ්‍ය කාලීන | සිදුකළ පුහුණුකිරීම් ප්‍රමාණය.<br>පෞද්ගලික අංශය සමග කළ උපදේශන ප්‍රමාණය. |
| | 1.2. ශ්‍රම බලකායේ කාන්තා නියෝජනය ඉහල දැමීම. | 1.2.1. රාජ්‍ය අංශයේ තීරණ ගැනීමේ තනතුරු සඳහා කාන්තා සංඛ්‍යාව ඉහළ නැංවීමට හිතකර ක්‍රියාමාර්ග ගැනීම. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | රාජ්‍ය අංශයේ තිරණ ගැනීමේ තනතුරු වල ඇති කාන්තාවන් ප්‍රතිශතයක් ලෙස. |
| | | 1.2.2. වාණිජ මණ්ඩලය සහ EFC අතරමැදි ආයතන ලෙස භාවිතා කරමින් පෞද්ගලික අංශයේ තීරණ ගැනීමේ තනතුරුවල සිටින කාන්තාවන් සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩි කිරීමට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට සාකච්ඡා පැවැත්වීම. | කම්කරු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය<br>ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය | මධ්‍ය කාලීන | පැවැත්වූ උපදේශන සංඛ්‍යාව.<br>ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.<br>පුද්ගලික අංශයේ කාන්තා සේවකයන්ගේ වැඩිවීමේ ප්‍රතිශතය පිළිබඳ සමූහනය නොකළ දත්ත රැස්කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.3. රැකියා ස්ථානයේ ලිංගික හිරිහැර වැළැක්වීම. | 1.3.1. ලිංගික අතවර ගැටළු සම්බන්ධ අභ්‍යන්තර දුක්ගැනවිලි හසුරුවාලීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාව සපුරාලීමට, විශේෂ අවධානයක් යොමු කරමින් නිර්මිත නව නීති පද්ධතියක්. | කම්කරු අමාත්‍යාංශය<br><br>අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන/මධ්‍ය කාලීන | පාර්ලිමේන්තුවේදී නීති පද්ධතිය අනුමත කිරීම. |
| | | 1.3.2. සියලු ආයතන සහන යාන්ත්‍රණයක් වශයෙන් CASH ප්‍රතිපත්තිය සකස් කිරීම සහ එයින් අවම වශයෙන් 50% කාන්තා නියෝජනයක් යුතුව මහාධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව සහිතව ගොඩ නැගීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | සහන යාන්ත්‍රණය සහිතව CASH ප්‍රතිපත්තිය ස්ථාපිත ආයතන ප්‍රතිශතයක් ලෙස. |
| | | 1.3.3. CASH ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි මානව සම්පත් සභිකයන්ට පුහුණු කරවීම් සිදු කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br><br>මුදල් අමාත්‍යාංශය | කෙටි කාලීන | අදාළ අමාත්‍යාංශයට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස. |
| | | 1.3.4. පැමිණිලි කමිටු, දුක් ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණ, දැනුවත් කිරීමේ සහ ආචාර ධර්ම පද්ධතියක් නිර්මාණය කිරීමට, කාර්මික ආරවුල් පනත (IDA) යටතේ පැමිණිලි නිරාකරණය සඳහා පැමිණ වීමේදී, හාම්පුතුන් ඒ සඳහා බැඳී සිටින බව තහවුරු කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>කම්කරු දෙපාර්තමේන්තුව<br><br>අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම.<br><br>පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන. |
| | | 1.3.5. එවැනි කමිටුවක් සිදු කරන ලද සොයාගැනීම්වලින් පසුව, ආයතන සංග්‍රහය යටතේ විනයානුකූල ක්‍රියාමර්ග ගැනීම හා අපරාධ පරීක්ෂණ සිදු කිරීමට පොලිසිය වෙත යොමුකිරීමට ඇති හැකියාව ඇති කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>කම්කරු දෙපාර්තමේන්තුව<br><br>අධිකරණ අමාත්‍යාංශය<br><br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | කෙටි කාලීන | ලිංගික හිරිහැරකිරීම් සම්බන්ධයෙන් පොලීසියට වෙත සිදු කළ යොමු කිරීම් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 1.3.6. ලිංගික අල්ලස් ලබාදීම ඇතුළත් වන ලෙස පනත සංශෝධනය කිරීම හා ලිංගික අල්ලස් භාරගැනීම හා පෙළඹවීම අල්ලස් හා දූෂණ ගණයට ඇතුළත්වන සේ අදාළ නීති සංශෝධනය. | ජනාධිපති ලේකම් කාර්යාලය | කෙටි කාලීන | අල්ලස් පනත සංශෝධනය. |
| | 1.4. රාත්‍රී වැඩමුර සඳහා දායක වන කාන්තාවන්ගේ ආරක්ෂාව. | 1.4.1. රාත්‍රී වැඩමුර අවසන් වී නිවසට යන කාන්තාවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට අවශ්‍ය පියවර ඇතුළත් කිරීමට කාන්තාවන් හා තරුණ පුද්ගලයින් සේවයේ නියුක්ත කරවීමේ පනතේ 2 ඒ වගන්තිය සංශෝධනය කිරීම. | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | අදාළ නීති සංශෝධනය. |
| | 1.5. කර්මාන්ත ශාලාවල කාර්යයන්හි නියුක්ත කරවීමට බලපාන කොන්දේසි. | 1.5.1. කර්මාන්තශාලා ආඥා පනත, විශේෂයෙන්ම ඊට අයත් සෞඛ්‍ය හා ආරක්ෂණය පිළිබඳව විධිවිධාන ඇතුළත් රෙගුලාසි දැඩි ලෙස බලාත්මක කිරීම. | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | ලැබුණු පැමිණිලි ප්‍රමාණය.<br><br>දඩ නියම කළ හා ක්‍රියාමාර්ග ගන්නා ලද කර්මාන්ත ශාලා ප්‍රතිශතය ලෙස. |
| | 1.6. ශ්‍රමිකයන් භාවිතය පිළිබඳ ඵලදායි පරීක්ෂණ. | 1.6.1. ආයෝජකයන්ට ලබාදෙන සහන, පරීක්ෂණ කටයුතුවලට බාධාවක් නොවෙන බවට ලෝක කම්කරු සංවිධාන ප්‍රඥප්ති 31 (1947 කම්කරු පරීක්ෂණ කටයුතු සම්බන්ධ සම්මුතිය) අනුව දැඩි අනුකූලතාවක් දැක්වීම. | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | අනුකූලතාවන් නොදැක් වූ තත්ත්වයන්ට ගත් ක්‍රියාමාර්ගයන් ප්‍රතිශතයක් ලෙස. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.7. දෙමාපිය නිවාඩු | 1.7.1. මාතෘ ප්‍රතිලාභ වැඩි කිරීමට හා පෞද්ගලික අංශයට පීතෘ නිවාඩු ඇතුළත් කිරීමට හැකි වන පරිදි, 1939 මාතෘ ප්‍රතිලාභ ආඥා පනත සහ 1954 සාප්පු සහ කාර්යාල (රැකියා සහ පාරිතෝෂික) පනත සංශෝධනය කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය<br>ලංකා සේව්‍යය සම්මේලනය | කෙටි / මධ්‍ය කාලීන | අදාළ පාර්ශ්වකරුවන් සමඟ කළ සාකච්ඡාවාර ගණන.<br>අදාළ නීති සංශෝධනය. |
| | | 1.7.2. රාජ්‍ය අංශයේ පීතෘ නිවාඩු වැඩි දියුණු කිරීමට මාතෘ ප්‍රතිලාභ ආඥා පනත / ආයතන සංග්‍රහය සංශෝධනය. | කම්කරු අමාත්‍යාංශය<br>ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන / මධ්‍ය කාලීන | අදාළ නීති සංශෝධනය.<br>පීතෘ නිවාඩු ලබාගත් පුද්ගලයින් ප්‍රතිශතයක් ලෙස. |
| | | 1.7.3. ළදරුවන්ට ශාරීරිකව දුබල සහ ආබාධිත තත්වයන් ඇති බවට රෝග නිශ්චය කළ අවස්ථාවන්හිදී, සම්පූර්ණ වැටුප් සහිත ව පීතෘ නිවාඩු දීර්ඝ කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය<br>ලංකා සේව්‍යය සම්මේලනය | මධ්‍ය කාලීන | දීර්ඝ නිවාඩු සහිත පුද්ගලයින් ප්‍රතිශතයක් ලෙස. |
| | | 1.7.4. හදාවඩාගත් දරුවන් සහිත දෙමව්පියන් සඳහා ප්‍රතිලාභ දීර්ඝ කිරීම හා එවැනි ප්‍රතිලාභ ලබා දීමට සේව්‍යයන් / සේවකයන්ට වැයවන වියදම පියවීමට අරමුදලක් පිහිටුවීම. | කම්කරු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | උපදේශන පැවැත්වූ වාර ගණන.<br>හදාවඩා ගත් දෙමව්පියන්ට ලබා දුන් ප්‍රතිලාභ ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.8. ගුණාත්මක දැරිය හැකි ළමා ආරක්ෂණ සේවා සඳහා පොදු ප්‍රවේශයක්. | 1.8.1. අංක 156 දරණ ILO සම්මුතිය අපරානුමත කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය සහ ඒ පිළිබඳ සළකා බැලීම (1981 පවුල් වගකීම් සහතික සේවක සම්මුතිය) | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | සමාලෝචනයක් කිරීම.<br>ILO සම්මුතිය වලංගු කිරීම. |
| | | 1.8.2. පවුලේ වගකීම් සහ රාජකාරීමය වගකීම් එක හා සමානව ඉටු කිරීමට දෙමාපියන්ට හැකි වන සේ ළමා රක්ෂක සේවා පහසුකම් ජාලයක් නිර්මාණය කිරීම හා සංවර්ධනය. | කම්කරු අමාත්‍යාංශය<br>ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | මධ්‍යම / දිගු කාලීන | ක්‍රියාකාරී සැලැස්මක් පිහිටුවීම.<br>පිහිටුවන ලද ළමාරක්ෂක පහසුකම් ප්‍රමාණය. |
| | | 1.8.3. සේවාස්ථානවල දිවා සුරැකුම් මධ්‍යස්ථාන අනිවාර්යයෙන්ම ඉදි කිරීම හා පවත්වාගෙන යාමට සහ මව්කිරි දීමට අනිවාර්ය විවේකය ලබාදීම සහතික කිරීම හැකි වන පරිදි මාතෘ ප්‍රතිලාභ ආඥා පනතේ 12 ඒ වගන්තියේ සඳහන් විධිවිධාන අනිවාර්යයෙන් ස්ථාපනය කිරීම. | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | ස්ථාපිත දිවා සුරැකුම් පහසුකම් ගණන.<br>මව්කිරි දීමට විවේකයන් ලබා ගැනීමට ඉඩදුන් කාන්තාවන් ගණන ප්‍රතිශතයක් ලෙස. |
| | | 1.8.4. සේවයේ නියුතු අවම කාන්තාවන් සංඛ්‍යාව අඩුකිරීම හරහා 12A වගන්තියේ උපයෝගීතාවය පුළුල් කිරීම. | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | නීති සංශෝධනය. |
| | 1.9. නිදහස් වෙළඳ කළාපය. | 1.9.1. නිදහස් වෙළඳ කළාප සේවකයන්ගේ ජීවන තත්ත්වයන්, නවාතැන් පහසුකම් (කාමරයේ විශාලත්වය, කාමරයක සිටින ප්‍රමාණය, සනීපාරක්ෂක පහසුකම් යනාදිය) වැඩිදියුණු කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) | කෙටි / මධ්‍ය කාලීන | සමාලෝචනයක් කිරීම.<br>ILO සම්මුතිය වලංගු කිරීම. |
| | 1.10. වැවිලි කර්මාන්ත අංශය. | 1.10.1. වතු ප්‍රජාවගේ සමාජ සංවර්ධනය සඳහා වූ ජාතික කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම. | කඳුරට, නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | කෙටි / මධ්‍ය කාලීන | උපදේශන පැවැත්වූ වාර ගණන. |
| | | 1.10.2. 1958 ලෝක කම්කරු සංවිධාන ප්‍රඥප්ති අංක 110 දරණ වතු සේවක සම්මුතියෙහි vi හා xii යන කොටස් සමාලෝචනය කොට අපරානුමත කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>කඳුරට, නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | කෙටි කාලීන | සමාලෝචනය සිදු කිරීම<br>ILO සම්මුතිය වලංගු කිරීම |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.11. පශ්චාත් - කාලීන රැකියා ප්‍රතිලාභ. | 1.11.1. විශ්‍රාම වැටුප් ගෙවීම්, EPF ලබාගැනීම, ETF, විශ්‍රාම පාරිතෝෂිතයද ඇතුළත්ව පශ්චාත් - කාලීන රැකියා ප්‍රතිලාභ ලබා දීම කඩිනම් කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | පශ්චාත් - කාලීන රැකියා ප්‍රතිලාභ ලබාදීමේ කාලය අවම කිරීම. |
| | | 1.11.2. වර්තමානය වන විට ආවරණය නොවන කණ්ඩායම් වෙත පශ්චාත් - කාලීන රැකියා ප්‍රතිලාභ ලබාදීමට ක්‍රියාවලියක් ආරම්භ කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br>ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය | මධ්‍යම කාලීන | කාර්යය ආරම්භ කිරීම.<br>කණ්ඩායම් හඳුනාගැනීම. |
| | | 1.11.3. හදිසි රැකියා අහිමි වීමක දී අවම වැටුප් ලබාගන්නන් සඳහා සමාජ සුභසාධන ප්‍රතිපත්ති හඳුන්වා දීම. | කම්කරු අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br>ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය | මධ්‍යම කාලීන | සමාජ සුභසාධන ක්‍රමයක් හඳුන්වාදීම. |
| | 1.12. ගෘහස්ථ සේවකයින් නියාමනය. | 1.12.1. අංක 189 දරණ ILO සම්මුතිය සමාලෝචනය කර සළකා බැලීම (2011 විදේශ කම්කරුවන්ගේ සම්මුතිය) | කම්කරු අමාත්‍යාංශය<br>සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | කෙටි කාලීන | සමාලෝචනයක් සිදු කිරීම.<br>ILO සම්මුතිය වලංගු කිරීම. |
| | | 1.12.2. කම්කරු අමාත්‍යාංශය විසින් සිදුකළ අධ්‍යයනයකට අනුව, IDA සංවිධානයට අයත් සේවකයන් ලෙස අර්ථ දක්වමින් සහ EPF සහ ETF හිමිකම සහිත, විධිමත් කොන්ත්‍රාත් පදනමක් මත දේශිය කම්කරුවන් නියාමනය කිරීම. | කම්කරු අමාත්‍යාංශය | දිගු කාලීන | අධ්‍යයනයන් සිදුකිරීම. |
| | | 1.12.3. කම්කරු අමාත්‍යාංශය විසින් සිදුකළ අධ්‍යයනයකට අනුව, ගෘහස්ථ සේවය සඳහා අවම ප්‍රමිතීන් නියම කිරීමට ප්‍රඥප්තියක් හඳුන්වා දීම. | කම්කරු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රඥප්තිය හඳුන්වාදීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.13. ගෘහස්ථ සේවකයන් සපයන පෞද්ගලික ආයතන නියාමනය. | 1.13.1. අංක 181 දරණ ILO සම්මුතිය සමාලෝචනය කර අපරානුමත කිරීම සළකා බැලීම (1997, පෞද්ගලික රැකියා නියෝජිත ආයතන සම්මුතිය) | කම්කරු අමාත්‍යාංශය | කෙටි කාලීන | සමාලෝචනයක් සිදු කිරීම.<br><br>ILO සම්මුතිය අපරානුමත කිරීම. |
| | | 1.13.2. කම්කරු අමාත්‍යාංශය විසින් සිදුකළ අධ්‍යයනයට අනුව, පෞද්ගලික නියෝජිත ආයතන ලියාපදිංචිය සහ රෙගුලාසි උල්ලංඝණය කරන ලද අවස්ථාවන්හිදී, ක්‍රමවත්ව / කලින් කලට බලපත්‍රය අධීක්ෂණයට ලක් කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය | කෙටි කාලීන | අධීක්ෂණ යාන්ත්‍රණයක් සහිතව ලියාපදිංචි වීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම. |
| | 1.14. වෘත්තිය සමිතිවල නීතිමය පිළිගැනීම ලිහිල්කරණය කිරීම. | 1.1.4.1. සාමූහිකව කේවල් කිරීමට, වෘත්තිය සමිති නීත්‍යානුකූලව පිළිගැනීමට ඇති 40% ක අවශ්‍යතාව CEACR නිරීක්ෂණ කටයුතුවලට අනුකූලව අඩු කිරීම. | කම්කරු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | උපදේශන පැවැත්වූ වාර ගණන.<br><br>නව අවශ්‍යතා හඳුන්වාදීම. |
| | 1.15. වැවිලි කර්මාන්ත අංශයේ වෘත්තිය සමිති පිහිටුවීමේ අයිතිය. | 1.1.5.1. අංක 110 දරණ ILO සම්මුතියෙහි X වන කොටස සහ 1958 වැවිලි කර්මාන්ත සේවක සම්මුතිය (ශ්‍රී ලංකාව අර්ධ වශයෙන් අනුමත කළ) සමාලෝචනය කර සළකා බැලීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>කඳුරට, නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය. | කෙටි කාලීන | සමාලෝචනයක් සිදු කිරීම.<br><br>ILO සම්මුතිය අනුමත කිරීම. |
| | 1.16. නීතිමය බාධා රහිතව වතු ප්‍රජාවට ප්‍රාදේශීය සභා මගින් සේවාවන් සැපයීම සහතික කිරීම. | 1.1.6.1. ඉහත යෝජනා සලකා බලමින් 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 33 සහ 19 වන වගන්ති සංශෝධනය. | පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | කැබිනට් මණ්ඩලය විසින් සංශෝධනය අනුමත කිරීම.<br><br>පාර්ලිමේන්තු යෝජනා ලබාදීමට පනත සංශෝධනය කිරීම. |
| | 1.17. වැඩ වර්ජන සිදු කිරීමේ අයිතීන් ශක්තිමත් කිරීම. | 1.17.1. වෘත්තිය සමිති විරෝධීන් වෙනස්කොට සැළකීම්වලට අදාළ නඩු අධිකරණය ඉදිරියට සෘජුව ඉදිරිපත් කරවීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | මධ්‍ය කාලීන | උසාවිවල ගොනු කළ නඩු ගණන. |
| | | 1.17.2. අසාධාරණ කම්කරු පිළිවෙත් සඳහා දැඩි දඩුවම් හඳුන්වාදීම තුළින් වෘත්තීය සමිති වලට වැඩ වර්ජන කිරීමේ අයිතියට බාධා නොවන ලෙස කටයුතු කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br><br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | මධ්‍ය කාලීන | අදාළ නීති, රෙගුලාසි හා ක්‍රියාකාරීත්වයන් සංශෝධනය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 1.18. EPZ හි වෘත්තිය සමිති ශක්තිමත් කිරීම. | 1.18.1. EPZ හි වෘත්තිය සමිති කළමනාකරණය සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මැදිහත් වීම් වැළැක්වීම. | කම්කරු අමාත්‍යාංශය<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | මධ්‍ය කාලීන | උපදේශන පැවැත්වූ වාර ගණන.<br>අත්සන් කළ ගිවිසුම් සංඛ්‍යාව. |
| 2. සමාජ ආරක්ෂාව සඳහා අයිතිය ප්‍රවර්ධනය. | 2.1. සමාජ ආරක්ෂණය ලබාදීම මගින් දුප්පත්කම තුරන් කිරීම සහ සියලු පුරවැසියන්ට ප්‍රමාණවත් ජීවන තත්ව තහවුරු කිරීම. | 2.1.1. විශේෂයෙන් ම ආබාධිත තත්ත්වයන්, මහලු වයස, මාතෘත්වය සහ අවිධිමත් අංශය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දැනට පවත්නා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයන්හි ප්‍රමාණවත් බව හඳුනාගැනීම සහ තක්සේරු කිරීම. | සමාජ සවිබලගැන්වීම් හා ශුභසාධන අමාත්‍යාංශය | කෙටි කාලීන | තක්සේරුව අවසන් කිරීම. |
| | | 2.1.2. තක්සේරු කිරීම මත පදනම්ව, ICESCR පිළිගත් සමාජ ආරක්ෂාව පිළිබඳ අයිතිය ප්‍රවර්ධනය කරන උපදේශක ක්‍රියාවලියක් හරහා සමාජ ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | | කෙටි කාලීන | ජාතික ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම. |
| | | 2.1.3. අවදානම් සහිත කාණ්ඩයන්ට අයත් යැයි හඳුනාගත් පුද්ගලයන් වෙනුවෙන් පුළුල් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ස්ථාපනය කිරීම. | | මධ්‍ය කාලීන | ක්‍රමවේද ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම. |
| | | 2.1.4. තිරසාර බව සඳහා යෝජනා ක්‍රම අධීක්ෂණය හා ඒ වෙනුවෙන් ඇගයුම් පියවර වර්ධනය කිරීම. | | මධ්‍ය කාලීන | නියාමන සහ ඇගයීම් ක්‍රම සංවර්ධනය. |
| | | 2.1.5. වර්තමානයේ දී, සමෘද්ධි හා දිවි නැගුම ප්‍රතිලාභ ලබා දීමේ දී පවතින අඩුපාඩු පිළිබඳ සළකා බැලීම. | | කෙටි කාලීන | සමාලෝචනයක් සිදු කිරීම. |
| | | 2.1.6. ඉහත යාන්ත්‍රණ කරා ළඟාවීමේ හැකියාව පුළුල් ව ගොඩනැගීමට අවශ්‍ය සුදුසුකම් ඇතුළත් නිර්ණායක සංශෝධනයන් ද සහිත ව වැඩිදියුණු කිරීම සඳහා පියවර නිර්දේශ කිරීම. | | කෙටි කාලීන | ක්‍රියාත්මක කළ නිර්දේශ ප්‍රතිශතයක් ලෙස. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 2.1.7. 2002 සුභසාධන ප්‍රතිලාභ පනතෙහි අන්තර්ගත ව්‍යාකුලතාවයන් සංශෝධනය කිරීම සහ වැඩසටහන් හරහා සාධාරණ සුභසාධන ප්‍රතිලාභ ලබාදීම තහවුරු කිරීම. | | කෙටි කාලීන | පනත සංශෝධනය. |
| | | 2.1.8. පවතින ක්‍රමවේදයන් පිළිබඳ ළඟා විය හැකි මාධ්‍ය තුළින් පුළුල් මාධ්‍ය ප්‍රචාරණයක් ලබා දීම සහ ප්‍රතිලාභීන්ට පවතින ක්‍රමවේදයන්ට ඉල්ලුම් කිරීමට සරල ක්‍රමවේද සැපයීම. | | මධ්‍ය කාලීන | පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන.<br><br>ක්‍රමවේද සමාලෝචනය. |
| | | 2.1.9. ශුභසාධනයේ සියලු අංශ පාලනය සඳහා ජාතික සමාජීය ශුභසාධන ප්‍රතිපත්තියක් භාවිත කිරීම. | | මධ්‍ය කාලීන | ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. |
| 3. සියලුම දෙනාට ප්‍රමාණවත් සහ පිරිසිදු ජලය සහ දියුණු සනීපාරක්ෂණ තත්ත්වයන් මෙන්ම තිරසර ජල කළමනාකරණය. | 3.1. සෑම ළමයෙකුටම, පුද්ගලයෙකුටම, නිවසකටම සහ ප්‍රජාවකටම ගෞරවනීය ජීවිතයකට සහ සෞඛ්‍ය, සනීපාරක්ෂාව සහ පෝෂණය ළඟා කර ගැනීම උදෙසා අත්‍යාවශ්‍ය වන්නා වූ ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන අයිතිය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ප්‍රතිපත්තිමය පිළිගැනීම හඳුනාගැනීම සහතික කිරීම. | 3.1.1. ජාත්‍යන්තර සම්මුතීන්හිදී පිළිගත් ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන අයිතිය සමාලෝචනය හා සලකා බැලීම. | පාර්ලිමේන්තුව (ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ නියාමන කමිටුව හරහා) | කෙටි කාලීන | නියාමන කමිටුව විසින් හඳුනාගත් ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන අයිතිය පිළිබඳ නිසි සකස්කරණය. |
| | | 3.1.2. ජලය හා සනීපාරක්ෂාව සඳහා වන අයිතිය ඇතුළත් කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සංශෝධනය කිරීම. | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන අයිතිය ඇතුළත් කිරීම. |
| | | 3.1.3. පුද්ගලික (පානීය) සහ ගෘහස්ථ භාවිතය සඳහා ජලය ලබා ගැනීමේ අවම ප්‍රමිති හඳුනාගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට සියලු ම ව්‍යවස්ථා, ප්‍රතිපත්ති සහ නියාමන විධිවිධාන ඒකාබද්ධ කිරීම. | ප්‍රාදේශීය සභා | කෙටි කාලීන | ජලය ලබා ගැනීම සඳහා වන අවම ප්‍රමිති පෙන්වාදීමට යෙදෙන සියලුම ව්‍යවස්ථා සහ ප්‍රතිපත්ති විධිවිධාන ඒකාබද්ධ කිරීම සඳහා මූලික වීම. |
| | | 3.1.4. අවදානම් සහිත පුද්ගලයින් සහ කණ්ඩායම් වෙත ලබාදෙන ප්‍රමුඛතාවයක් ලෙස, 'වැඩිදියුණු කළ සනීපාරක්ෂාව' සඳහා වන ප්‍රවේශයක් ඇති කරලනු පිණිස පැහැදිලි ප්‍රතිපත්ති ප්‍රකාශයක් සහ කාර්ය සැලැස්මක් සැකසීම. | සමාජ සේවා දෙපාර්තමේන්තුව<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | ජලය සහ සනීපාරක්ෂාව ක්‍රමික වර්ධනයක් සහිතව ලබා ගැනීම උදෙසා කාල රාමුවක් සහිතව ක්‍රියාවේ නැංවිය හැකි ප්‍රතිපත්තියක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 3.2. ජාතික සංඛ්‍යාලේඛනයන්ට අනුව පැහැදිලි ව පෙනෙන අයුරින් සැළකිය යුතු ලෙස ජලය සහ සනීපාරක්ෂාව අහිමි කලාප සහ කණ්ඩායම් සඳහා ජලය හා සනීපාරක්ෂාව සඳහා සම අයිතිය හඳුනා ගැනීමට දායක වීම. | 3.2.1. ග්‍රාමීය ප්‍රජා ජලසම්පාදන යටිතල පහසුකම් සහ (කුඩා පරිමාණයේ) ජල සේවාවන්ට සහයෝගය දැක්වීම සඳහා බලය ලත් පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය සම්පත් සහ ශක්‍යතාවන් ස්ථාපනය කිරීම. | මුදල් හා සැලසුම් දෙපාර්තමේන්තුව<br>මූල්‍ය කොමිසම<br>පළාත් සභා<br>ප්‍රාදේශිය සභා | මධ්‍ය කාලීන | පාර්ශවකරුවන්ගේ සුවිශේෂි ශක්‍යතා අවශ්‍යතාවන් ක්‍රමිකව ළඟා කර ගත හැකි සහ තිරසර ජල හා සනීපාරක්ෂාව ලබා ගැනීමට ක්‍රියාවේ නැංවිය හැකි සැලස්මක් සහ උපායමාර්ග මේ වන විට ක්‍රියාත්මක වේ. |
| | | 3.2.2. ජලය ලබා ගැනීමේ ක්‍රමවේද කළමණාකරණයට සහ භාවිතය මෙහෙයවීමට ප්‍රජාවන්ට සැළකිය යුතු මට්ටමේ වගකීමක් පවරමින් ග්‍රාමීය හා ජල සැපයුම් හා සනීපාරක්ෂක ප්‍රතිපත්තියෙහි ප්‍රායෝගික හා තිරසර භාවිතය සඳහා වූ ප්‍රතිපත්තිය නැවත අධ්‍යයනය කිරීම. | | මධ්‍ය කාලීන | ග්‍රාමීය හා ජල සැපයුම් සනීපාරක්ෂක ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම. |
| | | 3.2.3. ජලය හා සනීපාරක්ෂක සේවාවන් නිරීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීමට 'ඒකාබද්ධ ප්‍රවේශයක්' පිළිබඳ අර්ථ දැක්වීම. | | කෙටි කාලීන | නියාමන ක්‍රමවේද නැවත අධ්‍යයනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 3.3. අවදානම් සහිත බවට හඳුනාගත් කණ්ඩායම් / ප්‍රජාවන් වෙත ලබාදෙන ප්‍රමුඛතාවයක් ලෙස, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීමේ හැකියාව සහතික කිරීම. | 3.3.1. පාසල් ළමුන් වැනි මිනිස් කණ්ඩායම් වෙත ජලය හා සනීපාරක්ෂක අවශ්‍යතා සැපයීමට ක්‍රමික හා ස්ථාවර ක්‍රියාමාර්ග හඳුනාගැනීම. | පළාත් සභා, ප්‍රාදේශිය සභා පළාත් පාලන ආයතන (නගර සහ ග්‍රාමීය)<br><br>ආපදා වැළැක්වීම සහ අවම කිරීමට කටයුතු කරන ආයතන | කෙටි කාලීන | ශ්‍රී ලංකාවේ සියලුම පාසල්වල භාවිතා කළ හැකි පිරිසිදු වැසිකිළි තිබීම. |
| | | 3.3.2. විශේෂයෙන්ම නගර බද රැකියා කරන කාන්තාවන්ට සහ නගර බද අඩු ආදායම් ලාභී නිවාස සඳහා සනීපාරක්ෂාව හොඳින් නඩත්තු කරන ලබන පොදු වැසිකිළි පැවතීම. | | මධ්‍යකාලීන | කාන්තාවන්ට හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ප්‍රසිද්ධ ස්ථානවල සනීපාරක්ෂක සේවා ලබා ගැනීමට ඇති හැකියාව. |
| | | 3.3.3. ගෘහස්ථ මට්ටමින් පානීය ජල අවශ්‍යතා පැවතීම හා ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ නිසි අවධාණය යොමු කරමින්, අවම ගෘහස්ථ ජල පරිභෝජනයක් සඳහා භූගත ජලය භාවිතය සම්බන්ධයෙන් පවත්නා රෙගුලාසි අතර සමබරතාවයක් හඳුනා ගැනීම. | | මධ්‍යකාලීන | ආබාධිත / ආබාධිත නොවන පුද්ගලයන් වෙනුවෙන් වෙන් කරන ලද ආරක්ෂාකාරී කළමණාකරණයෙන් යුක්තව පවත්වා ගෙන යනු ලබන පානීය ජල සේවාවන් භාවිතා කරන ජනගහනය ප්‍රතිශතයක් ලෙස. (තිරසර සංවර්ධන අරමුණු යටතේ) |
| | | 3.3.4. නියගය සහ ආපදාවන් නිසා පීඩාවට පත් ප්‍රජාවන්ට නියමිත අවම පානීය ජල ප්‍රමාණයන් ලබා ගැනීමට ක්‍රමවේද හඳුනා ගැනීම. | | මධ්‍යකාලීන | කාර්ය සැලැස්ම ක්‍රියාත්මක වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 4. ප්‍රජාවට ආරක්ෂිත, ස්ථිර සහ ප්‍රමාණවත් නිවාස ලබා ගැනීමට පවත්නා හැකියාව සහ දැනුවත් කර / එකඟතාවන්ට එළැඹ ජනාවාස ඉදි කිරීම. | 4.1. ප්‍රමාණවත් නිවාස සඳහා වූ අයිතියට ව්‍යවස්ථාමය වශයෙන් සාර්ථක පිළිගැනීමක් ලබාදීම. | 4.1.1. පදිංචිය, නේවාසික කටයුතු හා ජීවන වෘත්තීන් සඳහා භාවිතා කරන ඉඩම් තුළින් නීති විරෝධී ලෙස සිදු කෙරෙන ඉවත් කිරීම්වලින් නිදහස් වීමට ඇති අයිතිය පිළිබඳව, නිවාසලාභීත්වය සඳහා වන අයිතිය යන විෂයපථය තුළ කරුණු සමාලෝචනය කිරීම. | පාර්ලිමේන්තුව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුව මගින්) | කෙටි කාලීන | මෙහෙයුම් කමිටුව විසින් හඳුනාගත් නිවාසලාභීත්වය සඳහා වන අයිතිය පිළිබඳ සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීම. |
| | | 4.1.2. අවම රාජ්‍ය වගකීම් පැහැදිලිව ප්‍රකාශිත සමානුපාතික ජාතික නිවාස ප්‍රතිපත්තියක් සකස් කිරීම. | නිවාස අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br><br>මානව හිමිකම් කොමිසම<br><br>සිවිල් සමාජය<br><br>ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව<br><br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | මධ්‍ය කාලීන | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් වෙනුවෙන් වූ නිවාස පහසුකම් ද ඇතුළුව නිවාස පහසුකම් ලබාදීම සඳහා වන අවම ප්‍රමිති සකස් කිරීම. |
| | | 4.1.3. ප්‍රතිපත්තිය මත පදනම්ව, වන නිවාසලාභීත්වය සඳහා වන අයිතිය ක්‍රමිකව සාක්ෂාත් කිරීම සඳහා පරිපූරක උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | නිවාස අමාත්‍යාංශය<br><br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br><br>සිවිල් සමාජය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | උපාය මාර්ගයක් සහ කාර්ය සැලැස්මක් සකස් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.1.4. ICESCR පොදු ප්‍රකාශ අංක 4 ට අවධානය යොමු කරමින්, අනෙකුත් කරුණු පිළිබඳවද සළකා බලමින් රාජ්‍ය හා රජයේ හවුල්කරුවන් විසින් නිවාස ප්‍රතිසංස්කරණය සඳහා අවම ප්‍රමිතියක් (ප්‍රමිතීන්) ද ඇතුළුව නිවාස ප්‍රතිනිර්මාණය කිරීමට උපදේශනාත්මක ක්‍රියාවලියකට දායක වීම. | ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව<br>නිවාස අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>සිවිල් සමාජ<br>මාර්ග සංවර්ධන අධිකාරිය (UDA) | කෙටි / මධ්‍ය කාලීන | උපදේශන පැවැත්වූ වාර ගණන. |
| | | 4.1.5. පැහැදිලිවම පෙනෙන නිවාස පරතරය මෙන්ම, වැඩිදියුණු කිරීම සහ ප්‍රතිනිර්මාණය කිරීම අවශ්‍ය නිවාස ප්‍රමාණාත්මකව හඳුනා ගැනීම සඳහා සිතියම් ගත කිරීමේ ක්‍රමවේදයක නිරතවීම. | | කෙටි / මධ්‍ය කාලීන | විවිධ නිවාස වර්ග සඳහා සිතියම් ගත කිරීමේ ක්‍රමවේදයක් නිශ්චය කර ඇත. |
| | | 4.1.6. පැහැදිලිවම පෙනෙන නිවාස අවශ්‍යතා සපුරාලීමට නවතම නිවාස ප්‍රතිසංස්කරණ ආකෘති, අඩු වියදම් අමුද්‍රව්‍ය සහ තාක්ෂණික ක්‍රම, හා අඩු පොළී මූල්‍ය ක්‍රමවේද හඳුනා ගැනීම. | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය<br>REPPIA<br>ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>දේශීය රාජ්‍ය නොවන සංවිධාන (ක්ෂේත්‍ර ප්‍රවීණයින්ද සමඟ) | කෙටි කාලීන | ආබාධ සහිත පුද්ගලයන්ටද ඇතුළුව අඩු වියදම් නිවාස වැඩිදියුණු කිරීම සහ අළුත් වැඩියා කිරීමට ක්‍රමවේදයකට මුල් වී එය ක්‍රියාත්මක කිරීමට සාකච්ඡා කිරීම. |
| | | 4.1.7. ජාත්‍යන්තර නිවාස ප්‍රතිපත්ති හා ගැටුම් නිසා අනතුරට ලක්වූ නිවාස ප්‍රතිස්ථාපනය සදහා ජාතික නිවාස ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයක් ලෙස දේපළ ප්‍රතිස්ථාපනය වෙනුවෙන් ජාතික නිවාස හා ඉඩම් ප්‍රතිස්ථාපන ප්‍රතිපත්තියක් පිහිටුවීම. | | මධ්‍ය කාලීන | පැහැදිලි මිනුම් දඬු සහිතව ජාතික නිවාස වන්දි ප්‍රතිපත්තිය සකස් කිරීම. |
| | | 4.1.8. රාජ්‍ය ආයතන සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි සියලුම රාජ්‍ය නොවන ආයතන ශක්තිමත් කර සේවයේ යෙදවීම. | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ශක්‍යතා වර්ධනය සහ ක්‍රියාත්මකකරණය සඳහා වන ක්‍රියාමාර්ගයක් හඳුනාගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 4.2. වාසස්ථාන හා නේවාසික කටයුතු සඳහා යොදා ගන්නා ඉඩම්වලින් බලහත්කාරයෙන් පිටමන් කිරීම වැළැක්වීම සඳහා ආරක්ෂිත ක්‍රියාමාර්ග සහ රෙගුලාසි පිහිටුවීම. | 4.2.1. (රාජ්‍ය) ඉඩම් අවුරුදු 20 කට වඩා භාවිත කර ඇති අවස්ථාවන්හිදී, එම ඉඩම් ආපසු ලබාගැනීම සඳහා වූ වඩාත් සාකච්ඡාමය ක්‍රියාවලියක් සඳහා 1979 අංක 7 දරණ (භුක්තිය නැවත ලබා ගැනීම) ඉඩම් පනතෙහි විධිවිධාන සහ 'නීත්‍යානුකූල නොවන භුක්තිය' යන්න අර්ථ දැක්විම පිළිබඳ නැවත සළකා බලා සංශෝධනය කිරීම. | නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව<br>ඉඩම් අමාත්‍යාංශය<br>සිවිල් සමාජය<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කෙටි කාලීන | 1950 අත්පත් කර ගැනිමේ පනත සමාලෝචනය කිරීම හා NIRPP සමඟ එහි සුසංයෝජනයට මූලික වීම. |
| | | 4.2.2. නැවත ඉඩම් අත්පත් කර ගැනීම හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ආශ්‍රිත වන්දි ප්‍රදානය වඩාත් සාධාරණ ක්‍රමවේදයක් වෙනුවෙන් වූ පුද්ගලයින් නිරුත්සාහකව නැවත පදිංචි කරවීමේ ප්‍රතිපත්තියෙහි අන්තර්ගත නිරුත්සාහක අනුමැතිය නමැති සංකල්පය අනිවාර්යයෙන්ම අනුගමනය කිරීම. | | කෙටි කාලීන | උපායමාර්ග භාවිතය. |
| | 4.3. නිවාස හා ජීවනෝපාය කටයුතු සඳහා වන ඉඩම් සතු කර ගැනීම හා විසර්ජනය / අත්පත් කර ගැනීම වෙනුවෙන් බලාත්මක කෙරෙන ව්‍යවස්ථාදායකය සංශෝධනය කිරීම. | 4.3.1. පොදුවේ මහජන සුබසිද්ධිය වෙනුවෙන් නිශ්චිත නිර්දේශ මත පදනම්ව ඇති දිගු කාලීන ප්‍රදාන / කල්බදුවලට යටත් වූ, පුද්ගලික සහ රාජ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට, 1950 අත්පත් කර ගැනීමේ පනතෙහි අන්තර්ගත 'මහජන කටයුතු' යන සංකල්පය නැවත නිර්වචනය කිරීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>ඉඩම් අමාත්‍යාංශය<br>සිවිල් සමාජය<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කෙටි කාලීන | 1950 අත්පත් කර ගැනිමේ පනත සමාලෝචනය කිරීම හා NIRPP සමඟ එහි සුසංයෝජනයට මූලික වීම. |
| | | 4.3.2. NIRPP හි අපේක්ෂිත හා පෙන්වා ඇති 'සාකච්ඡා කිරීම සහ දැනුවත් කැමැත්ත' අවශ්‍ය කෙරෙන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සදහා ඉඩම් අත්පත් කර ගැනිමේදී වන්දි ගෙවීම සහ ඊට අදාළ ක්‍රියා පටිපාටිවෙනුවෙන් පවතින විධිවිධාන සංශෝධනය කිරීම. | | කෙටි කාලීන | යෝජනා ක්‍රමයක් සකස්කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 4.4. ප්‍රමුඛතාවක් ලෙස ඇතැම් කණ්ඩායම් / ප්‍රජාවන් සඳහා නිවාස ලබා ගැනීම සහ හිමිකාරත්වය සහතික කිරීම. | 4.4.1. වතු ප්‍රජාවගේ නිවාස හිමිකාරත්වය සහතික කිරීමට පියවර ගැනීම. | කඳුරට, නව ගම්මාන යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | කෙටි කාලීන | පියවර සකස් කිරීම.<br>නිකුත්කළ හිමිකම් සහතික ප්‍රතිශතයක් ලෙස. |
| 5. ආහාර සුරක්ෂිතතාව, වැඩි දියුණු කරන ලද පෝෂණය සහ තිරසර කෘෂිකර්මාන්ත ප්‍රවර්ධනය සහතික කිරීම. | 5.1. සැමට සුරක්ෂිත ආහාර ලබාගැනීම සහතික කිරීම. | 5.1.1. ගොවියාගේ සිට පාරිභෝගිකයා (ගොවිපලෙන් ගැරුප්පු ක්‍රමවේදය) දක්වා යන ආහාර ගලනය පාලනය කරන සමගාමී ආයතනයන්හි පවත්නා දුර්වලතාවන් හඳුනා ගැනීම. | කෘෂිකර්ම අමාත්‍යාංශය<br>ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br>කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය<br>සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පරතර හඳුනා ගැනීම. |
| | | 5.1.2. ශ්‍රී ලංකාවේ ඇති ආහාර (දේශීය හා ආනයනය කළ) පිළිබඳ නියාමන සහ පාලන ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම ශක්තිමත් කිරීම. | | දිගු කාලීන | නියාමනය හා ඇගයීම සංවර්ධනය. |
| | | 5.1.3. මව්කිරිදීම ප්‍රවර්ධනයට සහ ළදරුවන්ට, ළමුන්ට සහ ගර්භණී මව්වරුන්ට නුසුදුසු ආහාර ප්‍රවර්ධනයට එරෙහිව නීති ශක්තිමත් කිරීම. | | මධ්‍ය කාලීන | නීති පැනවීම. |
| 6. සැමට පොදු සෞඛ්‍ය සේවාවක් සහ සෞඛ්‍ය හා යහපැවැත්ම පිළිබඳ ඉහළම තත්ත්වයක්. | 6.1. සෞඛ්‍යය සඳහා වන අයිතිය පිළිබඳ ව්‍යවස්ථාපිත පිළිගැනීම සහතික කිරීම. | 6.1.1. ජාත්‍යන්තර සම්මුතීන්හී පිළිගත් සෞඛ්‍යය සඳහා වන අයිතිය සමාලෝචනය සහ සළකා බැලීම. | පාර්ලිමේන්තුව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුව මඟින්) | කෙටි කාලීන | නියාමන කමිටුව විසින් හඳුනාගත් සෞඛ්‍යය සඳහා වන අයිතිය පිළිබඳ උචිත ක්‍රමවේද සකස් කිරීම. |
| | | 6.1.2. සෞඛ්‍යය සඳහා වන අයිතිය ඇතුළත් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය සංශෝධනය කිරීම. | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් හා සම්බන්ධ පරිච්ඡේදයට සෞඛ්‍යය සඳහා වන අයිතිය ඇතුළත් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.2. උපතේ සිට ළදරු අවස්ථාවේ දී, ළමා, නව යොවුන් සහ වැඩිහිටි යන ජීවන චක්‍රය පුරාවටම එක හා සමානව සෞඛ්‍ය සේවාවන් ලබාදීම. | 6.2.1. ප්‍රතිශක්තිකරණය පිළිබඳ දීප ව්‍යාප්ත ආවරණයක් දියත් කිරීම. | NNSL හි සඳහන් සියලුම රේඛීය අමාත්‍යාංශ | මධ්‍ය කාලීන | අදාළ MOH දර්ශක.<br>දුප්පත්, වෙන් කොට සළකනු ලබන, සමාජයෙන් ඈත් කරනු ලැබූ පුද්ගලයින්, ස්ත්‍රී - පුරුෂ භාවය (ස්ත්‍රී, පුරුෂ සහ අනෙකුත්), විවාහක, අවිවාහක බව, එකට විසීම, දික්කසාද, වැන්දඹු යනා දී විවිධ සෞඛ්‍ය සේවා සංරචකයන්ට අදාළව සේවා සැපයීම හා ලබා ගැනීම ආශ්‍රිත විශ්වාසවන්ත ක්‍රමවේද හරහා දත්ත සමූහනය කිරීම. |
| | | 6.2.2. වැළැක්විය හැකි මාතෘ මරණ තුරන් කිරීම. | | | |
| | | 6.2.3. නව යොවුන් සහ පුරුෂයන් වෙත විශේෂ අවධානයක් යොමු කරමින් බෝ - නොවන රෝග සඳහා වූ සේවා පුළුල් කර ශක්තිමත් කිරීම. | | | |
| | | 6.2.4. කාන්තාවන්, ළමයින් හා අවදානම් සහිත කණ්ඩායම් අතුරින් මන්දපෝෂණය තුරන් කිරීම. | | | |
| | | 6.2.5. ප්‍රමාණවත් මාතෘ හා මුල් ළමාවිය පෝෂණය සහතික කිරීම. | | | |
| | | 6.2.6. ගැබිණි මව්වරුන්ට හා දරුවන් සඳහා වන ජාතික පෝෂණ වැඩසටහන ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම. | | | |
| | | 6.2.7. ශ්‍රී ලංකාවේ ළඳරු හා ළමා පෝෂණ ක්‍රමවේදය (2015-2020) වෙනුවෙන් වූ ජාතික උපායමාර්ගය ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම. | | | |
| | | 6.2.8. මෑත කාලීන පර්යේෂණ සාක්ෂි පදනම් කර (අවධානයට ගනිමින්) සෞඛ්‍ය නිලධාරීන් සඳහා සේවාස්ථ පුහුණු යාවත්කාලීන කිරීම හා ශක්තිමත් කිරීම. | | | |
| | | 6.2.9. නිරෝගීව වයස්ගත වීම සඳහා වැඩසටහන් ගොඩ නැගීම. (ජනතාව දැනුවත් කිරීම සහ තරුණ ජනතාවගේ ආකල්ප හැඩගැස්වීම) | | | |
| | | 6.2.10. වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා යහපත් පරිසරයක් ප්‍රවර්ධනය කිරීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 6.2.11. වෘද්ධ චිකිත්සක විශේෂඥයින් සමානුපාතිකව සේවයේ නියුක්ත කරවීම. | | | |
| | | 6.2.12. අදාළ පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණය ලබාදීමට උපායමාර්ගයක් නිර්මාණය කිරීම. | | | |
| | | 6.2.13. රෝහල්වල සිටින නව යෞවනයන්, අබාධ සහිත පුද්ගලයන්, මහලු සහ විශේෂ කණ්ඩායම් ඇතුළුව සියලු දෙනාට ප්‍රතිකාර ලබාදියහැකි පහසුකම් හා ප්‍රමිතීන් පහිටුවීම. | | | |
| | 6.3. සෞඛ්‍ය සේවාවන් හි විධිවිධාන ආශ්‍රිත ව පවත්නා භූගෝලීය, සමාජ - ආර්ථික ගැටළු අවම කිරීම. | 6.3.1. සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමේදී පවත්නා සමාජ - ආර්ථික ගැටළු අවම කර ගැනීමට සමානුපාතික සම්පත් බෙදීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි / දිගු කාලීන | සම්පත් සාධාරණව වෙන් කිරීම. |
| | 6.4. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළුව අවධානම් සහගත කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් සෞඛ්‍ය ප්‍රවේශය. | 6.4.1. සියලුම ශික්ෂණ, පළාත්, මහ රෝහල් සහ දිස්ත්‍රික් රෝහල්වල පුනරුත්ථාපනය කිරීමේ ඒකක ඇති කිරීමෙන් ආබාධිත පුද්ගලයන්හට ප්‍රමාණවත් පුනරුත්ථාපන සේවයන් ලබාදීම සහතික කිරීම. | | කෙටි / දිගු කාලීන | මුළු මූලික රෝහල් සංඛ්‍යාවෙන් 50% ක පුනරුත්ථාපන ඒකක හෝ දෙපාර්තමේන්තු ඇති කිරීම. |
| | | 6.4.2. පුනරුත්ථාපනය හා රැකබලාගැනීම පිළිබඳ සෞඛ්‍ය සේවකයන්ට පුහුණුව ලබාදීම. | | | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශ 50%ක ප්‍රජා පුනරුත්ථාපන කණ්ඩායම් සිටීම.<br>අවශ්‍ය පුනරුත්ථාපන සේවා ලබාගන්නා වි.අ.පු. ප්‍රතිශතය. |
| | | 6.4.3. රාජ්‍ය සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ කායික චිකිත්සකයන්, වෘත්තීය චිකිත්සකයින් කථන හා භාෂා චිකිත්සකයින්, විකලාංග චිකිත්සකයින්, ශරීරාබාධ ප්‍රකෘත්තිමත් කිරීමේ චිකිත්සකයින් යන අයගේ සේවක සංඛ්‍යාවන්ගේ අඩුලුහුඩුකම් හඳුනාගැනීම. | | | පුනරුත්ථාපන වෘත්තිකයන්ගේ (කායික චිකිත්සකයන්, වෘත්තීය චිකිත්සකයන්, කථන හා භාෂා චිකිත්සකයින්, විකලාංග චිකිත්සකයින් හා ශරීරාබාධ ප්‍රකෘත්තිමත් කිරීමේ චිකිත්සකයින්) සේවක සංඛ්‍යා පුරප්පාඩු 50% කින් අඩුකිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.5. පෝෂණය, විනෝදාත්මක ක්‍රියා සහ කායික සහ මානසික යහපැවැත්ම ඇතුළුව නිරෝගී සංවර්ධනය සහතික කිරීම. | 6.5.1. නව ප්‍රසූති, ළදරු හා ළමා මරණ අඩු කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය / දිගු කාලීන | අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී දර්ශක. |
| | | 6.5.2. අධ්‍යාපන ආයතන වල තරුණ ප්‍රජාවගේ සෞඛ්‍යය පිළිබඳ ප්‍රතිපත්ති සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම. | | | විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මරණ දර්ශකය 5 ට අඩුවෙන් පවත්වා ගැනීම.<br>ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කාර්ය සැලැස්ම සංවර්ධනය |
| | | 6.5.3. විෂය මාලාවේ පුරවැසි සහ ජීවන කුසලතා අධ්‍යාපන වැඩසටහන් හරහා පුරවැසියකුගේ කායික හා මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ආමන්ත්‍රණය කිරීම. | | | විෂය මාලා සංශෝධනය |
| | | 6.5.4. විශේෂ අවශ්‍යතා සහිත ළදරුවන්ගේ හා ළමයින්ගේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය රැකවරණය සහ උත්තේජන ලබා දීමට පියවර ගැනීම. | | | MCH වැඩසටහන්වලට ආබාධිත තත්ත්වයේ පසුවන දරුවන්ගේ ප්‍රතිශතය ඇතුළත් කිරීම. |
| | 6.6. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සහ ප්‍රජනන අයිතිවාසිකම් වෙනුවෙන් විශ්වීය ප්‍රවේශයක් සහතික කිරීම. | 6.6.1. රෙගුලාසි සහ භාවිතයන් හරහා නව යොවුන් දරුවන් වෙනුවෙන් දියත් කෙරෙන උපාය මාර්ග, තරුණ පුද්ගලයින්ගේ සෞඛ්‍යය පිළිබඳ ප්‍රතිපත්තිය සහ මාතෘ හා ළමා සෞඛ්‍යය පිළිබඳ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>ජාතික ප්‍රතිපත්ති සහා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | අදාළ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.<br>පවත්වන ලද වැඩසටහන් ගණන.<br>විෂයාමාලා සංශෝධනය.<br>පවත්වන ලද වැඩසටහන් ගණන. |
| | | 6.6.2. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හරහා තරුණ සහ වැඩිහිටියන් සඳහා සුදුසු ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ තොරතුරු සහ සේවාවන් සැපයීම සඳහා වැඩසටහන් ආරම්භ කිරීම. | | මධ්‍ය කාලීන | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 6.6.3. ප්‍රතිපත්ති මාර්ගදේශයන්ට අනුගත වෙමින් ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ වත්මන් විෂය මාලාව පුළුල් කරමින් ප්‍රමාණවත් ගුරු පුහුණු යාන්ත්‍රණ සහිතව ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ වත්මන් විෂය මාලාව සියලුම පාසල් හරහා ක්‍රියාත්මක කෙරෙන සම්පූර්ණ ලිංගිකත්වය පිළිබඳ විෂය මාලාවක දක්වා පුළුල් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | |
| | | 6.6.4. සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් හරහා, ව්‍යුහාත්මක හා පද්ධති ආශ්‍රිතව පවතින බාධා ඉවත් කිරීමට පියවර ගැනීම ඇතුළුව HIV ආසාධිත හෝ එසේ හැඟෙන තත්වය මත පදනම්ව, වෙනස්කිරීම්වලට ලක් කරවීම් තුරන් කිරීම. | | මධ්‍ය කාලීන | |
| | 6.7. මානසික සෞඛ්‍ය සේවා සහ ආරක්ෂාව ලබාදීමේ ප්‍රමිතීන් නගා සිටුවීම. | 6.7.1. මනෝ සෞඛ්‍යය පිළිබඳ පනත් කෙටුම්පත සමාලෝචනය කොට සම්මත කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සමාලෝචන පැවැත්වීම.<br>නීති සම්මත කිරීම. |
| | | 6.7.2. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයේ සහභාගීත්වයෙන් මානසික සෞඛ්‍ය සේවාව හා මනෝ සමාජීය සුභසාධනය වැඩිදියුණු කිරීමේ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා සහාය යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම. | | | යාන්ත්‍රණ යොදා ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.8. රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සේවා සපයන්නන් ආවරණය වන පරිදි රටේ සෑම ප්‍රදේශයකම රෝගින්ගේ අයිතින් ආරක්ෂා කිරීමට යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම. | 6.8.1. පාර්ශවකරුවන් සමග සාකච්ඡා කොට පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සහිතව රෝගින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය විධිවිධාන සම්මත කර ගැනීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>පුද්ගලික අංශය<br>රාජ්‍ය නොවන සංවිධාන | දිගු කාලීන | ප්‍රඥප්තිය භාවිතය. |
| | | 6.8.2. එක් එක් සෞඛ්‍ය පහසුකම් ස්ථරයන්ට අදාළ ව සේවා සැපයීම් / පැමිණිලි / ප්‍රති පෝෂණය යන කරුණු සම්බන්ධයෙන් සේවාලාභීන්ට ප්‍රතිචාර ලබාගැනීම සඳහා විධිවිධාන සැකසීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය | කෙටි කාලීන | යාන්ත්‍රණ යොදා ගැනීම.<br>ලද පැමිණිලි ප්‍රතිශතයක් ලෙස.<br>ගනු ලැබූ පියවර ප්‍රතිශතයක් ලෙස. |
| | 6.9. ආරක්ෂිත සහ යහපත් පරිසරයක් භුක්තිවිඳීමට පුරවැසියන්ට ඇති අයිතිය සහතික කිරීම. | 6.9.1. සායනික සහ වෙනත් අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීම හා පිරිසිදු කිරීම සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>පළාත් පාලන ආයතන<br>කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | ඊට අදාළ සෞඛ්‍ය අමාත්‍යංශ දර්ශක.<br>වැඩසටහනක් යොදා ගැනීම. |
| | | 6.9.2. සෞඛ්‍ය සේවා පහසුකම් තුළ පිරිසිදු පරිසරයක පැවැත්ම ශක්තිමත් කිරිම. | | මධ්‍ය කාලීන | |
| | | 6.9.3. අවශ්‍ය ව්‍යුහාත්මක හා මෙහෙයුම් වෙනස්කිරීම් සැපයීම හරහා මහජන සෞඛ්‍ය පහසුකම් සියලු දෙනාට ලබා ගැනීමට ඇති හැකියාව සහතික කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>පළාත් පාලන ආයතන<br>කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රවේශය හා සම්බන්ධ විගණන වාර්තාවන්ට අනුව ලබාගත හැකි මහජන සෞඛ්‍ය පහසුකම් ප්‍රතිශතයක් ලෙස.<br>අදාළ දර්ශක. |
| | | 6.9.4. නිෂ්පාදනය, අලෙවිය, සකස් කිරීම, හා විකිණීම, සම්බන්ධයෙන් ආහාර සුරක්ෂණ ප්‍රමිතින් තහවුරු කිරීම. | | කෙටි කාලීන | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 6.10. දැනට පවතින ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම සහතික කිරීම. | 6.10.1. නව යොවුන් සෞඛ්‍යය පිළිබඳ ජාතික ක්‍රමෝපායික සැලැස්ම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>පළාත් සෞඛ්‍ය, තරුණ සහ අධ්‍යාපන අමාත්‍යාංශ ඇතුළුව පළාත් සභා | කෙටි/මධ්‍ය කාලීන | පවත්වන ලද උපදේශන ගණන.<br>සැලැස්ම ශක්තිමත් කිරීම. |
| | | 6.10.2. ජාතික තරුණ ප්‍රතිපත්තිය හා තරුණ පුද්ගලයින්ගේ සෞඛ්‍යය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පියවරගැනීම. | | | පියවර සකස් කිරීම. |
| | | 6.10.3. සෞඛ්‍යය සම්බන්ධයෙන් නව යොවුන් දරුවන් අතර ඇතිවන ප්‍රශ්න පිළිබඳව සිදුකළ ජාතික සංගණනය විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>කම්කරු අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය | | නිර්දේශ ක්‍රියාත්මක කිරීම. |
| | | 6.10.4. විශේෂයෙන්ම අවධානමට ලක්විය හැකි සහ වරප්‍රසාද නොලත් ජනගහනය සහ ග්‍රාමීය හා දුෂ්කර භූගෝලීය ප්‍රදේශ සඳහා වන ජාතික පෝෂණ ප්‍රතිපත්තිය ඵලදායිව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම. | | | දැනට පවතින කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම. |
| | 6.11. සියලු පුරවැසියන්ට සමාන සහ දැරිය හැකි සෞඛ්‍ය සේවා සැපයීම සඳහා වගවීම සහ විනිවිදභාවයේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම. | 6.11.1. ඖෂධවල ගුණාත්මක බව තහවුරු කිරීම. | සෞඛ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය/දිගු කාලීන | ප්‍රමිති සකස් කර ශක්තිමත් කිරීම. |
| | | 6.11.2. වෛද්‍ය සහ අනෙකුත් සෞඛ්‍ය වෘත්තිකයන් හා සම්බන්ධ රෙගුලාසි ශක්තිමත් කිරීම හා සංශෝධනය කිරීම. | | | රෙගුලාසි සංශෝධනය කිරීම. |
| | | 6.11.3. වෛද්‍ය අවප්‍රයෝග ආශ්‍රිත ව වගවීම සහ වැරදි සමාකරණයට වන්දි ගෙවීමේ ක්‍රම අහෝසි කිරීම. | | | පවත්වන ලද උපදේශන ගණන. |
| | | 6.11.4. වඩාත් ඵලදායි සෞඛ්‍ය සේවා සැපයුමකට රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයන් පිහිටුවීමේ ක්‍රම පිළිබඳ ගවේෂණය. | | | ගිවිසුම් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 7. සැමට පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක්. | 7.1. සැමට පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපන ප්‍රවේශයක් ලබා දීම. (සියලුම ළමුන් ඔවුන් ජීවත්වන ප්‍රදේශයේ ප්‍රාථමික පාසල්වලට ඇතුළත් කිරීම) | 7.1.1. ජාත්‍යන්තර සම්මුතීන්වලින් පිළිගත් පරිදි අධ්‍යාපනයේ අයිතිය සමාලෝචනය කිරීම හා සළකා බැලීම. | පාර්ලිමේන්තුව (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුව මගින්) | කෙටි කාලීන | නියාමන කමිටුව විසින් යොදා ගත් අධ්‍යාපන අයිතිය පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ග සකස් කිරීම. |
| | | 7.1.2. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ඇතුළත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික හිමිකම් පිළිබඳ පරිච්ඡේදය සංශෝධනය කිරීම. | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය ඇතුළත් කිරීම. |
| | | 7.1.3. වෙනස්කම්වලට ලක් වී ඇති කණ්ඩායම්ද ඇතුළත්ව සියලු දරුවන් ඔවුන්ගේ ප්‍රදේශ තුළ පාසල්වලට බදවා ගැනීම හා ඔවුන් නිතිපතා පාසල් යාම තහවුරු කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>PDE<br>පාසැල් | දිගු කාලීන | ආබාධිත තත්වයන්ද ඇතුළුව පාසල්වලට ළමුන් ඇතුළත් කරගැනීමේ අනුපාත |
| | | 7.1.4. නිවසේ සිට හෝ සාධාරණ ප්‍රවාහන පහසුකම් සහිත දුරක සිට සියලු ප්‍රදේශවලට සාධාරණ හා සංසන්දනාතමක ව ද්විතික අධ්‍යාපන විධිවිධාන ඇතිකිරීම. | | දිගු කාලීන | කාර්ය සැලැස්ම යොදා ගැනීම. |
| | 7.2. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කිරීම සහ සියලුම සිසුන්ට මූලික හා ද්විතීයික පාසල්වල ඉගෙනුම් ක්‍රියාවලියට සහභාගි වීමට ඇති හැකියාව සහතික කිරීම. | 7.2.1. මූලික ගුරු පුහුණු පැවැත්වීම හරහා ඇතුළත් කිරීම හා ළමා මිතුරු ඉගෙනීම් පිළිබඳ මූලධර්ම හඳුන්වාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>TED | දිගු කාලීන | සියලුම පාසල් තුළ යහපත් ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම. |
| | | 7.2.2. ක්‍රියාදාමය පුරා පන්ති මට්ටමින් පාසල් පාදක ඇගැයීම් සහ විසඳුම් ක්‍රියා භාවිතය. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>පාසැල් | දිගු කාලීන | සියලුම ගුරුවරුන් සඳහා පුහුණුව සහ අමුද්‍රව්‍ය සහිතව ඇගැයීමේ රාමුව ක්‍රියාත්මක කිරීම. |
| | | 7.2.3. ඉගෙනුම් දුර්වලතා හඳුනා ගනිමින් කෙරෙන ඉගැන්වීම, සහභාගීත්ව ක්‍රමවේද, ඵලදායී ඉගෙනුම් ඉගැන්වීම් සැලසුම් ඇතුළුව ආබාධ පරීක්ෂාකිරීම, විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට ඉගැන්වීමට කුසලතාව ලබාදීම සඳහා ගුරුවරුන්ට සේවාස්ථ පුහුණුවීම් ලබාදීම. | | දිගු කාලීන | විෂයමාලා යොදා ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 7.2.4. තත්ත්වය සහතික කිරීම සඳහා ස්වාධීන පාසල් පරීක්ෂණායතනයක් ස්ථාපිත කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>PDE | මධ්‍ය කාලීන | ඇගයීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම. |
| | | 7.2.5. ගුණාත්මක ඉගැන්වීමක් සහතික කිරීම සඳහා කලාප හා ප්‍රාදේශීය මට්ටමේ විදුහල්පතිවරුන් ඇතුළුව, අධ්‍යාපන නිලධාරීන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පුහුණු වැඩසටහන් ගණන.<br>ඉගෙනුම් දුෂ්කරතා සහිත ආබාධිත සිසුන් හඳුනා ගැනීමට ක්‍රමයක් ඇතුළත් කිරීම. |
| | | 7.2.6. ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා පළාත් මට්ටමෙන් අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | දිගු කාලීන | ස්වාධීන පාසල් පරීක්ෂණායතනයක්. |
| | | 7.2.7. ගුරු පුහුණුව සහ විෂය මාලාව සංවර්ධනය කිරීමට විකල්ප ක්‍රමවේද කරා ළඟා වීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>TVEC | දිගු කාලීන | හැකියා පූර්ණ අධ්‍යාපනික කාර්ය මණ්ඩලය.<br>නියාමන යාන්ත්‍රණය. |
| | | 7.2.8. දැනට පවතින අධ්‍යාපන ආයතනවල ශක්‍යතා වැඩි කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | යාන්ත්‍රණ ඇගයීම.<br>ඵලදායී අධ්‍යාපන ආයතන. |
| | | 7.2.9. ජාතික වෘත්තීය සුදුසුකම් යෝජනාවලියේ අවශ්‍යතා සපුරාලීම සඳහා, ශක්‍යතා සංවර්ධන, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |
| | 7.3. පාසල් හැරයාම තුරන් කිරීම තුළින් අධ්‍යාපනය තුළ සිසු සහභාගිත්වය වැඩි කිරීම. | 7.3.1. අ.පො.ස. (සා.පෙළ) අඩු සාධනීය මට්ටම් ලබාගත් අය ඇතුළුව සියලුම සිසුන්ට නම්‍යශීලී ඉගෙනුම් අවස්ථා ඇතුළත් ව අවුරුදු 13 ක අධ්‍යාපනය ලබාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>PDE | දිගු කාලීන | අ.පො.ස. (උසස් පෙළ) සිසුන්ගේ ප්‍රතිශතය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 7.3.2. ගුරුවරුන් හා විදුහල්පතිවරුන්, ළමුන්ගේ නොපැමිණීම නියාමනය හා දීර්ඝ කාලයක් නොපැමිණි සිසුන් ගැන අවධානය යොමු කිරීම. | පාසැල් | මධ්‍ය කාලීන | සිසුන්ගේ පැමිණීම. |
| | | 7.3.3. උසස් ලෙස දරිද්‍රතාවයෙන් පෙළෙන සිසුන් හඳුනා ගෙන 1 ශ්‍රේණියට ඇතුළත් වීමේදී ශිෂ්‍යාධාර ලබාදීම හා නිතිපතා පැමිණීම මත එම ගෙවීම් දිගටම ලබාදීම. | පාසැල් | මධ්‍ය කාලීන | සිසුන්ගේ පැමිණීම හා ශිෂ්‍යත්ව. |
| | | 7.3.4. පාසලෙන් පිටව සිටින සිසුන් නැවත විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයට යළි ඇතුළත් කිරීමට අවිධිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික අධ්‍යාපන ආයතනය<br>PDE | මධ්‍ය කාලීන | සිසුන් හා මධ්‍යස්ථාන ගණන.<br>ආබාධිත සිසුන් ඇතුළත් කිරීමට ප්‍රවේශ හා උපකරණ සහිත මධ්‍යස්ථාන ගණන. |
| | | 7.3.5. විධිමත් පද්ධතිය තුළට පාසලෙන් පිටව සිටින සිසුන් ඒකාබද්ධ කිරීමට ක්‍රියාමූලික තක්සේරුකරණයක් සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ ඔවුන්ගේ ජයග්‍රහණ සහතික කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>PDE | මධ්‍ය කාලීන | ඇගයීම් යාන්ත්‍රණ යොදා ගැනීම. |
| | | 7.3.6. කාර්යබද්ධ සාක්ෂරතාව සහ වෘත්තිය කුසලතා අත්පත් කර ගැනීමට, වයස ඉක්ම වූ පාසලෙන් පිටව සිටින සිසුන්ට පහසුකම් සැපයීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 7.4. සමාන තත්ත්වයන් සහ අවාසි මගහැරවීමට යෝග්‍ය සංවර්ධිත ක්‍රම සියලුම පාසල් වලට ලබාදීම. | 7.4.1. ග්‍රාමීය, කුඩා හා ඌණ සංවර්ධිත පාසල් සඳහා අතිරේක සම්පත්, අවශ්‍ය පරිදි ලබාදීම උදෙසා සම්පත් වෙන්කරන ලද යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>PDE | මධ්‍ය කාලීන | ග්‍රාමීය සහ ඌණ සංවර්ධිත පාසල්වලට අවශ්‍ය සම්පත් ලබාදීම. |
| | | 7.4.2. භෞතික සම්පත් සහ ගුරු සේවක සංඛ්‍යාව පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිශ්චිතව දක්වා ඇති සම්මතයන් ක්‍රියාවට නැංවීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>PDE | දිගු කාලීන | ඉහළ නැංවූ පහසුකම්. |
| | | 7.4.3. A/L විද්‍යාගාර, පරිගණක මධ්‍යස්ථාන, ප්‍රමාණවත් පුස්තකාල, වැඩපළ සහ නේවාසිකාගාරයක් සහිතව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම අවම වශයෙන් ද්විතියික පාසල් දෙකක් ලබාදීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. | | දිගු කාලීන | ක්‍රියාත්මක යෝජනා ක්‍රමය.<br>උසස් පෙළ විද්‍යාගාර ස්ථාපිත පාසැල් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 8. පූර්ණ සහ සමාන ගුණාත්මක භාවයන්ගෙන් යුක්ත අධ්‍යාපන අවස්ථා සහතික කිරීම සහ උසස් අධ්‍යාපන අවස්ථා ලබන්නන් සඳහා දීර්ඝ කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය. | 8.1 ආර්ථික සංවර්ධනය විශේෂයෙන් ඉලක්ක කරගත් උසස් අධ්‍යාපනික වැඩසටහන් වෙත බඳවා ගැනීම් වැඩි කිරීම. | 8.1.1. රාජ්‍ය විශ්වවිද්‍යාල සහ SLIATE සඳහා බඳවා ගැනීමේ අවස්ථා පුළුල් කිරීම. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටි/දිගු කාලීන | අදාළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දර්ශක. |
| | | 8.1.2. ජාත්‍යන්තර මට්ටමෙන් උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීම. | | | |
| | | 8.1.3. ජාතික අවශ්‍යතාව මත පදනම්ව විශ්ව විද්‍යාල විසින් යෝග්‍යයැයි හඳුනාගත් නව පීඨ / දෙපාර්තමේන්තු ස්ථාපිත කිරීමට සහයවීම. | | | |
| | | 8.1.4. උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය සහතික කිරීම. | | | |
| | | 8.1.5. විදේශීය විශ්වවිද්‍යාල සඳහා බඳවාගැනීම ප්‍රවර්ධනය කිරීම. | | | |
| | | 8.1.6. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වලට බඳවාගැනීම ප්‍රවර්ධනය කිරීම. | | | |
| | | 8.1.7. බහු හා අන්තර්ජාල විවෘත පාඨමාලා (MCOC) බිහි කිරීමට පෙළඹවීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 8.2. උසස් අධ්‍යාපන වැඩසටහන්වල අධ්‍යාපනිත ගුණාත්මකභාවය සහ ආර්ථික හා සමාජ වැදගත්කම වර්ධනය කිරීම. | 8.2.1. Ph.D සුදුසුකම් ලත් අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ අනුපාතය වැඩි කිරීම. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටි / දිගු කාලීන | අදාළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දර්ශක. |
| | | 8.2.2. සමාජ - මානසික කුසලතා ප්‍රවර්ධනය කිරීමත් සමග අධ්‍යාපනික ගුණාත්මකභාවය ඒකාබද්ධ කිරීමට ඉගැන්වීම් - ඉගෙනුම් හා ඇගයුම් ක්‍රම නවීකරණය. | | | |
| | | 8.2.3. නිවැරදි ඉඩම් සැලසුම්කරණ, ශාස්ත්‍රිය සහ සංස්කෘතික ප්‍රමුඛතා පිළිබිඹු කරමින් ඉදිකිරීම්, හා සාර්ථක ආපදා කළමණාකරණ පද්ධතියක් හරහා උසස් අධ්‍යාපන ආයතනයන්හි, භෞතික අධ්‍යාපනික පරිසරය වැඩි දියුණු කිරීම. | | | |
| | | 8.2.4. විශේෂයෙන්ම මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, වාණිජ හා කළමනාකරණ සහ ස්වාභාවික විද්‍යා විෂය හැදැරූ රැකියාවන්හි නියුක්ත කරවිය හැකි උපාධිධාරීන් බිහිකිරීම. | | | |
| | | 8.2.5. බාහිර උපාධි පාඨමාලාවන් හි ගුණාත්මක බව වැඩි කිරීම. | | | |
| | | 8.2.6. නිමැවුම් පදනම් හා ගුරු කේන්ද්‍රීය ක්‍රමවේදවල සිට ප්‍රතිඵල හා ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමයකට විශ්වවිද්‍යාල අධ්‍යාපනය වර්ධනය. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 9. සංස්කෘතින් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය. | 9.1. ප්‍රතිපත්ති, නීති අධ්‍යාපනය සහ ක්‍රියාකාරකම් හරහා ජාතික ඒකාග්‍රතාව ප්‍රවර්ධනය කරනු වස් සංස්කෘතික බහුත්වවාදයට වැඩි පිළිගැනීමක් සහතික කිරීම. | 9.1.1. ප්‍රධාන සාහිත්‍ය කෘති සිංහලෙන් දෙමළ භාෂාවට සහ දෙමළෙන් සිංහල භාෂාවට පරිවර්තනය කර පාසල් ළමුන් සහ තරුණයින් අතර ඒවා බෙදා හැරීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | සමාලෝචනය පැවැත්වීම.<br><br>පරිවර්තනය කළ පොත් ගණන. |
| | | 9.1.2. ප්‍රජාවන් අතර පොදු ධර්මතාවන් සහ අන්‍යෝන්‍ය අවබෝධය උද්දීපනය කරන චිත්‍රපට, රූපවාහිනී සහ වේදිකා නාට්‍ය නිෂ්පාදනය දිරිමත් කිරීම. | මූල්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | මධ්‍ය / දිගු කාලීන | සමාලෝචන පැවැත්වීම.<br><br>නිෂ්පාදන ගණන. |
| | | 9.1.3. පළාත් අතර සහ ජාතික මට්ටමින් ක්‍රීඩා තරග පැවැත්වීම. | ක්‍රීඩා අමාත්‍යාංශය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | සමාලෝචන පැවැත්වීම.<br><br>වාර්ෂික ව පවත්වන උත්සව ගණන. |
| | | 9.1.4. අන්තර් ආගමික සහ අන්තර් ප්‍රජා සභාවන්ගේ සහභාගිත්වයෙන් යුතු ව "ශ්‍රී ලාංකිකත්වය, අපගේ අනන්‍යතාව යි, විවිධත්වය අපගේ ශක්තිය යි" යන තේමාව යටතේ රටේ සෑම කොටසකම සහජීවන සමිති සමාගම් පිහිටුවා ඒවා පවත්වා ගෙන යාම. | ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | සමාලෝචන පැවැත්වීම. |
| | | 9.1.5. රාජ්‍ය උපදේශන ක්‍රියාවලියක් හරහා සංස්කෘතිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායමාර්ගය අවසන් කිරීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | ප්‍රතිපත්ති හා උපායමාර්ග සංවර්ධනය.<br><br>අදාළ පාර්ශවකරුවන් සමඟ උපදේශන වාර හඳුනා ගැනීම සහ පැවැත්වීම.<br><br>ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය තුළ ආබාධිත පුද්ගලයින් (විශේෂයින් බිහිරි පුද්ගලයින්) පිළිබඳ සැළකිල්ලට ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 9.1.6. කලා සහ සංස්කෘතික අගය කිරීම හා වැදගත්කම සම්බන්ධයෙන් අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම හා පැවැත්වීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි සිට දිගු කාලීන | සැලැස්ම යොදා ගැනීම.<br><br>කලාපය ආවරණය කෙරෙන පරිදි පවත්වන ලද වැඩසටහන් ගණන.<br><br>ඉලක්ක ගත පුද්ගලයින් ගණන.<br><br>ආබාධිත තත්ත්වයන් ඇතුළුව ඉලක්කගත පුද්ගලයින්ගේ ජනවිකාශ විස්තර. |
| | | 9.1.7. ජාතික ඒකාබද්ධතාවය සහ බහුජන අයිතිය පිළිබඳ හඳුනාගත් (විචාරාත්මක) ගැටලු ගැන අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දැනවුත් කිරීම හා සහතික කිරීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය | කෙටි සිට දිගු කාලීන | අන්තර් අමාත්‍යාංශ මට්ටමින් සිදුකළ උපදේශන ගණන. |
| | | 9.1.8. ආදි වාසීන්ගේ සංස්කෘතික භාවිතයන් පිළිබඳ අවධාරණය කරමින් ඔවුන්ගේ ප්‍රජාවන්හි දරුවන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම. | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ | කෙටිකාලීන | අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ ඇතුළත් නිර්දේශවල ප්‍රතිශතය.<br><br>පහසුකම් සැලසීම. |
| | 9.2. සංස්කෘතික විවිධත්වය හා විවිධ සංස්කෘතින්ට ගෞරවනීය සංවේදනය ප්‍රවර්ධනය කරන ප්‍රාථමික හා ද්විතියක අධ්‍යාපනය. | 9.2.1. සංස්කෘතික විවිධත්වය ගරු කරන ප්‍රාථමික හා ද්විතියක අධ්‍යාපන විෂය පාඨමාලා අන්තර්ගතයන්හි පැවැත්ම සහතික කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | විෂයමාලා සංශෝධනය. |
| | 9.3. ශ්‍රී ලංකා සමාජය තුළ රාජ්‍ය, මධ්‍යම හා පළාත් මට්ටමෙන් සංස්කෘතික විවිධත්වයට හා කලාපීය සංස්කෘතික විශේෂතාවන්ට ගරු කිරීම තහවුරු කිරීම. | 9.3.1. සමාජය තුළ සිදුවන සංස්කෘතික පිළිවෙත් සඳහා අන්‍යෝන්‍ය ගෞරවය සහ සාමූහිකත්වය තහවුරු කිරීම සඳහා පාසල්වල පවතින සංස්කෘතික වැඩසටහන් ශක්තිමත් කිරීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | කාර්ය සැලැස්ම යොදා ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 9.4. ආදිවාසීන්ට ඔවුන්ගේ සම්ප්‍රදායික දිවි පෙවෙත් හා සංස්කෘතින්ට අනුව ජීවිත පවත්වා ගෙන යාම හඳුනා ගනිමින් එම පුරුදුවලට ගරු කිරීම. | 9.4.1. අවශ්‍ය ප්‍රතිපත්ති, නීති සකස් කිරීම සඳහා ප්‍රමුඛතාවන් හඳුනා ගැනීමට ආදිවාසී ජනතාව සහ වැදි ජනතාවගේ පවත්නා අවශ්‍යතා / මැසිවිලි ඇතුළුව ආදිවාසි ජනතාව පිළිබඳ සමාජ ආර්ථික සංගනනයක් පැවැත්වීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>ජනාධිපති ලේකම් කාර්යාලය | කෙටි කාලීන / මධ්‍ය කාලීන | අවශ්‍ය ඇගයීම් තක්සේරු අවසන් කිරීම.<br>ප්‍රතිපත්ති හා නීති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. |
| | | 9.4.2. උපදේශන ක්‍රියාවලියක් තුළින් 2007 ආදිවාසි ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශය ඵලදායිව ක්‍රියාත්මක කිරීමට සළකා බැලීම හා පියවර ගැනීම. | | මධ්‍ය කාලීන | අදාළ පාර්ශවකරුවන් හඳුනාගැනීම.<br>අදාළ ප්‍රාදේශීය ආවරණ ගණන, දේශිය පුද්ගලයින්ගේ ඉලක්කගත ජනවිකාශ විස්තර සහිතව උපදේශන පැවැත්වීම. |
| | | 9.4.3. පවත්නා නීති, ප්‍රතිපත්තිහා ව්‍යවහාර සමාලෝචනය කිරීම සහ උපදේශන ක්‍රියාවලියක් තුළින් ආදිවාසි ජනතාව වෙනස්කොට සැළකීම වැලැක්වීමට අවශ්‍ය සංශෝධන කිරීමට පියවර ගැනීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>පාර්ලිමේන්තුව | කෙටි කාලීන | සමාලෝචනය අවසන් කිරීම.<br>සංශෝධනය සඳහා නිර්දේශ අවසන් කිරීම.<br>පාර්ශවකරුවන් සහ උපදේශන හඳුනාගැනීම අවසන් කිරීම.<br>අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති සංශෝධනය සඳහා අනුමැතිය ලබාගැනීම. |
| | | 9.4.4. වැදි ජනතාව (ප්‍රජාව) සතුන් සහ ශාක ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය පිළිබඳ පවත්නා නිති රීති සහ ප්‍රතිපත්ති සමඟ එකිනෙකට නොගැටෙමින් රැඳිසිටිය හැකි හෝ ආපසු යා හැකි භුගෝලීය ස්ථාන හඳුනා ගැනීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය<br>තිරසර සංවර්ධන සහ වනජීවි අමාත්‍යාංශය | කෙටි කාලීන | භුගෝලීය ස්ථාන හඳුනා ගැනීම.<br>හඳුනාගත් භුගෝලීය ස්ථාන තුළට ආපසු ගිය හෝ සිටීමට අවසන් දුන් ආදිවාසි ප්‍රතිශතයක් ලෙස. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 9.4.5. ආදි වාසි ජනතාවගේ අයිතීන් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් කරන අතරම වඳවී යාමේ අවධානමක් සහිත විශේෂයන් ආරක්ෂා කිරීම වැනි සාධාරණ සීමාවන් පැනවීම ගැනද දැනුවත් කිරීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය<br>තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය | කෙටි / මධ්‍ය කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |
| | | 9.4.6. ආදි වාසි ජනතාවගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂාව උදෙසා ඔවුන්ගේ සංස්කෘතිය, භාෂාව අයිතිවාසිකම් සහ අභිලාෂයන් පිළිබඳ, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ඇතුළුව අනෙකුත් අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | කෙටි සිට දිගු කාලීන | වැඩසටහන් සැලසුම් කිරීම.<br>කලාපීය ආවරණය සහිත ව පවත්වන ලද වැඩසටහන් ගණන.<br>ඉලක්කගත පුද්ගලයින් ගණන.<br>ඉලක්කගත පුද්ගලයින්ගේ ජන විකාශ විස්තර ගණන. |
| | | 9.4.7. ප්‍රමාණවත් අයවැය වෙන්කිරීම් සහිතව ආදිවාසි ජනතාවගේ අයිතීන් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණයට අවශ්‍ය ස්ථිර ආයතනයක් / දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කිරීම. | ජනාධිපති ලේකම් කාර්යාලය | මධ්‍ය කාලීන / දිගු කාලීන | ස්ථිර ආයතනයක් / දෙපාර්තමේන්තුවක් පිහිටුවීම. |
| | 9.5. පුද්ගලයින්ගේ භාෂාව සහ සංස්කෘතික උරුමයට අයිතිය ගරු කිරීම. | 9.5.1. සුළුතර ප්‍රජාවන් ඇතුළුව සියලු ප්‍රජාවන්ට තමන්ගේ භාෂාවක් පරිහරණය සහ ඔවුන්ගේ සංස්කෘතික උරුමයක් භුක්ති විඳීමට නිදහස තහවුරු කිරීම. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි කාලීන | සමාලෝචනය පැවැත්වීම. |
| | | 9.5.2. රජයේ සියලුම ස්ථරවලදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලතාවය සහතික කිරීම. | ජාතික සංහිඳියා, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | කෙටි කාලීන | අනුකූලතාව සහතික කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 9.5.3. භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය සම්බන්ධව ඵලදායි පිළියම් ලබාදීම. | පාර්ලිමේන්තුව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුව මගින්) | කෙටි කාලීන | නියාමන කමිටුව විසින් යොදා ගත් සුදුසු බණ්ඩය. |
| | | 9.5.4. පුද්ගලික ආයතන හා සංවිධාන අතර රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ගරු කිරීමට අනුබල දීම. | | | පවත්වන ලද සමාලෝචනය. |
| | | 9.5.5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඉංග්‍රීසි රාජ්‍ය භාෂාවක් ලෙස ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව සමාලෝචනය හා සලකා බැලීම. | ව්‍යවස්ථාදායක සභාව | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. |
| | | 9.5.6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඉංග්‍රීසි රාජ්‍ය භාෂාවක් ලෙස ප්‍රකාශ කිරීම. | | කෙටි කාලීන | |

# ළමා අයිතිවාසිකම්

## ළමා අයිතිවාසිකම්

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය 1991 ජූලි 12 වන දින සිට ශ්‍රී ලංකාව අපරානුමත කර ඇති අතර, පවත්නා සංදර්භය සහ රාජ්‍ය ව්‍යුහයන් තුළ ඇති බාධක මධ්‍යයේ ළමා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. ළමා අයිතිවාසිකම් ව්‍යුහය තුළ සාපේක්ෂ වටිනාකමකින් යුතු ළමා ආරක්ෂාව පිළිබඳ සංකල්පය මෙම කාලය තුළ වර්ධනය වී ඇත. 2014 දෙසැම්බර් මාසයේ දී, අමාත්‍ය මණ්ඩලය විසින් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත වැදගත් උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී. මෙහි සඳහන් අනෙකුත් කරුණු අතර, පවත්නා ප්‍රතිපත්ති ළමා ආරක්ෂාව සහතික කිරීමට ප්‍රමාණවත් නොවන බව, පවත්නා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ආයතන දුෂ්කරතාවන්ට මුහුණ දෙන බව, ළමා ආරක්ෂාව සහතික කිරීමට කටයුතු කරන සියලුම රාජ්‍ය ආයතන පොදු එකඟතාවයකට අනුව කටයුතු කළ යුතු බව, ඒකාබද්ධ යාන්ත්‍රණයක් මගින් ළමයින් රැක බලගැනීම, ආරක්ෂණය සහ පුනරුත්ථාපනය කිරීම සඳහා කටයුතු කළයුතු බව සඳහන් වේ. ඒ අනුව, ඒකාබද්ධ ක්‍රමවේදයක් පිළිබඳ පදනමක් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ළමා අයිතිවාසිකම් සඳහා මානව හිමිකම් පිළිබඳ ජාතික සැලැස්ම ළමුන් සඳහා පවත්නා සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිත කිරීමට තීරණයක් ගෙන ඇත. මෙම ප්‍රවේශය ඇගයීමට සුවිශේෂී තේමාවන් යටතට වැටෙන කරුණු සමහරක් ඇතුළත් කොට ඇත. ඒකාබද්ධ ක්‍රමවේදයක් නිර්මාණයට මඟ පාදන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ගොඩ නැංවීමට,  සියලුම පාර්ශ්වකරුවන් අතර අවංක එකඟතාවයක් ඇති කරවන පොදු සහ ඒකමතික ප්‍රවේශයක් පදනමක් කර ගත හැකිය

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. වැළැක්වීම, ආරක්ෂණය සහ සමෝධානික සේවාවන් ඇතුළත් අයිතිවාසිකම් මත පදනම් වූ ගුණාත්මක ළමා ආරක්ෂණ පද්ධතියක්. | 1.1. මේ වන විට රජය සහ එක්සත් ජාතීන් / ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් ළමා ආරක්ෂාව පිළිබඳ කාර්යය සඳහා දැනට යොදවා ඇති සම්පත් එක් විශේෂිත ක්‍රමයක් වෙත මාරු කිරීම සහ නැවත සංවිධානය කිරීම. | 1.1.1. මේ වන විට රජය සහ එක්සත් ජාතීන්/ ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් ළමා ආරක්ෂාව පිළිබඳ කාර්යය සඳහා දැනට යොදවා ඇති සම්පත් එක් විශේෂිත ක්‍රමයක් වෙත මාරු කිරීම සහ නැවත සංවිධානය කිරීම. | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br><br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br><br>පොලිස් දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br><br>සමාජ සේවා දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | රජය ළමා ආරක්ෂණය පිළිබඳ නීතිමය තත්ත්වය ජාතික විෂයයක් ලෙස පිළිගැනීම. |
| | | 1.1.2. ආපදා අවදානම් අවම කිරීම, වැළැක්වීම සහ ආරක්ෂණය යන කරුණු ඇතුළත් තේමාත්මක ව්‍යාපෘති පදනම් කරගත් ක්ෂේත්‍රයන් ත්‍රිත්වය තුළ අදාළ සියලුම පාර්ශ්වකරුවන් සමඟින් ළමා ආරක්ෂාව පිළිබඳ පොදු නිර්වචනයකට එකඟවීම. | | කෙටි කාලීන | ළමා ආරක්ෂාව වෙනුවෙන් ප්‍රධාන සහාය ලබාදෙන ආයතන මගින් පද්ධති ගොඩනැගීම සඳහා සම්පත් හඳුනා ගැනීම සහ වෙන් කිරීම. |
| | | 1.1.3. පාර්ශ්වකරුවන් විසින් සහාය ලබාදීම සහ ශක්තිමත් කිරීම සඳහා එකඟත්වය පළ කළ ප්‍රධාන ළමා ආරක්ෂක කාර්යයන් හඳුනාගැනීම. | | කෙටි කාලීන | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත ලියවිලි සහ බහු ශික්ෂණ පුහුණු සහාවන්හි සාමාජිකත්ව කටයුතු අවසන් කිරීම සහ දැනුම හුවමාරු කිරීම. |
| | | 1.1.4. අදාළ පාර්ශ්වකරුවන්ට සම අයිතිවාසිකම් සහිත බහු ශික්ෂණ පුහුණු සහාවක් හා දැනුම් හුවමාරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම. | | මධ්‍ය කාලීන | "ළමා ආරක්ෂණ ක්‍රමවේදය" සඳහා පැහැදිලි ශීර්ෂ පාඨයන් සහිතව අදාළ කාර්ය සැලසුම් සහ අයවැය. |
| | | 1.1.5. සම්බන්ධීකරණය කරන ලද තේමා මූලික කරගත් ව්‍යාපෘති, වාර්ෂික කාර්ය සැලසුම් සහ අයවැය සමඟින් වැළැක්වීම සහ ආරක්ෂාව සඳහා ඒකාබද්ධ කරන ලද බහු පාර්ශවීය උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම. | | මධ්‍ය කාලීන | අඛණ්ඩ නියාමනය සඳහා සමාලෝචන යාන්ත්‍රණ සහ කාර්යබද්ධ වැඩසටහන් හඳුනා ගැනීම. |
| | | 1.1.6. ළමා ආරක්ෂණය සඳහා වූ නීතිමය සහ පරිපාලනමය ව්‍යුහයන් සහ ජාතික ප්‍රතිපත්තියක් නියාමනය කර යාවත්කාලීන කිරීම. | | දිගු කාලීන | ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 2. වැළැක්වීම සඳහා ඵලදායී සහ ඒකාකාර ක්‍රියාපටිපා-ටියක් සංවර්ධනය කිරීම. | 2.1. ප්‍රජා මට්ටමින් වැළැක්වීම සඳහා සම්පත් යෙදවීම සහ ඒ පිළිබඳ ව යොමු කෙරෙන අවධානය වර්ධනය කිරීම. | 2.1.1. ප්‍රජා හැකියාවන් මැනීම සහ ප්‍රජා ප්‍රමුඛතාවය හඳුනාගැනීම සඳහා සහභාගිත්වය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>ජාතික ළමාරක්ෂක අධිකාරිය<br>පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>ළමා ලේකම් කාර්යාලය | මධ්‍ය කාලීන | ඇගයීම සඳහා වැඩපිළිවෙල සංවර්ධනය. |
| | | 2.1.2. VCDC සහ වෙනත් පවත්නා යාන්ත්‍රණ භාවිතා කරමින් සම්පත් ඒකරාශී කිරීම පිණිස ප්‍රජා මූල ව්‍යූහයන්ට සහය වීම. | පළාත් පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මධ්‍ය/දිගු කාලීන | ග්‍රාම නිලධාරී කොට්ඨාස තක්සේරු කිරීම. |
| | | 2.1.3. නිවාරණ අවස්ථා නියාමනය කිරීම හා අනුගමනය කිරීම. | ජාතික මට්ටමේ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මධ්‍ය/දිගු කාලීන | සම්පත් භාවිතය ප්‍රතිශත මට්ටමින් වැඩිවීම. |
| | | 2.1.4. නිවාරණ මැදිහත්වීම පිළිබඳ ලේඛනගත කිරීම. | ග්‍රාමසේවා නිලධාරීන්<br>පවුල් සෞඛ්‍ය සේවිකා<br>සමෘද්ධි නිලධාරීන් | මධ්‍ය/දිගු කාලීන | ප්‍රජා මූල ක්‍රමය තුළින් සහාය වූ වැළැක්වීමේ අවස්ථා ගණන. |
| | | 2.1.5. සමාජීය යාන්ත්‍රණය ක්‍රමානුකූල ප්‍රවේශයක් සඳහා යොදා ගැනීම හා සියලුම මට්ටමේ නිලධාරීන් සහ ප්‍රජාව පුහුණු කර නියාමනය කිරීම. | සමාජ සේවා<br>ප්‍රදේශීය නිලධාරීන් | මධ්‍ය/දිගු කාලීන | උපකාරක ක්‍රම හඳුනාගැනීම. |
| | | 2.1.6. නිවසේ වටපිටාව තුළ ළමුන් ආරක්ෂා කිරීම සඳහා හැකියාව ඇති කිරීමට ජෛව විද්‍යාත්මකව දෙමව්පියන් / තනි දෙමව්පියන් විස්තීරණ පවුල් / භාරකරුවන් වෙත සහයෝගය ලබාදීම. | ජාතික ළමාරක්ෂක අධිකාරිය | මධ්‍ය/දිගු කාලීන | සමාජගත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 2.1.7. ග්‍රාමීය ළමා සංවර්ධන කමිටු හරහා ප්‍රදේශීය, දිස්ත්‍රික් සහ පළාත් සභා කමිටුවලට වාර්තා කිරීම සහ යොමු කිරීම. | ජාතික ළමාරක්ෂක අධිකාරිය සහ අනෙක් පාර්ශ්වකරුවන් | මධ්‍ය / දිගු කාලීන | ස්ථාපිත කරන ලද කමිටු ගණන. |
| | | 2.1.8. වැළැක්වීමේ අවස්ථාවන් සඳහා සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ හඳුන්වාදීම. | | කෙටි කාලීන | මාර්ගෝපදේශ බෙදාහැරීම. |
| | | 2.1.9. සියලුම ප්‍රදේශීය ලේකම් කාර්යාල ආවරණය කරමින් ඉහත මාර්ගෝපදේශ පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ජාතික මට්ටමේ පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br><br>අනෙක් පාර්ශ්වකරුවන් | මධ්‍ය / දිගු කාලීන | වැළැක්වීමේ අවස්ථාවන් පිළිබඳ සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශ හඳුන්වාදීම.<br><br>පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන. |
| | | 2.1.10. උපද්‍රවයන්ට ලක්විය හැකි යැයි හඳුනාගත් කණ්ඩායම් සඳහා ආරක්ෂක සැලසුම් සකස් කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | හඳුනාගත් ළමුන් සංඛ්‍යාව. |
| 3. නීතිය හා සම්බන්ධ වෙමින් දරුවන් ආරක්ෂණයට නිශ්චිත ක්‍රමවේදයක් නිර්මාණය කිරීම. | 3.1. පොදු ආරක්ෂාව යටතට ගනු ලැබූ සියලුම ළමුන් සඳහා ලබාදෙන නෛතික ආරක්ෂාව ශක්තිමත් කිරීම. | 3.1.1. පොලීසිය, පරිවාස හා කම්කරු නිලධාරීන් විසින් දරුවෙකු මහෙස්ත්‍රාත් උසාවියකට ඉදිරිපත් කරන විට පවත්නා නීතිය යටතේ අනුගමනය කළ යුතු අවම සම්මත නීති හඳුන්වාදීම. | | මධ්‍ය / දිගු කාලීන | ළමුන්ගෙන් සහ ඔවුන් රැක බලාගන්නන්ගෙන් ලැබෙන ප්‍රතිචාර. |
| | 3.2. පුහුණු කාර්ය මණ්ඩලය සමගින් ළමුන් / ආයතන අධීක්ෂණය ශක්තිමත් කිරීම. | 3.2.1. පවත්නා නීති සම්මතයන්ට දක්වන අනුකූලතාව සමාලෝචනය කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | සේවා සපයන්නන්ගේ ප්‍රතිචාර. |
| | | 3.2.2. සියලුම නඩුවලදී පැය 24 ක් ඇතුළත අතුරු සමාජ විමසුම් හරහා පරිවාස නිලධාරීන්ගේ ප්‍රතිචාරය සහතික කිරීම. | | කෙටි / දිගු කාලීන | සේවා සපයන්නන් ප්‍රමුඛතාව දැක්විය යුතු සහ වර්ධනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගනී. |
| | | 3.2.3. ළමුන් ඇගයීම සහ වර්ගීකරණය කිරීම ශක්තිමත් කිරීම සඳහා පිළියම් සමාලෝචනය කිරීම සහ හඳුනා ගැනීම. | | මධ්‍ය / දිගු කාලීන | පරිවාස නිලධාරීන්ට හදිසි අවස්ථාවන්හිදී ඇමතීම සඳහා ක්ෂණික ඇමතුම් අංක භාවිතා කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 3.2.4. ළමුන් ඇගයීම සහ වර්ගීකරණය කිරීම ශක්තිමත් කිරීම සඳහා පිළියම් සමාලෝචනය කිරීම සහ හඳුනා ගැනීම. | | මධ්‍ය / දිගු කාලීන | කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා ආයතනික වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම. |
| | | 3.2.5. පොදු ආරක්ෂාව සඳහා ගනු ලැබූ ළමුන්ගේ අවශ්‍යතා හඳුනා ගෙන ඒ සඳහා පළමු සති දෙක තුළ ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | ළමා ආරක්ෂාව හා සම්බන්ධ ප්‍රමුඛ කාර්යයක් ලෙස ඇගයීම සහ වර්ගීකරණය යන ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම. |
| | | 3.2.6. අනාථ දරු නිවාස ආඥාපනතේ සහ පළාත් ව්‍යවස්ථාවන්හි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ ළමා නිවාස නියාමනය කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | ළමුන්ට පූර්ව ප්‍රතිචාර දැක්වීම සඳහා නියාමන පද්ධතියක් සකස් කිරීම. |
| | | 3.2.7. සෑම පළාතකම පවත්නා සියලුම ළමා නිවාස ලියාපදිංචිය සහතික කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | අධීක්ෂණය සහ ලියාපදිංචි කළ ළමා නිවාස ගණන. |
| | | 3.2.8. පසුගිය වසර තුන තුළ ආයතනික කාර්ය මණ්ඩල සේවකයන්ට ලබාදුන් පුහුණුව පිළිබඳ අවශ්‍යතා ඇගයීමක් සිදුකිරීම. | | කෙටි කාලීන | අවශ්‍ය තක්සේරු සිදුකිරීම. |
| | | 3.2.9. සත්කාර කරන්නන්ගේ වෘත්තීය මට්ටම තහවුරු කිරීමට සත්කාර කරන්නන් බඳවා ගැනීම, පුහුණු කිරීම, රැකබලා ගැනීම හා උපදේශන සේවා සඳහා නිශ්චිත ක්‍රමවේද අනුගමනය කිරීම. | | මධ්‍ය කාලීන | සමීක්ෂණ පැවැත්වීම. |
| | | 3.2.10. ජාතික ළමාරක්ෂක අධිකාරිය සහ වෘත්තිය පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධව ළමා සුරැකුම් ආයතනික කාර්ය මණ්ඩල සේවකයන්ට ජාතික වෘත්තීය සුදුසුකම් 4 වැනි මට්ටමේ ඩිප්ලෝමා පුහුණුවක් ලබාදීම. | | මධ්‍ය / දිගු කාලීන | පුහුණුකළ සේවක සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 3.2.11. ළමා සුභසාධනය හා පහසුකම් යනාදි ගණනය කළ හැකි දර්ශක ආශ්‍රිත ව තක්සේරුකරණයක් මත පදනම් වී සෑම වසර 3 කට වරක් ලියාපදිංචිය අලුත් කිරීම අත්‍යවශ්‍ය කිරීම. | | කෙටි/දිගු කාලීන | ගනු ලැබූ පියවර නැවත ලියාපදිංචි කළ ළමා නිවාස ගණන. |
| | | 3.2.12. පත් කිරීමේ කමිටු ක්‍රියාකාරීත්වය පිළිබඳ සමාලෝචනය කිරීම සහ විධිමත් රැස්වීම් සහ සෑම ළමා නිවාසයකම පුද්ගලික සත්කාර සැලසුම් ආශ්‍රිතව කාලීන සමාලෝචන පැවැත්වීම සහ ඒ වෙනුවෙන් අවශ්‍ය පිළියම් ක්‍රියාත්මක කිරීම. | | කෙටි කාලීන | සකස් කළ සත්කාර සැලසුම් ගණන. |
| | | 3.2.13. විකල්ප ආරක්ෂණය පිළිබඳ ව ප්‍රතිපත්තියක් සකස් කිරීම. | | | විකල්ප ආරක්ෂණ ස්ථානයන්හි රඳවා ඇති ළමුන් ගණන.<br><br>ප්‍රතිපත්තිය සකස් කිරීම. |
| | | 3.2.14. නීති විරෝධී ජාවාරම්කරණයේ නියුක්ත වූ ළමුන් හඳුනාගැනීම සහ පවුලට / සමාජයට නැවත සමාජගත කිරීම. | | මධ්‍ය/දිගු කාලීන | හඳුනාගත් සහ සමාජගත කළ ළමුන් ගණන. |
| | | 3.2.15. ළමා ආරක්ෂක ආයතනවලින් / ආරක්ෂාව හැර යන තරුණ ළමුන් සඳහා ඵලදායී සහය යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | සහය යාන්ත්‍රණ සංවර්ධනය. |
| | | 3.2.16. ළමුන් සමාජගත කිරීමේ දී මතුවන පරතර හඳුනා ගැනීමට සමීක්ෂණයක් පැවැත්වීම සහ ඒ වෙනුවෙන් පිළියම් ඇතුළත් ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීම. | | මධ්‍ය / දිගු කාලීන | සමීක්ෂණ පැවැත්වීම. |
| | | 3.2.17. ළමුන් ළමා නිවාසයන් හි සිට අධිකරණයන් වෙත සහ ආපසු ප්‍රවාහනය සඳහා වෙනම ප්‍රවාහන ක්‍රමයක් හඳුන්වාදීම. | | මධ්‍ය / දිගු කාලීන | සපයන ලද වාහන සංඛ්‍යාව.<br><br>වෙනම ප්‍රවාහන ක්‍රමයක් සඳහා සකස් කළ වැඩපිළිවෙල. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 4. ඕනෑම තත්වයක් යටතේ සහභාගි වීම සඳහා ළමයින්ට අයිතියක් ඇත. | 4.1. ශ්‍රී ලංකාවේ ළමුන්ගේ සහභාගිත්ව අයිතීන් ශක්තිමත් කිරීම. | 4.1.1. ළමා සහභාගිත්වය ක්‍රමවත් කිරීමේ වැදගත්කම පිළිබඳ රජයේ නිලධාරීන් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සහ ප්‍රජාව දැනුවත් කිරීම සහ අවබෝධ කරවීම. | පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | මධ්‍ය / දිගු කාලීන | ළමුන්ගේ සහභාගිත්වය සහිතව නිර්මිත ප්‍රතිපත්ති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ හා කාර්ය සැලසුම් ගණන.<br>ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ප්‍රමාණය. |
| | | 4.1.2. සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකම සහ දිවයින පුරා ළමා සමාජ පිහිටුවා ශක්තිමත් කිරීම සහ ඔවුන් ළමා සහභාගිත්වය පිළිබඳ අවම සම්මතයන් සපුරාලන බවට සහතික කිරීම. (ළමා සහභාගිත්ව මාර්ගෝපදේශ සළකන්න) | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ළමා සමාජ ප්‍රතිශතයක් ලෙස වැඩිවීම.<br>ළමා සහභාගිත්වය පිළිබඳ පිළිබඳ ව අවම ප්‍රමිතීන් සපුරාලන ළමා සමාජ සංඛ්‍යාව.<br>ළමා සහභාගිත්ව මාර්ගෝපදේශ ආශ්‍රිත ව පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන.<br>මාර්ගෝපදේශ.<br>ළමා සහභාගිත්වය පිළිබඳ අවම ප්‍රමිති සපුරාලන ළමා සමාජ සංඛ්‍යාව. |
| | | 4.1.3. ප්‍රාදේශිය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමේ ළමා මණ්ඩල ශක්තිමත් කිරීම සහ එම ළමා සමාජයන් ළමා සහභාගිත්වය පිළිබඳ අවම සම්මත සපුරාලන බවට සහතික කිරීම. | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ළමා සහභාගිත්වය පිළිබඳ අවම සම්මත සපුරාලන ළමා කවුන්සිල මඟින් මෙහෙයවන වැඩසටහන් වැඩිවීම ප්‍රතිශතයක් ලෙස.<br>පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන.<br>පුහුණු වැඩසටහන් තුළින් ලබාගත් දැනුම සහ කුසලතාවන්හි වැඩිවීම ප්‍රතිශතයක් ලෙස.<br>ළමුන් විසින් මෙහෙයවන වැඩසටහන්වල වැඩිවීම ප්‍රතිශතයක් ලෙස. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.1.4. ළමා සමාජ සහ මණ්ඩලයන්හි වැඩිහිටි පහසුකම් සපයන්නන්හට පුහුණුව, උපදේශනය සහ සහය ලබාදීම. | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ජාතික උපායමාර්ගයක් සංවර්ධනය කිරීම.<br>පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන. |
| | | 4.1.5. පක්ෂව කථා කිරීම, පර්යේෂණ, සම වයස් සහිත වූවන් එකිනෙකා වෙත දක්වන සහය යනාදි වශයෙන් වූ ළමුන් විසින් මෙහෙයවන වැඩසටහන් සඳහා ඉදිරිපත් වීමට ඔවුන් තුළ හැකියාව ඇති කිරීමට ළමා සමාජ සහ මණ්ඩල සවිබල ගැන්වීම. | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | NCC විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් ගණන. |
| | | 4.1.6. වෙනසක් නිර්මාණය කිරීමට සහ ඒ වෙනුවෙන් බලපෑම් කිරීමට ප්‍රධාන ප්‍රමුඛතාවන් මත ළමුන්ගේ සහභාගීත්වයෙන් යුක්තව ළමා සමාජ සහ සමාගම් ව්‍යුහයන් සඳහා ජාතික උපායමාර්ගයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම. | අනෙක් පාර්ශ්වකරුවන්<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය<br>පළාත් රාජ්‍ය සේවා කොමිසම<br>පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>තොරතුරු දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | විධිමත් යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම. |
| | | 4.1.7. ළමා සමාජ සහ සමාගම් හි සාමාජිකයින් සඳහා විධිමත් හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් ඉදිරිපත් කිරීම. | | මධ්‍ය කාලීන | ළමුන් ලබාගත් අවස්ථාවන් ගණන ප්‍රතිශතයක් ලෙස. |
| | | 4.1.8. මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය තුළින් ළමා සහභාගිත්වය පිළිබඳ මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | පවත්වන ලද මාධ්‍ය වැඩසටහන් ගණන.<br>වැඩසටහන් හරහා ළඟා වූ පුද්ගලයින් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 5. ළමයින්ට හිතකර අධ්‍යාපනික සැලසුම් - තත්ව සහතික ලද උපකාරක පන්තිද ඇතුළත්ව. | 5.1. සයිබර් අවකාශය ඇතුළුව මානසික හා කායික ප්‍රචණ්ඩත්වයන්ගෙන් තොර අධ්‍යාපන අවස්ථාවන් ලබාදීම. | 5.1.1. සිරිත් විරිත්, ආකල්ප සහ පුරුදු පිළිබඳ ගවේෂණය කිරීම හා විවෘත සාකච්ඡා පැවැත්වීම. | අධ්‍යාපන අමාත්‍යාංශය<br>ජාතික ළමාරක්ෂක අධිකාරිය<br>පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ළමුන්, දෙමව්පියන් සහ ගුරුවරුන් හරහා පසු විපරම. |
| | | 5.1.2. ළමුන්ගේ ඉගෙනුම් රටාවට සුදුසු ඉගැන්වීමේ රටා සංවර්ධනයට ගුරුවරුන්ට සහයවීම. | | | අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය පිළිබඳ ගුරුවරුන් හරහා පසු විපරම. |
| | | 5.1.3. පාසල් උපදේශන සහ සෞඛ්‍ය සේවා පහසුකම් වැඩි කිරීම. | | | පාසල් උපදේශනය සහ පාසල් සෞඛ්‍ය සේවා තුළ නිවැරදි භාවිතය මත පදනම් වූ ආදර්ශ සඳහා දර්ශක සංවර්ධනය. |
| | | 5.1.4. පාසල් කටයුතු සඳහා සහභාගිත්වය සහ ඇතුළත් වීම ප්‍රවර්ධන කිරීම සඳහා පාසල් මාධ්‍ය ඒකකය ශක්තිමත් කිරීම. | | | පාසල්වල නිවැරදි මාධ්‍ය භාවිතාව පිළිබඳ දත්ත ලේඛනගත කිරීම. |
| | 5.2. සමානාත්මතාව සහ සාධාරණත්වය වෙනුවෙන් ඇතුළත් කිරීම, රඳවාගැනීම සහ විනයානුකූල නෙරපීම පිළිබඳ පාසල් කටයුතු සමාලෝචනය. | 5.2.1. ගැටළුව විශ්ලේෂණය කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට ස්වාධීන කමිටුවක් පත්කිරීම. | | කෙටි කාලීන | අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු නිර්දේශ. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 6. සිරගත කළ මවුවරුන්ගේ ළමුන් ආරක්ෂණය. | 6.1. අදාළ ළමුන්ගේ අවශ්‍යතා පිළිබඳ බහු විනයානුකූල ඇගයීම් සඳහා පරිවාස සහ අනෙකුත් රාජ්‍ය සේවා ආයතනවල සහාය ලබාදීම. | 6.1.1. CYPO යටතේ පීඩාවට පත් ළමුන් රැකබලා ගැනීම සහ ආරක්ෂිත ක්‍රියාපටිපාටි ආරම්භ කිරීමට JSC උපදෙස් සහතික කිරීම. | පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>අධිකරණ අමාත්‍යාංශය<br>ජාතික ළමාරක්ෂක අධිකාරිය<br>බන්ධනාගාර දෙපාර්තමේන්තුව<br>බන්ධනාගාර අමාත්‍යාංශය | කෙටි කාලීන | ගනු ලැබූ පියවර. |
| | 6.2. බන්ධනාගාර තුළ ළමුන්ට යහපත් හා මිත්‍රශීලී පරිසරයක් නිර්මාණය කිරීම. | 6.2.1. මෙම සන්දර්භය තුළ දෙමව්පිය ළමා සම්බන්ධතා ප්‍රවේශය පිළිබඳ බන්ධනාගාර ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරීත්වයන් යාවත්කාලීන කිරීම. | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | බන්ධනාගාර ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරීත්වයන් යාවත්කාලීන කිරීම. |
| | 6.3. බන්ධනාගාරගත ළමුන් සඳහා සෞඛ්‍ය සහ මානසික පහසුකම් වර්ධනය කිරීම. | 6.3.1. ළමුන් සඳහා ඉගෙනුම් හා විනෝදාත්මක පහසුකම් ලබාදීම. | | මධ්‍ය/දිගු කාලීන | අදාළ පහසුකම් සහිත බන්ධනාගාර ගණන. |
| | | 6.3.2. ළමුන් සඳහා සෞඛ්‍ය සහ මනෝ සමාජ පහසුකම් ලබාදීම. | | මධ්‍ය/දිගු කාලීන | අදාළ පහසුකම් සහිත බන්ධනාගාර ගණන. |
| 7. සංක්‍රමණික සේවකයින්ගේ ළමුන්ගේ හිමිකම් ප්‍රවර්ධනය. | 7.1 ළමුන්ගේ යහපත සඳහා සංක්‍රමණය වැළැක්වීම. | 7.1.1. සංක්‍රමණ අවස්ථාව තෝරා ගැනීම වැළැක්වීම සඳහා පවුල්වලට සහය ලබාදීම හා විධිවිධාන සැපයීම. | පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය<br>ශ්‍රී ලංකා විදේශ රැකියා කාර්යාංශය<br>විදේශ රැකියා අමාත්‍යාංශය | කෙටි/දිගු කාලීන | පවුල් සහය සඳහා නිර්ණායක. |
| | 7.2. දෙමව්පියන් සඳහා සැලසුම්ගත කළ සහ ආරක්ෂිත සංක්‍රමණික ක්‍රියාවලියකට අදාළ ක්‍රියාපටිපාටි බලාත්මක කිරීම. | 7.2.1. දේශිය වශයෙන් විකල්ප ආදායම් මාර්ග උත්පාදන අවස්ථා හඳුන්වාදීම. | | කෙටි/දිගු කාලීන | ගනු ලැබූ පියවර. |
| | 7.3. සංක්‍රමණික පවුල්වල ළමුන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම. | 7.3.1. සංක්‍රමණික පවුල්වල ළමුන් පිළිබඳ සමීප අධීක්ෂණය ලබාදීම | | | හැරගිය ළමුන්ගේ සුභසාධනය සහ ප්‍රත්‍යස්ථතාව පිළිබඳ දර්ශක. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 8. අනන්‍යතාව සම්පූර්ණ කරන ලද ළමුන්ගේ අයිතිවාසිකම්. | 8.1. සෑම ළමයෙකුටම උප්පැන්න සහතික නිකුත් කිරීම. | 8.1.1. ළමුන් සඳහා උප්පැන්න සහතික තිබීමේ අවශ්‍යතාව සහ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම. | පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>NCW | කෙටි කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |
| | | 8.1.2. ජංගම සේවා මගින් උප්පැන්න සහතික නිකුත් කිරීම. | | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | පවත්වන ලද ජංගම සේවා ගණන.<br>නිකුත් කළ උප්පැන්න සහතික ගණන. |
| | | 8.1.3. සියලුම රජයේ සහ පුද්ගලික රෝහල් ආවරණය කිරීම. | | කෙටි/මධ්‍ය කාලීන | ආවරණය කළ රෝහල් ගණන. |
| 9. මුල් ළමාවිය තුළ ගෘහාශ්‍රිත මුලපිරීම් හරහා ECCD වෙත ප්‍රවේශය ලබාදීම. | 9.1. දෙමව්පියන්, වැඩිහිටියන්, තරුණ කණ්ඩායම් සහ පවුල්වල අනෙකුත් ආරක්ෂාව ලබා දෙන්නන් දැනුවත් කිරීම. | 9.1.1. දෙමව්පියන් හා විස්තීර්ණ පවුල් සාමාජිකයින් / තරුණ කණ්ඩායම් / ගර්භණී මව්වරුන්, සේවකයින් (රාජ්‍ය හා පුද්ගලික) සඳහා CECCD මත ගෘහාශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය | කෙටි කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |
| | 9.2. වයස 0-5 අතර ළමුන් පිළිබඳ අවධානය යොමු කරමින් පවුල් අධ්‍යාපනය සංවර්ධනය කිරීම. | 9.1.2. ECCD මගින් ලබාදෙන පවුල් අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | පවත්වන ලද දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 10. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙන්කොට සැළකීමෙන් සම්පූර්ණයෙන්ම වැළැක්වීම. | 10.1. මුල් ළමාවිය තුළ සමානාත්මතාව සහතික කිරීම. | 10.1.1. දෙමව්පියන්/ විස්තීර්ණ පවුල් සාමාජිකයින්/ භාරකරුවන් සහ ගුරුවරුන් හරහා විශේෂ අවශ්‍යතා ඇති ළමුන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය | කෙටි කාලීන | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන. |
| | | 10.1.2. අධ්‍යාපනික උපකරණ සහ ආධාරක උපකරණ ලබාදීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | තෝරාගත් දිස්ත්‍රික්ක තුළ ලබාදුන් ද්‍රව්‍ය ප්‍රමාණය.<br>ගුරු පුහුණු හා ගුරු අත්පොත.<br>පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන. |
| | | 10.1.3. මුල් ළමාවිය ආශ්‍රිත හඳුනාගත් දෘශ්‍යමය සහ අධ්‍යාපනික අඩුපාඩු ඇතුළත් ව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම. | සමාජ සේවා දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | |
| | | 10.1.4. කුඩා වියේදී ම ඔටිසම් රෝගී ළමුන් හඳුනාගෙන ඔවුන් ප්‍රතිකාර වෙත යොමු කර වීමට පෙර පාසල් ගුරුවරු පුහුණු කිරීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | |
| 11. අවුරුදු 3-5 (වි.අ. සහිත ළමුන් සඳහා ඇතුළුව) අතර සියලුම ළමුන් සඳහා ECCD මධ්‍යස්ථාන වෙත ප්‍රවේශ වීමේ මාර්ග සලසා දීම. | 11.1. සියලුම දෙනාටම අධ්‍යාපනික හා සංවර්ධන අයිතීන් ලබාදීම. | 11.1.1. නීති පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා යටිතල පහසුකම් පවතින බව සහතික කිරීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය | දිගු කාලීන | යටිතල පහසුකම් සංවර්ධනය සහ නීති පැනවීම. |
| | | 11.1.2. ECCD මධ්‍යස්ථාන පිහිටුවීමට පුද්ගලික අංශයට දිරිදීමනා ලබාදීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | දිගු කාලීන | දිරි දීමනා ලබාදීම සහ හේමාස් "පියවර" ව්‍යාපෘතිය සමඟ ECCD මධ්‍යස්ථාන 42 ක් පිහිටුවීම. |
| 12. ගුරුවන්ගේ සුදුසුකම් වර්ධනය කිරීම. | 12.1. ගුණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයක් සහතික කිරීම. | 12.1.1. මාසික දීමනා ලබාදෙමින් පෙර පාසල්වල ගුරුවරුන්ට සහය ලබාදීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br>කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>පෙර පාසල් අධිකාරීන් | දිගු කාලීන | රු. 250 ක මාසික දීමනාවක් ලබාදීම. |
| | | 12.1.2. ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 13. නිවාස, පෙර පාසල් හා අනෙකුත් අධ්‍යාපනික ආයතන තුළ ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක සේවා සඳහා සාධාරණාත්මක ප්‍රවේශයක් සහතික කිරීම. | 13.1. අධ්‍යාපනික ආයතන තුළ සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා වර්ධනය කිරීම. | 13.1.1. පෙර පාසල්වල ජලය, සනීපාරක්ෂාව හා සනීපාරක්ෂාව සඳහා අවම ප්‍රමිති සහ මාර්ගෝපදේශ සම්පාදනය කිරීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | කෙටි කාලීන | මාර්ගෝපදේශ හා ප්‍රමිති සංවර්ධනය. |
| 14. සියලුම ළමුන් අතර සෞඛ්‍ය සහ පොෂණය ප්‍රවර්ධනය කිරීම. | 14.1. සියලුම ළදරුවන්, පෙර පාසල් ළමුන් අතර හා මාතෘ මන්දපෝෂණය තුරන් කිරීම. | 14.1.1. ගර්භණී සහ කිරිදෙන මව්වරුන්ට පෝෂණීය ආහාර මල්ලක් ලබාදීම. (ආහාර සලාකයක්) | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br>සෞඛ්‍ය අමාත්‍යාංශය | කෙටි කාලීන | ප්‍රතිලාභින් 21 ට වැඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් ආවරණය කිරීම. |
| | | 14.1.2. වඩාත් අවදානම් සහගත කොට්ඨාශවල උදෑසන ආහාරය තුළින් පෙර පාසල් ළමුන්ගේ පෝෂණය නගා සිටුවීම. | | මධ්‍ය කාලීන | ඉලක්කගත පාසල් ගණන. |
| | | 14.1.3. පෝෂණය පිළිබඳ ගුරු පුහුණුව | | කෙටි කාලීන | පවත්වන ලද වැඩසටහන් ගණන. |
| 15. ECCD ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සංවර්ධනය කිරීම. | 15.1. TECCD ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර අනුගමනය කිරීම. | 15.1.1. ප්‍රාදේශීය කමිටු රැස්වීම් පැවැත්වීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | කෙටි කාලීන | පවත්වන ලද රැස්වීම් ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 16. ශ්‍රී ලංකාවේ පෙර පාසල්වල ප්‍රමිතිය සහතික කිරීම. | 16.1. රටපුරා පෙර පාසල් සේවාවේ තත්ත්වය සහ ඒකාකාරී ක්‍රියාකාරීත්වය වැඩි කිරීම. | 16.1.1. සියලුම පෙර පාසල්වලට පෙර පාසැල් මාර්ගෝපදේශ හඳුන්වාදීම. | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br><br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | දිගු කාලීන | ශ්‍රී ලංකාව තුළ ආසන්න වශයෙන් පෙර පාසල් 15000 ක්‍රියාත්මක කිරීම.<br><br>මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම. |
| | | 16.1.2. සියලුම පෙර පාසල් වලට මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම. | පෙර පාසල් අධිකාරීන් සහ කාර්යාංශය | | |
| | 16.2. ශ්‍රී ලංකාව තුළ ආසන්න වශයෙන් පෙර පාසල් 15000 ක ක්‍රියාත්මක කිරීම. | 16.2.1. දිවා සුරැකුම් මාර්ගෝපදේශ සම්පාදනය කිරීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය | කෙටි කාලීන | මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම. |
| | | 16.2.2. අනෙක් පාර්ශ්වකරුවන් සමග සහයෝගීත්වයෙන් නව දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම. | ජාතික ළමාරක්ෂක අධිකාරිය | කෙටි කාලීන | පිහිටුවන ලද නව දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගණන. |
| | | 16.2.3. සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම. | පළාත් පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ලේඛනය නඩත්තු කිරීම. |
| | | 16.2.4. දිවා සුරැකුම් මධ්‍යස්ථාන සිතියම්ගත කිරීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br><br>පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | සිතියම්ගත කිරීම අවසන් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම. |
| | | 16.2.5. දිවා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය සහ අධීක්ෂණය. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br><br>ජාතික ළමාරක්ෂක සේවා අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | යාන්ත්‍රණය සංවර්ධනය කිරීම. |
| | | 16.2.6. දිවා සුරැකුම් මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනයට සහයවීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය<br><br>වැවිලි මානව සංවර්ධන භාරකාර ආයතනය | දිගු කාලීන | ගනු ලැබූ පියවර. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 17. පෙරපාසල් පරිසරය තුළට සම්බන්ධවන ස්ත්‍රී පුරුෂ දැනුවත්-භාවය | 17.1. පෙර පාසල් ගුරුවරුන් තුළ ස්ත්‍රී - පුරුෂභාවය පිළිබඳ ධනාත්මක මානසිකත්වයක් ඇති කිරීම. | 17.1.1. ස්ත්‍රී - පුරුෂභාවය පිළිබඳ ගතානුගතික ආකල්පයන් මගින් සිදුවන නරක බලපෑම පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය | කෙටි කාලීන | පුහුණු කළ ගුරුවරු ගණන. |
| | | 17.1.2. ස්ත්‍රී - පුරුෂ හිතකාමී ක්‍රියාකාරකම් පිළිබඳ පෙර පාසල් ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය. | ළමයින් පිළිබඳ ලේකම් කාර්යාලය | කෙටි කාලීන | පුහුණු කළ ගුරුවරු ගණන. |

# කම්කරු අයිතිවාසිකම්

# කම්කරු අයිතිවාසිකම්

ශ්‍රී ලංකාව තුළ වැඩකරන පන්තිය සඳහා වූ ව්‍යාපාරයක ආරම්භය 1890 දශකය කරා දිව යන අතර, පළමු සාමුහික ක්‍රියාමාර්ගය 1893 දී වාර්තා විය. කාලයාගේ ඇවෑමත් සමගම, ශක්තිමත් වෘත්තීය සමිති සම්ප්‍රදායක් රටතුළ බිහි වූ අතර, එම සම්ප්‍රදාය ශ්‍රී ලංකීය නිදහස් ව්‍යාපාරය තුළ වෘත්තීය සමිති සිදුකළ සුවිශ්ෂි මෙහෙවර හා බැඳී පවතින්නකි.

20 වැනි සියවස මුල් භාගය වන විට, ලංකා සේවක සුභසාධන සංගමය සහ ලංකා ජාතික කොන්ග්‍රසය සම්මත කරගත් යෝජනා අතරට ඒ මගින් අනිකුත් කරුණු අතර සේවකයින්ට සමාගමයේ යෙදීමේ අයිතිය, අවම වැටුප් හා සේවය කරන පැය ගණනක් ස්ථාපිත කිරීම සහ නියාමනය කිරීම, ළමා ශ්‍රමය තහනම් කිරීම සහ සේවය කිරීම සඳහා යහපත් සේවා සහ ජීවන තත්ත්වයන් සහතික කිරීම යන කරුණු දක්වාලිය හැකිය. මුල්කාලීන වෘත්තීය සංගම් සමහරක් 1923 සහ 1928 අතර කාල වකවානුවේ දී පිහිටුවන ලදී.

මෙම වර්ධනයන් වැදගත් කම්කරු නීති කිහිපයක්ම පැනවීමට හේතු සාධක විය. ඒවා අතර 1935 වෘත්තීය සමිති ආඥා පනත; 1935 සේවක වන්දි ආඥාපනත; 1956 අංක 47 දරණ කාන්තාවන් හා තරුණ පුද්ගලයින් සේවයේ නියුක්ත කරවීමේ පනත; 1939 මාතෘ ප්‍රතිලාභ පනත; 1941 පඩිපාලක සභා ආඥාපනත; 1954 සාප්පු සහ කාර්යාල (රැකියා සහ පාරිතෝෂික) පනත සහ 1942 කර්මාන්ත ශාලා ආඥාපනත වේ.

1950 කාර්මික ආරාවුල් පනත සුවිශේෂි නීතියක් වූ අතර, එමඟින් කාර්මික ආරාවුල් වැලැක්වීම, විමර්ශනය කිරීම සහ නිරවුල් කිරීම සහ සේව්‍ය - සේවක යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා සාමුහික කේවල් කිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා අවකාශය සැලසේ.

ශ්‍රී ලංකාව ILO සම්මුතීන් 40 ක් බලාත්මක කර ඇති අතර, ILO ප්‍රතිපත්ති පාදක කර ගනිමින් ජාතික යෝග්‍ය වැඩ සඳහා වූ කාර්ය සැලැස්මක් ක්‍රියාත්මක කළ ප්‍රථම රාජ්‍ය බවටද පත්වේ.

රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම් කිරීම සඳහා සහ පුද්ගලික අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ ගෙවීම සඳහා පුළුල් සමාජ ආරක්ෂණ ක්‍රමයක් මෙරටට ඇත. අවිධිමත් අංශයේ සේවකයින්ගේ අවදානම් සහගත බව අවබෝධ කර ගනිමින්, රජය ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පියවර රැසක් ගෙන ඇත. අවිධිමත් අංශය තුළ ගොවීන්, ධීවරයින්, සහ ස්වයං රැකියා සේවකයින්ට විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීම සඳහා නියාමන ආයතන දෙකක් ක්‍රියාත්මකව පවතී.

ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙහි කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පරිච්ඡේදය තුළින් සේවකයින්ගේ අයිතිවාසිකම් තවදුරටත් ශක්තිමත් කිරීමට අදාළ වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් ආමන්ත්‍රණය කිරීමට උත්සාහ දරයි.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. සියලු වැඩබිම්වල කම්කරුවන් සඳහා වෘත්තිය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙළ. | 1.1. වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය නීතිවල ඇති පරතරයන් ආවරණය කිරීම. | 1.1.1. වෘත්තිය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳ පනත් කෙටුම්පතක් ජාතික කම්කරු උපදේශන මණ්ඩලයේදී සහාගත කිරීම හා සාකච්ඡා කොට අවසන් කිරීම. | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>ILO අධ්‍යයන වාර්තා සමාලෝචනය කිරීම හා රටේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වැඩපිළිවෙලක් සකස් කිරීම. | මධ්‍ය කාලීන | නීති සම්මත කිරීම. |
| | | 1.1.2. ILO අධ්‍යයන වාර්තා සමාලෝචනය කිරීම හා රටේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වැඩපිළිවෙලක් සකස් කිරීම. | | දිගුකාලීන | පවත්වන ලද අධ්‍යයන ගණන. |
| | | 1.1.3. රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවකයින් සඳහා ප්‍රමාණවත් හා සුදුසු පුහුණු හා උපදේශන ලබාදීම. | වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය | දිගු කාලීන | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන.<br>පවත්වන ලද උපදේශන ගණන. |
| 2. අවු 16-18 අතර දරුවන් අන්තරායකාරී රැකියාවල යෙදවීම තහනම් කිරීම සහ එවායින් ආරක්ෂා කිරීම සඳහා ILO සම්මුති 182 බලාත්මක බව ශක්තිමත් කිරීම. | 2.1. අවු 16-18 හැවිරිදි දරුවන් අන්තරායකාරී රැකියාවන්හි යෙදවීමේ තහනම බලාත්මක කිරීමේ දුර්වලතාවන් ආමන්ත්‍රණය කිරීම. | 2.1.1. මෙම වයස් කාණ්ඩයේ අන්තරායකාරී රැකියා තහනම් කිරීමට ඇති වර්තමාන යාන්ත්‍රණවල ඵලදායිත්වය වැඩි කිරීම. | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය<br>කම්කරු දෙපාර්තමේන්තුව | කෙටිකාලීන | පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 3. කාර්මික ආරවුල් විසඳීම කඩිනම් කිරීම. | 3.1. බේරුම් කිරීමේ ආයතන සහ කම්කරු විනිශ්චය සභා තුළ කාර්මික ආරවුල් විසඳීමේ ප්‍රමාදයන් අවම කිරීම. | 3.1.1. බේරුම්කරුවන් විසින් බැහැර කරන ලද නඩු ආශ්‍රිත සංඛ්‍යා ලේඛන ලබාගැනීම. | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය<br>අධිකරණ අමාත්‍යාංශය | මධ්‍ය කාලීන | පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීම.<br>සිදුකළ අධ්‍යයන ගණන. |
| 4. 1971 අංක 70 දරණ අනිවාර්ය මහජන සේවා පනත සංශෝධනය. | 4.1. ශ්‍රම බලහත්කරණය සම්බන්ධයෙන් ILO සම්මුතියට අනුකූල වන ලෙස 1971 අංක 70 දරණ අනිවාර්ය සේවා පනතේ ඇති ගැටළු ආමන්ත්‍රණය කිරීම. | 4.1.1. කම්කරු සංවිධාන සම්මුති 29 සහ 105 සමග කම්කරු සංවිධාන සමාලෝචන වාර්තා අධ්‍යයනය කිරීම. | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ ඊට අදාළ අනෙකුත් අමාත්‍යාංශ | කෙටි කාලීන | අධ්‍යයන මත පදනම් වී පසු විපරම් ක්‍රියා මාර්ග ගැනීම. |
| 5. අනිවාර්ය පාසල් අධ්‍යාපනය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව යමින් රැකියාවක නියුක්ත වීමේ අවම වයස හා වෘත්තීය සමිති සඳහා එක් වීමට ඇති අයිතිය ඒකාග්‍ර කරවීම. | 5.1. වෘත්තිය සමිති හා සම්බන්ධ වීමට ඇති අවම වයස සම්බන්ධයෙන් පවතින නීති විෂමතා ආමන්ත්‍රණය කිරීම. | 5.1.1. 1956 අංක 47 දරණ කාන්තාවන් හා තරුණ පුද්ගලයින් සේවයේ නියුක්ත කරවීමේ පනත සංශෝධනය කිරීමේ අදහසින් එය සමාලෝචනය කිරීම.<br>5.1.2. ඉහත සමාලෝචනය අනුව යමින්, පාසල් අධ්‍යාපනය ලැබීමේ වයස් සීමාව 14 සිට 16 දක්වා ඉහළ දැමීම සඳහා 1956 අංක 47 දරණ පනත සංශෝධනය කිරීම. | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය<br>කම්කරු දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | නීති සමාලෝචනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 6. අවිධිමත් අංශයේ පුද්ගලයින් සඳහා නිසි ආරක්ෂණය සැපයීම. | 6.1. අවිධිමත් අංශයේ පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. | 6.1.1. අවිධිමත් අංශයට අදාළ අධ්‍යයනයන් පැවැත්වීමට යෝග්‍ය ආයතන හඳුනාගැනීම. | කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය සහ ඊට අදාළ අනෙකුත් අමාත්‍යාංශ<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>සේවකභාර අරමුදල | මධ්‍ය කාලීන | වාර්තා අධ්‍යයනය. |
| | 6.2. අවිධිමත් අංශයේ පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණ ආවරණ සැපයීමේ ඇති දුර්වලතා ආමන්ත්‍රණය කිරීම. | 6.2.1. අවිධිමත් අංශයට සේවක භාරකාර අරමුදලේ සහාභාගිත්ව දායකත්වය ලබා දීමට ඇති හැකියාව සොයා බැලීම වෙනුවෙන් අධ්‍යයනය කිරීම. | | මධ්‍ය කාලීන | අධ්‍යයන අවසන් කිරීම.<br>නිර්දේශ ක්‍රියාත්මක කිරීම. |
| 7. ගෘහස්ථ සේවය නියාමනය කිරීම. | 7.1. ගෘහස්ථ සේවකයින් ආරක්ෂණය කිරීම සහ අවම ප්‍රමිතීන් සහතික කිරීම. | 7.1.1. ගෘහස්ථ සේවකයින් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදීමට ඇති හැකියාව අධ්‍යයනය කිරීම සහ ගවේෂණ කිරීම. | කම්කරු අමාත්‍යාංශය<br>කම්කරු දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | අධ්‍යයන වාර්තා.<br>හඳුන්වාදුන් ප්‍රමිතීන්. |

# පාරිසරික අයිතිවාසිකම්

## පාරිසරික අයිතිවාසිකම්

සෑම මනුෂ්‍යයෙකුම සිය පැවැත්ම උදෙසා පරිසරය මත රඳා පවතී යි. ශ්‍රී ලංකාවේ පාරිසරික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා නොයෙකුත් පියවර ගෙන ඇත. මෙම කාර්යය ඉටු කිරීම සඳහා නීති සහ ප්‍රතිපත්ති සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද මේ ආශ්‍රිත රජයේ යුතුකම් සහ වගකීම් හඳුනාගෙන ඇති අතර රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලික යුතුකම් පිළිබඳ උද්දේශික ප්‍රතිපත්ති හරහා සෑම ශ්‍රීලාංකිකයෙකුටම මූලික වගකීමක් ලෙස පරිසරය සුරැකීම හා එහි සම්පත් සංරක්ෂණය කරගැනීමට නියම කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 12 (1) දරණ වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පාරිසරික ගැටළුවලට අදාළ මූලික අයිතිවාසිකම් ඉල්ලීම් සඳහා සහන ලබා දී ඇත. තවද, මහේස්ත්‍රාත් අධිකරණය, පළාත් මහාධිකරණය සහ අභියාචනාධිකරණය වෙතින් ද පාරිසරික ගැටළු උදෙසා පිළියම් ලබා ගැනීමට මහජනතාවට අවස්ථාව සලසා දී ඇත. අධිකරණ තීරණ පරිසරය සුරැකීමෙහිලා සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත මගින්, පරිසර ආරක්ෂණය හා පාලනය කිරීමේ පුළුල් පරමාර්ථ පෙරදැරි ව, පොදු නියෝගයක් හරහා මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවන ලදී.

ජාතික ප්‍රතිපත්තිය (NEP), අදාළ ව්‍යවස්ථාපිත වගකීම පිළිගෙන, ඒ සඳහා මගපෙන්වනු වස්, ශ්‍රී ලංකාවේ සෑම පාරිසරික අංගයක්ම සංරක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීමට අවශ්‍ය මගපෙන්වීම ලබාදීමට බැඳී සිටී. වර්තමාන සහ අනාගත පරපුරෙ හි සුබසිද්ධිය උදෙසා පරිසරය ඵලදායී ලෙස කළමනාකරණය කරනු වස් ජනතාවගේ සහභාගීත්වයෙන් යුක්ත ව, NEP විසින් පරිසරය සඳහා වූ රජයේ කැපවීම, නැවත අලුත් කරනු ලබයි. මෙම ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා වන රාමුව තුළ, යහපත් පාරිසරික කළමනාකරණයක් සහතික කිරීමයි. මෙම ප්‍රතිපත්තිය, අනෙකුත් අංශ වැඩිදියුණු කිරීම සඳහා වූ තවත් බොහෝ ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන්ගේද අනුග්‍රහය ලබයි.

1992 දී රියෝද ජනයිරෝහී දි පවත්වන ලද එක්සත් ජාතීන්ගේ ලෝක සමුළුවේදී පිළිගත් රියෝ ප්‍රතිපත්ති සහ අංක 21 දරණ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ බැඳීම නැවත තහවුරු කර ඇත. ගෝලීය පාරිසරික හවුල්කාර ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකාව සක්‍රීයව සහභාගි වී ඇති අතර, බහුපාර්ශ්වීය පාරිසරික ගිවිසුම් සහ ප්‍රකාශ ආසන්න වශයෙන් 40 ක් පමණ වලංගු කර ඇත. පරිසරයට ඇති අයිතිය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූලව ආරක්ෂා කරන මූලික හිමිකමක් ලෙස හඳුනාගැනීම අවශ්‍ය වන අතර පාරිසරික නීති සහ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම පිණිස ජාතික කාර්ය සැලැස්ම තුළ ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 1. තිරසර පාරිසරික කළමණාක-රණය. | 1.1. සෑම පාර්ශ්වකරුවකුගේම සහභාගීත්වයෙන් යුක්තව, වගකීම් සහගතව, පරිසරයේ මනා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම. | 1.1.1. පවත්නා පාරිසරික ගැටලුවලට පිළියම් ලෙස ජාතික පරිසර ප්‍රතිපත්තිය සහ උපායමාර්ග යාවත්කාලීන කිරීම. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන | කෙටි කාලීන | ජාතික ප්‍රතිපත්ති සහ උපායමාර්ග යාවත්කාලීන කිරීම. |
| | | 1.1.2. ජාතික පාරිසරික සැලැස්ම වැඩි දියුණු කිරීම. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන | කෙටි/මධ්‍ය කාලීන | කාර්ය සැලස්ම අවසාන කිරීම. |
| 2. මිනිස් අයිතිවාසිකම් සහ පරිසරය අතර සබඳතාව ශක්තිමත් කිරීම. | 2.1. නීති ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම. | 2.1.1. මූලික අයිතිවාසිකමක් ලෙස ආරක්ෂාකාරී සහ සෞඛ්‍යසම්පන්න පරිසරයක් ලැබීමේ අයිතිය සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම. | පාර්ලිමේන්තුව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මෙහෙයුම් කමිටුව තුළින්) | කෙටි කාලීන | මෙහෙයුම් කමිටුව මගින් යොදාගත් ආරක්ෂිත සහ සෞඛ්‍යසම්පන්න පරිසරයකට ඇති අයිතිය විධිමත්ව සකස් කිරීම. |
| | 2.2. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම. | 2.2.1. ජාතික පාරිසරික පනත යාවත් කාලීන කිරීම. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි කාලීන | පරිසරය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති මාලාවක්. |
| | 2.3. තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කිරීම. | 2.3.1. යාවත්කාලීන කරන ලද, පාරිසරික නීති පද්ධතියේ සම්පිණ්ඩිත විස්තරයක් ප්‍රසිද්ධ කිරීම. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය<br><br>මධ්‍යම පරිසර අධිකාරිය සහ අදාළ අනෙකුත් අමාත්‍යාංශ<br><br>නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව | කෙටි/දීර්ඝ කාලීන | අදාළ සියලු පාරිසරික නීති පද්ධතියේ සම්පිණ්ඩිත විස්තරයක් ප්‍රසිද්ධ කිරීම හා උප නීති පද්ධතියක් භාෂා 3 න්ම ප්‍රකාශයට පත් කිරීම.<br><br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඊට සම්බන්ධ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ / නියෝජිතායතනවල වෙබ් අඩවිවලින් බාගත කළ හැකිවීම. |
| | | 2.3.2. යාවත්කාලීන කරන ලද, පාරිසරික නීති රෙගුලාසි පිළිබඳ සම්පිණ්ඩිත විස්තරයක් ප්‍රසිද්ධ කිරීම. | | | |
| | | 2.3.3. තොරතුරු දැනගැනීමේ පනත යටතේ මහජනතාවගේ තොරතුරු ඉල්ලීම් ඉටුකිරීමට අදාළ ආයතනවල යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. | | | |
| | | 2.3.4. තොරතුරු නිලධාරියෙකු හා අභියාචන තීරක නිලධාරියෙකු පත් කිරීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 3. දේශීය අවශ්‍යතාවලට යටත්ව, ගෝලීය පාරිසරික සම්මේලන-යන්ට අනුකූලතාවය දැක්වීම. | 3.1. අදාළ පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කිරීම හරහා ජාතික අභිරුචිය සැලකිල්ලට ගන්නා බව සහතික කිරීම. | 3.1.1. සම්මේලනයන්හිදී ජාත්‍යන්තර වගකීම් ප්‍රකාශයට පත්කිරීමට පෙර, ජාතික ස්ථාවරය තීරණය කරනු පිණිස රාජ්‍ය - රාජ්‍ය නොවන සියලුම පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා පැවැත්වීම. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ අදාළ අනෙකුත් අමාත්‍යාංශ. | කෙටි / දීර්ඝ කාලීන | පැවැත්වූ උපදේශන ගණන |
| 4. ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය අගය කරමින්, සංරක්ෂණය කර සහ තිරසර ලෙස භාවිත කිරීම. | 4.1. ජෛව-විවිධත්වයෙහි දීර්ඝකාලීන සංරක්ෂණය තහවුරු කිරීම. | 4.1.1. ආගන්තුක ආක්‍රමණික විශේෂයන් ඇතුළුවීම වලක්වනු වස් නියාමන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම. | BDS, NPQS, FARD, DWLC, NAQDA, AD, MA, ID, NISSG, NARA.<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පාර්ශ්වකරුවන්. | මධ්‍ය කාලීන | අවදානම ඇගයීමේ ක්‍රමවේද පිහිටවීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම. |
| | | 4.1.2 පරිසර පද්ධති සහ විශේෂයන් පිළිබඳ ජාතික ලැයිස්තුවක් පිළියෙල කිරීම සහ එය වාර්ෂිකව යාවත්කාලීන කිරීම . | BDS, NPQS, FARD, DWLCNAQDA, AD, MA, ID, NISSG, NARA.<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් පාර්ශ්වකරුවන්. | කෙටි / දීර්ඝ කාලීන | ශාක හා සත්ත්ව වර්ගයන් ගැන ජාතික ලැයිස්තුව ස්ථාපනය කිරීම. |
| | 4.2. ජෛවීය සම්පත් තිරසර භාවිතයට අනුබල දීම. | 4.2.1. ජෛව විවිධත්වයට සම්බන්ධ කෞතුක වස්තු හා සාම්ප්‍රදායික දැනුම නැවත රටට ගෙන්වා ගැනීමට අදාළ මෙන්ම ජෛව විවිධත්ව සංරක්ෂණයට අදාළ ප්‍රධාන ධාරාවන්හි ඒත්තු ගැන්වීමේ ප්‍රතිපත්තිමය මෙවලම් සංවර්ධනය කිරීම. | BDS ජාතික ප්‍රවීණයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන්. | මධ්‍ය / දිගු කාලීන | ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම. |
| | 4.3. ජෛව විවිධත්වයෙන් ලැබෙන ප්‍රයෝජනයන්හි සමතුලිත හුවමාරුව සඳහා අනුබල දීම. | 4.3.1. ජෛවීය සම්පත්වල ප්‍රතිලාභ හුවමාරුව සඳහා ක්‍රමවේද, මාර්ගෝපදේශනය සහ යාන්ත්‍රණ සංවර්ධනය කිරීම. | ජෛව විවිධත්ව පිළිබඳ BDS<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, NBG, NZG, DWLC, NEC සහ අනෙකුත් පාර්ශ්වකරුවන්. | මධ්‍ය / දිගු කාලීන | සංවර්ධිත මාර්ගෝපදේශන හා ක්‍රියා පටිපාටි.<br>අත්සන් කළ ද්‍රව්‍යමය හුවමාරු ගිවිසුම් දෙක. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 4.3.2. ජෛව විවිධත්ව සම්පත් හා ප්‍රයෝජන හුවමාරුවට ඇති ප්‍රවේශය සඳහා ජාතික ප්‍රතිපත්තිය සෑදීම / වර්ධනය කිරීම. | ජෛව විවිධත්ව පිළිබඳ BDS, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, DWLC, SLC, NPQC, NEC සහ අනෙකුත් පාර්ශ්වකරුවන් | කෙටි / මධ්‍ය කාලීන | සම්පත් හුවමාරු ප්‍රවේශය (ABS) ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම. |
| | 4.4. ප්‍රධාන පරිසර පද්ධතින් වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය තුළින් මානව යහපැවැත්ම නගා සිටුවීම. | 4.4.1. ජාතික ජෛව නියාමන සැලැස්ම සඳහා වූ ප්‍රධාන සැලැස්ම සංවර්ධනය සහ ක්‍රියාවට නැංවීම. | ජෛව විවිධත්ව පිළිබඳ BDS, SLC, NPQS, MAPH, MFAR, DWLC, AD, DIEC, විශ්වවිද්‍යාල, විශේෂඥයන්, රාජ්‍ය නොවන සංවිධාන, NEC | කෙටි / දීර්ඝ කාලීන | ජෛව ආරක්ෂාව සඳහා වූ ප්‍රධාන සැලැස්ම සෑදීම. |
| | | 4.4.2. ජාන වෙනස් කරන ලද ජීවන් (GMO) ගෙන් ජාතික ජෛව විවිධත්ව හා දේශීය භෝගයන්ට සිදුවන හානියෙන් ආරක්ෂා වීමට නීති පැනවීම. | ජෛව විවිධත්ව පිළිබඳ BDS, SLC, NPQS, MAPH, MFAR, DWLC, AD, DIE, විශ්වවිද්‍යාල, විශේෂඥයන්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන, NEC | කෙටි / දීර්ඝ කාලීන | ජාන වෙනස් කරන ලද ජීවන් ගෙන් දේශීය භෝග ආරක්ෂා කිරීම උදෙසා පනතක් කෙටුම්පත් කොට බලාත්මක කිරීම. |
| | 4.5. ජෛව විවිධත්වයේ දීර්ඝකාලීන ආරක්ෂාව සහතික කිරීම. | 4.5.1. කඩොලාන, වැසි වනාන්තර, මොන්ටානා වනාන්තර, තෙත්බිම් සහ ජලාධාර ප්‍රදේශ ද ඇතුළත්ව ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සහ තිරසාර පරිභෝජනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම. | BDS, DWLC, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, NARA, CC&CRMD, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව | කෙටි කාලීන | ශ්‍රී ලංකාව තුළ ඇති පරිසර පද්ධතියේ සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම. |
| | | 4.5.2. වැදගත් ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා ආරක්ෂා කළ යුතු ප්‍රදේශ හඳුනාගැනීම සහ ඒවා පාලනයට මාර්ගෝපදේශ සකස් කිරීම. | | | හඳුනාගැනීම අවසන් කිරීම සහ මාර්ගෝපදේශන සකස් කිරීමග |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 5. වාසස්ථාන, ශාක හා සත්ව / විශේෂයන්හි විවිධත්වය සංරක්ෂණය හා ශාක සත්ව විශේෂයන් තුළ ජාන විවිධත්වය සහතික කිරීම. | | 5.1.1. ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා ආයතනික හා නීතිමය රාමුව ශක්තිමත් කිරීම. | වනජීවී දෙපාර්තමේන්තුව | කෙටි / දීර්ඝ කාලීන | සිද්ධීන් හා නඩු පැවරීමේ ප්‍රමාණය. |
| | | 5.1.2. භාවිතයෙන් යටපත් කෙරුණු භෝග සහ සත්ව විශේෂයන්ද ඇතුළත්ව දේශීය භෝග සහ සත්ව විශේෂ ආරක්ෂා කිරීම පිළිබඳ නීති රෙගුලාසි බලාත්මක කිරීම. | | | ප්‍රකාශයට පත්කළ නව රෙගුලාසි ගණන.<br>වනජීවී ප්‍රදේශ ආසන්නයේ ව්‍යාපෘති සඳහා සිදුකරන ලද EIA ප්‍රමාණය. |
| | | 5.1.3. සංවර්ධන ව්‍යාපෘති සහ ගැටුම් අවම කිරීම් නිසා වනජීවී වාසස්ථාන වෙත එල්ලවන බලපෑම අවම කිරීම. | | | වනජීවී ප්‍රදේශ ආසන්නයේ ව්‍යාපෘති සඳහා සිදුකරන ලද EIA ප්‍රමාණය. |
| | | 5.1.4. ආර්ථික ප්‍රතිලාභ ළඟා කර ගැනීම සඳහා දේශීය ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිත කළ හැකි අයුරු සොයා බැලීම. | | | |
| | | 5.1.5. දේශීය ශාක විශේෂයන්ට තර්ජනය කළ හැකි ජෛව විශේෂයන් ආනයනය කිරීම නියාමනය. | | | රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම. |
| | | 5.1.6. ක්ෂීරපායි විශේෂ මගින් කෘෂිභෝගවලට සිදුවන හානිය අවම කරගැනීමට අවශ්‍ය පියවර අධ්‍යයනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | | | අධ්‍යයනය පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 6. ජාතික ආර්ථිකය සහ ජනතා සුභසිද්ධිය උදෙසා දායක වෙමින් රටේ දැව අවශ්‍යතා සපුරලමින් පාරිසරික සේවා ලබාදීම සඳහා වනාන්තර සහ තුරු සම්පත් වල තිරසාර පාලනය. | 6.1. වන සම්පත් ආරක්ෂා කිරීමට උපායමාර්ගික නීති සම්පාදනය කර බලාත්මකකරණය කිරීම. | 6.1.1. වන සංරක්ෂණය, සංරක්ෂිත වනාන්තර සහ අනෙකුත් රාජ්‍ය වනාන්තර සඳහා වන සංරක්ෂණ ආඥා පනත සහ රෙගුලාසි සංශෝධනය කිරීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ඉඩම් දෙපාර්තමේන්තුව | දිගු කාලීන | සංශෝධිත වන සංරක්ෂණ ආඥා පනත / රෙගුලාසි. |
| | 6.2. වනාන්තර සහ තුරු සම්පත්වල තිරසාර පාලනය කිරීම මගින් වනාන්තරවල කාබන් තොග වැඩිකර පවත්වා ගැනීම. | 6.2.1. වන ආවරණය පිළිබඳ සිතියම් සකස් කර වනාන්තර ප්‍රදේශ ඇස්තමේන්තු ගත කිරීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | දිගු කාලීන | සිතියම් සකස් කිරීම. |
| | | 6.2.2. ජාතික වශයෙන් වනාන්තර ආශ්‍රිතව ලේඛන පවත්වාගෙන යාම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | දිගු කාලීන | නිර්මිත ලේඛනගත දත්ත. |
| | 6.3. ප්‍රධාන වශයෙන් පස, ජලය සහ ජෛව විවිධත්ව සංරක්ෂණ අරමුණ සඳහා ස්වභාවික කැලෑ සංරක්ෂණය කිරීම. | 6.3.1. කළමනාකරණ සැලසුම් 80 ක් සකස් කිරීම. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, DWC, මධ්‍යම පරිසර අධිකාරිය | වාර්ෂික | වසරකට කළමනාකරණ සැලසුම් 50 ක් සකස් කිරීම. |
| | | 6.3.2. ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව විද්‍යාත්මකව වන ආවරණය පවත්වා ගැනීමට පියවර ගැනීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 7. එලදායි ලෙස කොටස්කරුවන්ගේ සහභාගීත්ව යාන්ත්‍රණයක් හරහා සියලු මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන අහිතකර වායු දූෂක විමෝචනය අවම කිරීම මගින් ආරක්ෂිත මට්ටමේ වායු තත්ත්වයන් පවත්වාගෙන යාම. | 7.1. බහුපාර්ශවික කොටස්කරුවන් අතර සංවාදයක් ඇති කිරීමට අවකාශය නිර්මාණය කිරීම. | 7.1.1. සියලු වායු ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම හා කළමනාකරණ වැඩසටහන් සකස් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ජාතික බහුපාර්ශවික කොටස්කරුවන්ගේ වේදිකාවක් සංවර්ධනය කිරීම හා ස්ථාපිත කිරීම. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | කෙටි කාලීන | වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයක් (AIRMAC) ස්ථාපිත කිරීම. |
| | | 7.1.2. වායු සම්පත් කළමනාකරණය පිළිබඳ කැබිනට් මණ්ඩලය මගින් පත් කරන ලද කමිටුවක් ස්ථාපිත කිරීම. | | | |
| | 7.2. ජංගම මූලාශ්‍ර, ලිපි ද්‍රව්‍යමය මූලාශ්‍ර සහ ගෘහස්ථ දූෂණය මගින් සිදුවන වායු දූෂණය පාලනය කිරීම. | 7.2.1. ප්‍රවාහන ක්ෂේත්‍රය මගින් සිදුවන වායු විමෝචන වීම පාලනය (ජංගම මූලාශ්‍ර) : | | මධ්‍ය කාලීන | සැලැස්ම සංවර්ධනය කිරීම. |
| | | අ. ශ්‍රී ලංකා වාහන විමෝචන පරීක්ෂණ වැඩසටහන දියුණු කිරීමට වායු විමෝචන පරීක්ෂණ (VET) මධ්‍යස්ථාන සඳහා පිළිගත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. ශ්‍රී ලංකාවේ ඉන්ධන කාර්යක්ෂමතා මාර්ග සිතියම් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | මෝටර් රථ දෙපාර්තමේන්තුව, AIRMAC, මධ්‍යම පරිසර අධිකාරිය, DOMUSS, SLAB, ප්‍රවාහන අමාත්‍යාංශය | මධ්‍ය / දිගු කාලීන | පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම. |
| | | ආ. ජාත්‍යන්තර ප්‍රමිතින්ට යටත්ව සහ ඒවා බලාත්මක කිරීම සඳහා රෙගුලාසි හඳුන්වා දීම හරහා නව වාහන විමෝචන ප්‍රමිති සකස් කිරීම. | මෝටර් රථ දෙපාර්තමේන්තුව, AIRMAC, මධ්‍යම පරිසර අධිකාරිය, ප්‍රවාහන අමාත්‍යාංශය | කෙටි කාලීන | නව වාහන වායු විමෝචන ප්‍රමිති මත රෙගුලාසි පැනවීම. |
| | | ඇ. ශ්‍රී ලංකාවේ ඉන්ධන කාර්යක්ෂමතා මාර්ග සිතියම් උදෙසා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | AIRMAC, CPC, MOPRD | මධ්‍ය කාලීන | ඉන්ධන කාර්යක්ෂමතා මාර්ග සිතියම සෑදීම. |
| | | ඈ. අඩු වායු විමෝචිත වාහන ආනයනය සඳහා රාජ්‍ය මූලය දිරිගැන්වීම් හඳුන්වා දීම. | මුදල් අමාත්‍යාංශය | කෙටි කාලීන | අඩු වායු විමෝචන වාහන ප්‍රතිශතය වර්ධනය කිරීම.<br>2017 අය-වැයේ දී හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 7.2.2. නිශ්චල මූලාශ්‍ර හරහා සිදු කෙරෙන වායු දූෂණය පාලනය කිරීම සඳහා වූ නිශ්චල මූලාශ්‍ර විමෝචන ප්‍රමිති කෙටුම්පත් ගැසට් කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි / මධ්‍ය කාලීන | නිශ්චල මූලාශ්‍ර විමෝචන ප්‍රමිති සංවර්ධනය කිරීම. |
| | | 7.2.3 ගෘහස්ථ වායු දූෂණය පාලනය කිරීම.<br>අ. ගෘහස්ථ වායු දූෂණය පිළිබඳ මූලික අධ්‍යයනය සිදු කිරීම.<br>ආ. ගෘහස්ථ වායු තත්ව මාර්ගෝපදේශන සැකසීම.<br>ඇ. ඉන්ධන කාර්යක්ෂමතාව ප්‍රචලිත කිරීම.<br>ඈ. දර භාවිතා කරන ඉවුම් පිහුම් කටයුතු වලදී ඉන්ධන කාර්යක්ෂමතා උඳුන් භාවිතය පුළුල් කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | මධ්‍ය කාලීන | ගෘහස්ථ වායු දූෂණය පිළිබඳ මූලික දත්ත සැකසීම. |
| | | 7.2.4. ගැසට් රෙගුලාසි දක්වා අතුරු සම්මත උත්ශ්‍රේණිගත කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | ගෘහස්ථ වායු තත්ත්ව මාර්ගෝපදේශ සැකසීම. |
| | | 7.2.5. EPL ක්‍රියාපටිපාටියට යෝග්‍ය වන පරිදි අනුකූලතා නියාමන ක්‍රියාවලිය යොදා ගැනීම. | මධ්‍යම පරිසර අධිකාරිය | | සැලැස්ම සංවර්ධනය. |
| | | 7.2.6. ඉවුම් පිහුම් කටයුතු සඳහා වාතාශ්‍රිත ප්‍රදේශ භාවිතයට නිවැසියන් දිරිමත් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | මධ්‍යම පරිසර අධිකාරිය | | ගැසට්ගත කරන ලද රෙගුලාසි ගණන.<br>වලංගු EPL ගණන.<br>පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන. |
| | | 7.2.7. ගෘහ ආහාර පිසීම සඳහා LPG ආදේශක ලෙස ජෛවීය ස්කන්ධ භාවිත කිරීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම. | විද්‍යා හා තාක්ෂණ ආයතනය / විශ්වවිද්‍යාල | | තාක්ෂණය දියුණු කිරීමට ගනු ලැබූ පියවර. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 7.3. ජාතික ප්‍රමිතීන්ට අනුකූලව, පරිමණ්ඩිත වායු ගුණාත්මකභාවයන් (AAQ) පවත්වාගෙන යාම. | 7.3.1. AAQ - අධීක්ෂණ වැඩසටහන දිවයින පුරා ව්‍යාප්තිය පුළුල් කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි/දීර්ඝ කාලීන | AAQ මධ්‍යස්ථාන ඉදිකළ ප්‍රමාණය. |
| | | 7.3.2. මෙම AAQ මට්ටම් නිතිපතා ප්‍රකාශයට පත් කිරීම. | | කෙටි/මධ්‍ය කාලීන | ප්‍රකාශයට පත් කළ AAQ දත්ත සංඛ්‍යාව.<br>යොදා ඇති පිළියම් ගණන. |
| | 7.4. වාහන මගින් සිදුවන වායු දූෂණය අවම කිරීම. | 7.4.1. ජාතික අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි වාහන වායු විමෝචන ප්‍රමිතීන් වර්ධනය කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | වර්ධනය කළ වාහන විමෝචන සම්මත. |
| | | 7.4.2. නව ප්‍රමිතීන්ට අනුකූලව වාහන දුම් පරීක්ෂණ (VET) වැඩසටහන ශක්තිමත් කිරීම. | | | |
| | | 7.4.3. ජංගම උපකරණ භාවිතය හරහා ප්‍රවාහන මාර්ග අසල අහඹු ලෙස වාහන වායු විමෝචන තහවුරු කිරීම් ක්‍රමවේදය ශක්තිමත් කිරීම. | | | ක්‍රියාත්මක සැලැස්ම. |
| | | 7.4.4. සියලුම වාහන වර්ග VET වැඩසටහන යටතට ගෙන ඒම. | | | |
| | | 7.4.5. ලංකා ගමනාගමන මණ්ඩලය, සන්නද්ධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිසිය ඇතුළු සියලු රාජ්‍ය වාහන VET වැඩසටහන යටතට ගෙන ඒම. | | | VET වැඩසටහන යටතේ ඇති වාහන සංඛ්‍යාව. |
| | | 7.4.6. වාහන පන ගැන්වීම සඳහා භාවිත කරන ඉන්ධන වෙත ප්‍රමිතීන් බලාත්මක කිරීම. | | | VET වැඩසටහන යටතේ ඇති රජයට අයත් වාහන සංඛ්‍යාව. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 8. ඕසෝන් ස්ථරය ක්ෂයවීමට තුඩු දෙන ද්‍රව්‍ය ක්‍රමානුකූලව අඩුකිරීම සහ ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීම සඳහා පරිසර හිතකාමී තාක්ෂණය යොදා ගැනීම. | 8.1. ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ වියානා සම්මුතිය හා මොන්ට්‍රියල් ප්‍රතිපත්ති සහ වගකීම් ක්‍රියාත්මක කිරීම. | 8.1.1. ඉතිරිව ඇති ODS ඉවත් කිරීම සඳහා පියවර ගැනීම. | SLC, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, DIEC සහයෝගය ද සහිතව සමස්ත අධීක්ෂණය NOU වෙතිනි | කෙටි/දීර්ඝ කාලීන | 2020 වසර වන විට 35% පමණ අඩුවීම.<br>ODSS 96 ක් අතුරින් ශ්‍රී ලංකාව ODS 56 ක් තහනම් කර තිබේ.<br>ඉතිරි 35% HCFCS සහ ඒවායේ මුසුවන් 2020 වන විට ක්‍රමානුකූලව ඉවත් කරනු ඇත.<br>2030 වන විට සම්පූර්ණයෙන් තහනම් කරනු ඇත.<br>ශ්‍රී ලංකා රේගුවේ ආනයනික දත්ත.<br>ආයෝජන මණ්ඩලයේ නිෂ්පාදිත දත්ත. |
| | | 8.1.2. ශීතකරණ හා වායු සමීකරණ සේවා අංශයට නව ඕසෝන් හිතකාමී හා අඩු ගෝලීය උණුසුම් කාරක (GWP) රසායනික ද්‍රව්‍ය හඳුන්වාදීම. | NOU | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ගෝලීය උණුසුම් කාරක ආනයනික ODS ද්‍රව්‍ය අඩු කළ ප්‍රතිශතය.<br>තාක්ෂණික ශිල්පීන් පුහුණු කළ ප්‍රමාණය. |
| | | 8.1.3. සියලු කාර්මික විද්‍යාල සහ වෘත්තිය පුහුණු ආයතනවල සිසුන්ට උපදෙස් / මාර්ගෝපදේශ සඳහා ඕසෝන් හිතකාමී යහපත් තාක්ෂණික පුරුදු ඇතුළත් කරමින් තාක්ෂණික විෂය සංශෝධනය. | VAT, TC, NYSC පුහුණු මධ්‍යස්ථාන, NAITA පුහුණු මධ්‍යස්ථාන සහ පුද්ගලික අංශයේ තාක්ෂණික අධ්‍යාපන ආයතන | දිගු කාලීන | සංශෝධිත තාක්ෂණික විෂය නිර්දේශය. |
| | | 8.1.4. වායුසමීකරණ හා ශීතකරණ සේවා මධ්‍යස්ථාන සඳහා නව නීති (ආපසු ගැනීම්, ප්‍රතිචක්‍රීකරණය, නැවත ලබාගැනීමේ තාක්ෂණික ක්‍රම) හඳුන්වාදීම. | NOU | දිගු කාලීන | ගැසට් නිවේදනය නිකුත් කර කැබිනට් අනුමැතිය ලබා ගැනීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 8.1.5. පරිසර සංවේදී විෂය කරුණු ඇතුළත් කරමින්, 6 - 12 ශ්‍රේණි දක්වා විද්‍යා අධ්‍යාපන විෂය නිර්දේශය සංශෝධනය කිරීම. | MOE සහ NIE සමග සහයෝගිත්වයෙන් NOU | කෙටි කාලීන | පුහුණුකරුවන් 450 ක් පුහුණු කිරීම. (විද්‍යා විෂය අධ්‍යක්ෂකවරුන්, සේවයේ නියුතු උපදේශකවරුන්, තෝරා ගත් විද්‍යා ගුරුවරුන්) |
| | | 8.1.6. කලින් කලට, ඕසෝන් ස්ථරයෙන් ක්ෂය වන ද්‍රව්‍ය ලේඛනගත කිරීම සහ ප්‍රසිද්ධ කිරීම. | NOU | වාර්ෂික | ODS ආශ්‍රිත දත්ත ඇතුළත් ලේඛන. |
| 9. ඛණිජ සම්පත්. | 9.1. තිරසාර ඛනිජ සම්පත් භාවිතය සහතික කිරීම සහ ප්‍රවර්ධනය. | 9.1.1. ඛනිජ සම්පත්, සංරක්ෂණය හා තිරසාර භාවිතය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම. | MHC, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | කෙටි/මධ්‍ය කාලීන | තිරසර ඛනිජ සම්පත් භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිය සැකසීම. |
| | | 9.1.2. විවිධ භූගෝලීය ප්‍රදේශයන්හි පවත්නා විවිධ ඛනිජ නිස්සාරණය කිරීම නිසා ඇතිවන බලපෑම් අවබෝධ කර ගැනීමට විද්‍යාත්මක ඇගයීමක් සිදුකිරීම. | | | අවසන් කළ තක්සේරුව. |
| | | 9.1.3. කැනීම සඳහා හඳුනාගත් කලාප විධිමත් කිරීමට සහ ලේඛනගත කිරීමට පියවර ගැනීම. | | | රෙගුලාසි ප්‍රකාශ කිරීම. |
| 10. තිරසර ඉඩම් කළමනාක-රණයග | 10.1. ඉඩම් හායනය අවම කිරීම සහතික කිරීම. | 10.1.1. ජාතික ඉඩම් භාවිත පනත පිළිබඳ කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | LUPPD, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | කෙටි/මධ්‍ය කාලීන | ජාතික ඉඩම් භාවිත කිරීමේ පනත කෙටුම්පත සම්පූර්ණ කිරීම. |
| 11. තිරසාර ලෙස දේශීය ස්වභාවික සම්පත් පදනම කළමනාක-රණයග | 11.1. පාරිසරික තක්සේරු කරණය සහ කළමනාකරණය හරහා තිරසාර ලෙස ස්වභාවික සම්පත් යොදාගැනීම. | 11.1.1. සංවර්ධන ව්‍යාපෘති සඳහා EIA/IEE ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | EIA හා IEE සඳහා අනුකූල ප්‍රතිශතය.<br>වාර්තා කරන ලද සහ විසඳුම් ලබා දී ඇති EIA හා IEE සඳහා අනුකූල නොවන ප්‍රමාණය. |
| | | 11.1.2. EIA ක්‍රියාවලිය සුමට ක්‍රියාකාරීත්වය සඳහා දැනට පවත්නා නීති රෙගුලාසි හා ක්‍රියාපටිපාටි ක්‍රමවත් කිරීම සහ වැඩිදියුණු කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි කාලීන | සංශෝධිත රෙගුලාසි. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 11.1.3. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් හඳුන්වාදීම (SEA) සඳහා හා SEA ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික පාරිසරික පනත (NEA) සංශෝධනය | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි / දීර්ඝ කාලීන | NEA සංශෝධනය හා ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන්වලට SEA අදාළ කිරීම. |
| | | 11.1.4. පරිසර පද්ධති හඳුනාගැනීම, කළමනාකරණය සහ සංරක්ෂණය. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ප්‍රකාශිත නව පරිසර ආරක්ෂිත කලාප (EPA) විවෘත කළ ප්‍රමාණය. |
| | | 11.1.5. තිරසාර ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා කොටස්කරුවන් අතර සම්බන්ධීකරණය. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | යාවත්කාලීන කළ සැලසුම් ක්‍රියාවලියක් වෙනුවෙන් මාර්ගෝපදේශන පොතක් / මාර්ගෝපදේශ අත්පත්‍රිකා / අත්පොත් ඒකාබද්ධ පාරිසරික ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම හා පිළිගත් ප්‍රතිපත්ති ප්‍රමාණය. |
| | | 11.1.6. නියාමන ප්‍රමිතීන් දැඩිව ක්‍රියාත්මක කිරීම හරහා, ගංගා ද්‍රෝණි, ගංගාවල පෝෂක ප්‍රදේශ හා ගංගා මෙන්ම අභ්‍යන්තර ජලාශ වෙතට කාර්මික හා ගෘහාශ්‍රිත බැහැර කිරීම් පාලනයද ඇතුළු ව ගංගා, ජලාශ සංරක්ෂණය හා කළමනාකරණය. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ජලපෝෂක ප්‍රදේශ හා ගංගා ද්‍රෝණි සංරක්ෂණය හා කළමනාකරණය කළ ප්‍රමාණය. |
| | | 11.1.7. පළාත් පාලන ආයතන මගින් එකතු කරන ඝණ අපද්‍රව්‍ය තෙත් බිම්වලට සහ අනෙකුත් පාරිසරික අධි සංවේදී ප්‍රදේශ කරා බැහැර කිරීම තහනම් කිරීම නියාමනය. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | අනුමත රෙගුලාසි ගණන. |
| | | 11.1.8. තෙත් බිම් සංරක්ෂණය හා වැදගත් තෙත් බිම් හඳුනාගැනීමෙන් ඒවා ආරක්ෂිත ව තැබීම. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | සංරක්ෂණය කිරීමට හඳුනාගත් තෙත් බිම් ප්‍රමාණය. |
| | | 11.1.9. පාරිසරික සැලසුම් කිරීම, කළමනාකරණය, ඇගයීම, අධීක්ෂණය හා එවැනි තොරතුරු ව්‍යාප්ත කරලීම සඳහා භූගෝලීය - තොරතුරු දත්ත සැකසීමේ විද්‍යාත්මක ක්‍රම භාවිතය. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | යාවත්කාලීන කරන ලද දත්ත / දිස්ත්‍රික්ක 24 ක විස්තර / දිස්ත්‍රික්ක 5 ක අධි සංවේදී ප්‍රදේශ / අන්තර්ජාලය හරහා ලබාගත් සම්පූර්ණ GIS. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 12. ජලය සහ පාරිසරික තත්ත්ව ආරක්ෂණය, පවත්වාගෙන යාම හා වැඩි දියුණු කිරීම. | 12.1. පාරිසරික තත්ත්ව පවත්වාගෙන යාම සහ වර්ධනය. | 12.1.1. ජාතික පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලතාව සහතික කරමින් කර්මාන්ත ඵලදායි ලෙස අධීක්ෂණය. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | කර්මාන්ත අධීක්ෂණ වාර ගණන/ ප්‍රමිතීන් කරා ළං වීමට වැඩි දියුණු කළ ආයතන ප්‍රතිශතයක් ලෙස / වැඩි දියුණු කළ පාරිසරික පරිසාධන මට්ටම. |
| | | 12.1.2. සංශෝධනය / පරිමණ්ඩිත ජලය හා බර පදනම් වූ බලපත්‍ර රෙගුලාසි හඳුන්වාදීම / රසායනික ද්‍රව්‍ය කළමනාකාරීත්වය / ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය / අධිවේගී මාර්ග සහ ප්‍රජා ශබ්ද / කම්පන ප්‍රමිතීන් / කර්මාන්ත විපරම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි / දීර්ඝ කාලීන | NEA M ප්‍රතිපාදන හා ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි සංශෝධනය. |
| | 12.2. සෑම ගෘහස්ත ඒකකයකට ම පිරිසිදු පානීය ජලය ලබාදීම. | 12.2.1. ජීවත්වන කලාපයේ ජල මූලාශ්‍රවලින් දිවයිනේ නල ජල පද්ධතිය පුළුල් කිරීම. | ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය<br>පළාත් සභා | කෙටිකාලීන / 2025 | නල ජලය සහිත නිවාස ප්‍රතිශතයක් ලෙස. |
| | | 12.2.2. ජනගහනය අවමව විසිරී පවතින ප්‍රදේශවල නිවාසයන්හි දෛනික අවශ්‍යතා සපුරාලීම සඳහා මූලාශ්‍ර ක්ෂය වීම වැළැක්වෙන ලෙස භූගත ජලය භාවිතය. | | | |
| | | 12.2.3. සුදුසු නීති පනත් හරහා කෘෂි වාණිජ අරමුණු සඳහා භූගත ජල යොදා ගැනීම පාලනය. | ජල සම්පත් මණ්ඩලය / මධ්‍යම පරිසර අධිකාරිය | මධ්‍ය / දිගු කාලීන | නව නීති අනුමත කිරීම. |
| | | 12.2.4. ජල මූලාශ්‍ර අඩු ප්‍රදේශවල වැසි ජලය ආශ්‍රය කරගත් කෘෂිකාර්මික ක්‍රම හඳුන්වා දීම. | පළාත් මට්ටමෙන් පළාත් සභා | දිගු කාලීන / 2023 | සපයන ලද නිවාස සංඛ්‍යාව. |
| | | 12.2.5. කරදිය හෝ මිරිදිය ජලය භාවිත කර පානීය ජලය ලබා ගැනීමට අඩු වියදම් සූර්ය බල පෙරීමේ ඒකක ස්ථාපනය. | පළාත් සභා | මධ්‍ය කාලීන | සවි කරන ලද ඒකක ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 12.2.6. ග්‍රාමීය ප්‍රදේශවල පානීය ජලය ලබාගැනීමට සූර්ය පැනල හෝ සුළං බලයෙන් ක්‍රියාත්මක ගැඹුරු ජල පොම්ප ස්ථාපනය. | පුද්ගල මට්ටමෙන් | දිගු කාලීන | සවිකරන ලද ඒකක ගණන. |
| | 12.3. ජල මාර්ගයන්ට සහ පොළවට සෑම අයුරකින්ම පිරිසිදු නොකරන ලද අපද්‍රව්‍ය මුදා හැරීම තහනම් කිරීම. | 12.3.1. කර්මාන්ත විසින් පිරිසිදු නොකරන ලද අපද්‍රව්‍ය ජලාශ වෙත මුදා හැරීම වැළැක්වීමට නීති රෙගුලාසි ගෙන ඒම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | ගොනුකළ නඩු ගණන.<br>කර්මාන්තායතනවලින් සිදු කළ පැමිණිලි ගණන. |
| | | 12.3.2. පරිසයට දූෂිත ජලය බැහැර කිරීම අවම කිරීම සඳහා අපද්‍රව්‍ය බැහැරලීමේ ස්ථාන ස්ථාපනය කිරීමට කර්මාන්තායතන පෙළඹවීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | ගොනුකළ නඩු ගණන.<br>කර්මාන්තායතනවලින් සිදු කළ පැමිණිලි ගණන.<br>රෙගුලාසි ගණන. |
| | | 12.3.3. ජලාශ ආසන්නයේ කර්මාන්ත ඉදිකිරීම් සීමා කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය<br>ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | දිගු කාලීන | ගනු ලැබූ පියවර. |
| | | 12.3.4. පරිසරයට හානිකර නොවන අයුරින් අපවිත්‍ර ජලය පිරිසිදු කරන ස්ථානයන් හි යාන්ත්‍රික ද්‍රවමය අපද්‍රව්‍ය බැහැර කිරීමට මාර්ගෝපදේශ හඳුන්වා දීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | ස්ථාපිත මාර්ගෝපදේශ. |
| | | 12.3.5. අන්තරායකාරී අපද්‍රව්‍ය ජනනය කරන කර්මාන්ත ආශ්‍රිත ව ඇති භූගත ජලයේ ගුණාත්මක භාවය අධීක්ෂණය කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | යොදාගත් යාන්ත්‍රණ. |
| | | 12.3.6. උචිත නීති සම්පාදනය හරහා ජල භාවිතය අවමකිරීමේ ක්‍රමවේද හා පරිසරය අපවිත්‍ර නොකරමින් සිදු කළ හැකි තාක්ෂණික භාවිතයන් කරා යොමු වන ලෙස කර්මාන්තවලට පෙළඹවීම. | මධ්‍යම පරිසර අධිකාරිය<br>පිරිසිදු තාක්ෂණ මධ්‍යස්ථාන | දිගු කාලීන | ජල භාවිතය අවමකිරීමේ ක්‍රමවේද යොදා ගත් කර්මාන්ත ගණන. |
| | | 12.3.7. අපද්‍රව්‍ය පිරිසිදු කිරීමේ පහසුකම් ඇති කිරීම / පවත්නා කාර්මික වතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පිහිටුවීම සහ පුද්ගලික කර්මාන්තවලට පහසුකම් භාවිතයට පෙළඹවීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | ස්ථාපිත අපවිත්‍ර ජලය පිරිසිදු කිරීමේ පහසුකම් ප්‍රමාණය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 13. පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය වෙත පොදු ජනතාවගේ සහ අනෙකුත් පාර්ශ්ව කරුවන්ගේ ආකල්ප සහ චර්යාත්මක රටාව වෙනස් කිරීම. | 13.1. වැඩිදියුණු කරන ලද දැනුම හා තොරතුරු බෙදාහැරීම හරහා පරිසරය පිළිබඳ ජනතාව හා පාර්ශ්වකරුවන් තුළ හැඟීමක් ඇති කරවීම හා අවධානය යොමු කරවීම. | 13.1.1. සියලු වයස්වල දරුවන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් සියලු කොටස්කරුවන් අතර පරිසර අධ්‍යාපනය ප්‍රවර්ධනය හා දැනුවත් කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | පවත්වනු ලැබූ වැඩසටහන් ප්‍රමාණය. |
| | | 13.1.2. දිවයිනේ සියලුම පාසල් ඇතුළත් කිරීමට, පවත්නා පාසැල් නියමු වැඩසටහන් ශක්තිමත් කිරීම. | | | |
| | | 13.1.3. ඵලදායි තොරතුරු බෙදාහැරීමේ පද්ධතියක් පවත්වාගෙන යාම. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | බෙදාහරින ලද පාරිසරික තොරතුරු. |
| 14. ශ්‍රී ලංකාව තුළ කාර්යක්ෂම අපද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය කළමනාකාරීත්වය තහවුරු කිරීම. | 14.1. නගර සහා ඝණ අපද්‍රව්‍ය, අන්තරායකර අපද්‍රව්‍ය සහ රසායනික අපද්‍රව්‍ය කළමනාකරණය තුළින් පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් බිහි කිරීම. | 14.1.1. පළාත් පාලන ආයතන සඳහා තාක්ෂණික සහ මූල්‍ය ආධාර සැපයීම හරහා, මහනගර සහා ඝණ අපද්‍රව්‍ය ඵලදායි ලෙස කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ක්‍රියාත්මක කරන ලද ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ගණන. |
| | | 14.1.2. රසායන ද්‍රව්‍යයන්හි ප්‍රශස්ථ භාවිතය හරහා රසායනික උපද්‍රවවලින් තොර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා රසායනික ද්‍රව්‍ය ජීවන චක්‍ර කළමනාකරණය. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි / දීර්ඝ කාලීන | ජාතික රසායනික කළමනාකරණ සැලසුම පිළියෙල කර සහ ක්‍රියාත්මක කර ඇත. |
| | | 14.1.3. ශ්‍රී ලකාවේ කාර්මික රසායනික ද්‍රව්‍ය ආනයනය, භාවිතය සහ බැහැර කිරීම සඳහා නියාමන ක්‍රමයක් හඳුන්වා දීම සහ අන්තරායකාරී කාර්මික රසායනික භාවිතය තහනම් කිරීම / හෝ සීමා කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි / දීර්ඝ කාලීන | නියාමන ක්‍රමයක් හඳුන්වාදීම. |
| | | 14.1.4. ගිවිසුම්, නීති පද්ධතීන් සහ සම්මුති මගින් නියමකර ඇති පරිදි උචිත ප්‍රතිපත්ති, වැඩසටහන් යොදා ගැනීම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි කාලීන / 2019 දක්වා | කරන ලද ක්‍රියාකාරකම් ප්‍රමාණය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 15. පාරිසරික සුරක්ෂිත භාවය පවත්වා ගෙන යමින් අපද්‍රව්‍යය කළමනාකරණය සහතික කිරීම. | | 15.1.1. පවත්නා ඝන අපද්‍රව්‍ය කොම්පෝස්ට් හා බලශක්ති ඇතුළු ප්‍රයෝජනවත් නිෂ්පාදන බවට හැරවීම. | පළාත් සභා සහ පළාත් පාලන ආයතන | දිගු කාලීන | ජනනය කළ බලශක්ති ප්‍රමාණය හා නිපද වූ කොම්පෝස්ට් පරිමාණය.<br>ක්‍රියාත්මක කරන ලද කොම්පෝස්ට් හා අපද්‍රව්‍ය මතින් බලශක්ති නිර්මාපක කර්මාන්තශාලා ප්‍රමාණය. |
| | | 15.1.2. ගෘහස්ථ මට්ටමින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සහ වෙන් කිරීමට. | | කෙටි කාලීන | ගනු ලැබූ පියවර. |
| | | 15.1.3. ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා කාබනික අපද්‍රව්‍යයන්ට අමතර ව තෝරා වෙන් කරන ලද ඝණ අපද්‍රව්‍ය පමණක් මහ නගරසභා ට්‍රක් රථ හරහා එකතු කිරීමට කටයුතු සම්පාදනය කිරීම. | | කෙටි කාලීන | ගනු ලැබූ පියවර. |
| | | 15.1.4. විශාල කර්මාන්ත, හෝටල්, මහල් නිවාස හා නිවාස සංකීර්ණවලට සිය අපවහන පද්ධති ක්‍රියාත්මක කිරීමට බල කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | ගනු ලැබූ පියවර. |
| | | 15.1.5. සායනික අපද්‍රව්‍යයන්ද ඇතුළුව හානිකර අපද්‍රව්‍ය බැහැර කිරීම හැසිරවීමේදී විශේෂ විධිවිධාන ක්‍රියාත්මක කිරීම. | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | සංශෝධිත NEA. |
| | | 15.1.6. NEA යටතේ, අන්තරායකර අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසිවලට අදාළ විධිවිධාන බලාත්මක කිරීම දැඩි කිරීම. | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය | දිගු කාලීන | SWML ගණන / ගොනුකළ නඩු ගණන. |
| | | 15.1.7. රට වෙනුවෙන් ඒකාබද්ධ අන්තරායකාරී අපද්‍රව්‍ය පිරිපහදු හා බැහැර කිරීමේ පහසුකම් ස්ථාපිත කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව | ස්ථාපිත අවසාන බැහැර කිරීමේ පහසුකම. |
| | | 15.1.8. බාසල් සම්මුතියෙහි ඇතුළත් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ කිසිදු තත්වයක් යටතේ වෙනත් රටවල ජනනය වන අන්තරායකාරී අපද්‍රව්‍ය ශ්‍රී ලංකාව වෙත ළඟාවීම වැළැක්වීම වගබලා ගැනීමට සහතික කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | කෙටි කාලීන | නිකුත් කළ එකඟතා ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 16. මුහුදුබඩ කලාපය හා කලාපීය සම්පත් තිරසාර ලෙස සංරක්ෂණය සහ කළමනාකරණය. | 16.1. අපද්‍රව්‍ය බැහැර කිරීමේ හා ජල දූෂණය කළමනාකරණය තුළින් පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න වෙරළ පරිසරයක් සංවර්ධනය කිරීම. | 16.1.1. ශ්‍රී ලංකාව තුළ තෝරාගත් සංචාරක කලාප 6 ක් තුළ වෙරළබඩ ජල තත්ත්ව පරීක්ෂා කිරීමේ නියමු වැඩසටහනක් පැවැත්වීම. | CC & CRMD | කෙටි කාලීන | ආවරණය කළ ප්‍රදේශ ගණන. |
| | 16.2. දේශ සීමා ආශ්‍රිත පාරිසරික ගැටළු අවම කිරීම. | 16.2.1. පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සමගාමීව වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | මධ්‍ය කාලීන | පවත්වන ලද වැඩසටහන ගණන.<br>ආවරණය කළ වෙරළ ප්‍රදේශ ප්‍රතිශතය. |
| | 16.3. විනාශ වූ පරිසර පද්ධති පුනරුත්ථාපනය. | 16.3.1. භාවිතයෙන් ඇත් වූ / ඛාදනයට ලක්වූ වෙරළබඩ ප්‍රදේශවලට කෘතිම වැලි පෝෂණ ක්‍රම සැපයීම සහ නිරිතදිග සහ දකුණු වෙරළ තීරයේ ස්ථාවර වෙරළතීරයන් ඛාදනය වන්නේදැයි අධීක්ෂණය කරමින් වරින් වර කෘතිම වැලි පෝෂණ ක්‍රම සැපයීම. | | දිගු කාලීන | කෘතිම ලෙස සැකසූ කි.මී. 10 වූ වෙරළ තීරය. |
| | | 16.3.2. හරිත වෙරළ තීරය පිහිටුවීම. | | දිගු කාලීන | හරිත වෙරළ තීරය පිහිටුවීම. (ඉලක්කය කි.මී. 35) |
| | | 16.3.3. වෙරළ ඛාදනය තීව්‍ර කරන සහ වෙරළ පරිසර පද්ධතිය පහත හෙලන සාධක හඳුනා ගැනීම සහ පවත්නා රෙගුලාසි හා ප්‍රතිපත්තීන්හි ඇතුළත් ක්‍රියාමාර්ග සුසංයෝජනය කිරීම. | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
| --- | --- | --- | --- | --- | --- |
| 17. ආපදා තත්ත්වයන් කළමනාකරණය හරහා වෙරළබඩ ජනතාවට ආරක්ෂිත වෙරළබඩ පරිසරයක් නිර්මාණය කිරීම. | 17.1. වෙරළබඩ ජනතාවට වඩා යහපත් ජීවන තත්ත්වයක් හා ආරක්ෂාවක් සහතික කිරීම. | 17.1.1. අනතුරුදායක, අවදානම් සහ අනාරක්ෂිත තත්ත්ව සිතියම් ගත කිරීම. | CC & CRMD, DMC | දිගු කාලීන | පිළියෙල කර ඇති තෙවැදෑරුම් සිතියම්. |
| | 17.2. ආපදාවන්හිදී භූමිය විනාශවීම වැළැක්වීම සඳහා ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන්වලට අනුගත වීම. | 17.2.1. මුහුදු මට්ටම් ඉහළ යාමේ බලපෑම මත වෙරළ අවදානම් තක්සේරුකරණයට පර්යේෂණ ව්‍යාපෘති සැකසීම. | | මධ්‍ය කාලීන | ප්‍රකාශිත පර්යේෂණ සොයාගැනීම්. |
| 18. ශ්‍රී ලංකාවේ සුපිරිසිදු සමුද්‍රිය පරිසරයක් / මුහුදු තීරයක් නිර්මාණය කිරීම. | 18.1. ශ්‍රී ලංකා මුහුදු තීරයේ සහ වෙරළබඩ මාර්ග යේ සමුද්‍ර දූෂණය අවම කිරීම. | 18.1.1. දූෂණයෙන් තොර සමුද්‍රිය පරිසරයක් උදෙසා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම. | MEPA, DMS, CC&CRMD, මධ්‍යම පරිසර අධිකාරිය, අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන කොටස්කරුවන් | දිගු කාලීන | ශ්‍රී ලංකා මුහුදු තීරයේ සහ වෙරළබඩ මාර්ගයේ දූෂණයෙන් තොර සමුද්‍රිය පරිසරයක් හා වායුගෝලයක් සඳහා සංවර්ධිත ක්‍රියාකාරී සැලසුමක් සැකසීම. |
| | 18.2. දූෂණයෙන් තොර සමුද්‍රීය පරිසරයක් පවත්වාගෙන යාම. | 18.2.1. ජාත්‍යන්තර සමුද්‍රිත සංවිධානයේ (IMO) වායු දූෂණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ MARPOL ඇමුණුම VI සහිත සම්මුතිය අත්සන් කිරීම. | MEPA, DMS, CC&CRMD, මධ්‍යම පරිසර අධිකාරිය, අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන කොටස්කරුවන් | දිගු කාලීන/ 2022 දක්වා | IMO MARPOL ඇමුණුම VI ක්‍රියාත්මක කරන රාජ්‍යයක් බවට පත් කිරීම. |
| | | 18.2.2. සංවර්ධන කටයුතු සඳහා මුහුදු බඩ ප්‍රදේශ අල්ලා ගැනීම වැළැක්වීමට නීති රෙගුලාසි ශක්තිමත් කිරීම. | වෙරළ සංරක්ෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2024 | ප්‍රසර්පන ක්‍රියාවලියට නව රෙගුලාසි නොමැතිකම.<br>වෙරළ සම්පත් මෙහෙයුම් සැලැස්ම යාවත්කාලීන කිරීම. |
| | | 18.2.3. වෙරළබඩ කලාපයීය ගතික ස්වභාවයන් අධ්‍යයනය කර වෙරළ ඛාදනය අවම කිරීම සඳහා පියවර ක්‍රියාත්මක කිරීම. | | | අධ්‍යයන පැවැත්වීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 18.2.4. මුහුදු වෙරළෙහි පාරිසරික සමතුලිතතාවට හානිකර වැලි හා පතල් කැනීම වැළැක්වීම සඳහා නීති රෙගුලාසි ශක්තිමත් කිරීම. | | | අධිකරණය විසින් ලබාදුන් දඩුවම් ප්‍රමාණය. |
| | | 18.2.5. හෝටල් කර්මාන්තය හා පොදු ජනතාව විසින් සිදු කරන මුහුදු වෙරළ දූෂණය කිරීම වැළැක්වීම සඳහා නියාමන ක්‍රියාත්මක කිරීම. | | | ගනුලැබූ පියවර. |
| | | 18.2.6. ආර්ථික ප්‍රතිලාභ අත්කර ගැනීමේ අරමුණින් අභ්‍යන්තරික මුහුදුබඩ හා අක්වෙරළ ධීවර කර්මාන්තය ලෙස සංවර්ධනය. | | | ගනුලැබූ පියවර. |
| 19. හානිකර සාගර ආක්‍රමණික විශේෂයන් ගෙන් ශ්‍රී ලංකා මුහුද ආරක්ෂා කිරීම. | 19.1. ශ්‍රී ලංකා මුහුදු සීමාවට ඇතුළුවන නැව්වල ස්ථායිතාව ආරක්ෂා කිරීමට පවත්නා පිරවුම් ද්‍රව්‍ය ලවණ ජලය හා මුසුවීම නිසාවෙන් මුහුදු තීරයේ ඇතිවන අහිතකර බලපෑම අඩු කිරීම. | 19.1.1. නැව්වල ස්ථායිතාව ආරක්ෂා කිරීමට පවත්නා පිරවුම් ද්‍රව්‍ය සහිත ජලය කළමනාකරණය හා එය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ IMO හි ජාත්‍යන්තර සම්මුතිය අත්සන් තැබීම. | MEPA, DMS | දිගුකාලීන / 2022 දක්වා | IMO - නැව්වල ස්ථායිතාව ආරක්ෂා කිරීමට පවත්නා පිරවුම් ද්‍රව්‍ය සහිත ජලය කළමනාකරණ සම්මුතියට අයත් රාජ්‍යයක් බවට පත්වීම. |
| 20. ශ්‍රී ලංකාව තුළ භූ අන්තරායකාරී ක්‍රියාකාරකම් අවම කිරීම. | 20.1. භූ අන්තරායකාරී සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ රටේ භූ විද්‍යාත්මක දැනුම ප්‍රශස්ත ලෙස වර්ධනය කිරීම. | 20.1.1. පළාත් ඛනිජ සමීක්ෂණ සහ නියැදි සංශෝධන සිදුකිරීම. | GSMB | කෙටි / දීර්ඝ කාලීන | සිතියම් මුද්‍රණය. |
| | | 20.1.2. නියැදි විශ්ලේෂණය | | | |
| | | 20.1.3. එක් සිතියමක් විශ්ලේෂණ කොට මුද්‍රණය කිරීම | | | |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 21. තිරසර ඛනිජ සම්පත් භාවිතය. | 21.1. නීති විරෝධීව හා ඛනිජ ලවණ උපරිම සූරාකෑම අවම කිරීම. | 21.1.1. බලාත්මක කිරීමේ ඒකකයක් පිහිටුවීම. | භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය<br>DOP | කෙටි / දීර්ඝ කාලීන | ඒකකය ස්ථාපිත කිරීම. |
| | | 21.1.2. පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය. | | | පනත සංශෝධනය. |
| | | 21.1.3. පතල් ඉන්ජිනේරුවරුන් සඳහා මාර්ගෝපදේශන හා අත්පොත සකස් කිරීම. | | | මාර්ගෝපදේශන හා අත්පොත සකස් කර මුද්‍රණය කිරීම. |
| 22. ශ්‍රී ලංකාව තුළ වඩා සාර්ථක ඛනිජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම. | 22.1. අගය මත පනවන ලද බදු ඇතුළත් ඛණිජ නිෂ්පාදන අපනයනය වැඩි කිරීම. | 22.1.1. අදාළ රාජ්‍ය නියෝජිතායතන සමග සාකච්ඡා පැවැත්වීම. | භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය<br>MST<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කෙටි / දීර්ඝ කාලීන | කැබිනට් අනුමැතිය ලත් ඛනිජ ලවණ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කිරීම. |
| | 22.2. ලොව පිළිගත් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම. | 22.2.1. මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති සංශෝධන සකස් කිරීම. | භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය<br>MST<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | කෙටි / දීර්ඝ කාලීන | සකස් කරන ලද මාර්ගෝපදේශ. |
| | | 22.2.2. ජෛව විවිධත්වයට අවම හානි ගෙන දෙන, ජනාවාස අහිමිවීම, වෙරළ ඛාදනය, සහ ජල චක්‍රය අඩුවීම යන කරුණු වෙත අවම බලපෑම සහතික කිරීමට තක්සේරුවක් ගොඩනගා ගනිමින් කැනීම් නොකළ යුතු ප්‍රදේශ හඳුනාගැනීමට පියවර ගැනීම. | | | ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 23. තිරසර මැණික් සම්පත් භාවිතය. | 23.1. මැණික් කර්මාන්තය මත යැපෙන ප්‍රජාවන්ට ප්‍රතිලාභ ලබාදෙමින් ජාතික ආර්ථිකයට දායකත්වය සැපයීම. | 23.1.1. නීති විරෝධී මැණික් පතල් වැටලීම. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | කෙටි කාලීන / අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ජාතික ආර්ථිකයට දායකත්වය සැපයීම. |
| | | 23.1.2. මැණික් පතල් කැණීම හේතුවෙන් හානියට පත්වන ප්‍රදේශ නැවත නගා සිටුවීම. | | මධ්‍ය / දිගු කාලීන / අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | මැණික් හැරීමෙන් පසු නැවත නගා සිට වූ ප්‍රදේශ ප්‍රමාණය. |
| | | 23.1.3. මැණික් පතල් කැණීම නිසා වාර්තා වී ඇති මරණ සහ තුවාල වීම් වලට වන්දි ලබාදීම. | | මධ්‍ය / දිගු කාලීන/ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | වන්දි ලබාදීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වේ. |
| | | 23.1.4. මැණික් සහිත ඉඩම් හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් සිදු කිරීම. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය<br>සබරගමුව විශ්වවිද්‍යාලය | කෙටි / දීර්ඝ කාලීන | මැණික් සහිත ඉඩම්වල සිතියම. |
| | | 23.1.5. මැණික් නීති විරෝධී අපනයනය වැලැක්වීමට මැණික් පතල්කරුවන් ආදායම් බදුවලින් නිදහස් කිරීම සහ අපනයනකරුවන්ට සහන ලබාදීම. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය<br>මුදල් අමාත්‍යාංශය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | රාජ්‍ය බදු ආදායම වැඩි කරලීම. |
| 24. සියලුදෙනා සඳහා ප්‍රමාණවත් පෝෂණ ගුණාංග සහිතව, අවශ්‍ය වන්නා වූ ආහාර සුරක්ෂිතව ලබාගැනීම සහතික කිරීම. | 24.1. මිනිසුන්ට අලෙවි කරන අමු ආහාර ද්‍රව්‍ය විෂ රහිතව, අදාළ ප්‍රමිතීන්ට යටත් බව සහතික කිරීම. | 24.1.1. ආහිර ආශ්‍රිත ව පැවතිය හැකි උපරිම රසායනික ද්‍රව්‍ය සඳහා ප්‍රමිතීන් ස්ථාපනය | පළාත් සභා/පළාත් පාලන ආයතන<br>සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | කෙටි / දීර්ඝ කාලීන | රසායනික ද්‍රව්‍ය අඩංගු වූ ආහාර ද්‍රව්‍ය නොමැති වීම. |
| | | 24.1.2. නිතිපතා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා ආහාර ද්‍රව්‍ය අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. | | | නඩු පැවරූ ප්‍රමාණය. |
| | 24.2. සියලු පිසින ලද ආහාර අලෙවි සැල් සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන යාම. | 24.2.1. පරීක්ෂණ වාර ගණන හා අධිකරණයේ නඩු පැවරීම් වැඩි දියුණු කිරීම. | | | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය. |
| | | 24.2.2. පරීක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම හා පරීක්ෂා කිරීමේ වාර ගණන හා පරීක්ෂා කරන සාම්පල සංඛ්‍යාව වැඩි කිරීම. | | | ඉලක්කගත කණ්ඩායම මගින් විසුරුවා හරින ලද / ප්‍රදේශ.<br>ගනුලැබූ පියවර. |
| | | 24.2.3 ප්‍රමිතීන්ට අනුකූල ආහාර ද්‍රව්‍ය පමණක් මෙරටට ආනයනය කෙරෙන බව තහවුරු කිරීම. | | | පවත්වන ලද වැඩසටහන් ප්‍රමාණය. |
| | | 24.2.4. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | | පරීක්ෂා කළ සාම්පල. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 25. වන සත්ව හා වෘක්ෂලතා විශේෂ තුළ වාසස්ථාන සංරක්ෂණයක්, සත්ව විවිධත්වයක් හා ජාන විවිධත්වයක් සහතික කිරීම. | 25.1. ස්වභාවික රක්ෂිතයන් පවත්වාගෙන යාමේදී අවශ්‍ය ආයතනික සහ නීතිමය රාමුව ශක්තිමත් කිරීම. | 25.1.1. වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත (FFPO) සංශෝධනය කිරීම.<br>යටිතල පහසුකම් (වාහන, සන්නිවේදන, ආදී) වැඩි දියුණු කිරීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | නව සංශෝධන. |
| | 25.2. දේශීය භෝග සහ සත්ත්ව විශේෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ රෙගුලාසි බලාත්මක කිරීම. | 25.2.1. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>25.2.2. නීති විරෝධී කටයුතු පිළිබඳ දිවයින පුරා වැටලීම් සිදුකිරීම. | තිරසාර සංවර්ධනය හා වනජීවී අමාත්‍යාංශය. | කෙටි කාලීන | වාහන සහ උපකරණ ප්‍රමාණය. |
| | 25.3. සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් වනජීවී වාසස්ථාන මත අහිතකර බලපෑම් මැඩපැවැත්වීම සහ ගැටුම් අවම කරගැනීම. | 25.3.1. EIA නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ක්‍රියාත්මක කළ වැඩසටහන් හා වැටලීම් ප්‍රමාණය. |
| | 25.4. ආර්ථික ප්‍රතිලාභ ගෙන ඒමට තිරසාර දේශීය ස්වභාවික සම්පත් භාවිතය. | 25.4.1. W.L. PAS වෙතින් දේශීය ස්වභාවික සම්පත් යොදාගැනීම සඳහා FFPO හි අන්තර්ගත විධිවිධාන. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ක්‍රියාත්මක කළ නිර්දේශ ප්‍රමාණය. |
| | 25.5. දේශිය ශාක විශේෂයන්ට තර්ජනයක් කළ හැකි ජීව විද්‍යාත්මක විශේෂයන් ආනයනය නියාමනය කිරීම. | 25.5.1. FFPO හා CITES ක්‍රියාත්මක කිරීම. | මධ්‍යම පරිසර අධිකාරිය | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ගනුලැබූ පියවර. |
| | 25.6. ක්ෂීරපායි සත්ව විශේෂයන්ගෙන් කෘෂි භෝගවලට සිදුවිය හැකි හානි පිළිබඳ අධ්‍යයනය හා එම හානි අවම කරගැනීමට පියවර ක්‍රියාත්මක කිරීම. | 25.6.1. අලි ගම් වැදීම හා කෘෂි භෝග විනාස කිරීම වැලැක්වීම සඳහා විදුලි වැට සවි කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම.<br>25.6.2. වාසස්ථානවල ඇති සම්පත් වර්ධනය. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | මූල්‍ය වසරක් තුළ සිදුවූ ක්‍රියාකාරකම් ප්‍රමාණය |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| 26. අලි ගහනය ඇතුළු වන ජීවී සංරක්ෂණය සහතික කිරීම. | 26.1. වනජීවී සම්පත් සංරක්ෂණය. | 26.1.1. වනජීවී සංරක්ෂණයට සෘණාත්මක බලපෑම් ඇති කරන වත්මන් අභියෝග වලට ඇමතීමට 2000 ජාතික වනජීවී ප්‍රතිපත්ති සමාලෝචනය හා සංශෝධනය. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | අවුරුද්දක දී සිදු වූ සිද්ධීන් ප්‍රමාණය.<br>පොහොසත් කල හෙක්ටයාර් ප්‍රමාණය.<br>සංශෝධිත ජාතික වනජීවී ප්‍රතිපත්තිය. |
| | 26.2. අලි ගහනය සංරක්ෂණය. | 26.2.1. අලි ගහනය අඩු වීමකට තුඩු දිය හැකි වර්තමාන අභියෝග ජයගැනීමට 2006 අලි සංරක්ෂණ ප්‍රතිපත්ති සමාලෝචනය හා සංශෝධනය. | | | අලි සංරක්ෂණය කිරීමේ ප්‍රතිපත්ති සංශෝධනය. |
| | 26.3. පහත කරුණුවලින් අලින් ආරක්ෂා කිරීම.<br>■ දුම්රිය අනතුරු<br>■ හක්ක පටස්<br>■ වගා ළිංවලට ඇද වැටීම.<br>■ අනාරක්ෂිත ප්‍රවාහනය<br>■ අපචාර, සූරාකෑම කෘර සැලකීම්, අල්ලා තබාගැනීමේදී නොසලකා හැරීම්වලට නිරාවරණය වීම. | 26.3.1. කල්තියා අලින් හඳුනා ගැනීමට දුම්රියේ අධෝරක්ත කිරණ සහිත කැමරා සවි කිරීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | ගනුලැබූ පියවර. |
| | | 26.3.2. අලින් ගමනාගමනය කරන ප්‍රදේශවල උමං මාර්ග ඉදිකිරීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / නීතිපති දෙපාර්තමේන්තුව | කෙටි / දීර්ඝ කාලීන | ඉදිකළ යටින් ගමන් කළ හැකි පාරවල් ගණන. |
| | | 26.3.3. අපරාධකරුවන්ට එරෙහිව සෘජු හා ඵලදායි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ | අධිකරණයට නඩු යොමුකළ ප්‍රමාණය.<br>වරදකරුවන් කළ ප්‍රමාණය. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | 26.4. වන ජීවී අභය භූමි හා ජාතික වනෝද්‍යාන සංරක්ෂණය. | 26.4.1. වන ජීවී අභය භූමි හා ජාතික වනෝද්‍යාන වෙත ගෙන යා හැකි භාණ්ඩ පිළිබඳව තක්සේරුවක් ලබාගෙන වනජීවීන්ගේ අවශ්‍යතාවයන් ගැන අවධානය යොමු කරමින් අමුත්තන්ගේ පැමිණීම පාලනය කිරීමට පියවර ගැනීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / නීතිපති දෙපාර්තමේන්තුව | කෙටි / දීර්ඝ කාලීන | තක්සේරුකරණය / සංවර්ධනය කරන ලද හා ප්‍රකාශයට පත් කරන ලද නිරන්තර ක්‍රියාකාරකම් නියාමනය කළ අමුත්තන් ගණන.<br>අධිකරණයට නඩු යොමුකළ ප්‍රමාණය.<br>වරදකරුවන් කළ ප්‍රමාණය. |
| | | 26.4.2. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වෙනුවෙන් ක්‍රියාකරන මාර්ගෝපදේශකයින් සංචාරක ක්‍රියාකරුවන් විසින් සිදුකරන උල්ලංඝණය කිරීම් එරෙහිව නීති සහ රෙගුලාසි දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | බලපත්‍ර අවලංගු කිරීම් හෝ අත්හිටුවීම් සිදුකළ ප්‍රමාණය. |
| | | 26.4.3. වනජීවී ස්වභාවික වාසස්ථානවලට අන්තරායකාරී ලෙස පිවිසෙන අමුත්තන්ගේ හැසිරීම නියාමනය හා / හෝ එසේ සිදු කිරීමට පියවර ගැනීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව / නීතිපති දෙපාර්තමේන්තුව | මධ්‍ය කාලීන | අමුත්තන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත් අවස්ථා ගණන ආරක්ෂිත ප්‍රදේශ තුළ හඳුන්වාදුන් කළමනාකරණ සැලසුම් ගණන. |
| | | 26.4.4. වනජීවී අභය භූමි හා ජාතික වනෝද්‍යාන තුළ නරඹන්නන්ට පිරිසිදු පානීය ජලය සහ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් යනාදී මූලික පහසුකම්ද ලබාදීම හා වැඩිදියුණු කිරීම. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | ප්‍රමාණවත් ජලය සහ සනීපාරක්ෂාව සැපයීම සහිත අභයභූමි සහ ජාතික උද්‍යාන ගණන. |

| පරමාර්ථය | අරමුණ | ක්‍රියාකාරකම | අදාළ ආයතනය | ඉලක්ක සම්පූර්ණ කරන දිනය | කාර්ය සාධන දර්ශකය |
|---|---|---|---|---|---|
| | | 26.4.5. වන ජීවිත පිළිබඳ ආකල්ප ප්‍රවර්ධනය සහ වන ජීවී ආරක්ෂණය හා ආකර්ෂණය කරවීම යන කරුණු මුල් කර ගනිමින් කෞතුකාගාර සහ නරඹන්නන් සහ කුඩා දරුවන් ඉලක්ක කරගත් විශේෂිත ක්‍රියාකාරකම් හරහා වන ජීවිත පිළිබඳ තොරතුරු ලබාදීමට, ඉඩකඩ හා සම්පත් සැලසීම යනා දී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව / සංචාරක සංවර්ධන අමාත්‍යාංශය | අඛණ්ඩ ව ක්‍රියාත්මක වේ. | වැඩිදියුණු කළ සංචාරක මධ්‍යස්ථාන ගණන.<br>සංවර්ධනය කරන ලද තොරතුරු / අධ්‍යාපනික මධ්‍යස්ථාන ගණන. |
| | | 26.4.6. වන ජීවී දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් සඳහා ප්‍රමාණවත්, අඛණ්ඩ පුහුණුවීම් ලබාදීම. | වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව | අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | පැවැත් වූ පුහුණු සැසි ගණන ඉලක්ක.<br>ඉලක්කගත කණ්ඩායම මගින් විසුරුවා හරින ලද / භූ ගෝලීය ප්‍රදේශ. |